2023

වාර්ෂික වාර්තාව
ஆண்டறிக்கை
Annual Report



ජාතික විද්‍යා පදනම
தேசிய விஞ்ஞான மன்றம்
National Science Foundation

ජාතික විද්‍යා පදනම (NSF); විද්‍යාව සහ තාක්ෂණය සම්බන්ධිත විශිෂ්ටතම මධ්‍යස්ථානයකි.

තම ආයතනය වෙත පැවරී ඇති බලය අනුව සහ ජාතික ප්‍රතිපත්ති සහ තිරසර සංවර්ධන ඉලක්කවලට අනුකූල වෙමින්, එහි සභාපති, අධ්‍යක්ෂ ජනරාල් සහ කළමනාකරණ මණ්ඩලයේ අඛණ්ඩ දිරිගැන්වීම සහ මඟ පෙන්වීම යටතේ ජාතික විද්‍යා පදනම විසින් 2023 වර්ෂය තුළ සාර්ථක අයුරින් කටයුතු සිදුකරන ලදී.

නව තාක්ෂණික මෙවලම්, ශිල්පීය ක්‍රම සහ පරිචයන් ගවේෂණය කිරීමේ සහ ඒ සඳහා අනුගතවීමේ මාර්ගය වෙත නායකත්වය ලබාදෙන කණ්ඩායමක් සමඟින් නිපුණතාවය සහ හැකියාවැති ආයතනයක් ලෙසින් ශ්‍රී ලංකාවේ ආර්ථික සහ සාමාජීය සෞභාග්‍යය උදෙසා විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික විද්‍යා පදනම කැප වී සිටියි. යෝග්‍ය නිර්දේශ ලබාදීම පිණිස පර්යේෂණ සහ සංවර්ධන කටයුතුවල දී මනා පරිචයන් ස්ථාපනය කිරීම සහ ප්‍රවර්ධනය සිදුකරමින් සහ විද්‍යා අධ්‍යාපනයේ දී ඉතා වැදගත් වශයෙන් සැලකෙන සුවිශේෂී අවධානිත ක්ෂේත්‍ර සඳහා සහාය ලබාදෙමින් මනා නායකත්වයක් සහ මඟපෙන්වීමක් ලබාදීම පිළිබඳ අවධානය සහිතව ජාතික විද්‍යා පදනමේ කණ්ඩායම විවිධ ක්ෂේත්‍ර ඔස්සේ ක්‍රියාත්මක වේ. සමස්ත කාර්යාවලියම අඛණ්ඩ නවෝත්පාදනයක් ලෙස සැලකෙන "දැනුම නිර්මාණය කිරීමේ සමාගමක්", නැමති ප්‍රකට කළමනාකරණ දර්ශනය ඔස්සේ ජාතික විද්‍යා පදනම විසින් ආයතනයේ සමස්ත සාර්ථකත්වය සඳහා රුකුලක් ලබාගැනේ.

වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම තුළ දක්වා ඇති පරිද්දෙන් ඵලදායි නිමැවුමක් ලබාදීම සඳහා කාර්ය මණ්ඩලය කැපවී සිටින අතර, ජයග්‍රහණ සහ සාර්ථකත්වය පත් වූ නිපැවුම් සහ තොරතුරු සමඟින් මෙම වර්ෂයේ වාර්ෂික වාර්තාව තුළින් මෙය නිරූපණය වේ.

ආයතනයේ කාර්යසාධනය, අනාගත අපේක්ෂා සහ සංරෝධක සම්බන්ධයෙන් විනිශ්චයක් සිදුකිරීමට කැමැත්තක් දක්වන පාර්ශවයන්ට, එසේ කිරීමට හැකිවන පරිදි ප්‍රස්තාරික ඉදිරිපත් කිරීම් 71ක්, වගු 14ක්, ඡායාරූප 154ක් සහ ඇමුණුම් 07ක් සමඟින් ආයතනයේ අදාළ සියලු තොරතුරු මෙම වාර්තාවේ අන්තර්ගත වේ.

විගණන වාර්තාව සහ විගණන වාර්තාව සම්බන්ධයෙන් ජාතික විද්‍යා පදනමේ පිළිතුරු සමඟින් සමස්ත වාර්ෂික වාර්තාව පිටු 228 කින් සමන්විත වේ. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත්කළ වාර්ෂික වාර්තා පිළියෙළ කිරීම සඳහා වූ මාර්ගෝපදේශ අනුගමනය කරමින් මෙම වාර්තාව පිළියෙල කර තිබේ.

ජාතික විද්‍යා පදනම
47/5, මේවිලන්ඩ් පෙදෙස,
කොළඹ - 07,
ශ්‍රී ලංකාව.

දුරකතන : +94 112694170
+94 112696771

ෆැක්ස් : +94 112694754

ඊ මේල් : dg@nsf.gov.lk

වෙබ් : www.nsf.gov.lk

: https://www.facebook.com/nsflk/

: https://twitter.com/NSFSriLanka

: https://www.youtube.com/user/NSFSL



පටුන

ආයතනය පිළිබඳ හැඳින්වීම	01
• ජාතික විද්‍යා පදනම පිළිබඳ හැඳින්වීම	03
• පනත මගින් පැවරී ඇති කාර්යයන්	03
• දැක්ම	04
• මෙහෙවර	04
• ඉලක්කය	04
• අරමුණු	04
පාලන රාමුව	05
• සංවිධාන ව්‍යුහය	07
• කළමනාකරණ මණ්ඩලය - 2023	08
• කාර්ය මණ්ඩල සවිය	11
• ජාතික විද්‍යා පදනමේ බාහිර සම්පත් සංචිතය	12
සභාපතිවරයාගේ සමාලෝචනය	13
අධ්‍යක්ෂ ජනරාල්ගේ වාර්තාව	15
ප්‍රධාන කාර්යසාධන දර්ශක සමඟ ක්‍රියාකාරී සැලැස්ම - 2023	16
කාර්යසාධනයේ සුවිශේෂී කරුණු	21
• භෞතික කාර්යසාධනයේ සුවිශේෂී කරුණු	23
• මූල්‍ය කාර්යසාධනයේ සුවිශේෂී කරුණු	27
• ජාතික විද්‍යා පදනම විසින් ඉටුකරනු ලබන කාර්යයන් තිරසර සංවර්ධන ඉලක්ක සහ ජාතික ප්‍රතිපත්ති රාමුව සමඟ ගැලපීම	29
ක්‍රියාකාරී සැලැස්ම - 2023 සමඟ ලබාගත් ප්‍රගතිය සංසන්දනය කිරීමක්	31
• පැවරී ඇති බලය අ) පර්යේෂණ සහ සංවර්ධන කටයුතු ප්‍රවර්ධනය කිරීම	33
• පැවරී ඇති බලය ආ) විද්‍යා සහ තාක්ෂණ තොරතුරු ව්‍යාප්ත කිරීම	63
• පැවරී ඇති බලය ඇ) විද්‍යා සහ තාක්ෂණ ධාරිතා ගොඩනැංවීම	97
• පැවරී ඇති බලය ඈ) විද්‍යා සහ තාක්ෂණ ප්‍රතිපත්ති පර්යේෂණ	109
• පැවරී ඇති බලය ඉ) විද්‍යාව ප්‍රචලිත කිරීම	111
• මාධ්‍ය සහ ඉසව් කළමනාකරණය	123
• ප්‍රාග්ධන වත්කම් අත්පත් කරගැනීම, නඩත්තු කිරීම සහ පද්ධති පරිපාලනය	127
ඉදිරි සැලසුම් වාර්තාව	131
මූල්‍ය සමාලෝචනය	133
• පසුගිය වසර 10ක මූල්‍ය කාර්යසාධනයේ සුවිශේෂී කරුණු	135
• කාර්යසාධනය පිළිබඳ ගණන්දීමේ නිලධාරියාගේ නිරීක්ෂණ	136
• 2023 දෙසැම්බර් 31 වැනි දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය	137
විගණකාධිපතිවරයාගේ වාර්තාව	171
විගණකාධිපතිවරයාගේ වාර්තාව සම්බන්ධයෙන් ජාතික විද්‍යා පදනමේ අදහස් දැක්වීම	179

ඇමුණුම් 197

ඇමුණුම 1 - 2023 දෙසැම්බර් 31 වැනි දිනට ප්‍රධාන කාර්ය මණ්ඩලය 199
ඇමුණුම 2 - දැනට පර්යේෂණ කටයුතු කෙරීගෙන යමින් පවතින ප්‍රදානයන් - 2023 203
ඇමුණුම 3 - 2023 වර්ෂයේ දී පිරිනමන ලද පර්යේෂණ ප්‍රදාන 209
ඇමුණුම 4 - 2023 වර්ෂයේ දී කටයුතු නිමාකරන ලද පර්යේෂණ ප්‍රදාන 212
ඇමුණුම 5 - පර්යේෂණ ප්‍රදානවල සාරාංශයක් - 2023 219
ඇමුණුම 6 - පර්යේෂණ උපාධි අධීක්ෂණය සඳහා වන සහාය යෝජනා ක්‍රමය (SUSRED) යටතේ ප්‍රදානයන් 2021/2022 220
ඇමුණුම 7 - පුහුණු හා ධාරිතා සංවර්ධනය 226

ආයතනය පිළිබඳ කෙටි හැඳින්වීමක්



ආයතනය පිළිබඳව

එවකට ජාතික විද්‍යා පදනම අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක විණි. 1968 වර්ෂයේ දී මෙම ආයතනය ජාතික විද්‍යා සභාව (National Science Council - NSC) වශයෙන් මුලින් ස්ථාපිත කරන ලදී. (1968 අංක 09 දරන පනත යටතේ) ජාතික විද්‍යා සභාව 1982 වර්ෂයේ දී ස්වාභාවික සම්පත්, බලශක්ති සහ විද්‍යා අධිකාරිය (Natural Resources, Energy and Science Authority - NARSEA) වශයෙන් නැවත ප්‍රතිසංවිධානය කරන ලදී. (1981 අංක 78 දරන පනත යටතේ) වසර 16ක සේවා කාලයකින් අනතුරුව, 1998 වර්ෂයේ දී 1994 අංක 11 දරන පනත මගින් ජාතික විද්‍යා පදනම (National Science Foundtaion - NSF) වශයෙන් ස්වාභාවික සම්පත්, බලශක්ති සහ විද්‍යා අධිකාරිය නැවත නම් කරන ලදී.

පනත මගින් පැවරී ඇති කර්තව්‍යයන්

පහත දැක්වෙන පරිදි, 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩිදියුණු කිරීමේ පනතේ විධිවිධානවලට අනුකූලව සිය කර්තව්‍ය ඉටු කිරීම සඳහා ජාතික විද්‍යා පදනම වෙත බලය පැවරී තිබේ:

(අ) පහත කරුණු සාක්ෂාත් කරගැනීමේ අරමුණුකිව විශ්වවිද්‍යාල, විද්‍යා සහ තාක්ෂණ ආයතන සහ විද්‍යාඥයන් විසින් සිදු කරන මූලික සහ ව්‍යවහාරික විද්‍යාත්මක පර්යේෂණ ආරම්භ කිරීම, පහසු සැලසීම සහ එහිලා සහායවීම සිදු කෙරේ -

(i) සමාජ විද්‍යාව පිළිබඳ පර්යේෂණ සහ විද්‍යා අධ්‍යාපන වැඩසටහන් ද ඇතුළුව, විද්‍යාත්මක පර්යේෂණ විභවතාවය ශක්තිමත් කිරීම;

(ii) ශ්‍රී ලංකාවේ ස්වාභාවික සම්පත් සංවර්ධනය කිරීම;

(iii) ශ්‍රී ලංකාවේ ජනතාවගේ සුභ සාධනය ප්‍රවර්ධනය කිරීම; සහ

(iv) විද්‍යා සහ තාක්ෂණ කටයුතුවල නියැලෙන පර්යේෂකයන් පුහුණු කිරීම.

(ආ) ශ්‍රී ලංකාවේ සහ විදේශ රටවල විද්‍යාඥයන් අතර විද්‍යාත්මක තොරතුරු හුවමාරු කරගැනීම දිරිමත් කිරීම;

(ඇ) විද්‍යා සහ තාක්ෂණ ආයතනවල කරනු ලබන විද්‍යාත්මක අධ්‍යයන හෝ විද්‍යාත්මක කටයුතු සම්බන්ධයෙන් ශිෂ්‍යත්ව සහ අධිශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම;

(ඈ) විද්‍යා සහ තාක්ෂණික පිරිස් පිළිබඳ ප්‍රවර්තන ලේඛනයක් පවත්වාගෙන යෑම සහ විද්‍යාත්මක සහ කාර්මික සම්පත් ශ්‍රී ලංකාවෙහි පැවතීම සහ ඒ සම්පත් සඳහා දැනට පවත්නා හා අරමුණුගත අවශ්‍යතාවය පිළිබඳ දත්ත එකතු කිරීම, අර්ථ නිරූපණය කිරීම හා විශ්ලේෂණය කිරීම සම්බන්ධයෙන් වෙනත් ආකාරවලින් මධ්‍ය නිෂ්කාශණාගාරයක් ඇති කිරීම සහ විද්‍යාව, තාක්ෂණය සහ වෙනත් ක්ෂේත්‍ර පිළිබඳ වූ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම පිණිස තොරතුරු ලබාගැනීමේ මාධ්‍යයක් ඇති කිරීම;

(ඉ) විද්‍යාව ජනප්‍රිය කිරීමේ කාර්යය සඳහා වන වැඩසටහන්වලට අරමුදල් යෙදවීමෙන් විද්‍යාව මහජනතාව අතර ජනප්‍රිය කරවීම.

දැක්ම

ශ්‍රී ලංකාවේ ආර්ථික සහ සමාජීය සමෘද්ධිය සඳහා විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීමේ ප්‍රමුඛතම නියමු බලවේගය බවට පත්වීම.

මෙහෙවර

පහත කාර්යයන් ඉටු කිරීම මගින් ශ්‍රී ලංකාවේ ආර්ථික සහ සමාජීය සමෘද්ධිය සඳහා විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම:

- පර්යේෂණ, සංවර්ධන, නවෝත්පාදන සහ තාක්ෂණ හුවමාරු ආරම්භ කිරීම, පහසුකම් සැලසීම සහ සහාය ලබාදීම;
- දැනුම නිර්මාණය කිරීම, ව්‍යාප්ත කිරීම, ධාරිතා සංවර්ධනය, සහයෝගිතාවයන්, විද්‍යාව ප්‍රචලිත කිරීම සහ විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු සහ ගණිත අධ්‍යාපනය (STEM) ප්‍රවර්ධනය කිරීම සඳහා හැකියාව ඇති කිරීම සහ අරමුදල් සම්පාදනය කිරීම; සහ
- ප්‍රතිපත්ති පර්යේෂණ සිදුකිරීම සහ ප්‍රතිපත්ති සංවර්ධනය සඳහා සහාය ලබාදීම.

ඉලක්කය

ජාතික ප්‍රතිපත්ති රාමුවේ ප්‍රමුඛතා යටතේ වැඩසටහන් ක්‍රියාවට නැංවීම මගින් ජාතියේ වේගවත් සංවර්ධනය උදෙසා ක්‍රියාකාරීව සහ ඵලදායී අන්දමින් දායකවීම.

අරමුණු

1. රාජ්‍ය-පෞද්ගලික, ආයතනික-කර්මාන්ත හවුල්කාරිත්වයන් ගොඩනැංවීම ඔස්සේ දැනුම් ආර්ථිකයක් බිහි කිරීම සඳහා පර්යේෂණ, සංවර්ධන සහ නවෝත්පාදන සිදුකිරීම.
2. අපගේ ජනතාවගේ ජීවිතවල ගුණාත්මක තත්වය වැඩිදියුණු කිරීම සඳහා සියලු විද්‍යා සහ තාක්ෂණ ක්ෂේත්‍රවල අවශ්‍ය ධාරිතා සංවර්ධන, යටිතල පහසුකම්, තාක්ෂණ හුවමාරු, දැනුම නිර්මාණය හා බෙදාගැනීම සඳහා පහසුකම් සැලසිම.
3. ප්‍රතිපත්ති සම්පාදකයන් විසින් තීරණ ගැනීම ප්‍රවර්ධනය කිරීමෙහිලා විද්‍යා හා තාක්ෂණ දර්ශක වැඩිදියුණු කිරීමට සහාය දැක්වීම උදෙසා ප්‍රතිපත්ති අධ්‍යයන සහ සමීක්ෂණ, දත්ත රැස්කිරීම් සහ සාක්ෂි පදනම් කරගත් වාර්තාකරණය සිදුකිරීම.
4. විද්‍යා සන්නිවේදනය ඔස්සේ මහජනතාව හා සමාජයේ අනෙකුත් අංශ වෙත ළඟාවීම සහ මහජනතාවගේ විද්‍යා සාක්ෂරතාවය සහ ඔවුන් විද්‍යාව හා සම්බන්ධිත කාර්යයන්හි නියැලීම ඉහළ නැංවීම.
5. කාර්යසාධනය මත පදනම් වූ සහ ප්‍රතිඵල මූලික හිතකර වැඩ පරිසරයක් තුළ දක්ෂ ශ්‍රම බලකායක් ඇතිකිරීම.



පාලන රාමුව

සංවිධාන ව්‍යුහය



AO - ගිණුම් නිලධාරීන්
CS - රහස්‍ය ලේකම්
HRDO - මානව සම්පත් සංවර්ධන නිලධාරී
IA - අභ්‍යන්තර විගණක
IAO - අභ්‍යන්තර විගණන නිලධාරී
IAD - ජාත්‍යන්තර සබඳතා අංශය
IO - තොරතුරු නිලධාරී
ITM - තොරතුරු තාක්ෂණ කළමනාකරු

JIO - කණිෂ්ඨ තොරතුරු නිලධාරී
JPD - සඟරා ප්‍රකාශන අංශය
LA - පුස්තකාල සහායක
MA - කළමනාකරණ සහකාර
MEMD - මාධ්‍ය සහ ඉසව් කළමනාකරණ අංශය
NA - ජාල පරිපාලක
NSLRC - ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානය
P & TO - ප්‍රසම්පාදන සහ ප්‍රවාහන නිලධාරී

PIO - ප්‍රධාන විද්‍යාත්මක නිලධාරී
PL - ප්‍රාථමික මට්ටම
PM - මුද්‍රණ කළමනාකරු
PO - මුද්‍රණ නිලධාරී
PSO - ප්‍රධාන විද්‍යාත්මක නිලධාරී
RD - පර්යේෂණ අංශය
SA/ A - ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී/ ගණකාධිකාරී
SAO - ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරී

SIO - ප්‍රධාන තොරතුරු නිලධාරී
SO - විද්‍යාත්මක නිලධාරී
SCOD - විද්‍යා සන්නිවේදන සහ ව්‍යාප්ත අංශය
SSO - ජ්‍යෙෂ්ඨ විද්‍යාත්මක නිලධාරී
STPRD - විද්‍යා සහ තාක්ෂණ ප්‍රතිපත්ති පර්යේෂණ අංශය
TDID - තාක්ෂණ සංවර්ධන සහ නවෝත්පාදන අංශය
* - * දරන්නාට පුද්ගලික වන ලෙස තනතුර

කළමනාකරණ මණ්ඩලය පිළිබඳ කෙටියෙන්

කළමනාකරණ මණ්ඩලයක් විසින් ජාතික විද්‍යා පදනම පාලනය කරනු ලැබේ. සභාපති, අධ්‍යක්ෂ ජනරාල්, සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC), ශ්‍රී ලංකා විද්‍යානිවර්ධන සංගමය (SLAAS), ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය (IESL), ජාතික අධ්‍යාපන ආයතනය (NIE) සහ මුදල් අමාත්‍යාංශය යන සෑම ආයතනයක්ම නියෝජනය කරමින් එක් සාමාජිකයෙකු බැගින් සහ විෂයභාර අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන තවත් සාමාජිකයන් සිවුදෙනෙකුගෙන් කළමනාකරණ මණ්ඩලය සමන්විත වේ.



මහාචාර්ය රංජිත් සේනාරත්න
සභාපති



ආචාර්ය සේපාලිකා සුදසිංහ
අධ්‍යක්ෂ ජනරාල්



මහාචාර්ය චන්දන පී. උඩවත්ත
(විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නියෝජිත)
උප සභාපති
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
(2023 අගෝස්තු 11 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි)



මහාචාර්ය ප්‍රසාද් සේතුංග
(ජාතික අධ්‍යාපන ආයතනයේ නියෝජිත)
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය
(2023 සැප්තැම්බර් 19 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි)



එම්. කේ. සිතාරා ජයසේන මිය
(භාණ්ඩාගාර නියෝජිත)
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යාංශය
(2023 මාර්තු 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි)



මහාචාර්ය රංජිත් දිසානායක
(ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ නියෝජිත)
සභාපති
ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය
(2023 නොවැම්බර් 16 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි)



වෛද්‍ය විනය ආරියරත්න
සභාපති
සර්වෝදය ශ්‍රමදාන ව්‍යාපාරය
(2023 ජනවාරි 30 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි)



මහාචාර්ය එම්. එන්. කෞමාල්
(ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ නියෝජිත)
රසායන විද්‍යා මහාචාර්ය විශ්වවිද්‍යාල තාක්ෂණ හුවමාරු කාර්යාලයේ (UBL) අධ්‍යක්ෂ
කොළඹ විශ්වවිද්‍යාලයේ, විද්‍යා පීඨයේ විද්‍යා සහ තාක්ෂණ කේන්ද්‍රයේ ප්‍රධාන විධායක නිලධාරී
(2023 මාර්තු 20 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි)



මහාචාර්ය සම්පත් පුංචිහේවා
පීඨාධිපති
නීති පීඨය
කොළඹ විශ්වවිද්‍යාලය
(2023 ජනවාරි 30 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි)



තුෂාර වජිර පෙරේරා මහතා
විද්‍යා සහ තාක්ෂණික කටයුතු පිළිබඳ ජනාධිපති උපදේශක සහ ප්‍රධාන විධායක නිලධාරී
ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණික ආයතනය (SLINTEC)
(2023 ජනවාරි 30 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි)



ඩෙන්සිල් ඉන්ද්‍රජිත් පෙරේරා මහතා
සභාපති
ලංකා සළුසල
(2023 ජනවාරි 30 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි)



මහාචාර්ය ආනන්ද ජයවර්ධන
(විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නියෝජිත)
මහාචාර්ය
සිවිල් ඉංජිනේරු අධ්‍යයනාංශය
මොරටුව විශ්වවිද්‍යාලය
(2020 ජූලි 03 වැනි දින සිට 2023 ජූලි 03 වැනි දින දක්වා)



ඉංජිනේරු (ආචාර්ය) කමල් ලක්සිරි
(ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ නියෝජිත)
සභාපති
ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය
(2022 මැයි 09 වැනි දින සිට 2023 මැයි 09 වැනි දින දක්වා)



ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න
(ජාතික අධ්‍යාපන ආයතනයේ නියෝජිත)
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය
(2020 මාර්තු 02 වැනි දින සිට 2023 මාර්තු 02 වැනි දින දක්වා)



ඒ. වයි. හර්ෂණී අනුරුද්ධා මෙනවිය
(භාණ්ඩාගාර නියෝජිත)
නියෝජ්‍ය අධ්‍යක්ෂ (සෞඛ්‍ය)
ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යාංශය
(2022 මැයි 09 වැනි දින සිට 2023 පෙබරවාරි 28 වැනි දින දක්වා)

කාර්ය මණ්ඩල සවිය

අනුමත කාර්ය මණ්ඩලය 144ක් නමුදු, ජාතික විද්‍යා පදනම 2023 වර්ෂයේ දී 106 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් සමගින් කාර්ය මණ්ඩල හිඟය මධ්‍යයයේ වුව ද සිය කටයුතු ඉටු කරන ලදී. 2022 සහ 2023 වර්ෂවල දී විවිධ සේවා ගණවල කාර්ය මණ්ඩල නියුක්තිය පිළිබඳ සංසන්දනයක් *වගුව 01* හි දැක්වේ.

වගුව 01: 2022 සහ 2023 වර්ෂවලට අදාළව විවිධ සේවා ගණවල කාර්ය මණ්ඩල නියුක්තිය පිළිබඳ සංසන්දනයක්

සේවා ගණය	වර්ෂය					
	2022.12.31 දිනට			2023.12.31 දිනට		
	අනුමත කාර්ය මණ්ඩලය	දැනට සිටින කාර්ය මණ්ඩලය	පුරප්පාඩු සංඛ්‍යාව	අනුමත කාර්ය මණ්ඩලය	දැනට සිටින කාර්ය මණ්ඩලය	පුරප්පාඩු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ කළමනාකර සේවා ගණය (HM)	10	9	1	10	8	2
අධ්‍යයන/පර්යේෂණ සේවා ගණය 2 (AR2)	6	5	1	6	5	1
අධ්‍යයන/පර්යේෂණ සේවා ගණය 1 (AR1)	26	16	10	26	14	12
මධ්‍යම කළමනාකරණ සේවා ගණය (MM)	11	9	2	11	7	4
කණිෂ්ඨ කළමනාකරණ සේවා ගණය (JM)	10	4	6	10	6	4
කළමනාකරණ සහායක සේවා ගණය (MA)	56	46	10	56	43	13
ප්‍රාථමික සේවා ගණය (PL)	25	17	8	25	15	10
එකතුව	**144**	**106**	**38**	**144**	**98**	**46**

විද්‍යාත්මක අංශ සහ විද්‍යාත්මක නොවන යන අංශ දෙකෙන්ම ජාතික විද්‍යා පදනමේ කාර්ය මණ්ඩලය සමන්විත වේ. පාලන, මූල්‍ය, තොරතුරු තාක්ෂණ, මුද්‍රණ, අභ්‍යන්තර විගණන සහ ප්‍රසම්පාදන යන අංශවල කාර්ය මණ්ඩලය විසින් මෙම ආයතනයේ කටයුතු මනාව පවත්වාගෙන යෑම සඳහා ප්‍රධාන කාර්යයක් ඉටු කරනු ලැබේ. 2023 වර්ෂයේ දී විවිධ සේවා ගණවල අනුමත කාර්ය මණ්ඩලයට සාපේක්ෂව සේවයේ නියුක්ත කාර්ය මණ්ඩලය සහ පුරප්පාඩු සංඛ්‍යාව රූප සටහන *01* හි දැක්වේ.



රූප සටහන 01: අනුමත කාර්ය මණ්ඩලයට සාපේක්ෂව දැනට සිටින කාර්ය මණ්ඩලය සහ පුරප්පාඩු සංඛ්‍යාව ප්‍රතිශතාත්මක වශයෙන්

ජාතික විද්‍යා පදනමේ බාහිර සම්පත් සංචිතය

ජාතික විද්‍යා පදනම වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය සඳහා රුකුලක් වශයෙන් සහ එහි නිත්‍ය කටයුතු සඳහා සහාය ලබාදීම පිණිස, පහත දැක්වෙන කමිටු, කර්තෘ මණ්ඩල සහ ක්‍රියාකාරී කණ්ඩායම් ස්ථාපනය කිරීම සහ/හෝ පෙර වර්ෂවල එලෙස ස්ථාපිත කරන ලද කමිට, මණ්ඩල සහ කණ්ඩායම් අඛණ්ඩව පවත්වාගෙන යෑම 2023 වර්ෂයේ දී සිදුවිය.

1. ජාතික විද්‍යා පදනමේ සඟරාවේ (Journal of the NSF) කර්තෘ මණ්ඩලය
2. ශ්‍රී ලංකා සමාජ විද්‍යා සඟරාවේ (Sri Lanka Journal of Social Science) කර්තෘ මණ්ඩලය
3. විද්‍යා සහ තාක්ෂණ ප්‍රතිපත්ති පිළිබඳ ක්‍රියාකාරී කමිටුව
4. විද්‍යාව ප්‍රචලිත කිරීම පිළිබඳ ක්‍රියාකාරී කමිටුව
5. වෙළඳපොළට ඇතුළුවන ශාකසාර නිෂ්පාදනවල තත්ත්ව පාලනය සහ තත්ත්ව ආරක්ෂණය පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම
6. ආහාර සුරක්ෂිතතාවය සහ ආහාරවලින් ඇතිවිය හැකි විභව්‍ය සෞඛ්‍ය අවදානම් පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම
7. තත්ත්ව ආරක්ෂණය පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම
8. පාර්ශවකරුවන් සමග ජාතික නවෝත්පාදන පරිසර පද්ධති සංවර්ධනය පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම
9. උපකරණ පිළිබඳ දත්ත සමුදායක් සකස් කිරීමේ ක්‍රියාකාරී කණ්ඩායම
10. විශ්වවිද්‍යාලවල ව්‍යාපාරික සබැඳුම් කේන්ද්‍ර (University Business Link Cells) සමග සහයෝගිතාවය පවත්වා ගැනීමේ ක්‍රියාකාරී කණ්ඩායම
11. කර්මාන්ත අංශයේ සංවර්ධනය පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම
12. මිනිසා සහ ජෛවගෝලය පිළිබඳ ජාතික කමිටුව
13. පර්යේෂණ අංශයේ තාක්ෂණික ඇගැයීම් මඩුල්ල
14. මාධ්‍ය සම්බන්ධයෙන් ජාතික විද්‍යා පදනමේ ක්‍රියාකාරී කමිටුව
15. ජාතික විද්‍යා පදනමේ පර්යේෂණ පිළිබඳ ක්‍රියාකාරී කමිටුව
16. ජාතික විද්‍යා පදනමේ තාක්ෂණ සංවර්ධන සහ නවෝත්පාදන පිළිබඳ ක්‍රියාකාරී කමිටුව

සභාපතිවරයාගේ සමාලෝචනය



රටෙහි සමාජ- ආර්ථික සංවර්ධනය සඳහා විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදන ප්‍රවර්ධනය පිණිස බලය පැවරී ඇති ප්‍රමුඛතම ජාතික ආයතනය වන ජාතික විද්‍යා පදනමේ 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව සඳහා මා විසින් මෙම පණිවිඩය එකතු කරනුයේ හදපිරි සතුටිනි.

පෙර නොවූ විරූ ආර්ථික සහ සමාජ අර්බුදයන් යෝග්‍ය මැදිහත්වීම් ඔස්සේ මැඩපවත්වා ගැනීමට අප රටට හැකිවී තිබෙන අතර, 2050 දී සංවර්ධිත ජාතියක් වශයෙන් නැඟී සිටීම සඳහා වර්ධනය වෙමින් පවතින තලයක් වෙත ආර්ථිකය ඔසොවා තබා ඇත. මෙහි දී, වඩා යහපත් සහ සුරක්ෂිත හෙට දිනක් ළඟා කරගැනීම උදෙසා පොදු මහජනතාව විද්‍යාඥයින්, තාක්ෂඥයින් සහ වෘත්තිකයන් කෙරෙහි වැඩි නැඹුරුතාවයක් යොමුකිරීමේ ඉහළ යන ප්‍රවණතාවයක් පවතී. එබැවින්, ජාතික විද්‍යා පදනම වැනි විද්‍යාත්මක ආයතනවලට ප්‍රජාව සහ ජාතිය සම්බන්ධයෙන් පැවරී ඇති වගකීම පෙර කවර කලකටත් වඩා වැඩිවී පවතී.

කාලගුණික විපර්යාස, ආහාර සහ පෝෂණ අනාරක්ෂිතබව, දුගීබව තුරන් කිරීම, ග්‍රාමීය සංවර්ධනය සහ ස්වාභාවික ව්‍යසනයන් වැනි අභියෝගයන් වඩාත් සංකීර්ණ, බහුමාන සහ බහු පැතිකඩයන් සහිත වේ; මෙම අභියෝගයන් වෙත මුහුණදීම සඳහා දේශසීමා මායිම් නොසලකා හරිමින් ස්වාභාවික විද්‍යා සහ සමාජ විද්‍යා යන ද්වි අංශයේම විවිධ පසුබිම් සහිත විශේෂඥයන් අතර සහයෝගිතාවය සහිත අන්තර්විෂයයික සහ අන්තර්ජාතීය ප්‍රවේශයක් අත්‍යවශ්‍ය වේ. ඒ හැරුන විට, විද්‍යාව යළි ශක්තිමත් කිරීම පිණිස නව්‍ය ප්‍රවේශයන් සහ විවිධ ආකාරවල විශේෂඥ දැනුම අවශ්‍ය බවට වන පිළිගැනීම වර්ධනය වෙමින් පවතී. එනිසා, සැබෑ ජීවන ගැටලු වඩාත් ඵලදායී අයුරින් විසඳීම සඳහා ජාතික විද්‍යා පදනම විසින් අන්තර්විෂයයික අධ්‍යයනයන් ප්‍රවර්ධනය කෙරේ.

ඉහළ ප්‍රමුඛතාවයක් සහිත අවශ්‍යතා සඳහා ඵලදායී අයුරින් ප්‍රතිචාර දැක්වීම පිණිස, ජාතික විද්‍යා පදනම විසින් මීට පෙර මැදිහත්වීම් සවිමත් කරන අතරම, නව්‍ය මූලාරම්භයන් කිහිපයක්ම ආරම්භ කර තිබේ. ජාතික සමගිය හා ජාතීන් අතර මිත්‍රත්වය සඳහා බලගතු මෙවලමක් වශයෙන් විද්‍යාත්මක කටයුතුවල නිපුණතාවය උපයෝගී කරගැනීම, රාජ්‍ය-පුද්ගලික හවුල්කාරිත්වයන් (PPP) සහ සමාජය තුළ විද්‍යාත්මක සාක්ෂරතාවය ප්‍රවර්ධනය කිරීම. අධ්‍යයන ආයතනවල පිරිස, පර්යේෂණ සහ සංවර්ධන ආයතන සහ කර්මාන්ත විසින් ඉහළ මට්ටමේ විශ්ලේෂණ සහ පර්යේෂණ මෙවලම් භාවිතා කිරීම ප්‍රතිසංවිධානය කර කාර්යක්ෂම කිරීම සඳහා ජාතික උපකරණ දත්ත සමුදාය (National Instrument Database) සවිමත් කිරීම සහ පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයක් ලෙස හයිඩ්‍රජන් යොදාගැනීම සම්බන්ධයෙන් යළි පණගැන්වී ඇති උනන්දුව විශේෂයෙන් සඳහන් කළ යුතු ය.

ජාතික විද්‍යා පදනම තමා වෙත පැවරී ඇති බලතල සහ ජාතික අවශ්‍යතාවලට අනුකූලව, පොදු යහපත සහ ජාතික සංවර්ධනය සඳහා විද්‍යා සහ තාක්ෂණ කටයුතුවල අපේක්ෂා ප්‍රගමනය උදෙසා වන සිය අඛණ්ඩ ප්‍රයත්නයන් තවදුරටත් පවත්වාගෙන යනු ඇත.

සම්මානිත මහාචාර්ය රංජිත් සේනාරත්න
සභාපති

අධ්‍යක්ෂ ජනරාල්ගේ වාර්තාව



පෙර වර්ෂවලදී පරිදිම, 2023 වර්ෂයේදී ද ජාතික විද්‍යා පදනම විසින් 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩිදියුණු කිරීමේ පනත ප්‍රකාරව බලය පැවරී ඇති කාර්යයන් පහක් යටතේ සුවිශේෂී ආකාරයෙන් සිය කාර්යභාරය සාර්ථකව ඉටු කරන ලදී. ඉටු කරන ලද කාර්යයන් යටතට පෙර වර්ෂවල සිට ක්‍රියාත්මක කළ වැඩසටහන් සේම ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය වෙත විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු, කලා සහ ගණිත අධ්‍යාපනය (STEAM education) හඳුන්වා දීමේ ජාතික වැඩසටහන වැනි නව්‍ය වැඩසටහන් ද ඇතුළත් විය. තිරසර සංවර්ධන ඉලක්ක සහ ජාතික ප්‍රතිපත්ති රාමුවේ ප්‍රමුඛතා සමග අනුකූල වන පරිද්දෙන් සිය මෙහෙවර අඛණ්ඩව ඉදිරියට රැගෙන යෑම සඳහා පැහැදිලි දැක්මක් සහ යොමුවීමක් ජාතික විද්‍යා පදනම සතු ය.

ජාතික විද්‍යා පදනමේ 2023 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව ආරම්භ වනුයේ භෞතික සහ මූල්‍ය කාර්යසාධනයේ විශේෂ වැදගත්කමකින් යුතු කරුණුවලින් වන අතර, ඉන් අනතුරුව වර්ෂය සඳහා සැලසුම් කරන ලද ක්‍රියාකාරී සැලැස්මට අනුව ලබාගෙන ඇති ප්‍රගතිය පිළිබඳ විස්තර ඇතුළත් වේ. අපේක්ෂා කළ පරිදි, ක්‍රියාකාරී සැලැස්ම තුළ හඳුනාගත් ප්‍රධාන කාර්යසාධන දර්ශකවලට අනුව සුවිශේෂී නිමැවුම් සහ ප්‍රතිඵල සාක්ෂාත් කරගැනීමට සහ ව්‍යාප්ත කිරීමට ජාතික විද්‍යා පදනමට හැකි විය.

පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සඳහා පහසුකම් සැලසීම තවදුරටත් වැඩිකිරීම, ඒවා උපයෝගී කරගැනීම සහ වාණිජකරණය ඉලක්ක කරගැනීම, සහයෝගිතා ක්‍රියාකාරකම් හරහා ධාරිතා සංවර්ධනය සහ වැඩිදියුණු කළ ක්‍රමවේද සහ ක්‍රියාවලි ඔස්සේ මෙරට ප්‍රධාන පාර්ශවකරුවන් සහ පොදු ජනතාව අතර පර්යේෂණ ප්‍රතිඵල ප්‍රචලිත කිරීම ඔස්සේ අනාගතයේ දී සිය කාර්යසාධනය තවදුරටත් ඉහළ නංවාගැනීම සඳහා ජාතික විද්‍යා පදනම අපේක්ෂාවෙන් පසුවේ.

කාර්යයන් සඳහා අනුගතවීම සහ ඒවායේ සුමට ක්‍රියාකාරිත්වය සඳහා දැනට පවතින යෝජනා ක්‍රම සහ වැඩසටහන් අඛණ්ඩව සමාලෝචනය කිරීම පෙර වර්ෂවලදී සිදුකළ පරිදිම සිදුකරනු ඇත.

බොහෝ කාර්යයන් සිදුකරගෙන යාමේදී සමස්ත ක්‍රියාවලිය පුරා අගනා මඟ පෙන්වීමක් ලබාදීම සම්බන්ධයෙන් ජාතික විද්‍යා පදනමේ සභාපති සහ කළමනාකරණ මණ්ඩලය වෙත මාගේ අවංක ස්තුතිය පිරිනමමි. සීමිත සම්පත් ප්‍රමාණයක් මධ්‍යයයේ වුව ද, කාර්යක්ෂම අයුරින් සිය උපරිම හැකියාව යොදවමින් තමා වෙත පැවරූ කාර්යයන් සඳහා කැපවීමෙන් සහ දිරිමත්ව කටයුතු කළ ආයතනයේ ඉහළතම ශක්තිය වශයෙන් සැලකෙන ජාතික විද්‍යා පදනමේ කාර්ය මණ්ඩල කණ්ඩායමට මම බෙහෙවින් කෘතඥ වෙමි.

ආචාර්ය සේපාලිකා සුදසිංහ
ප්‍රධාන විධායක නිලධාරී/අධ්‍යක්ෂ ජනරාල්

ප්‍රධාන කාර්ය සාධන දර්ශක සමඟ ක්‍රියාකාරී සැලැස්ම - 2023

අරමුණ අභිකාංකය

මිනිසාගේ අගුරාස්ථ - 2023

මිනුම්කය කෙරෙහින, මිලැයිමේ අවශ්‍යතා, ප්‍රතිචාරයේ සහ සංවේදීතාවය

ප්‍රතිචාරය සහ සංවේදීතාවය ඉහළ

අපේක්ෂාකෘත ප්‍රතිඵල සංඛ්‍යාවක්	ජාතික විද්‍යා පදනම මඟින්	අභිප්‍රේරක ක්‍රියාකාරකම් අරමුණු	වැඩසටහන - ප්‍රතිදායක ව්‍යාපෘති	ප්‍රතිපාදනය (රු.මිලියන)	මිලියන (රු.මිලියන)				ප්‍රතිඵල				ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPI)	අපේක්ෂිත ඵලදායිතා
					1 වැනි කාර්තුව	2 වැනි කාර්තුව	3 වැනි කාර්තුව	4 වැනි කාර්තුව	1 වැනි කාර්තුව	2 වැනි කාර්තුව	3 වැනි කාර්තුව	4 වැනි කාර්තුව		
ආයතනික ප්‍රතිඵල සංඛ්‍යාවක් තාවකාලික ප්‍රතිඵල සඳහා ඉලක්ක ඉදිරිපත් කිරීම සඳහා ප්‍රතිඵල කාලරාමුවක් තීරණය

අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන්	අමාත්‍යාංශයේ අරමුණු	නිරීක්ෂක ආයතන අභිමතාර්ථවල අරමුණු සහ ඉලක්කගතව අදාළත්වය	වැඩසටහන - ප්‍රත්‍යක්ෂණ ව්‍යාපෘති	ප්‍රතිපාදනය (රු.මිලියන)	ඉලක්කය								ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPI)	අපේක්ෂිත ඵලාපල	අපේක්ෂිත ප්‍රතිඵලය
					මුදල (රු.මිලියන)				සමුච්චිත භෞතික ඉලක්ක (වර්ගමෙටර්)						
					1 වැනි කාර්තුව	2 වැනි කාර්තුව	3 වැනි කාර්තුව	4 වැනි කාර්තුව	1වැනි කාර්තුව	2වැනි කාර්තුව	3වැනි කාර්තුව	4වැනි කාර්තුව			
	ජාතික විද්‍යා පදනම් වෙත පැවරී ඇති බලය දෑ) විද්‍යා හා තාක්ෂණික මානව සම්පත් වර්ධනය කිරීම														
	විද්‍යාත්මක පර්යේෂණ ප්‍රකාශයට පත්කිරීම	i. ජාතික විද්‍යා පදනමේ සහාය ප්‍රකාශයට පත් කිරීම (JNSF)		2.676	0.639	0.699	0.639	0.699	වෙමහ 5I1 කලාපය 1 ප්‍රකාශයට පත්කිරීම	වෙමහ 5I1 කලාපය 2 ප්‍රකාශයට පත්කිරීම	වෙමහ 5I1 කලාපය 3 ප්‍රකාශයට පත්කිරීම	වෙමහ 5I1 කලාපය 4 ප්‍රකාශයට පත්කිරීම	ජාතික විද්‍යා පදනමේ සහාරාවල පළකරනු ලබන වාර්තා සංඛ්‍යාව 40ක් තිත් ඉහළ යෑම (BP= 60) 2022 වර්ෂයට සාපේක්ෂව විද්‍යා සහ තාක්ෂණ තොරතුරු ලබාගැනීම් සඳහා භාවිතයේ 5%කින් ඉහළ යෑම 2022 වර්ෂයට සාපේක්ෂව විද්‍යා සහ තාක්ෂණ තොරතුරු භාවිතය 5%කින් ඉහළ යෑම	ජාතික විද්‍යා පදනමේ සහාරාවලට අදාළව ප්‍රකාශයට පත්කර ඇති කලාප ලබන වාර්තා සංඛ්‍යාව	ලේඛීය සහ ගෝලීය වශයෙන් සිටින විද්‍යාත්මික ප්‍රජාව සඳහා ලේඛීය සහ විශ්වීය පර්යේෂණ ආයිත්ත ප්‍රසාරණය කිරීම.
		ii. ශ්‍රී ලංකා සමාජ විද්‍යා සහරාව ප්‍රකාශයට පත් කිරීම (SLJSS).								වෙමහ 4I1 කලාපය 01 ප්‍රකාශයට පත්කිරීම		වෙමහ 4I1 කලාපය 02 ප්‍රකාශයට පත්කිරීම		සමාජ විද්‍යාව පිළිබඳ ශ්‍රී ලංකා සහරාවල් ප්‍රකාශයට පත්කළ කලාප සංඛ්‍යාව - 02 ප්‍රකාශයට පත්කළ ලිපි සංඛ්‍යාව - 20	ඒක ප්‍රකාශනයක් සඳහා සහාය ලබාදීම් ඇත.	සමාජ විද්‍යාව පිළිබඳ Clarivate Analytics ඒකාබද්ධ ශ්‍රී ලංකා සමාජ විද්‍යාව සහරාවට ප්‍රසිද්ධකිරීම
		iii. විද්‍යා හා තාක්ෂණික කටයුතුවලට සම්බන්ධ ජාත් වෘත්තීය ආයතනයකට (විද්‍යාත්මධ්‍යන සංගමය - SLASS) වසි වගාමික සැසිවාර ප්‍රකාශයට පත් කිරීම සඳහා සහාය ලබාදීම.		0.5				0.5				ඒක ප්‍රකාශනයක් සඳහා සහාය ලබාදීම් ඇත.			
		iv) සමදෙස්ථ කණ්ඩායම් විසින් සම්පාලෝචනය කරනු ලබන සහරා (SLJOL) සඳහා මෘදුගත වේදිකාවක් සැපයීම		4.000	1.8	1.950	0.125	0.125	සෑම කර්තෘවරයම අදාළව සහන කටයුතු සිදුකරනු ලැබේ: 1. පර්යේෂණ ආස්ථිරවත් 35%ක් ප්‍රකාශයට පත්කිරීම. 2. ලිපි 35%ක් සඳහා hyperlinked CC බලපත්‍ර, DOIs සහ ORCID IDs එකතු කිරීම. 3. වෙබ්/වීවර්ජ් පණිවිඩ 4%ක් සකස් කිරීම. 4. ප්‍රකාශන ශ්‍රමිකීන් සමඟ අනුකූලවන වෙබ් යාවත්කාලීන කිරීම් 25ක් සිදුකිරීම. 5. සමදෙස්ථ කණ්ඩායම් විසින් සම්පාලෝචනය කරනු ලබන සහරාවල සංස්කාරකවරුන් සඳහා පවත්වන ගැටලු විසඳීම් සැසි 2ක් සහ ආදර්ශන සැසි 05ක් සඳහා සහභාගීවීම්. 6. සමදෙස්ථ කණ්ඩායම් විසින් සම්පාලෝචනය කරනු ලබන සහරා කාණ්ඩයට නව සහරා 01 හෝ 02ක් එකතු කිරීම්.					සමාජ විද්‍යාව පිළිබඳ ශ්‍රී ලංකා සහරාවල් ප්‍රකාශයට පත්කළ ලිපි සංඛ්‍යාව, අන්තර්ජාලයට එකතු කරන ලද සහරා කලාප සංඛ්‍යාව, ඩිජියුඩිජිටි කළ DOI සංඛ්‍යාව	ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් වාපත්ත කළ විද්‍යා සහ තාක්ෂණ තොරතුරු
	විද්‍යා හා තාක්ෂණ දත්ත සමුදායන් හෙළ ප්‍රවේශය ලබාදීම	ජාතික වීඩිටල්කරණ වාහපෘතිය සහ අනෙකුත් දත්ත සමුදායන්/වේදිකා සහ වීඩිටල් සුරක්ෂිතාගාර ක්‍රියාත්මක කිරීම							විදේශීය දත්ත සමුදායන් සහ සම්පාදක කණ්ඩායම් විසින් සම්පාලෝචනය කරනු ලබන සහරා සඳහා දායකත්ව ගෙවීම් සිදුකිරීම	ලේඛීය ප්‍රකාශන සඳහා ගෙවීම් සිදුකිරීම				විද්‍යා සහ තාක්ෂණ තොරතුරු වීඩිටල්කරණය සඳහා ආයෝජන කළ/ නිමිකළ වාහපෘති සංඛ්‍යාව සහ ආශ්‍රිතත්ව කරන ලද විද්‍යා සහ තාක්ෂණ තොරතුරු ආශ්‍රිතත් සම්පූර්ණ ලිපි/ වාර්තා සංඛ්‍යාව ජනතය වූ ආදායම් (රු.මිලියන) දත්ත සමුදාය තුළ යාවත්කාලීන කළ විද්‍යා සහ තාක්ෂණ වාර්තා සංඛ්‍යාව ජාතික විද්‍යා පදනමේ පුස්තකාලයේ KOHA මෘදුකාංගය පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීම.	
									ජාතික විද්‍යා පුස්තකාල සහ සම්පත් මධ්‍යස්ථානයේ (NSLRC) KOHA වාහපාතිය ආරම්භ කර එහි කටයුතු නිමා කිරීම						
					ජනාධිපති ලේකම් කාර්යාලයේ වීඩිටල් පුස්තකාල වාහපාතිය ආරම්භ කර එහි කටයුතු නිමා කිරීම			–	–		
					මාරිස්ටෙලා වීදුරුවේ KOHA වාහපාතිය ආරම්භ කිරීම						
		වීඩිටල් වේදිකා වැඩිදියුණු කිරීම්		0.9 (විද්‍යා සහ තාක්ෂණ කළමනාකරණ තොරතුරු පද්ධතිය - STMIS සඳහා)		0.200		0.700	පර්යේෂණ සහ පරීක්ෂණ කටයුතු සඳහා අවශ්‍ය ඉහළ මෙටමේ විශ්ලේෂණාත්මක උපකරණ පිළිබඳ තොරතුරු ආතුළත් ජාතික උපකරණ දත්ත සමුදාය (NID) ප්‍රවර්ධනය කිරීම හා වැඩිදියුණු කිරීම, ආදර්ශන සැසි සංවිධානය කිරීම, තාක්ෂණ කටයුතු සම්බන්ධිත කාර්ය භේදවාදය සඳහා මෙවියුලයක් එකතු කිරීම, විද්‍යා සහ තාක්ෂණ කළමනාකරණ තොරතුරු පද්ධතිය (STMIS) ප්‍රවර්ධනය හා වැඩිදියුණු කිරීම, විද්‍යා සහ තාක්ෂණ කළමනාකරණ තොරතුරු පද්ධතිය සඳහා දත්ත සමුදායේ භේදා ගැනීම සම්බන්ධිත ප්‍රතිපත්තියක් හඳුන්වාදීම. විදේශගත ශ්‍රී ලාංකික වෘත්තිකයාවදින් සඳහා වන ගෝලීය වීඩිටල් දේදිකාව (GDP) ප්‍රවර්ධනය හා වැඩිදියුණු කිරීම.	NID, STMIS සහ GDP ප්‍රවර්ධනය කිරීම	NID, STMIS සහ GDP ප්‍රවර්ධනය කිරීම හා වැඩිදියුණු කිරීම NID සම්බන්ධයෙන් වාර්ෂික සම්මාලෝචනයක් සිදුකිරීම		ලියාපදිංචි ආයතන සංඛ්‍යාව 80 දක්වා ඉහළ නැංවීම, උපකරණ සම්බන්ධිත වාර්තා සංඛ්‍යාව 1,500 දක්වා ඉහළ නැංවීම, නිශ්පාදන කාණ්ඩ සංඛ්‍යාව 250 දක්වා ඉහළ නැංවීම වීඩිටල්දිඩි කැනැත්තන් සංඛ්‍යාව/ නව ලියාපදිංචිවීම් සිද්ධින් සම්බන්ධිත කොරතුරු මෙට හැරීම/ වාපත්ත කිරීම් සංඛ්‍යාව දත්ත ලබාදීම්.	පර්යේෂණ සහ පරීක්ෂණ කටයුතු සඳහා අවශ්‍ය ඉහළ මෙටමේ විශ්ලේෂණාත්මක උපකරණ පිළිබඳ තොරතුරු ආතුළත් ජාතික උපකරණ දත්ත සමුදායේ (NID) යාවත්කාලීන තොරතුරු ලබා පාර්ශවකරුවන් වෙත ලබාගැනීමට පැහැසිම, පරිශීලකයන් 750 ශ්‍රී ලංකාවේ විද්‍යාත්මක ප්‍රජාව අතර ඉහළ මෙටමෙට පැමිණි ස්ලගතවීම.
	ජාතික විද්‍යා පදනම් වෙත පැවරී ඇති බලය දෑ) විද්‍යා සහ තාක්ෂණය ආශ්‍රිත ධාරිතා වෙබඩනැංවීම														
	නැති වන ක්ෂේත්‍ර ආශ්‍රිතව ධාරිතා සංවර්ධනය කටයුතු ජාතික වශයෙන් ඉහළ මූල්‍යමානයක් ලබාදිය යුතු ගැටලු විසඳීම	විශ්වවිද්‍යාල, පර්යේෂණ සහ සංවර්ධන ආයතනවල අවශ්‍යතා සමඟ විදේශීය ආයතනවලින් ලැබී ඇති අවස්ථා/ යෝජනා ගැළපීම සහ භවුල්කාරිත්වයන්/ පර්යේෂණ සහ සංවර්ධන සහභාගීතා ස්ථාපනය කර ගැනීම.		0.590	0.035	0.235	0.210	0.110	විද්‍යේෂකයන් දෙදෙනෙකු පුහුණු කිරීම	වෙබ්ති එක් අවස්ථාවක් සංවිධාන කර ගැනීම පර්යේෂකයන් හිඳෙනෙකු පුහුණු කිරීම	විද්‍යේෂකයන් සිව්දෙනෙකු පුහුණු කිරීම	වෙබ්ති එක් අවස්ථාවක් සංවිධාන කර ගැනීම පර්යේෂකයන් දෙදෙනෙකු පුහුණු කිරීම	විද්‍යා, තාක්ෂණ සහ නවෝත්පාදන ක්ෂේත්‍රයේ පුහුණු කාර්ය මණ්ඩලයේ සංඛ්‍යාව 15%කින් ඉහළ යෑම (BP =50) ස්ථාපනය කරගනු ලබන ජාත්‍යන්තර සහයෝගිතාවයන් සංඛ්‍යාව 30%කින් ඉහළ යෑම (BP=5)	වීසිටල් වේදිකාවේ ලියාපදිංචි වූ වීදේශ රටවල සේවය කරන විශේෂ ඝණත්ත්වක අගය සාර්ථකවීට පත්වූ සහයෝගිතා සංඛ්‍යාව පුහුණුව ලැබූ පර්යේෂයෙන් සංඛ්‍යාව පුහුණුවේ දී ලබාගත් නව දැනුම ක්‍රියාත්මක කිරීම සඳහා පුහුණුව ලැබූ පර්යේෂකයන් විසින් දරනු ලැබූ නව ප්‍රයත්නයන් ලබාගත් ප්‍රදාතෘන් සංඛ්‍යාව ලබාගත් තෙවේලීන පුහුණු ශිෂණ්ඨ සංඛ්‍යාව ප්‍රතිඵලන ලබාගත් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සංඛ්‍යාව ක්‍රියාත්මක කරන ලද පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම් සංඛ්‍යාව	සුළුදේ පෘතඵක විසිදී ගිය විශ්ණදේ දැනුම සමෙහින් පරිපූර්ණ වූ විදේශ රටවල් ආශ්‍රිත සේවය කරන විසිදේ. ලේඛීය වෙස්වා ශ්‍රේණිස් ප්‍රතිලාභ සිමිවන දිලුණුමට පත්වූ ලේඛීය නවෝත්පාදන පද්ධතිය. ශ්‍රී ලංකාවේ විද්‍යා, තාක්ෂණ සහ නවෝත්පාදන ආශය තුළ ගෝලීය වශයෙන් වූ වැඩිදියුණු මෙටමට පැමිණ ඇති ප්‍රමුඛතාවය. වැඩිදි ඇති ප්‍රතුම මෙදා ගැනීම්. අවමුදල් ලැබීම් හා ධාරිතා සංවර්ධන කටයුතු ආශ්‍රිතව ලබාගත් ප්‍රතිඵල.
	විද්‍යාව, IoT සහ කෘත්‍රිම බුද්ධිය වැනි ඉහළ ඉල්ලුමක් සහිත තාක්ෂණික ක්ෂේත්‍රවල වාත්තීය ප්‍රහුණු සහ කුසලතා සංවර්ධනය සඳහා පහසුකම් සැලසීම	තාක්ෂණික සහ වාත්තීය අධ්‍යාපනය හා ප්‍රහුණු ආයතන සමඟ භවුල්කාරිත්වයෙන් කටයුතු සිදුකිරීම		0.050		0.030	0.020		අදාළ තාක්ෂණික සහ වාත්තීය අධ්‍යාපනය හා ප්‍රහුණු ආයතන සමඟ පළමු ශ්‍රේස්ථිය පාඨමාලාව සහ අධ්‍යයනය තක්සේරු කිරීම	සේවය ලබාගැනීමේ විවෘතභාවයක් සහිත විදේශ රටවල සේවය කරන විසිස් අනාවරණය කරගැනීම සහ එකඟතාවයන් ඇතිකරගැනීම	තාක්ෂණික සහ වාත්තීය අධ්‍යාපනය හා ප්‍රහුණු ආයතන සහ අදාළ විදේශ ශ්‍රාවල සේවය කරන කණ්ඩායම් සමඟ භවුල්කාරිත්වයන් ඇතිකර ගැනීම	දිවඳේකවරු සඳහා ධාරිතා ගොඩනැංවීමේ පළමු වැඩසටහන පැවැත්වීම	නැති වන ක්ෂේත්‍ර සඳහා දැනුමින් යුතුවාදාන් වැඩසටහන් සංඛ්‍යාව	
			පර්යේෂකයන්ගේ අභිගාදීය උදෙසා ශ්‍රාවල් අතර හවිතකම දැනුම් හුවමාරු කරගැනීම සඳහා පහසුකම් සැලසීම						දැනුම් හුවමාරු වැඩසටහනක් පැවැත්වීම	දැනුම් හුවමාරු වැඩසටහනක් පැවැත්වීම	දැනුම් හුවමාරු වැඩසටහනක් පැවැත්වීම	දැනුම් හුවමාරු වැඩසටහනක් පැවැත්වීම		නවීකනම් දැනුම් ලබාගත් පර්යේෂකයන්ගේ සංඛ්‍යාව	
	ජාත්‍යන්තර විද්‍යා සහ තාක්ෂණ තොරතුරු ආයාතන සමඟ ජාලගත කටයුතු ශක්තිමත් කිරීම සහ සුලභ් කිරීම	ICGEB, ISC, GRC, GRA සහ AASSREC වැනි ජාත්‍යන්තර ආයතන සමඟ භවුල්කාරිත්වයෙන් විද්‍යා සහ තාක්ෂණ කටයුතු සිදුකිරීම		1.750		1.500	0.250		–	ICGEB සාමාජිකත්වය සඳහා ආස්තු ගෙවීම් සහයෝගිතා පර්යේෂණ වැසසවහන (CRP) ප්‍රධානේ ශ්‍රී ලාංකික පර්යේෂකයන්ගේ අයදුම්පත් ICGEB වෙත නියමිත කාලසීමාවන් තුළ අනුමත කිරීම	AASSREC සාමාජිකත්වය සඳහා ආස්තු ගෙවීම AASSREC 25 වැනි ද්විවාර්ෂික සම්මේලනය සඳහා ශ්‍රී ලංකාව වෙනුවෙන් වන පළිකාර ඉදිරියත් කිරීම	–	ලබාගත් ප්‍රදාතෘන් සංඛ්‍යාව ලබාගත් තෙවේලීන පුහුණු ශිෂණ්ඨ සංඛ්‍යාව ක්‍රියාත්මක කරන ලද පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම් සංඛ්‍යාව	
			ප්‍රස්තකාල වාත්තිකයන්ගේ ධාරිතා සංවර්ධන කටයුතු						"KOHA" සම්මේලනයෙන් පුහුණු වැඩසටහන් පැවැත්වීම	"JISIS" සම්මේලනයෙන් පුහුණු වැඩසටහන් පැවැත්වීම	"DSpace" සම්මේලනයෙන් පුහුණු වැඩසටහන් පැවැත්වීම		පවත්වනු ලැබූ පුහුණු සැසි/වැඩසටහන් සංඛ්‍යාව	ඉහළ යනු ලැබූ දැනුම් හුවමාරුව සහ ධාරිතා සංවර්ධන කටයුතු

අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යභාර	අමාත්‍යාංශයේ අරමුණු	නිරෝ සංවේදක අමතකතරාරුව අරමුණු සහ ඉලක්කවලට දායකවීම	වර්ධනය - පරීක්ෂණය මාතෘකාව	ප්‍රතිඵලය (රු.මිලියන)	ඉලක්ක								ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPI)	අපේක්ෂිත ප්‍රතිඵල	අපේක්ෂිත ප්‍රතිඵලය
					මූල්‍යය (රු.මිලියන)				ක්‍රමලේඛිත භෞතික ඉලක්ක (වර්ෂයකදෑ)						
					1 වැනි කාර්යපූර්ව	2 වැනි කාර්යපූර්ව	3 වැනි කාර්යපූර්ව	4 වැනි කාර්යපූර්ව	1වැනි කාර්යපූර්ව	2 වැනි කාර්යපූර්ව	3 වැනි කාර්යපූර්ව	4 වැනි කාර්යපූර්ව			
			ජාතික විදුහා පදනම මෙහ තැපෑ අයි බලන ලදි විදුහා සහ තාක්ෂණ ප්‍රතිපත්ති පරීක්ෂණ												
			ප්‍රතිපත්තිමය අධ්‍යයන	ජාතික පරීක්ෂණ සහ සංවර්ධන සම්මේලනය ආ) 2022 වර්ෂය සඳහා වූ පරීක්ෂණ සහ සංවර්ධන සම්මේලනය අවසන් කිරීම ඇ) පරීක්ෂණ සහ සංවර්ධන සම්මේලනයට අදාළ සංවිධානාත්මක අත්සනක ප්‍රකාශයට පත්කිරීම	2.900	0.1	0.500	2.200	0.100	සම්මේලනය සඳහා ප්‍රාරම්භක කටයුතු UIS වෙත දත්ත ඉදිරිපත් කිරීම	2022 වර්ෂය සඳහා වූ පරීක්ෂණ සහ සංවර්ධන සම්මේලනයේ දත්ත රැස්කිරීම	2022 වර්ෂය සඳහා වූ පරීක්ෂණ සහ සංවර්ධන සම්මේලනයේ ප්‍රස්ථ, රාජ්‍ය ආයතන සංවිධාන, වාපාරික ආයතන සහ දැනස් අධ්‍යාපනය යන ආංශවලට අදාළ කටයුතු නිම කිරීම	සංවිධානාත්මක අත්සනක සඳහා ප්‍රාන්ත සහාස් කිරීමේ කටයුතු - 50%	වර්ෂය අවසානය වනවිට 2022 වර්ෂය සඳහා වූ පරීක්ෂණ සහ සංවර්ධන සම්මේලනයේ කටයුතුවලින් 75%ක් නිමකර තිබීම පරීක්ෂණ සහ සංවර්ධන සම්මේලනයට අදාළ සංවිධානාත්මක අත්සනක ප්‍රකාශයට සත්කිරීමේ කටයුතුවලින් 50%ක නිමකර තිබීම. පරීක්ෂණ සහ සංවර්ධන සංවිධානාත්මක අත්සනක හාවිතාකිරීමේ කටයුතු සඳහා මූර්තමය වශ 23%ක් ඉහළ යාම.	2022 වර්ෂය සඳහා වූ පරීක්ෂණ සහ සංවර්ධන සම්මේලනයේ කටයුතුවලින් 75%ක් නිමකර තිබීම පරීක්ෂණ සහ සංවර්ධන සම්මේලනයට අදාළ සංවිධානාත්මක අත්සනක ප්‍රකාශයට සත්කිරීමේ කටයුතුවලින් 50%ක නිමකර තිබීම. පරීක්ෂණ සහ සංවර්ධන සංවිධානාත්මක අත්සනක හාවිතාකිරීමේ කටයුතු සඳහා මූර්තමය වශ 23%ක් ඉහළ යාම.	ජාතික්‍රත්ව මණ්ඩලයේ අනුමැතිය ඔත පරීක්ෂණ සහ සංවර්ධන සංවිධානාත්මක ශ්‍රී ලාංකික සහ ගෝලීය ප්‍රවාහ පෙන ලක්ගැනෙ තැබීම
				දැනට ශ්‍රීධාත්මක ගෙවෙ තාක්ෂණ ප්‍රතිපත්තියේ අඩුපාඩු සම්මේලනයෙන් අදහස්/ ප්‍රතිපෝෂණ ලබාගැනීම සඳහා පාර්ශවකරුවන්ගේ රැස්වීම ප්‍රතිපත්තිය සම්මේලනය කිරීමට අදාළ පාර්ශවකරුවන්ගේ රැස්වීමෙන් ලබාගත් අදහස් සම්මේලනයෙන් වූ කෙටුම්පත ලබාගැනෙ	0.900	0.125	0.225	0425	0.125	දැනට ශ්‍රීධාත්මක ගෙවෙ තාක්ෂණ ප්‍රතිපත්තිය සම්මේලනයෙන් අඩුපාඩු/ ගාවත්තාවලින්න කිරීම් වැඩිදියු කිරීම්/අ සහස් කිරීම ජාතික විදුහා සභ තාක්ෂණික කොමිෂන් සභාවේ දැනුවත් කිරීමේ වැඩසටහන් සියල්ල තබ, ඒ සඳහා වැය කිරීම්වලින් ඉදිරිපත් කිරීම			කිරීවලින සමග වාර්තාව/අලේඛනය	දැනට ශ්‍රීධාත්මක ගෙවෙ තාක්ෂණ ප්‍රතිපත්තිය සංශෝධනය හා යාවත්කාලීන කිරීම සඳහා ජාතික විදුහා සභ තාක්ෂණික කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ නිර්දේශ පැබැම්ම ජාතික විදුහා පදනමේ කළමනාකාරීත්වය සඳහා සංක්ෂිප්ත වාර්තාවක් පැබැම්ම
				තිවුවැනි කාර්තුව විද්‍යුලයට අදාළ උපයෝගීතාවන් පිළිබඳව ශ්‍රී ලංකාවෙ සංදේහය තුළ දැනුත්වීම හා හාවිතය ඉහළ නැංවීම					'4 වැනි කාර්තුව විද්‍යුලයේ තාක්ෂණික ප්‍රගතිපත්තියේ අනුමතිය' බලයෙන් කංවේදීකරණ වැඩසටහන් ආරම්භ කිරීම සඳහා කටයුතු ආරම්භ කිරීම	පුළුහාවන් සඳහා ධන සමබන්ධ විධිවාන් අයදුම්පත්වලට ශ්‍රී ලංකාවෙ සංදේහය සංවර්ධනය/ තාක්ෂණික ප්‍රගති ගෙවීකා තුළ සඳහා මාර්ගගතකරණය සෘජු කිරීම පිණිස අදාළ ප්‍රතිපාදනීමේ ඒ්‍යාපෘතියක් ස්වීම/ ස්වීම	'4 වැනි කාර්තුව විද්‍යුලයේ තාක්ෂණික ප්‍රගතිපත්තියේ අනුමතිය' බලයෙන් සංදේහය සංවර්ධනය වැඩසටහන් ආරම්භ කිරීම සඳහා ප්‍රාප්තිවීම	'4 වැනි කාර්තුව විද්‍යුලයේ තාක්ෂණික ප්‍රගතිපත්තියේ අනුමතිය' බලයෙන් සංදේහය සංවර්ධනය වැඩසටහන් ආරම්භ කිරීම සඳහා කටයුතු ආරම්භ කිරීම	'4 වැනි කාර්තුව විද්‍යුලයේ තාක්ෂණික ප්‍රගතිපත්තියේ අනුමතිය' බලයෙන් සංදේහය සංවර්ධනය වැඩසටහන් ආරම්භ කිරීම සඳහා කටයුතු අවසන් කිරීම	4 වැනි කාර්තුව විද්‍යුලයේ තාක්ෂණික ප්‍රගතිපත්තියේ අනුමතිය' බලයෙන් සංදේහය සංවර්ධනය වැඩසටහන් ආරම්භ කිරීම සඳහා කටයුතු අවසන් කිරීම	4 වැනි කාර්තුව විද්‍යුලයේ තාක්ෂණික ප්‍රගතිපත්තියේ අනුමතිය' බලයෙන් සංදේහය සංවර්ධනය වැඩසටහන් ආරම්භ කිරීම සඳහා කටයුතු අවසන් කිරීම	4 වැනි කාර්තුව විද්‍යුලයේ තාක්ෂණික ප්‍රගතිපත්තියේ අනුමතිය' බලයෙන් සංදේහය සංවර්ධනය වැඩසටහන් ආරම්භ කිරීම සඳහා කටයුතු අවසන් කිරීම
				අතොතුත් අදාළ ප්‍රතිපත්තිමය අධ්‍යයන/ සම්මේලන ප්‍රතිපත්ති සංවාදයන් සිදුකිරීම/ සහස් කිරීම					මානසතා හඳුනාගැනීම සඳහා කුඩා පාදුලක්වීම. ප්‍රතිපත්ති සාංවාදයන්ගේ අත්තප්පාය සහසකිරීමේ ගෙදරුම් ලබාගැනීම සඳහා විශේෂඥයන් සමග හලුවීම.	ප්‍රතිපත්තිමය සාංවාදයන්ගේ අදහස් සාදුගුම්වලදී සහ සාකච්ඡුම්	අධ්‍යයනයක්/ අධ්‍යයන සිදුකිරීම	ප්‍රකාශනය ප්‍රකාශයට සිදුකිරීම		ප්‍රතිපත්ති සාසඹිජය ථිරත්වයක්	අදාළ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ අවශ්‍යතාවලට ප්‍රතිපත්තිමය නිර්දේශ ලබාගත හැකිවීම
			ජාතික විදුහා පදනම මෙහ තැපෑ අයි බලන ලදි විදුහාවේ ශ්‍රවණීය කිරීම												
			පුස්ථ විදුහා ශාඛා වැඩිදියුණු කිරීම	- සහාපති - විශ්වවිද්‍යාල - විදුහා ඛෙටඝ්ඨාන/ ගොවි සංවිධාන සහ අනෙකුත් ප්‍රජා කණ්ඩායම් හා සාකච්ඡා පැවැත්වීම් විදුහා සංගම් ජාලය පත්තිරමෙහ යෑම/ වැඩිදියුණු කිරීම් සහ ස්ථාපිත කිරීම්					විදුහා සංගම් පවත්වාගෙන යෑම, වැඩිදියුණු කිරීම සහ ස්ථාපිත කිරීම	විදුහා සංගම් පවත්වාගෙන යෑම, වැඩිදියුණු කිරීම සහ ස්ථාපිත කිරීම	විදුහා සංගම් පවත්වාගෙන යෑම, වැඩිදියුණු කිරීම සහ ස්ථාපිත කිරීම	විදුහා සංගම් පවත්වාගෙන යෑම, වැඩිදියුණු කිරීම සහ ස්ථාපිත කිරීම	සීදුරාව සහරාවේ පාඨක ප්‍රජාව 5%කින් වැඩිකිරීම (BP 2500) විදුහා ප්‍රස්ථිය කිරීම ශ්‍රීධාත්මකභාවේ සඳහා සිසුන්ගේ සිංහල 10%කින් වැඩිකිරීම (BP=3000) හඳුනාගනු ලබන ග්‍රන්ථාගතවල නාම්ක්‍රාවේ සහ විහාරාධිපති (සහ වැඩසටහන්)	ලියාපදිංචි කිරීමේ කටයුතුවලට 10%ක ඉහළ යාමක් (BP=1,165)	විදුහාව ප්‍රස්ථිය කිරීමට සහ විදුහා හා තාක්ෂණ ශ්‍රීධාත්මකභාවය ප්‍රජාවේ සිංහලීම වැඩිදියුණු කිරීම සඳහා ප්‍රස්තාව විවිධ ආකාරයන් මෙහ ලගාවීම
			විදුහා අධ්‍යාපනය ප්‍රගතිධානය කිරීම උදෙසා අන්තර්ගතය නිර්මාණය කිරීම සඳහා ගුරු පුහුණුව පැවැත්වීම	විදුහා අධ්‍යාපනය සඳහා සංවිධානය සහ විදුහාව ප්‍රස්ථිය කිරීම සඳහා තරග පැවැත්වීම	2.500	05	0.500	1.000	0.500	2022/23 වර්ෂයේ තරගාවලි පැවැත්වීම පීඨාධිපති සහ II. 2023 වර්ෂයේ විදුහා පරීක්ෂණ පාසලෙහි තරගය (SRPC) හා විදුහා සංගම් තරගය (SSC) සඳහා ඇයදුම්පත් කැඳවීම් සහ කුඩා ළමුන් ස්වභාවධර්මය සමග අනුභූත කිරීමේ වැඩසටහන (KNP)	2023 වර්ෂය සඳහා SRPCහි වාසගාලි ගැන්වීම් ආයෝජිත ආයතනය SSC ආයතිත කටයුතු. කුඩා ළමුන් ස්වභාවධර්මය සමග අනුභූත කිරීමේ වැඩසටහන සඳහා ආයෝජිතයන් කැඳවීම්	2023 වර්ෂය සඳහා SRPCහි කටයුතු ආරම්භ කිරීම. විදුහා ගංගා කරයෙන් ඇගයීම් කටයුතු සහ (n=3) සහ කුඩා ළමුන් ස්වභාවධර්මය සමග අනුභූත කිරීමේ වැඩසටහන සඳහා ලැබී ඇති අයදුම්පත් පරීක්ෂා කිරීමේ කටයුතු	මූලාම්‍ය සම්මේලනය සහ SRPCහි පීඨාධිපති I සහ II සඳහා සරන පැවැත්වීම	සිසුන්ගේ සහභාගීත්වය 20%කින් වැඩිකිරීම	
			විදුහාව ප්‍රස්ථිය කිරීම ගණ්ඩේ පුද්ගලයන්ගේ ප්‍රවර්ධනී විදුහා සහ්ත්‍රතොරය සහ සමාජ-ආර්ථික මානා පැවැත්ම වැඩිදියුණු කිරීම	සිසුන සහ විසිටර් මාධ්‍ය සඳහා විදුහා සහභාගීවීම සහ ප්‍රස්ථිය කිරීමේ කටයුතු	0.500	0	0.250	0.250	0.000	"පිදුරස" සහරාවේ 4 වැනි කලාපය ප්‍රකාශයට පත් කිරීම (2023)	"පිදුරස" සහරාවේ 1 වැනි කලාපය ප්‍රකාශයට පත් කිරීම	"පිදුරස" සහරාවේ 2 වැනි කලාපය ප්‍රකාශයට පත් කිරීම	"පිදුරස" සහරාවේ 3 වැනි කලාපය ප්‍රකාශයට පත් කිරීම ප්‍රකාශන කටයුතු ගෙදුරෙන් පූදානයක් පිරිනැමීම		ප්‍රජා විදුහා අධ්‍යාපනය සඳහා "පිදුරස" ප්‍රකාශයට පත්කිරීම	විදුහාත්මක සාක්ෂරතාවය සහිත සමාජයක් නිර්මාණය කිරීම
					2.85	0.55	0.875	0.875	0.55	වරණ රැසවාණිනී නාම්කාය ගත්තේ රැසවාණිනී විදුහා සඟරා පැසසුවෙන් 04ක් සහභාගී වීමත් 02ක් විමසුවා තැබීම. දුනුවු ආකාරයේ විදුහා පණිවිඩ සඳහා විධියේ ඡදීම් 02ක් නිශ්චාදනය කිරීම. ලිපි 02ක් ප්‍රකාශයට පත්කිරීමේ.	වරණ රැසවාණිනී නාම්කාය ගත්තේ රැසවාණිනී විදුහා සඟරා පැසසුවෙන් 04ක් සහභාගී වීමත් 02ක් විමසුවා තැබීම. දුනුවු ආකාරයේ විදුහා පණිවිඩ සඳහා විධියේ ඡදීම් 03ක් නිශ්චාදනය කිරීම. ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව සමග ප්‍රසාරණී වැඩසටහනක් සංවිධානය කිරීම. ලිපි 02ක් ප්‍රකාශයට පත්කිරීමේ.	වරණ රැසවාණිනී නාම්කාය ගත්තේ රැසවාණිනී විදුහා සඟරා පැසසුවෙන් 04ක් සහභාගී වීමත් 02ක් විමසුවා තැබීම. දුනුවු ආකාරයේ විදුහා පණිවිඩ සඳහා විධියේ ඡදීම් 03ක් නිශ්චාදනය කිරීම. ලිපි 02ක් ප්‍රකාශයට පත්කිරීමේ.	වරණ රැසවාණිනී නාම්කාය ගත්තේ රැසවාණිනී විදුහා සඟරා පැසසුවෙන් 04ක් සහභාගී වීමත් 02ක් විමසුවා තැබීම. දුනුවු ආකාරයේ විදුහා පණිවිඩ සඳහා විධියේ ඡදීම් 03ක් නිශ්චාදනය කිරීම. ලිපි 02ක් ප්‍රකාශයට පත්කිරීමේ.	කාලීන වගයෙන් වැදගත් මාතෘකා සම්බන්ධයෙන් ශ්‍රී විදුහාවෙහෙන්	නැගී එන ගෙදරිය සහ ජාතික ගැටලුවල විදුහාත්මක සම්බන්ධයෙන් පොදු ජනතාවගේ දැනුවත්භාව සහ ලද්ධිය වගයන් නිර්මාණය කිරීම සඳහා ශ්‍රී විදුහාත්මක ලිපි ආදියේ සංවාදාත්මක වගයෙන් ඉදිරිපත් කිරීම.

අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන්	අමාත්‍යාංශයේ අරමුණු	නිර්දේශ සංවර්ධන අභිමතාර්ථවල අරමුණු සහ ඉලක්කවලට අදාළත්වය	වැඩසටහන - ප්‍රජාදේශෙ ව්‍යාපෘති		ප්‍රතිපාදනය (රු.මිලියන)	ඉලක්කය								ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPI)	අපේක්ෂිත ඵලදායිතාව	අපේක්ෂිත ප්‍රතිඵලය
						මූල්‍ය (රු.මිලියන)				සමුච්චිත භෞතික ඉලක්ක (වර්ෂයෙන්)						
						1වැනි කාර්තුව	2 වැනි කාර්තුව	3 වැනි කාර්තුව	4 වැනි කාර්තුව	1වැනි කාර්තුව	2 වැනි කාර්තුව	3 වැනි කාර්තුව	4 වැනි කාර්තුව			
				ලෝක විද්‍යා දිනය සැමරීම සහ විද්‍යාව ප්‍රචලිත කිරීම සඳහා ජාතික විද්‍යා පදනමේ සම්මාන ප්‍රදාන උත්සවය	2.000		1.500	0.250	0.250	පූර්ව සංවිධාන කටයුතු	විද්‍යාව ප්‍රචලිත කිරීම සඳහා සම්මාන උත්සවය	ලෝක විද්‍යා දිනය සැමරීමේ පූර්ව සංවිධාන කටයුතු	ලෝක විද්‍යා දිනය සැමරීම		1. විද්‍යාව ප්‍රචලිත කිරීම සඳහා ජාතික විද්‍යා පදනමේ සම්මාන ප්‍රදාන උත්සවය 2. ලෝක විද්‍යා දිනය	සිසුන් සඳහා පිළිගැනීමක් ලබාදීම සහ ඔවුන් දිරිමත් කිරීම
				විද්‍යාව ප්‍රචලිත කිරීම සඳහා ප්‍රජාවට සමීප වැඩසටහන්, STEAM (විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු විද්‍යාව, කලා සහ ගණිතය) අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමේවැඩසටහන්, විද්‍යාත්මක නොගැලපෙන් ව්‍යාජත්ව කිරීම (SID) සහ ජාතික විද්‍යා පදනමේ සේවා සඳහා වැඩසටහන් පැවැත්වීම	4.034	1	1.500	1.000	0.534	ප්‍රජාවේ විවිධ ස්තර සඳහා විද්‍යාව ප්‍රචලිත කිරීම සඳහා ප්‍රජාවට සමීප වැඩසටහන් එකක් (01) දිස්ත්‍රික්ක 10ක STEAM (විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු විද්‍යාව, කලා සහ ගණිතය) අධ්‍යාපනය ප්‍රවර්ධනය සඳහා සංවාර 10ක් සිදුකිරීම	ප්‍රජාවේ විවිධ ස්තර සඳහා විද්‍යාව ප්‍රචලිත කිරීම සඳහා ප්‍රජාවට සමීප වැඩසටහන් එකක් (01) දිස්ත්‍රික්ක 15ක STEAM (විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු විද්‍යාව, කලා සහ ගණිතය) අධ්‍යාපනය ප්‍රවර්ධනය සඳහා සංවාර 15ක් සිදුකිරීම	ප්‍රජාවේ විවිධ ස්තර සඳහා විද්‍යාව ප්‍රචලිත කිරීම සඳහා ප්‍රජාවට සමීප වැඩසටහනක් STEAM (විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු විද්‍යාව, කලා සහ ගණිතය) අධ්‍යාපනය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රගතිය අධීක්ෂණය කිරීම (1 වැනි සහ 2 වැනි කාර්තුවේ දී)	ප්‍රජාවේ විවිධ ස්තර සඳහා විද්‍යාව ප්‍රචලිත කිරීම සඳහා ප්‍රජාවට සමීප වැඩසටහනක් STEAM (විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු විද්‍යාව, කලා සහ ගණිතය) වැඩසටහනේ ප්‍රගතිය/ කාර්යයන් මත පදනම්ව එම වැඩසටහන ක්‍රියාත්මක කිරීම ප්‍රගතිය අධීක්ෂණය කිරීම		ප්‍රජාවේ ඉහළ ප්‍රජාව 100 (BP=0)	ප්‍රජාවේ යහ පැවැත්ම වැඩිදියුණු වීම
					0.350	0.1	0.1	0.1	0.050	විද්‍යාත්මක නොගැලපෙන් ව්‍යාජත්ව කිරීම (SID) තුනක්	විද්‍යාත්මක නොගැලපෙන් ව්‍යාජත්ව කිරීම (SID) තුනක්	විද්‍යාත්මක නොගැලපෙන් ව්‍යාජත්ව කිරීම (SID) තුනක්	විද්‍යාත්මක නොගැලපෙන් ව්‍යාජත්ව කිරීම (SID) තුනක්		විද්‍යාත්මක සහ ප්‍රායෝගික නිගැලපී සම්මේලනයෙන් දුනුවන්ගාරය ඉහලැයිම 10ක් සිහි වැඩිසිටීම	
		STEM (විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු විද්‍යාව සහ ගණිතය) අධ්‍යාපනය සඳහා පහසුකම් සැලසීම සහ ප්‍රවර්ධනය	සාමාන්‍ය පෙළ විද්‍යාව විෂය සඳහා අඩු සාමාර්ථයක් සහිත තෝරාගත් පාසැල් 9ක් සඳහා විශේෂ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම		1.000	0.25	0.250	0.250	0.250	පුහුණු වැඩසටහන් - 03	නියමු අධ්‍යයනයක් ආරම්භ කිරීම	ප්‍රගතිය අධීක්ෂණය කිරීම සහ වැඩසටහන අවශ්‍යවිට වර්ධනාගෙන යෑම	ප්‍රගතිය අධීක්ෂණය කිරීම සහ වැඩසටහන අවශ්‍යවිට වර්ධනාගෙන යෑම		පාසැල්වල වැඩිදියුණු වූ පහසුකම් (BP=1)	විද්‍යාව ආශ්‍රිත අධ්‍යයන ක්ෂේත්‍ර සිස්සේ ඉදිරියට යෑම සඳහා සිසුන් වැඩිදියුණු කිරීම
			ගුරුවරුන් සහ සිසුන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම		1.000	0.5		0.5		ගුරුවරුන් සඳහා පුහුණු වැඩසටහනක් පැවැත්වීම	වැඩසටහන්වල පූර්ව සහ පශ්චාත් ක්‍රියාකාරකම්	ගුරුවරුන් සඳහා පුහුණු වැඩසටහනක් පැවැත්වීම	වැඩසටහන්වල පූර්ව සහ පශ්චාත් ක්‍රියාකාරකම්		පුහුණුව ලැබූ ගුරුවරු 500 (BP 250)	ගුරුවරුන්ගේ දැනුම ඉහළ නැංවීම
			SEPP සහ OSEP ප්‍රදාන යෝජනා ක්‍රම		0.500	0.250	0.000	0.250	0.000	පාසැල් 04ක් සඳහා පහසුකම් සැලසීම	ප්‍රගතිය අධීක්ෂණය කිරීම	පාසැල් 01ක් සඳහා පහසුකම් සැලසීම	ප්‍රගතිය අධීක්ෂණය කිරීම		පාසැල්වල වැඩිදියුණු වූ විද්‍යාගාර පහසුකම්	STEM (විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු විද්‍යාව සහ ගණිතය) අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම
		ප්‍රාන්ත වක්‍රාකම් අත්පත් කරදැනීම, නවෝත්තු කිරීම හා පද්ධති පරිපාලනය														
		කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම	කාර්යසාධන කුසලතා වැඩිදියුණු කරගැනීම සඳහා පුහුණුවීම් ලබාදීම		2.800	0.500	0.860	1.280	0.160	කාර්ය මණ්ඩලයේ 10 දෙනෙකු සඳහා කෙටිකාලීන පුහුණු වැඩසටහන් (තාක්ෂණික) ලබාදීම මෘදු කුසලතා සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන් 03ක් පැවැත්වීම කාර්යක්ෂමතා කවුළුව සඳහා පුහුණු වැඩසටහන් 02ක් සංවිධානය කිරීම සහ විභාග පැවැත්වීම	කාර්ය මණ්ඩලයේ 02 දෙනෙකු සඳහා පශ්චාත් උපාධි වැඩසටහන් ලබාදීම කාර්ය මණ්ඩලයේ 20 දෙනෙකු සඳහා කෙටිකාලීන පුහුණු වැඩසටහන්ලබාදීම් විධායක නිලධාරීන් 45 දෙනෙකු, විධායක නොවන නිලධාරීන් 45 දෙනෙකු සහ ප්‍රාථමික වෙටමේ කාර්ය මණ්ඩල සාමාජිකයන් 15 දෙනෙකු සඳහා පුහුණුවීම් ලබාදීම	කාර්ය මණ්ඩලයේ 15 දෙනෙකු සඳහා කෙටිකාලීන පුහුණු වැඩසටහන් (තාක්ෂණික) ලබාදීම හා මෘදු කුසලතා සම්බන්ධයෙන් පුහුණුවීම් ලබාදීම (MA - 45, PL - 15) සහේක කාර්ය මණ්ඩලය සඳහා කණ්ඩායම් හැඳීම ගොඩනැංවීම් ක්‍රියාකාරකමක් දියත් කිරීම	කාර්ය මණ්ඩලයේ 10 දෙනෙකු සඳහා කෙටිකාලීන පුහුණු වැඩසටහන් (තාක්ෂණික) ලබාදීම MA සහ PL කණ්ඩායවලට අයිති කාර්ය මණ්ඩලයේ 60 දෙනෙකු සඳහා පැය 100 පුහුණු වැඩසටහන් ලබාදීම	2022 වර්ෂයට සාපේක්ෂව ඉහළ ගොස් ඇති කාර්ය මණ්ඩලයේ සතුෂ්ටි දර්ශකය	පුහුණුව ලැබූ කාර්ය මණ්ඩලයේ සංඛ්‍යාව	වැඩිදියුණු වී ඇති අභිලේඛණය සහ කාර්යසඵල තිමිලුම
		නොගැලපෙ තාක්ෂණ යටිතල පහසුකම් පවත්වාගෙන යෑම	ශ්‍රවණාගාරයේ ඔනුමාධ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීම		2.500	2.5				අන්තර්ජාලය ඔස්සේ සහ හොතික සහභාගීත්වය සහිත ප්‍රවීම් දේශනාවාර පැවැත්වීම සඳහා ශ්‍රවණාගාරයේ ඔනුමාධ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීම	–	–	–	2022 වර්ෂයට සාපේක්ෂව පරිගණක ආශ්‍රිත ගැටලු කාරී අවස්ථා අඩුවීම	අන්තර්ජාලය ඔස්සේ සහ හොතික වශයෙන් ක්‍රියාත්මකවන උපකාරණ සහිත ඔනුමාධ්‍ය පහසුකම්ත් ශ්‍රවණාගාරය තුළ ස්ථාපිතවීම	අන්තර්ජාලය සහ හොතික සහභාගීත්වය සහිත යැවීම්/ උත්සව අවස්ථා පැවැත්වීම සඳහා වැඩිදියුණු කළ පහසුකම්
		එකතුව			70.00	11.549	28.174	21.624	8.653							

කාර්යසාධනයේ සුවිශේෂී කරුණු

භෞතික කාර්යසාධනයේ සුවිශේෂී කරුණු - 2023

• 2023 වර්ෂයේ දී පැවැත්වූ හොඳම වාර්ෂික වාර්තා සහ ගිණුම් සඳහා වන සම්මාන ප්‍රදාන උත්සවයේ දී ජාතික විද්‍යා පදනම විසින් රන් සම්මානය හිමිකර ගන්නා ලදී.

ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ රාජ්‍ය අංශය සඳහා වන ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරිවරුන්ගේ සංගමය (APFASL) විසින් 2023 වර්ෂයේ දී හත්වැනි වරටත් පවත්වන ලද හොඳම වාර්ෂික වාර්තා සඳහා වන සම්මාන ප්‍රදාන උත්සවයේ දී 'පර්යේෂණ ආයතන' කාණ්ඩය යටතේ පිරිනමන රන් සම්මානය ජාතික විද්‍යා පදනම විසින් 2022 වර්ෂය සඳහා වූ එහි වාර්ෂික වාර්තාවට හිමිකර ගන්නා ලදී. මෙම සම්මාන උළෙලේ දී ජාතික විද්‍යා පදනම සම්මානයකින් අඛණ්ඩව ගෞරවයට පාත්‍ර වූ 5 වැනි අවස්ථාව මෙය විය. ජාතික විද්‍යා පදනමේ 2022 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව ඔස්සේ මූල්‍ය සහ භෞතික කාර්යසාධනය සංක්ෂිප්ත ආකාරයෙන් මෙන්ම සවිස්තරාත්මකව සහ ප්‍රස්තාරික ආකෘතියෙන් ඡායාරූපද සහිතව ඇතුළත්ව පූර්ණ වශයෙන් පිළිබිඹු වේ. ව්‍යාකූල ආර්ථිකය සහ අනෙකුත් අභියෝග මධ්‍යයේ වුව ද සියලු පාර්ශවකරුවන්ගේ අඛණ්ඩ මඟ පෙන්වීම යටතේ ජාතික විද්‍යා පදනමේ සේවය සඳහා කැපවූ කාර්ය මණ්ඩලය විසින් සිදුකළ සුවිශේෂී කාර්යය සහ මූල්‍ය ගිණුම්වල ඉතා සුපරීක්ෂාකාරී නිරවද්‍යතාවය මෙම ඉහළ සම්මානය දිනාගැනීම සඳහා විශේෂ කාර්යභාරයක් ඉටු කරන ලදී.

• "හොඳම කාර්යසාධන සම්මානය" ජාතික විද්‍යා පදනම විසින් දිනාගනී.

ශ්‍රී ලංකාවේ විද්‍යා සහ තාක්ෂණ ආයතන අතුරින් "හොඳම කාර්යසාධන සම්මානය", හිමිකර ගැනීම ඔස්සේ ජාතික විද්‍යා පදනම පිළිගැනීමට බඳුන්විය. ජාතික විද්‍යා සහ තාක්ෂණ කොමිෂන් සභාව (NASTEC) විසින් ඇගයීම සිදුකර ලබාදුන් මෙම පිළිගැනීම ශ්‍රී ලංකාවේ විද්‍යා සහ තාක්ෂණ ක්ෂේත්‍ර සවිමත් කිරීම සඳහා ජාතික විද්‍යා පදනමේ ඇති කැපවීම සම්බන්ධයෙන් වූ සාක්ෂියකි. 2023 මාර්තු 23-24 දක්වා 9 වැනි වරටත් පැවති විද්‍යා සහ තාක්ෂණය පිළිබඳ ද්විවාර්ෂික සම්මන්ත්‍රණයේ දී අධ්‍යාපන අමාත්‍ය ගරු ආචාර්ය සුසිල් ප්‍රේමජයන්ත මහතා අතින් මෙම සම්මානය ලබාගන්නා ලදී. මේ සම්බන්ධයෙන් පැවති අභිනන්දන උත්සවයේ දී මෙම සම්මානය ජාතික විද්‍යා පදනමේ සභාපති මහාචාර්ය රංජිත් සේනාරත්න සහ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සේපාලිකා සුදසිංහ විසින් ලබාගන්නා ලදී.

• ලබාදී ඇති ප්‍රදාන දෙකකට අදාළ පර්යේෂණ නිමැවුම් වාණිජකරණ මට්ටමට ළඟා වී ඇත -

  • RG/GAPF/2021/EB/02 - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මහාචාර්ය පත්මලාල් මානගේ මහතා ප්‍රධාන විමර්ශක වශයෙන් කටයුතු කරන ලද මෙම පර්යේෂණ ව්‍යාපෘතියේ දී පානීය ජලයේ පියොස්මින්, 2-මෙතිලිසෝබෝර්නියෝල්, සයනෝටොක්සීන්ස් සහ ප්‍රතිජීවක ඉවත් කිරීම සඳහා ජල ෆිල්ටරයක් සකස් කළ අතර, මෙය වැඩිදුරටත් වැඩිදියුණු මට්ටමට ළඟා වූ අතර ගෘහස්ත ජල ෆිල්ටර වශයෙන් වාණිජකරණය විය. විවිධ ජල ප්‍රභවවල ගන්ධය හා රසය ඇතිකරන සංයෝග, සයනෝටොක්සීන්ස්, පලිබෝධනාශක, බැර ලෝහ සහ ප්‍රතිජීවක ඉවත්කිරීම සඳහා මෙහිදී ප්‍රකාශ උත්ප්‍රේරිත හායනය සහ අවශෝෂණ තාක්ෂණයන් උපයෝගී කරගනී. පර්යේෂණ කණ්ඩායම විසින් සාර්ථක ආකාරයෙන් කාර්මික සැලසුමක් සමඟින් ජල ෆිල්ටරය වැඩිදියුණු කිරීම සිදුකරන ලදී.

  • RG/GAPF/2021/EB/01 දැනට කෙරීගෙන යමින් පවතින පර්යේෂණයකට ලබාදී ඇති ප්‍රදානය - 'ඉහළ අගය එකතු කිරීමක් ආකාරයෙන් ශ්‍රී ලංකාවේ ග්‍රැෆයිට් පවිත්‍රීකරණය' මැයෙන් වූ පර්යේෂණයේදී පවිත්‍රීකරණ ක්‍රමවේද තුනක් ප්‍රතිඵල වී තිබේ. එනම්, භෞතික ක්‍රමවේදය, ආම්ලික ක්‍රමවේදය සහ භාෂ්මික-ආම්ලික ක්‍රමවේදය වේ. 40% කට වඩා අඩු කාබන් සංයුතියක් සහිත ග්‍රැෆයිට්වල කාබන් සංයුතිය 98-99% ක මට්ටමක් කරා පරිවර්තනය කිරීම පිණිස මහා පරිමාණ මට්ටමින් භාවිතා කළ හැකි උපකරණයක් මෙම ව්‍යාපෘතියේ දී වැඩිදියුණු කර තිබේ.

• 2023 වර්ෂය තුළ දී ව්‍යාපෘති හතලිස් නවයක් (49) අධීක්ෂණය කළ අතර ජාතික විද්‍යා පදනමේ යෝජනා ක්‍රම කිහිපයක් යටතේ වර්ෂ අවසානය වනවිට නව ප්‍රදානයන් අටක් (08) ද පිරිනමා ඇත. ආයතන තිස් එකකට (31) සම්බන්ධ පර්යේෂකවරු එකසිය අනූ නවයක් (199) (ප්‍රධාන විමර්ෂකවරු සහ සම-විමර්ෂකවරු) මෙම පර්යේෂණ ප්‍රදාන ඔස්සේ ප්‍රතිලාභ හිමිකර ගෙන තිබේ.

• ශ්‍රී ලංකාවේ ජාතික විද්‍යා පදනම සහ චීනයේ ස්වභාවික විද්‍යා පදනම (NSF-NSFC) එක්ව සිදුකළ ප්‍රථම ඒකාබද්ධ පර්යේෂණ වැඩසටහනේ සොයාගැනීම් ප්‍රසිද්ධියට පත්කිරීම සඳහා විශේෂ උත්සවයක් සංවිධානය කරන ලදී.

• ජාත්‍යන්තර සහයෝගිතා පර්යේෂණ ප්‍රවර්ධනය කරගැනීමේ අරමුණින්, ඉතාලියේ, ට්‍රීඑස්ටිහි ජාන ඉංජිනේරු සහ ජෛව තාක්ෂණ ජාත්‍යන්තර මධ්‍යස්ථානය (ICGEB) හා චීනයේ ස්වභාවික විද්‍යා පදනම (NSFC) සමඟ පවතින සබඳතා සවිමත් කරගන්නා ලදී.

• නිෂ්පාදන ක්‍රියාවලිය, තිරසාරත්වය වැඩිදියුණු කිරීම සහ බතික් නිෂ්පාදනවල ගුණාත්මකබව වැඩිදියුණු කිරීම ඔස්සේ ජාතික ආර්ථිකය සඳහා දායකත්වය ලබාදීමට ශ්‍රී ලංකාවේ බතික් කර්මාන්තය නඟා සිටුවීමේ කාර්යය සඳහා ජාතික

මෝස්තර මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සහ ජාතික ශිල්ප සභාව යන ආයතන සමඟ එක්වී මනා නිෂ්පාදන පරිචයන් (GMP) පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස් කිරීම සඳහා ජාතික විද්‍යා පදනම විසින් සහාය ලබා දෙන ලදී.

• විද්‍යා සහ තාක්ෂණ අංශයේ මෙරට ප්‍රමුඛතම කේන්ද්‍රීය ආයතනය වශයෙන්, ජාතික විද්‍යා පදනම විසින් පර්යේෂණ සහ පරීක්ෂණ කටයුතු සඳහා විශ්ලේෂණාත්මක උපකරණ පිළිබඳ තොරතුරු ඇතුළත් ජාතික උපකරණ දත්ත සමුදාය (NID) - එනම් ආයතනවල පවතින නවීනතම උපකරණ පිළිබඳ ඩිජිටල් දත්ත සමුදාය, සකස් කරන ලදී. තාර්කිකකරණය තහවුරු කිරීම සහ ඉහළ වටිනාකමින් යුතු උපකරණවල අනවශ්‍ය ආකාරයෙන් ද්විකරණයවීම වැළැක්වීම හැරුන විට, විශේෂයෙන් අවශ්‍ය විද්‍යාගාර පහසුකම් හා තාක්ෂණික විශේෂඥතාවයන් නොමැති අධ්‍යයන ආයතන, පර්යේෂණ සහ සංවර්ධන ආයතන හා ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ඇතුළු කර්මාන්ත සඳහා එමඟින් පරිශීලක-හිතකාමී, පිරිවැය-ඵලදායි, විශ්ලේෂණාත්මක හා පරීක්ෂණ සේවා සැපයීම සිදු කෙරේ. වර්ෂ අවසානය වනවිට, මේ සඳහා විශ්වවිද්‍යාල/ ආයතන 61ක් හා පරිශීලකයන් 397 දෙනෙකු ලියාපදිංචි වී ඇති අතර, නිෂ්පාදිත කාණ්ඩ 253ක්, විද්‍යාගාර 487 සහ උපකරණ පිළිබඳ වාර්තා 1,120ක් දත්ත පද්ධතියට ඇතුළත් කර තිබේ.

• පර්යේෂණ උපාධිවල අධීක්ෂණ කටයුතු සඳහා වන ජාතික විද්‍යා පදනමේ සහාය යෝජනා ක්‍රමය (SUSRED) සඳහා අරමුණු වී තිබෙනුයේ විද්‍යා හා තාක්ෂණික සියලුම ක්ෂේත්‍රවල පශ්චාත් උපාධිවලට අදාළව පර්යේෂණ සිදුකරන සිසුන් අධීක්ෂණය කිරීමේ කටයුතුවල නිරත විද්‍යාඥයන්/ඉංජිනේරුවරුන් දිරිමත් කිරීම, සහාය දීම හා පිළිගැනීමක් ලබාදීම යි. මෙම වර්ෂයේ දී පර්යේෂකයන් 93 දෙනෙකුගෙන් සමන්විත අධීක්ෂණ කණ්ඩායම් 42ක් ප්‍රදාන ලබාගැනීම සඳහා සුදුසුකම් ලබා සිටී *(රූප සටහන 22).*

• 40% කට වඩා අඩු කාබන් සංයුතියක් සහිත ග්‍රැෆයිට්වල කාබන් සංයුතිය 98-99% ක මට්ටමක් කරා පරිවර්තනය කිරීම පිණිස මහා පරිමාණ මට්ටමින් භාවිතා කළ හැකි උපකරණයක් සහ ක්‍රමවේදය සඳහා 'ඉහළ අගය එකතු කිරීමක් ආකාරයෙන් ශ්‍රී ලංකාවේ ග්‍රැෆයිට් පවිත්‍රීකරණය' මැයෙන් වූ ජාතික විද්‍යා පදනමේ ප්‍රදානයක් ලද ව්‍යාපෘතිය, 2023 වර්ෂයේ දී ජාතික නව නිපයුම්කරුවන්ගේ දිනය සැමරුම්වල දී DASIS සම්මානයෙන් ගෞරවයට පාත්‍රවිය. ස්වාභාවික සම්පත් සඳහා අගය එකතු කිරීම් සම්බන්ධයෙන් මෙය සුවිශේෂී සංධිස්ථානයක් සනිටුහන් කරයි.

• 'සාධක මත පදනම් තීරණවලට එළැඹීමේ වැඩසටහන: පර්යේෂණ ක්‍රියාවට නැංවීම, නැමති මූලාරම්භය යටතේ ඩෙංගු පර්යේෂණවලට යොමුව සිදුකළ පර්යේෂණයේදී අනාවරණය වූ කරුණු සෞඛ්‍ය අමාත්‍යාංශයේ අදාළ නිලධාරීන් වෙත ඉදිරිපත් කරන ලදී. ජාතික විද්‍යා පදනමේ "Lab to Market" ආදර්ශය මෙම රැස්වීමේ දී හඳුන්වාදෙනු ලැබීය.

• අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ එක්ව ජාතික විද්‍යා පදනම විසින් ඉන්දු - ශ්‍රී ලංකා ඒකාබද්ධ පර්යේෂණ වැඩසටහනේ දෙවන සම්මන්ත්‍රණය 2023 ජනවාරි මස 20 වැනි දින ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ සංකතනී ශාලාවේ දී පවත්වනු ලැබී ය.

• SCIE හි සුචිගත ශ්‍රී ලංකාවේ එකම සඟරාව වන ජාතික විද්‍යා පදනමේ සඟරාව (JNSF) එහි 51වැනි වෙළුම කලාප හතරකින් මාර්තු, ජූනි, සැප්තැම්බර් සහ දෙසැම්බර් මාසවල දී ප්‍රකාශයට පත්කළ අතර එකී කලාප ලිපි 54කින් සමන්විත විය (පර්යේෂණ ලිපි 52, විචාර ලිපි 01 සහ පර්යේෂණ සන්නිවේදන ලිපි 01).

• ශ්‍රී ලංකා සඟරාවල මාර්ගගත වේදිකාව (SLJOL) 2023 මාර්තු මාසයේ දී ආරම්භ කළ අතර මෙය විශිෂ්ට ජයග්‍රහණයක් සහ ශ්‍රී ලංකාවේ විද්‍යා ප්‍රජාව සඳහා සුවිශේෂී දායකත්වයක් ලබා දෙනු ලැබේ. මේ තුළින් පර්යේෂණ සඳහා ගෝලීය දෘක්ම වැඩිදියුණු කරමින් විද්වත් සඟරා 131 කින් පර්යේෂණ ලිපි 20,000කට අධික සංඛ්‍යාවක් සඳහා විවෘත ප්‍රවේශයක් ලබාදෙනු ලැබේ.

• 2020 මූල්‍ය වර්ෂය සඳහා සිදුකළ ජාතික පර්යේෂණ සහ සංවර්ධන සමීක්ෂණය මත පදනම්ව පර්යේෂණ සහ සංවර්ධන සංඛ්‍යාලේඛන අත්පොත ප්‍රකාශයට පත්කරන ලදී. ක්ෂේත්‍ර හතරකට අදාළව, එනම් උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය, රජයේ පර්යේෂණ සහ සංවර්ධන ක්ෂේත්‍රය, ව්‍යාපාරික ව්‍යවසාය ක්ෂේත්‍රය සහ පුද්ගලික ලාභ නොලබන ක්ෂේත්‍රය යන ක්ෂේත්‍රවල පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම්වල කාර්යසාධනය මෙම සංඛ්‍යාලේඛන අත්පොත ඔස්සේ පිළිබිඹු වේ.

• විද්‍යා සහ තාක්ෂණ කළමනාකරණ තොරතුරු පද්ධතිය (STMIS) යනු 2004 වර්ෂයේ සිට ජාතික විද්‍යා පදනම විසින් සකස් කර පවත්වාගෙන යනු ලබන පරිගණකගත තොරතුරු පද්ධතියකි. 2023 වර්ෂයේ අවසානය වනවිට, මෙම දත්ත සමුදාය සඳහා ලියාපදිංචි වී සිටි සංඛ්‍යාව 7,300ක් වූ අතර ඔවුන්ගෙන් 163ක් මෙම වර්ෂය තුළ ලියාපදිංචි වී ඇත.

• විදේශගත වී සිටින විද්වතුන් 90ක් අලුතින් ලියාපදිංචි වීම සමඟින් ජාතික විද්‍යා පදනමේ ගෝලීය ඩිජිටල් වේදිකාව පුළුල් වී තිබෙන අතර රටවල් අතර පර්යේෂණ සහයෝගිතාවය සහ තාක්ෂණික සහයෝගය සඳහා හවුල්කාරිත්වයන් නවයක් ස්ථාපනය කරන ලදී.

• සිවුවැනි කාර්මික විප්ලවය සඳහා යොමුවෙමින් තාක්ෂණික සහ වෘත්තීය අධ්‍යාපන සහ පුහුණු අංශය ශක්තිමත් කිරීම පිණිස, ගෝලීය ශ්‍රම වෙළඳපොළෙහි නැඟී එමින් පවතින දත්ත විද්‍යාව වැනි විෂය ක්ෂේත්‍රවල පවතින අවස්ථා අවධාරණය කරමින් තාක්ෂණික සහ වෘත්තීය අධ්‍යාපන සහ පුහුණු අංශයේ කාර්යසාධනය වැඩිදියුණු කිරීම සඳහා ජාතික විද්‍යා පදනම විසින් ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය සමඟ හවුල්කාරිත්වයක් ඇතිකරගන්නා ලදී. ඒ අනුව, ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ ඉල්ලීම පරිදි, දත්ත විද්‍යාව පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා වන සම්පූර්ණ විෂයමාලාවක් සකස්කර ඔවුන් වෙත ඉදිරිපත් කරන ලදී.

• වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ ආචාර්යවරුන් ඉලක්ක කරගත් IoT සම්බන්ධිත ධාරිතා ගොඩනැංවීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වෙමින් පැවතිණි.

• ජාන ඉංජිනේරු සහ ජෛව තාක්ෂණ ජාත්‍යන්තර මධ්‍යස්ථානයේ (ICGEB) 'Meeting and Courses programme and Arturo Falaschi Fellowship' යටතේ පර්යේෂකවරුන්ගේ ප්‍රතිලාභය පිණිස රු.මිලියන දහයක මුදලක් ලබාගැනීම පිණිස ජාතික විද්‍යා පදනම විසින් පහසුකම් සලසන ලදි.

• පර්යේෂණ ප්‍රජාවේ යහපත පිණිස ක්‍රමෝපායික වාසියක් ඇති ක්ෂේතවලට අදාළව නවීනතම දැනුම රටවල් අතර හුවමාරු කරගැනීම පිණිස පහසුකම් සැලසීම සඳහා වැඩසටහන් පහක් පවත්වන ලදී.

• රබර් ශාකවල පූර්ණ ආර්ථික ජීව කාලය උපයෝගී කරගැනීම සහතික කිරීම සඳහා තිරසර ආකාරයෙන් රබර් ශාකවල පොත්ත කළමනාකරණය කිරීම හා එමගින් ඵලදායිතාවය වැඩිදියුණු කිරීම පිළිබඳ දැනුම රබර් වගා කිරීමේ අංශ වෙත ලබාදෙන ලදී.

• ආනයනික ක්‍රිත්ව සුපර් පොස්ෆේට් (TSP) වෙනුවට දිලීර බැක්ටීරියා ජෛව පටල ක්‍රියාකාරිත්වය ඔස්සේ එළවළු ශාකවල ඵලදායිතාවය වැඩිදියුණු කිරීම පිණිස එප්පාවල රොක් පොස්ෆේට් (ERP) සමඟින් ඵලදායි පොහොර සංයෝජනයක් සකස් කිරීමේ පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සඳහා පහසුකම් සලස්වන ලදී.

• ශ්‍රී ලංකාවේ උක් සහ කිරිගව ක්ෂේත්‍ර වැඩිදියුණු කිරීම පිණිස බ්‍රසීල සහයෝගිතා නියෝජිතායතනයේ (ABC Institute) තාක්ෂණික සහයෝගිතාවය ලබාගැනීම පිණිස පහසුකම් සලස්වන ලදී.

• විද්‍යා සාක්ෂරතාවය සඳහා වූ ලෝක සංවිධානය (WOSL) සමඟින් විද්‍යා සහ තාක්ෂණය සඳහා වූ චීන සංවිධානය (CASiy T) සහ චීනයේ විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය විසින් සංවිධානය කළ Belt and Road Teenager Maker Camp සහ ගුරුවරුන් සඳහා වූ වැඩමුළුව සඳහා සිසුන් (10) දෙනෙකු සහ ගුරුවරු (03) දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් සහභාගී විය. ඔවුන් විසින් කඳවුර තුළ සිදුකළ ක්‍රියාකාරකම් සඳහා 'හොඳම කණ්ඩායම', හොඳම ඉදිරිපත් කිරීම සහ 'හොඳම සෑදුම්කරු' යන කාණ්ඩ යටතේ ජයග්‍රාහි ස්ථාන ලබාගැනීමට සමත් විය.

• 2023 වර්ෂය අවසාන වනවිට, ජාතික විද්‍යා පදනම විසින් පාසැල් විද්‍යා සංගම් 1,163 ක් සහ විශ්වවිද්‍යාල විද්‍යා සංගම් 55 ක් ලියාපදිංචි කරන ලදී. මෙම මුල්පිරීම ග්‍රාමීය මට්ටමේ දී ප්‍රජා පාදක විද්‍යා සංගම් පිහිටුවීම දක්වා රැගෙන යන ලදී.

• විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු, කලා සහ ගණිත අධ්‍යාපන (STEAM education) ප්‍රවේශය ඔස්සේ තෝරාගත් පාසැල් 50ක විද්‍යා අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ ව්‍යාපෘතියක් ජාතික විද්‍යා පදනම විසින් ආරම්භ කරන ලදී. අධ්‍යාපන අමාත්‍යාංශයේ විද්‍යා අංශය සහ කොමර්ෂල් බැංකුවේ සමාජ දායකත්ව භාරය සමඟ එක්ව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

• ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය තුළට විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු, කලා සහ ගණිත අධ්‍යාපනය (STEAM education) හඳුන්වාදීම සඳහා වූ ජාතික වැඩසටහන මෙම වසරේ මාර්තු මස 31 වැනි දින කොළඹ 07, රාජකීය විදුහලේ නව රඟහල ශාලාවේ දී පැවැත්වුණු අතර එය අධ්‍යාපන අමාත්‍යාංශය සහ ජාතික අධ්‍යාපන ආයතනය විසින් ඒකාබද්ධව සංවිධානය කරන ලදී.

• පොදු මහජනතාව වෙත විශේෂ අවධානය යොමුකරමින් විද්‍යාත්මක සොයාගැනීම්/නවෝත්පාදන/හෝ වෙනත් ඕනෑම විද්‍යාත්මක වැඩිදියුණු කිරීමකට අදාළ නිරවද්‍ය කරුණු හා විශ්වාසනීය තොරතුරු ව්‍යාප්ත කිරීම පිණිස විෂය නිශ්‍රීත විද්‍යා වාර්තාකරණය පිළිබඳ වැඩසටහනක් ආරම්භ කරන ලදී.

• ජාතික ප්‍රමුඛතාවලට අනුකූලව ශ්‍රී ලංකාව තුළ කොවිඩ් - 19 වසංගත තත්වයට එරෙහිව කටයුතු කිරීමට සහ එහි ප්‍රතිඵල අවම කරවීම සඳහා කොවිඩ් -19 ප්‍රදාන යටතේ ජාතික විද්‍යා පදනම විසින් තරඟකාරී පදනමින් විශේෂ ප්‍රදාන යෝජනා ක්‍රමයක් ආරම්භ කරන ලදී. එම ප්‍රදාන අටෙන් (08) හතක් (07) 2023 වර්ෂයට ඇතුළත් විය.

• තාක්ෂණ සංවර්ධන සහ නවෝත්පාදන අංශය විසින් පිරිනැමූ ප්‍රදානයන් තුනක් (03) සාර්ථක අයුරින් නිමාකරන ලද අතර එයින් එක් ප්‍රදානයකට අදාළ නිෂ්පාදන ජාතික මට්ටමේ දී වාණිජකරණයට පත්කර තිබේ.

ජාතික විද්‍යා පදනමේ සමස්ත කාර්යසාධනය

2023 වර්ෂයේ දී, ආයතනික කාර්යසාධනය ඇගයීම සඳහා ජාතික විද්‍යා පදනම විසින් කාර්යසාධන පුවරුවක් (a Performance Dashboard) හඳුන්වාදෙන ලදී. ප්‍රධාන කාර්යසාධන දර්ශක සකස් කරමින් ස්වකීය ඉලක්ක කරාගමන් කිරීමට උපකාරීවන, එකම ඉලක්ක කරා සියලුම සේවකයන් හා පරිපාලකයන් කාර්යයන් ඉටුකරන බවට සහතික කරලීම, සහ ප්‍රගතියක් ලබාගන්නේ ද යන්න පරීක්ෂා කරබැලීමේ හැකියාව සතු බලගතු මෙවලමක් ලෙස මෙම කාර්යසාධන පුවරු සැලකිය හැකි ය. සකස් කරන ලද ප්‍රධාන කාර්යසාධන දර්ශකවලට එරෙහිව 2023 වර්ෂයේ නොවැම්බර් 31 වැනි දිනට ජාතික විද්‍යා පදනමේ ආයතනික කාර්යසාධනය පහත නිරූපණය වේ.

ජාතික විද්‍යා පදනමේ එක් එක් අංශ අනුව කාර්යසාධනය

අංශය	භෞතික ප්‍රගතිය	
පර්යේෂණ අංශය	85.61%	
තාක්ෂණ සංවර්ධන සහ නවෝත්පාදන අංශය	77.78%	
ජාත්‍යන්තර සබඳතා අංශය	100%	
විද්‍යා සන්නිවේදන සහ ව්‍යාප්ත අංශය	100%	
විද්‍යා සහ තාක්ෂණ ප්‍රතිපත්ති පර්යේෂණ අංශය	71.86%	
සඟරා ප්‍රකාශන අංශය	76.11%	
ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානය	100%	
පාලන අංශය	80%	
මාධ්‍ය සහ ඉසව් කළමනාකරණ අංශය	95.69%	
ජාතික විද්‍යා පදනම	**89.81% (90%)**	

	සුවිශේෂී (90% ට වැඩි)
	විශිෂ්ට (75% - 89%)
	ඉතා හොඳ (60% - 74%)
	හොඳ (50% - 59%)
	සතුටුදායක (40% - 49%)
	දුර්වල 39% ට අඩු)

2023 සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම - ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPIs)

1. ශ්‍රී ලංකාවේ පර්යේෂණ පදනම ශක්තිමත් කර ඇති වපසරිය (පිරිනමන ලද ප්‍රදාන, ප්‍රතිලාභ ලැබූ ආයතන, - ප්‍රතිලාභ ලැබූ විද්‍යාඥයන්, විද්‍යාපති/ ආචාර්ය උපාධි හිමිකරගත් සංඛ්‍යාව, පිළිගැනීමට බඳුන් වූ විද්‍යාඥයන් අනුව).

2. නව දැනුම නිර්මාණය වීම සහ තාක්ෂණ දියුණුව (සඟරා ප්‍රකාශන, පිරිනැමූ පේටන්ට්/ ගොනු කළ අයදුම්පත් සංඛ්‍යාව, සාර්ථක අයුරින් නිමාකළ ප්‍රදාන, තාක්ෂණික නුවමාරු අනුව).

3. විද්‍යා සහ තාක්ෂණ තොරතුරු සුලභව පැවතීම සහ භාවිතයේ ප්‍රමාණය.

4. විද්‍යා, තාක්ෂණ සහ නවෝත්පාදන කාර්යසාධනය ඉටුකරගැනීම සඳහා පහසුකම් සලස්වන ලද ජාත්‍යන්තර හවුල්කාරිත්වයන් (පර්යේෂණ සහ සංවර්ධන කටයුතු පිළිබඳව පුහුණු කළ පිරිස, තාක්ෂණ හා වෘත්තීය අධ්‍යාපන සහ පුහුණු අංශයේ පුහුණු කළ පිරිස, රටවල් හරහා නවීනතම දැනුම නුවමාරු කිරීම සහ ජාත්‍යන්තර සහයෝගිතා පර්යේෂණ අනුව).

5. ප්‍රතිපත්ති සම්පාදනය සවිමත් කිරීම පිණිස නිර්මාණය කළ/ යාවත්කාලීන කළ විද්‍යා, තාක්ෂණ සහ නවෝත්පාදන දර්ශක ප්‍රමාණය.

6. පාසැල් ප්‍රජාව වෙත විශේෂ අවධානය යොමු කරමින් විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු, කලා සහ ගණිත අධ්‍යාපනය (STEAM education) ප්‍රවර්ධනය කිරීමේ වැඩිදියුණු වූ මට්ටම.

7. කාර්ය මණ්ඩලය සේවා කටයුතුවල නියැලීමේ වැඩිදියුණු වූ මට්ටම.

8. 2022 වර්ෂයට සාපේක්ෂව පරිගණක ආශ්‍රිතව ඇතිවූ අඩු ගැටලුකාරී අවස්ථා.

මූල්‍ය කාර්යසාධනයේ සුවිශේෂී කරුණු - 2023

ජාතික විද්‍යා පදනම වෙත බලය පැවරී ඇති ක්ෂේත්‍ර හය අනුව 2023 වර්ෂයේ දී සෑම ක්ෂේත්‍රයක් යටතේ වෙන්කළ ප්‍රතිපාදන සහ වැයකිරීම් (රු.මිලියන වලින්) *රූප සටහන 02* මගින් පැහැදිලි කෙරේ. ආයතනය වෙත පැවරී ඇති බලය 1 යටතේ ඉහළතම ප්‍රතිපාදනය ලැබී ඇති අතර වැය කිරීම්වල ද ඉහළතම අගය එහි දක්වෙන අතර, පැවරී ඇති බලය 3 යටතේ අඩුම ප්‍රතිපාදන වෙන් කිරීම පවතින අතර, පැවරී ඇති බලය 6 යටතේ අවම වැයකිරීම පවතී.



රූප සටහන 02: සෑම පැවරුම් බලය ක්ෂේත්‍රයක් යටතේ වෙන්කළ ප්‍රතිපාදන සහ තත්‍ය වැය කිරීම් (රු.මිලියන වලින්)

ජාතික විද්‍යා පදනම විසින් 2023 වර්ෂයේ දී රු.2,537,790.74 ක ආදායමක් උපයා ඇති අතර එකී ආදායම් මාර්ග *රූප සටහන 03* හි දක්වා ඇති පරිදි වේ.



රූප සටහන 03: 2023 වර්ෂයේ දී ජාතික විද්‍යා පදනම විසින් ඉපැයූ ආදායම

ජාතික විද්‍යා පදනම විසින් ඉටු කරනු ලබන කාර්යයන් තිරසර සංවර්ධන ඉලක්ක (SDG) සහ ජාතික ප්‍රතිපත්ති රාමුව (NPF) සමග ගැලපීම

එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන ඉලක්ක (SDGs) සහ ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්ති රාමුව (NPF) සමග ජාතික විද්‍යා පදනම සඳහා බලය පැවරී ඇති ක්ෂේත්‍රයන් අනුකූල කිරීම සඳහා *රූප සටහන 04* හි දක්වා ඇති පරිදි ගැලපීම් සිදුකරන ලදී. ඒ අනුව, ජාතික විද්‍යා පදනමෙහි සියලු කාර්යයන් එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන ඉලක්ක (SDGs) සහ ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්ති රාමුව (NPF) සමග සමානුපාත වේ.



රූප සටහන 04: ජාතික ප්‍රතිපත්ති රාමුව සහ තිරසර සංවර්ධන ඉලක්ක සමඟ ජාතික විද්‍යා පදනම වෙත බලය පැවරී ඇති ක්ෂේත්‍රයන් අනුකූලවීම

ක්‍රියාකාරී සැලැස්ම - 2023 සමඟ ලබාගත් ප්‍රගතිය පිළිබඳ සංසන්දනයක්

ජාතික විද්‍යා පදනම වෙත පැවරී ඇති බලය අ) පර්යේෂණ සහ සංවර්ධන කටයුතු ප්‍රවර්ධනය කිරීම

වැඩසටහන: පර්යේෂණ සහ තාක්ෂණික සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

පර්යේෂණ අංශය විසින් පහත යෝජනා ක්‍රම යටතේ පර්යේෂණ ප්‍රදාන පිරිනැමීම සහ එම කටයුතු අධීක්ෂණය කිරීම ඔස්සේ මෙම අරමුණ සපුරාලනු ලැබේ. එසේ වුව ද, රට තුළ පැවති ආර්ථික තත්ත්වය හේතුවෙන් ප්‍රදානයන් පිරිනැමීමේ කටයුතු ප්‍රබල ලෙස බලපෑමට ලක්විය.

- තරඟකාරී පර්යේෂණ ප්‍රදාන යෝජනා ක්‍රමය (CRG)
- ජාත්‍යන්තර සහයෝගිතා පර්යේෂණ ව්‍යාපෘති (ICRP)
- වැඩිදුරටත් පර්යේෂණ කටයුතු සිදුකිරීමට හැකි වාණිජ විභවයක් සහිත ව්‍යාපෘති සඳහා පිරිනැමෙන පර්යේෂණ ප්‍රදාන (GapF)
- සෞඛ්‍ය විද්‍යාව පිළිබඳ පර්යේෂණ වැඩසටහන (RPHS)
- ජාතික සංවර්ධනය සඳහා දායකත්වය ලබාදිය හැකි ජාතික අවශ්‍යතා අනුව සිදුකරන පර්යේෂණ වැඩසටහන (NTRP)

වර්ෂය තුළ දී පර්යේෂණ ව්‍යාපෘති හතලිස් නවයක් (49) ක් අධීක්ෂණය කළ අතර, 2023 වර්ෂ අවසානය වනවිට ඉහත යෝජනා ක්‍රම යටතේ නව පර්යේෂණ ප්‍රදානයන් අටක් (08) ද පිරිනමන ලදී. ආයතන තිස් එකක (31) පර්යේෂකවරු (ප්‍රධාන ගවේෂකයින් සහ සම-ගවේෂකයින්) එකසිය අනූ නවයක් (199) මෙම සියලු පර්යේෂණ ප්‍රදානවලින් ප්‍රතිලාභ හිමිකර ගෙන තිබේ. පර්යේෂණ ප්‍රදාන බෙදී ගොස් ඇති ආකාරය සහ ප්‍රදාන ලැබූ පිරිස් *රූප සටහන 05* සහ *06* තුළ දැක්වේ.



රූප සටහන 05: 2023 වර්ෂයේ දී විවිධ ක්ෂේත්‍ර යටතේ පිරිනමන ලද පර්යේෂණ ප්‍රදාන සංඛ්‍යාව



රූප සටහන 06: ආයතන අතර ප්‍රතිලාභීන් විසිරී ඇති ආකාරය

නව, දැනට කෙරීගෙන යමින් පවතින සහ සම්පූර්ණ වී ඇති ප්‍රදාන බෙදී ගොස් ඇත්තේ විවිධ විෂය ක්ෂේත්‍ර නියෝජනය කරන කණ්ඩායම් (පර්යේෂණ ප්‍රදාන 34), එකම අංශයක් නියෝජනය කරන විමර්ෂකවරුන්ගෙන් සමන්විත කණ්ඩායම් (පර්යේෂණ ප්‍රදාන 12) එක් විමර්ෂකවරයෙකුගෙන් පමණක් සමන්විත (පර්යේෂණ ප්‍රදාන 11) වශයෙනි. *(රූප සටහන 07)* බහුතරයක් ප්‍රදානයන් සැලකිල්ලට ගැනීමේ දී, පර්යේෂකවරු සහයෝගිතාකරුවන් සමග හවුල්කාරිත්වයෙන් කටයුතු කර තිබේ. පර්යේෂණ ප්‍රදාන 57කට අදාළව පුද්ගලික අංශයේ සහයෝගිතාකරුවන් නවයක් (09) ක් ද ඇතුළුව දේශීය (40) සහ විදේශීය (34) වශයෙන් සහයෝගිතාකරුවන් හැත්තෑ හතරක් (74) ඇතුළත් වේ *(රූප සටහන 08)*.



රූප සටහන 07: කණ්ඩායම් සාමාජිකයන් බෙදී යන ආකාරය



රූප සටහන 08: සහයෝගිතාකරුවන් බෙදීයෑම

පර්යේෂණ ප්‍රදානවල නිමැවුම් ලෙස ප්‍රකාශන, නව නිපැයුම් සඳහා පිරිනමන පේටන්ට් සහ පශ්චාත් උපාධි ඇතුළත් වේ. *(රූප සටහන 09)* SCIE සුචිගත ප්‍රකාශන විසි එකක් (21), සමාලෝචනය කර පළකරන ප්‍රකාශන හතක් (07) සහ ප්‍රචාරණ හතලිස් හතරක් (44) ඇතුළුව ප්‍රකාශන හැත්තෑ දෙකක් (72) 2023 වර්ෂය තුළ පර්යේෂණ ප්‍රදානවලින් ප්‍රතිඵල වී තිබේ. මීට අමතරව, පරිසරය හා ජෛව විවිධත්වය, සහ සෞඛ්‍ය විද්‍යාව යන ක්ෂේත්‍රවලට අදාළව පේටන්ට් බලපත්‍ර තුනක් (03) ද ලබාගෙන තිබෙන අතර මූලික විද්‍යාවන්, පරිසරය හා ජෛව විවිධත්වය සහ සෞඛ්‍ය විද්‍යාවන් යන ක්ෂේත්‍රවලට පිරිනමන ලද ප්‍රදානයන් සඳහා 2023 වර්ෂයේ දී තවත් පේටන්ට් අයදුම්පත් පහක් (05) යොමුකර තිබේ. ආචාර්ය උපාධි පහක් (05) සහ විද්‍යාපති උපාධි විස්සක් (20) ද වර්ෂය තුළ දී සම්පූර්ණ කර තිබේ.



රූප සටහන 09: පර්යේෂණ ප්‍රදානවල නිමැවුම් ව්‍යාප්ත ආකාරය

1.1 ජාතික විද්‍යා පදනමේ තරඟකාරී පර්යේෂණ ප්‍රදාන යෝජනා ක්‍රමය

විද්‍යාත්මක පර්යේෂණ සඳහා ශ්‍රී ලංකාවේ විද්‍යා සහ තාක්ෂණ ආයතනවල පවතින මූල්‍ය, භෞතික සහ මිනිස්බල සම්පත සඳහා අතිරේක වශයෙන් ප්‍රදාන සැපයීමෙන් ජාතික විද්‍යා පදනමේ තරඟකාරී පර්යේෂණ ප්‍රදාන යෝජනා ක්‍රමය ඔස්සේ සහාය ලබා දේ. විද්‍යාඥයින්ගේ ස්වාධීන, තනි සහ බුද්ධිමය දේපළ ධාරිතාවයන් උපයෝගී කරගැනීම සඳහා එමගින් පහසුකම් සැලසෙන අතර රටෙහි සමාජ-ආර්ථික සංවර්ධනය උදෙසා යොමුවූ ඉහළ මට්ටමේ පර්යේෂණ දියත් කිරීම සඳහා මෙමගින් දිරිමත් කෙරේ. සමාජ විද්‍යාව ඇතුළුව විද්‍යා හා තාක්ෂණ සියලු ක්ෂේත්‍ර සඳහා තරඟකාරී පර්යේෂණ ප්‍රදාන පිරිනැමේ.

2023 වර්ෂයේ දී නව ප්‍රදානයන් නවයක් (09) පිරිනමා තිබේ *(ඇමුණුම 03)*. එසේ වුව ද, එයින් ප්‍රදානයන් අටක්ම (08) පිරිනමා ඇත්තේ වර්ෂ අවසානයේ දී බැවින් එම ප්‍රදානයන්ට අදාළ ව්‍යාපෘති කාර්යයන් ආරම්භ නොවීය. තරඟකාරී පර්යේෂණ ප්‍රදාන හතලිස් එකක් (41) වර්ෂය තුළ දී අධීක්ෂණය කරන ලද අතර එම ව්‍යාපෘතිවල මනා ප්‍රගතිය සහ මූල්‍ය අවශ්‍යතාවයන් අනුව අරමුදල් නිදහස් කරනු ලැබීය. මෙයින් පර්යේෂණ ප්‍රදාන විසි දෙකක් (22) 2023 වර්ෂය අවසානය වනවිට සම්පූර්ණ කරන ලදී. පර්යේෂකවරු (ප්‍රධාන ගවේෂකයින් සහ සම-ගවේෂකයින්) එකසිය තිස්තුනක් (133) තරඟකාරී පර්යේෂණ ප්‍රදාන යටතේ ප්‍රතිලාභ හිමිකර ගෙන තිබේ. එහි විස්තර *ඇමුණුම 02* සහ *ඇමුණුම 04* හි දක්වා ඇත. වර්ෂය තුළ දී පර්යේෂණ සිසුන් 11 දෙනෙකු සහ තාක්ෂණික සහකාරවරු 03 දෙනෙකු පත්කර තිබේ. 2023.12.31 දිනට පර්යේෂණ ප්‍රදාන පිළිබඳව වූ සාරාංශයක් *ඇමුණුම 05* හි දැක්වේ.

1.2 පර්යේෂණ ප්‍රදානවල ප්‍රගතිය අධීක්ෂණය කිරීම

දැනට කෙරීගෙන යමින් පවතින පර්යේෂණවලට අදාළ ප්‍රදානවල ප්‍රගතිය අර්ධ වාර්ෂික ප්‍රගති වාර්තා, ප්‍රගති සමාලෝචන සම්මන්ත්‍රණ සහ ප්‍රගති සමාලෝචන ඔස්සේ අධීක්ෂණය කෙරේ.

1.2.1 ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය වෙත සිදුකළ ප්‍රගති සමාලෝචන

ශ්‍රී ලංකාවේ පොල් මද නිෂ්පාදන ජාත්‍යන්තර වෙළඳපොළ තුළ ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීමේ අපේක්ෂාවෙන් RG/2021/BS/01 දරන පර්යේෂණ ප්‍රදානය යටතේ 'Applying Isotopic Fingerprinting to Authenticate Sri Lankan Coconut Kernel Products to Protect and Promote in International Market' මැයෙන් දැනට කෙරීගෙන යමින් පවතින පර්යේෂණයේ ප්‍රගතිය අධීක්ෂණය කිරීම සඳහා 2023 ඔක්තෝබර් 23 දිනැතිව ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය වෙත ප්‍රගති සමාලෝචන සිදුකරන ලදී.

මූලික විද්‍යාවන් පිළිබඳ ක්‍රියාකාරී කමිටුවේ සභාය ඇතිව මෙම ප්‍රදානය අධීක්ෂණය කරන ලදී. කාරක කමිටුවේ සභාපති, සමාලෝචක සහ ජාතික විද්‍යා පදනමේ නිලධාරීන් මෙම ප්‍රගති සමාලෝචන සඳහා සහභාගී විය. isotopic fingerprinting තාක්ෂණය උපයෝගී කරගෙන ශ්‍රී ලංකාවේ පොල් මද නිෂ්පාදන ජාත්‍යන්තර වෙළඳපොළ තුළ ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා සහතිකකරණයක් ලබාදීම මෙම ප්‍රදානයේ අරමුණ වේ. ඇගයීම සිදුකරන අවස්ථාව වනවිට 50%ක භෞතික කාර්යසාධනයක් සහ 66%ක මූල්‍ය ප්‍රගතියක් මෙම ව්‍යාපෘතියට අදාළව ලබාගෙන තිබුණි. ව්‍යාපෘතිය වැඩිදියුණු කිරීම සඳහා යෝජනා ප්‍රදානලාභීන් වෙත ලබාදෙන ලදී.

1.2.2 කාර්මික තාක්ෂණ ආයතනය වෙත ලබාදුන් ප්‍රදානය පිළිබඳ ප්‍රගති සමාලෝචන රැස්වීම

ඉහළ අගය එකතු කිරීමක් ආකාරයෙන් ශ්‍රී ලංකාවේ ග්‍රැෆයිට් පවිත්‍රීකරණය මැයෙන් වූ පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා RG/GAPF/2021/EB/01 යටතේ ලබා දී ඇති ප්‍රදානය සම්බන්ධයෙන් වූ ප්‍රගති සමාලෝචන රැස්වීම ජාතික විද්‍යා පදනමේ කළමනාකරණ මණ්ඩල කාමරයේ දී 2023 නොවැම්බර් 02 දිනැතිව පවත්වන ලදී. පර්යේෂණ කණ්ඩායම විසින් අත්පත් කරගෙන ඇති ප්‍රගතියේ වැදගත් කරුණු සවිස්තරාත්මකව ඉදිරිපත් කරන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ, පවිත්‍රීකරණ ක්‍රමවේද තුනක්, එනම් භෞතික ක්‍රමය, අම්ල ක්‍රමය සහ භෂ්ම-අම්ල ක්‍රමය යන ක්‍රම තුනක් පරීක්ෂා කරන ලදී. එකී සෑම ක්‍රමයක් යටතේම සුවිශේෂී අනාවරණය කරගැනීම් සමග අත්පත් කරගත් ප්‍රගතිය පහත වගුවේ දැක්වේ;

පවිත්‍රීකරණ ක්‍රමවේදය	ප්‍රතිඵල/සාධනය
භෞතික ක්‍රමය	පවිත්‍රීකරණ මට්ටම: කර්මාන්ත මට්ටමේ වාණිජකරණ ක්‍රියාවලියේ දී පවිත්‍ර මට්ටම 99%ක් දක්වා.
අම්ල ක්‍රමය	පවිත්‍රීකරණ මට්ටම: කර්මාන්ත මට්ටමේ දී පවිත්‍ර මට්ටම 99.8%ක් දක්වා. තාක්ෂණ දැනුම කර්මාන්ත වෙත ලබාදෙන ලදී.
භෂ්ම-අම්ල ක්‍රමය	පවිත්‍රීකරණ මට්ටම: විද්‍යාගාර මට්ටමේ දී පවිත්‍ර මට්ටම 99.97%ක දක්වා. විද්‍යාගාර අත්හදා බැලීම් තවමත් කෙරීගෙන යමින් පවතී.



රූප සටහන 10: 40% කට වඩා අඩු කාබන් සංයුතියක් සහිත ග්‍රැෆයිට්වල කාබන් සංයුතිය 98-99% ක මට්ටමක් කරා පරිවර්තනය කිරීම පිණිස ව්‍යාපෘතිය යටතේ වැඩිදියුණු කළ මහා පරිමාණ මට්ටමින් භාවිතා කළ හැකි උපකරණය

වසරතුල සාර්ථකව නිම කරනලද ප්‍රදාන

ප්‍රදාන අංකය : RG/2017/BS/03
ප්‍රධාන විමර්ශක : මහාචාර්ය ආර්. එම්. ජී. රාජපක්ෂ, රසායන විද්‍යා අධ්‍යයනාංශය, විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
ව්‍යාපෘතියේ මාතෘකාව : ජෛව වෛද්‍ය හා ජල පිරිපහදුවල භාවිතයන් සඳහා ශ්‍රී ලංකාවේ ස්වාභාවිකව පවතින ඛනිජවලින් ව්‍යුත්පන්න කරගන්නා හයිඩ්‍රොක්සි ඇපටයිට් නැනෝ අංශු හා ඒවායේ සංයෝජනවල ජෛව අනුකූලතාවය සහ ප්‍රති-ක්ෂුද්‍රජීවී ගුණාංග නාළස්ථ ආකාරයෙන් ඇගයීම

ශ්‍රී ලංකාවේ ස්වාභාවිකව පවතින ඛනිජ භාවිතයෙන් ජෛව අනුකූලතාවය සහිත හයිඩ්‍රොක්සි ඇපටයිට් නැනෝ අංශු හා ඒවායේ සංයෝජන පිරිවැය ඵලදායි ආකාරයෙන් සංශ්ලේෂණය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ විය. කෘත්‍රිමව සකස් කරන ශරීර කොටස් වැනි ජෛව වෛද්‍ය යෙදීම් සඳහා මෙම හයිඩ්‍රොක්සි ඇපටයිට් නැනෝ අංශු උපකාරී වේ. මෙම අධ්‍යයනය ඔස්සේ, ජෛව වෛද්‍ය යෙදීම් සහ දූෂිත ජලය පිරිපහදු කිරීම සඳහා යොදාගත හැකි ප්‍රති-ක්ෂුද්‍රජීවී සහ ජෛව අනුකූලතාවය සහිත අඩු-පිරිවැය හයිඩ්‍රොක්සි ඇපටයිට් නැනෝ අංශු සහ ඒවායේ සංයෝජන පරීක්ෂා කරන ලදී. මෙම පිරිවැය ඵලදායි ක්‍රමවේද සඳහා දේශීයව පවතින ස්වාභාවිකව හටගන්නා ඛනිජ භාවිතා කරන ලද අතර ඒවායින් දූෂිත ජලයෙන් විෂ සහ බැර ලෝහ ඉවත්කිරීමට හැකි වැඩිදියුණු කාර්යක්ෂමතාවයෙන් හෙබි නැනෝ අංශු නිපදවන ලදී. ජෛව අනුකූලතාවය සහිත හයිඩ්‍රොක්සි ඇපටයිට් නැනෝ අංශු හා ප්‍රති-ක්ෂුද්‍රජීවී ගුණාංග සහිත නැනෝ ද්‍රව්‍ය මගින් පානීය ජලය සම්බන්ධිත ගැටලු කාර්යක්ෂම අයුරින් හසුරුවන ලදී. ශ්‍රී ලංකාවේ ඛනිජවල උපයෝගිතාවය තුළින් මෙරට ඛනිජ සම්පත් සඳහා වටිනාකමක් එක්කළ අතර ආර්ථිකය සඳහා දායකත්වයක් ලබාදෙන නව කර්මාන්තයක් ශ්‍රී ලංකාවේ ස්ථාපනය කිරීම සඳහා අවස්ථාවක් මෙමගින් උදා කරන ලදී. මෙම පර්යේෂණ කාර්යය ඔස්සේ SCIE ප්‍රකාශන 01ක්, පොතක පරිච්ඡේද 01ක්, පර්යේෂණ සන්නවේදන 11ක් සහ දර්ශනපති උපාධි 01ක් ප්‍රතිඵල වී තිබේ.



රූප සටහන 11: විෂ-රහිත සංශ්ලේෂිත නැනෝ අංශු සහ සංයෝජනවල භාවිතය

ප්‍රදාන අංකය : RG/2018/BS/02
ප්‍රධාන විමර්ශක : මහාචාර්ය ආර්. සෙන්තිල්නිධි, රසායන විද්‍යා අධ්‍යයනාංශය, ස්වාභාවික විද්‍යා පීඨය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
ව්‍යාපෘතියේ මාතෘකාව: පිළිකා කේතවලට පාරිසරික හේතුවලින් සිදුවන ජානවල විකරණ නිෂේධනය සඳහා සංඛ්‍යානමය විශ්ලේෂණ අධ්‍යයන

ඩීඑන්ඒ ජාන සහ පාරිසරික විකරණ යන දෙකම ඔස්සේ පිළිකා ඇති විය හැකි ය. ඇසිටිල් සහ මෙතිල් හිස්ටෝන් විකරණ හා ඩීඑන්ඒ මෙතිලේෂන් යනු මානව පටකවල අසාමාන්‍ය වැඩීමේ පොදු ලක්ෂණයක් ලෙස හඳුනාගෙන ඇති වඩාත්ම අධ්‍යයනය කර හඳුනාගෙන ඇති ජානමය විකරණ වේ. මෙම අධ්‍යයනයේ දී, ඖෂධ බැඳෙන ස්ථානවල

පරමාණුක/අණුක මට්ටමේ විස්තරය සහ ඩීඑන්ඒ සහ ප්‍රෝටීන් සමඟ ඖෂධ අණු බැඳීමේ සාපේක්ෂ ශක්තිය පරීක්ෂා කිරීම පිණිස සංඛ්‍යානමය විශ්ලේෂණ ක්‍රමවේද (අණුක ඇඳුම් සහ අණුක ගතිකයන්) සකස් කිරීම සඳහා පර්යේෂණ කණ්ඩායම විසින් ප්‍රයත්න දරා තිබේ. දැනට, ප්‍රති පිළිකාකාරක ඖෂධ කිහිපයක් එහි සායනික අත්හදා බැලීම්වල විවිධ පියවරවල පවතී. එසේ වුව ද, එම ඖෂධ ප්‍රතිඵලදායක ද නැත් ද යන්න තවමත් තහවුරු වී නොමැත. HDLP එන්සයිමයට සහ DNMT එන්සයිමයට එරෙහිව නිෂේධක සංයෝගවල නිශේධක සඵලතාවය මෙම අධ්‍යයනය හරහා අනාවරණය විය. පර්යේෂණය ඔස්සේ සිදුකර ගෙන ඇති අනාවරණය කිරීම්වලට අනුව, LBH589, PCI24781 සහ zebularineg අදාළව වැඩිදුර සායනික පර්යේෂණ සහ සායනික පරීක්ෂණ සිදුකිරීම යෝජනා කිරීමේ විභවයක් පවතී.

මෙම පර්යේෂණ කාර්යය ඔස්සේ SCIE ප්‍රකාශන 02ක්, SCIE ප්‍රකාශන නොවන ප්‍රකාශන 02ක්, පර්යේෂණ සන්නවේදන 10ක් සහ දර්ශනපති උපාධි 01ක් ප්‍රතිඵල වී තිබේ.

ප්‍රදාන අංකය : RG/2018/BS/03
ප්‍රධාන විමර්ශක : මහාචාර්ය ජී. ආර්. ඒ. කුමාර, ජාතික මූලික අධ්‍යයන ආයතනය
ව්‍යාපෘතියේ මාතෘකාව : බලශක්ති උත්පාදනය සඳහා කර්මාන්තමය වශයෙන් සාධ්‍ය ක්‍රමවේද මගින් ඉහළ කාර්යක්ෂම හා පාරිසරික වශයෙන් ස්ථායි පෙරොව්ස්කයිට් සූර්ය කෝෂ හා පෙරොව්ස්කයිට් සූර්ය කෝෂ පැනෙල සකස් කිරීම

පෙරොව්ස්කයිට් සූර්ය කෝෂ (PSC) යනු ආලෝකය රැස්කර ගැනීමේ සක්‍රීය පටලය වශයෙන් වර්ණක සංවේදී සූර්ය කෝෂ වෙනුවට බොහෝවිට, පෙරොව්ස්කයිට්වලින් නිර්මාණය වූ, දෙමුහුම් කාබනික, අකාබනික, මිනිරන් හෝ ටින් හේලයිඩ් පාදක ද්‍රව්‍යවල සංයෝගයක් ඇතුළත් සූර්ය කෝෂ ආකාරයකි. PSC වල ධන ආරෝපණය රැගෙන යෑමේ වාහකය (hole) ලෙස Spiro-OMETAD භාවිතා කරන අතර, සියලු විදුලි සම්බන්ධක (back contact) සඳහා රන් (Au) භාවිතා කෙරේ. මෙම ද්‍රව්‍ය ඉතා මිල අධික ය. මෙම අධ්‍යයනයේ දී, එකී ද්‍රව්‍ය සඳහා ආදේශක වන අඩු පිරිවැයකින් යුතු ද්‍රව්‍ය භාවිතා කරන ලදී.

මිනිරන් පතල්වලින් ඉවත් කළ මිනිරන් සහිත කුඩා පාෂාණ භාවිතා කරමින් ප්‍රසාරණය වූ මිනිරන් (EG) සංශ්ලේෂණය කරන ලදී. මෙම අධ්‍යයනයේ දී, රන් වෙනුවට ප්‍රසාරණය වූ මිනිරන් (EG) යොදාගත් අතර, අඩු පිරිවැය සහ සරල ක්‍රම හා නව්‍ය සම්පීඩන ක්‍රමවේදයක් යොදාගෙන සක්‍රීය කරන ලද සක්‍රීය පොල් කටු අඟුරු (ACSC) සහ වී දහයියා පොල් කටු අඟුරුවලින් (ARHC) මිල අධික පොලිමර් ප්‍රතිස්ථාපනය කරන ලදී. 950°C උෂ්ණත්වයේ දී සක්‍රීය කරන ලද ACSC භාවිතා කරමින් නිෂ්පාදනය කරන ලද සූර්ය කෝෂවලින් AM 1.5 වූ හාත්පස තත්ත්ව යටතේ දී ඉහළතම කාර්යක්ෂමතාවය වූ 4.94% ක් පෙන්නුම් කරන ලදී.

උපකරණයේ පවුඩර් පරිවර්තන කාර්යක්ෂමතාවය සහ දිගු කාලීන ස්ථාවරබව වැඩිකිරීම සඳහා පිරිසැකැස්ම සහ සංශ්ලේෂණය වැඩිදියුණු කිරීම පිණිස වැඩිදුර පරීක්ෂණ සිදුකරමින් පවතී.

ප්‍රදාන අංකය : RG/2019/BS/01
ප්‍රධාන විමර්ශක : ආචාර්ය ගයාන් බෝවත්ත, මූලික විද්‍යා අධ්‍යයනාංශය, සම සෞඛ්‍ය පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
ව්‍යාපෘතියේ මාතෘකාව : මහනුවර නගරය සඳහා 3ඩී ත්‍රිමාණ (3ඩී) වායු දූෂණ ආකෘතියක් ගොඩ නැංවීම: සෞඛ්‍ය බලපෑම් ඇගයීම පිණිස වූ වේදිකාව

ශ්‍රී ලංකාව තුළ අවට පරිසරයේ වායු දූෂණය යනු අඩුවෙන් විමර්ශනයට බඳුන්වූ මාතෘකාවකි. සම්මත වායු දූෂණ අධීක්ෂණය මිල අධික වන අතර, ශ්‍රී ලංකාව තුළ එවැනි අධීක්ෂණ මධ්‍යස්ථාන ඇත්තේ ඉතාමත් සුළු සංඛ්‍යාවකි. මනා ක්‍රමාංකනය සහ අඩු පිරිවැය සංවේදන ජාල නඩත්තු ඔස්සේ වායු දූෂණය අධීක්ෂණය කිරීමේ කටයුතුවල අඩුපාඩු මඟහරවා ගැනීම සඳහා ඇතැම් විසඳුම් ලබාදිය හැකි ය.

මෙම ව්‍යාපෘතියේ දී, මහනුවර නගර සභා සීමාවේ 2.5 µm (PM2.5) ට වඩා අඩු අංශුමය ද්‍රව්‍ය මැනීම සඳහා කුඩා සංවේදන ජාලයක් භාවිතා කළ අතර, PM2.5 මැනීම සඳහා ඉහළ විභේදනයකින් යුත් ඉඩම් භාවිතයේ ප්‍රතික්‍රමණ (LUR) ආකෘතියක් ගොඩනංවන ලදී. මුළු ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි පර්යේෂණය ව්‍යාප්ත කිරීම පිණිස මෙම පර්යේෂණය සම්බන්ධිතව සිදුකළ සහයෝගිතාවයන් ඔස්සේ රු. මිලියන 36ක වටිනාකමකින් යුත් ජාත්‍යන්තර ප්‍රදානයක් ලබාගැනීම සාර්ථක කරගැනීමට ප්‍රධාන විමර්ශකට හැකි විය. වායු දූෂණය සඳහා ඉහළ අන්තරායකාරී තත්ත්වයක් ඇති ස්ථානයක් හඳුනාගෙන ඒ ඔස්සේ මහනුවර නගරයේ වායු දූෂණය පාලනය කිරීම සඳහා පර්යේෂණ ප්‍රතිඵල යොදාගත හැකි ය. තව ද, වායු දූෂණය අඩු කිරීම සඳහා අනාගතයේ දී ගනු ලබන පියවරවල සාර්ථකත්වය අධීක්ෂණය කිරීම සඳහා ද මෙම ව්‍යාපෘතිය යොදාගත හැකි ය. වර්ග කි.මීටර් 26කට වැඩි වපසරියක දිවෙන සමස්ත මහනුවර දිස්ත්‍රික්කයේ වායු දූෂණයට අදාළ තොරතුරු ලබාගැනීම සඳහා ඉඩම් භාවිතයේ ප්‍රතික්‍රමණ සිතියම භාවිතා කළ හැකි ය. පුද්ගලික මට්ටමේ දී වායු දූෂණයට නිරාවරණය තක්සේරු කිරීම සඳහා ලිපිනය සහ ඒ සම්බන්ධිත සෞඛ්‍යමය ප්‍රතිඵලවල භූගෝලීය සම්බන්ධකය යොදා ගනිමින් LUR ආකෘතිය භාවිතා කළ හැකි ය.

ප්‍රදාන අංකය : RG/2019/BS/02
ප්‍රධාන විමර්ශක : ආචාර්ය ඩබ්. එම්. ඩී. ජී. බී. විජයරත්න, ක්ෂුද්‍රජීවී විද්‍යා අධ්‍යයනාංශය, වෛද්‍ය පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය
ව්‍යාපෘතියේ මාතෘකාව : පිළිකා රෝගීන්ගේ මුඛයේ ඇති ක්ෂුද්‍රජීවී සංහතියෙන් වෙන්කර ගත් *candida* දිලීර විශේෂවල ලක්ෂණික ගුණ සහ ශ්‍රී ලංකාවේ තෝරාගත් ඖෂධීය ශාකවල *candida* දිලීරවල ක්‍රියාකාරිත්වයට එරෙහි ක්‍රියාකාරිත්වය නාලස්ථව ඇගයීම

මෙම අධ්‍යයනයේ දී, *Candida* දිලීර විශේෂය හේතුවෙන් ඇතිවන candidiasis ආසාදනය හා ආශ්‍රිත සායනික සාධක සහ ජනවිකාස සාධක නිර්ණය කරන ලදී. fluconazole, voriconazole සහ amphotericin B සඳහා වෙන්කරගත් *Candida* විශේෂවල ප්‍රතිදීලීර පාත්‍රතාවය/ ප්‍රතිරෝධිතාවය පරීක්ෂා කරන ලදී. විශේෂය මට්ටම දක්වා සියලු වෙන්කරගත් *Candida* ගණයන් හඳුනාගන්නා ලදී. තෝරාගත් සියලුම ශාක නිස්සාරකවල ප්‍රති-කැන්ඩිඩා ක්‍රියාකාරිත්වය ඇගයීම සිදුකරන ලදී. මුව සේදීමේ දිලීර සකස් කිරීම සඳහා විභවයක් සහිත ශාක නිස්සාරක තෝරාගන්නා ලදී. සායනික සහ ප්‍රජා වශයෙන් වූ වෙන්කරගත් *Candida* විශේෂවල ප්‍රති-දිලීර ප්‍රතිරෝධිතාවය සහ පාත්‍රතාවය පිළිබඳ දත්ත මගින් සායනික වෛද්‍යවරු සහ පර්යේෂකයන්ට ප්‍රතිකාර ක්‍රමවේද අවබෝධ කරගැනීමට හා නව්‍ය ප්‍රතිකාරක ප්‍රවේශ නිර්ණය කිරීම සිදුකළ හැකි ය. මෙම පර්යේෂණ ව්‍යාපෘතිය ඔස්සේ පර්යේෂණ සන්නිවේදන 04ක් සහ ප්‍රතිඵල වූ අතර දර්ශනපති උපාධි 01කට යොමුවීමක් සිදුවී ඇත.

ප්‍රදාන අංකය : ICRP/NSF-NSFC/2019/BS/03
ප්‍රධාන විමර්ශක : මහාචාර්ය කේ. බී. එස්. එන්. ජිනදාස, සිවිල් ඉංජිනේරු අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
ව්‍යාපෘතියේ මාතෘකාව : ශ්‍රී ලංකාවේ නිදන්ගත වකුගඩු රෝගී තත්ත්වයේ බලපෑමට ලක්වූ ප්‍රදේශවල භූගත ජලයේ ද්‍රවණය වූ කාබනික ද්‍රව්‍ය සහ ඉහළ කඨිනත්වය පිරිසිදු කිරීම සඳහා අනවශ්‍ය ද්‍රව්‍ය පටල මත තැන්පත් කරවීමේ යාන්ත්‍රණය සහ අධි පීඩන පටල ක්‍රියාවලි (NF/RO) සහ විද්‍යුත් කාන්දු පෙරීම (ED)

ශ්‍රී ලංකාවේ නිදන්ගත වකුගඩු රෝගී තත්ත්වය (CKDu) යනු ශ්‍රී ලංකාවේ ජාතික සෞඛ්‍ය උපද්‍රවයකි; එසේ වුව ද, මේ දක්වා එම රෝගයට හේතු කාරකයක් හඳුනාගෙන නොමැත. මෙම නිදන්ගත වකුගඩු රෝගී තත්ත්වය උත්සන්න කරන බාහිර සාධක බොහොමයක් පානීය ජලය සමඟ බැඳී පවතින හෙයින්, එකී රෝගය බහුලව ව්‍යාප්ත ප්‍රදේශ සඳහා ආරක්ෂිත පානීය ජලය සැපයීම අතිශයින් වැදගත් වේ. නැනෝ පරිශ්‍රාවණය (NF) සහ ප්‍රති විද්‍යුත් කාන්දු පෙරීම (EDR) වැනි පටලමය තාක්ෂණයන් උපයෝගී කරගනිමින් නිදන්ගත වකුගඩු රෝගී තත්ත්වයේ (CKDu) බලපෑමට ලක් වූ ප්‍රදේශවල භූගත ජලය පිරිපහදු කිරීම මෙම පර්යේෂණය ඔස්සේ විමර්ශනය කරන ලදී. මෙම නිදන්ගත වකුගඩු රෝගී තත්ත්වයේ බලපෑමට ලක් වූ බොහෝ ප්‍රදේශවල භූගත ජලය කඨිනත්වය, ෆ්ලෝරයිඩ්, යකඩ සහ ද්‍රවණය වූ කාබනික ද්‍රව්‍යවලින් බහුලව පවතී. ද්විත්ව විචලන සහ බහු විචලන සහබන්ධයන් නිරීක්ෂණය වෙමින් ද්‍රවණය වූ කාබනික ද්‍රව්‍ය මට්ටම් ඉහළ යෑම තුළින් DOC-Ca, DOC-Mg, DOC-Al සහ DOC- Fe සංකීර්ණ හටගැනීම පෙන්නුම් කෙරෙන අතර, මේවා පටල මත තැන්පත්වන ද්‍රව්‍ය ලෙස ක්‍රියාකරයි. පටලමය පෙරීම ආශ්‍රිත ප්‍රධානතම සීමාවලින් එකක් වනුයේ පටල මත සිදුවන තැන්පත් කිරීම් වන අතර, මෙම අධ්‍යයනයේ දී, ද්‍රවණය වූ කාබනික ද්‍රව්‍ය මට්ටම සහ කඨිනත්වය (කැල්සියම්) පැවතීම මත පටල මත සිදුවන තැන්පත්වීමේ යාන්ත්‍රණ පැහැදිලි කිරීමක් සිදු විය. නැනෝ පරිශ්‍රාවණය (NF) සහ ප්‍රති විද්‍යුත් කාන්දු පෙරීම (EDR) සඳහා වන තත්ත්ව විද්‍යාගාර මට්ටමින් උපයෝගී කරගනිමින් අනවශ්‍ය ද්‍රව්‍ය පටල මත තැන්පත් කරවීමේ අධ්‍යයන සිදුකරන ලදී. නිදන්ගත වකුගඩු රෝගී තත්ත්වය ආවේණික වශයෙන් පවතින ප්‍රදේශයේ භූගත ජලයෙන් ශ්‍රී ලංකාවේ හියුමික් අම්ලය (SLHA) සහ ෆුල්වික් අම්ලය (SLFA) නිස්සාරණය කරගනු ලැබූ අතර, කැල්සියම් පැවතීම යටතේ වාණිජමය වශයෙන් හියුමික් අම්ලය පැවතීම ද සමඟින් අනවශ්‍ය ද්‍රව්‍ය පටල මත තැන්පත් කරවීමේ යාන්ත්‍රණය අධ්‍යයනය කිරීම සඳහා එය යොදාගන්නා ලදී. පටලයේ ක්‍රියාකාරී කාණ්ඩ සමඟ ත්‍රි සංයුක්ත සංකීර්ණ නිර්මාණය කිරීමෙන් අප්‍රතිවර්ත්‍ය ආකාරයෙන් පටල මත තැන්පත්වීම කෙරෙහි කැල්සියම් පැවතීම සුවිශේෂී අයුරින් දායක වේ. අනවශ්‍ය ද්‍රව්‍ය පටල මත තැන්පත් කරවීමේ යාන්ත්‍රණවල විචලනයන් ගවේෂණය සඳහා අවශෝෂිත ද්‍රව්‍ය පටලය ඔස්සේ මුක්ත කරවීමේ පරීක්ෂණ විවිධ පිරිසිදු කිරීමේ කාරක යොදා ගනිමින් සිදුකරන ලදී. හියුමික් අම්ලයේ (SLHA) සහ ෆුල්වික් අම්ලයේ (SLFA) පවතින ව්‍යුහාත්මක වෙනස්කම් හේතුවෙන් එකී අම්ල සඳහා අනවශ්‍ය ද්‍රව්‍ය පටල මත තැන්පත් කරවීමේ යාන්ත්‍රණ සුවිශේෂී ආකාරයෙන් වෙනස් වේ. මීට අමතරව, ප්‍රවර්තන ක්ෂේත්‍ර ප්‍රති-ආස්‍රැතිය හා නැනෝ පරිශ්‍රාවණය විමර්ශනය කරමින් හා තෝරාගත් නැනෝ පරිශ්‍රාවණ ඒකකවල අඛණ්ඩ මෙහෙයුම සඳහා ඒවායේ කාර්යසාධනය විශ්ලේෂණය කරමින් පානීය ජල පිරිපහදු තාක්ෂණයන්ගේ දිගු කාලීන ස්ථාවර ක්‍රියාවලිය පරීක්ෂා කරන ලදී. නිදන්ගත වකුගඩු රෝගී තත්ත්වය ආවේණික වශයෙන් පවතින ප්‍රදේශවල භූගත ජලය පිරිපහදු කිරීම සඳහා නැනෝ පරිශ්‍රාවණය ඵලදායී තාක්ෂණයක් විය හැකි බව පර්යේෂණය මගින් අනාවරණය විය. මෙම පර්යේෂණ කාර්යය ඔස්සේ SCIE ප්‍රකාශන 04ක්, පර්යේෂණ සන්නවේදන 05ක් සහ දර්ශනපති උපාධි 02ක් ප්‍රතිඵල වී තිබේ.

ප්‍රදාන අංකය : RG/2019/BT/01
ප්‍රධාන විමර්ශක : මහාචාර්ය රුපිකා රාජකරුණා, සත්ත්ව විද්‍යා අධ්‍යයනාංශය, විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
ව්‍යාපෘතියේ මාතෘකාව : මධ්‍යම පළාත තුළ කිනිතුල්ලන් ආශ්‍රිතව ව්‍යාප්තිය සිදුවන *rickettsia* බැක්ටීරියා ගණය මගින්

හටගන්නා rickettsioses උණ සහ ආසාදන තත්ත්වය: රෝග කාරකය, පෘෂ්ඨවංශික ආගන්තුක සත්ත්ව ප්‍රජාවේ සංයුතිය, රෝග ව්‍යාධිජනකයන් ව්‍යාප්ත කිරීමට හා පවත්වාගැනීමට උපකාරිවන කිනිතුල්ලන් විශේෂ

මිනිසුන් සහ ගෘහස්ත සතුන් අතර දරුණු රෝගාබාධ සහ මරණයන් පවා ඇතිකරමින් කිනිතුල්ලන් සපාකෑම ඔස්සේ ඇතිවන ආසාදන ගෝලීය වශයෙන් ඉහළ යමින් පවතී. ඔවුන්ගේ වාසස්ථාන අතිපිහිතවීම නිසා වන සතුන් සමඟ පවතින සම්බන්ධතා ඉහළ යෑම, විශේෂයෙන් ගෘහස්තව ඇතිකරන සතුන් විසින් වන සතුන් සමඟ ගැටීම හේතුවෙන් කිනිතුල්ලන් හා එකී සතුන් ආශ්‍රිත ආසාදන මිනිසුන් වෙත ඇතුළුව කිනිතුල්ලන් සපාකෑම ඔස්සේ මිනිසුන් තුළ ඇතිවන ආසාදන තත්ත්වයන් මතු වෙමින් පවතී. මධ්‍යම පළාත තුළ පෘෂ්ඨවංශික සතුන් අතර කිනිතුල්ලන් මගින් ඇතිවන rickettsial ආසාදන පිළිබඳව සහ rickettsial රෝග කාරකයින් ව්‍යාප්තවීම හා නඩත්තුවීම කෙරෙහි කිනිතුල්ලන් විශේෂවල භූමිකාව පරීක්ෂා කිරීමට මෙම අධ්‍යයනය සැලසුම් කරන ලදී. ගෘහස්ත සතුන් (657), වන සතුන් (18) සහ මිනිසුන් (28) මත සිටින සමස්තයක් වශයෙන් කිනිතුල්ලන් 3,087ක් සහ ගෘහස්ත හා වන සතුන්ගේ රුධිර සාම්පල 920ක් රැස් කරන ලදී. rickettsial ආසාදනය පවතින බවට සැක සහිත රෝගීන්ගෙන් චර්ම ජීව පටක සාම්පල හයක් ද ලබාගන්නා ලදී. rickettsial ආසාදන සම්බන්ධයෙන් කිනිතුල්ලන් ඒකරාශීකර ඔවුන්ගේ ලේ ආහාර විශ්ලේෂණය කරන ලදී. Giemsastained slides සහ ඉන් අනතුරුව molecular tools භාවිතා කරමින් සතුන් වෙතින් ලබාගත් රුධිර සාම්පල විශ්ලේෂණය කරන ලදී. rickettsial ආසාදන පැවතීම පරීක්ෂා කිරීම පිණිස නිස්සාරණය කරගත් DNA පීසීආර් පරීක්ෂණයට යොමුකරන ලදී. කිසිදු සාම්පලයක් rickettsial DNA සඳහා ධනාත්මක ප්‍රතිචාර නොදැක්වීය. එබැවින්, සියලු සාම්පලවල කිනිතුල්ලන් සපාකෑම ඔස්සේ ඇතිවන සියලු ආසාදන පරීක්ෂා කිරීම පිණිස පරීක්ෂණයේ අරමුණ පුළුල් කරන ලදී. රැස්කර ගත් සත්ත්ව සාම්පලවල *Babesia, Leishmania, Anaplasma, Hepatazoons, filaria* සහ *Ehrlichia* වැනි බොහෝ රුධිර පරපෝෂිතයන් පවතින බව Geimsastained අඳුන් සහ අණුක විශ්ලේෂණය ඔස්සේ වාර්තා විය. මෙම සතුන් මත බොහෝ පරපෝෂිතයන් වාසය කරන නමුදු, බොහෝ සතුන් විශේෂයෙන් සුවිශේෂී වර්ගයකට අයත් නොවන නිදැල්ලේ සැරිසරන සුනඛයන් විසින් රෝග ලක්ෂණ නොපෙන්වන අතර, රෝග විනිශ්චය සඳහා අඳුන් පමණක් භාවිතා කළහොත් රෝගය අනාවරණය කරගත නොහැකි වනු ඇත. රුධිර සාම්පලවල rickettsial DNA අනාවරණය නොවුන ද, ආසාදනය නොමැති බවට බැහැර කළ නොහැකි අතර, සංශෝධිත පරීක්ෂණ ක්‍රමවේද (protocols) සහ විශාල පරීක්ෂණ නියැදියක් විශ්ලේෂණය කිරීමට පර්යේෂණය මගින් අපේක්ෂා කෙරේ. එසේම, මෙම ආසාදන වසරේ ඇතැම් කාල සීමා තුළ පමණක් පැවතීම සහ පර්යේෂකයින්ට සාම්පල රැස්කිරීමේ දී එසේ ආසාදන තත්ත්වය උත්සන්න වන කාල සීමාව මඟහැරී යෑම සිදුවූවා ද විය හැකි ය.

ප්‍රදාන අංකය : RG/2019/BT/02
ප්‍රධාන විමර්ශක : ආචාර්ය තුසිත වික්‍රමසිංහ, ජෛව රසායන සහ සායනික රසායන විද්‍යා අධ්‍යයනාංශය, වෛද්‍ය පීඨය, කැළණිය විශ්වවිද්‍යාලය
ව්‍යාපෘතියේ මාතෘකාව : ඇප්ටමර්ස් තෝරාගැනීම පිණිස SELEX ප්‍රශස්තකරණය හා SELEX අධීක්ෂණය සඳහා නව්‍ය තත්‍ය කාල PCR පදනම් ප්‍රවේශය ඇගයීම

ප්‍රතිදේහවල ප්‍රයෝජනවත්බව හමුවේ වුව ද, ඒවායේ නිෂ්පාදනය, විශේෂයෙන් වාණිජ මට්ටමින් ප්‍රතිදේහවල නිෂ්පාදනය යනු ඉතා මිල අධික ක්‍රියාවලියක් වන අතර, එමගින් ප්‍රතිදේහ යනු මිල අධික අණුක ප්‍රතික්‍රියාකාරකයක් බවට පත්කරයි. "ඇප්ටමර්ස් (Aptamers)" යනු සංශ්ලේෂිත අණු විශේෂයක් වන අතර, අනාවරක අණු වශයෙන් සාම්ප්‍රදායික ප්‍රතිදේහ ප්‍රතිස්ථාපනය සඳහා මේවායේ පවතින හැකියාව හේතුවෙන් මෑත කාලීනව මෙම ඇප්ටමර්ස් කෙරෙහි අවධානය යොමුවිය. කෘත්‍රිම වශයෙන් සංශ්ලේෂිත ප්‍රවේශයක් ඔස්සේ පූර්ණ වශයෙන් නිපදවීමේ පහසුව මෙම ඇප්ටමර්ස් සතු වන හෙයින්, ඒවායේ නිෂ්පාදනය බොහෝ දුරට පිරිවැය ඵලදායි වේ. තව ද, මෙම අණු සතුව දිගු කල්තබා ගැනීමේ කාල සීමාවක් පවතින අතර, උෂ්ණත්ව විචලනයන් සඳහා ප්‍රතිරෝධිතාවයක් දැක්වීම, සහ රසායනිකව වෙනස්කිරීමේ හැකියාවක් ද පවතී. එම කරුණු හේතුවෙන් මෙම ඇප්ටමර්ස් යනු සාම්ප්‍රදායික ප්‍රතිදේහ සඳහා සැබෑ ආදේශකයකි. සායනික චිකිත්සක කටයුතුවල සිට පරිසර දූෂක හඳුනාගැනීම දක්වා විහිදෙන විවිධ හඳුනාගැනීම් කටයුතු සඳහා භාවිතාවන ඩොලර් මිලියන ගණනක ව්‍යාපාරයක් බවට මෙය පත්වී තිබේ. බොහෝ රටවල් මෙම ක්ෂේත්‍රයේ පර්යේෂණවල නියැලෙන අතර, සුවිශේෂී ප්‍රගතියක් ද අත්පත් කරගෙන තිබේ. ශ්‍රී ලංකාව තුළ මෙම අදාළ තාක්ෂණය පැවතුණ ද, ඇප්ටමර්ස් සම්බන්ධිත පර්යේෂණ අභාවිත ක්ෂේත්‍රයක් වශයෙන් පවතී. මෙම ව්‍යාපෘතියේ දී, ශ්‍රී ලංකාව තුළ ප්‍රථම වරට ඇප්ටමර්ස් වැඩිදියුණු කිරීමේ වේදිකාවක් ස්ථාපනය කිරීමට මූලික ප්‍රයත්නයන් දරන ලදී. මෙම ක්‍රියාවලිය තුළ දී, සෑම පියවරකදීම නිශ්චිත අධීක්ෂණයක් අවශ්‍ය වන අතර, ඇප්ටමර්ස් වැඩිදියුණු කිරීම් සිදුකිරීමේ අධීක්ෂණ ක්‍රමවේදවල නව්‍ය සංයෝජනයක් පර්යේෂකවරු විසින් යෝජනා කර තිබේ. අවසානයේ දී, පරිගණක සහාය සහිත ගණනය කිරීමක් මත පදනම්ව සංසන්දනාත්මක බන්ධුතා සමඟ ඇල්බියුමින් බන්ධිත ඇප්ටමර්ස් එකක් පර්යේෂකවරු විසින් හඳුනාගෙන තිබේ. තෝරාගත් ඇප්ටමර්ස් වල ප්‍රායෝගික වශයෙන් ලෝකය තුළ උපයෝගිතාවය පිණිස වාසිදායකබව සහතික කිරීම සඳහා විද්‍යාගාර මත පදනම් දැඩි බන්ධන ක්‍රමවේද සම්බන්ධයෙන් සලකා බැලීම මෙම ව්‍යාපෘතියේ ඊළඟ අදියරේ අපේක්ෂාව වේ. සාරාංශයක් වශයෙන් සැලකූ විට, මෙම ව්‍යාපෘතිය ඔස්සේ ශ්‍රී ලංකාව තුළ ප්‍රථමවරට ඇප්ටමර්ස් වැඩිදියුණු කිරීමේ මූලික වේදිකාවක් සාර්ථක අයුරින් ස්ථාපනය කර තිබේ. ඉතා මිල අධික ප්‍රතිදේහ ආනයනය කිරීමේ අවශ්‍යතාවය අවම කරමින්, ඇප්ටමර්ස් වාණිජ වශයෙන් වැඩිදියුණු කිරීම සඳහා මෙය වැඩිදුරටත් දියුණු කිරීමට හා උපයෝගී කරගැනීමට මෙමගින් අපේක්ෂා කෙරේ.

ප්‍රදාන අංකය : RG/GAPF/2021/EB/02
ප්‍රධාන විමර්ශක : මහාචාර්ය එම්. එම්. පත්මලාල්, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ව්‍යාපෘතියේ මාතෘකාව : පානීය ජලයේ ජියොස්මින්, 2-මෙතිලිසෝබෝර්නියෝල්, සයනෝටොක්සින් හා ප්‍රතිජීවක ඉවත් කිරීම සඳහා වැඩිදියුණු කළ ගෘහස්ත ජල ෆිල්ටරයේ නිෂ්පාදනය ඉහළ නැංවීම

ලෝකයේ වැඩිවෙමින් පවතින ජනගහනය සඳහා පිරිසිදු, අපවිත්‍ර ද්‍රව්‍යවලින් තොර පානීය ජලය සැපයීම සඳහා ජල නියෝජිතායතන නිරන්තර අරගලයක නිරතව සිටී. ජලය සමඟ බැඳී ඇති සෞඛ්‍යමය ප්‍රතිලාභ සම්බන්ධයෙන් මූලික අවධානය යොමුකළ යුතු වුව ද, ජලයේ ඇති සංවේද්‍ය සිත් ඇදගන්නා සුළු ස්වභාවය මත පදනම්ව පුද්ගලයන් බොහෝවිට ජලයේ ගුණාත්මකභාවය ඇගයීම සිදු කෙරේ. නොකඩවා පවතින එක් ගැටලුවක් වනුයේ පානීය ජලය සඳහා පාංශුමය පුස් රසයක් හා ගන්ධයක් ලබාදෙන සංයෝග පැවතීම වන අතර විශේෂයෙන් ජියොස්මින්, 2-මෙතිලිසෝබෝර්නියෝල් මීට අයත් වේ. ජියොස්මින්, 2-මෙතිලිසෝබෝර්නියෝල් යනු සයනොබැක්ටීරියා හා ඇසිටොනෝමයිසිටීස් වැනි ජලීය ක්ෂුද්‍රජීවීන්ගේ අතුරු නිෂ්පාදන වේ. මානව සෞඛ්‍ය වෙත සැලකිය යුතු අවදානමක් ඇතිකරමින් සයනොබැක්ටීරියා විසින් සයනෝටොක්සීන්, සිලින්ඩ්‍රොස්පර්මොප්සින් (CYN), සහ මයික්‍රෝසිස්ටීන්-එල්ආර් (MC-LR) වැනි සංයෝග නිපදවීම සිදුකරයි. අක්මාවට හානි කරන හෙපටොටොක්සීන් හා සෛලවලට විෂ සහිත බලපෑම් ඇති කරන සයිටෝටොක්සින් වශයෙන් මෙම ද්‍රව්‍ය හඳුන්වා තිබුණ ද, 100°C උෂ්ණත්වයකට රත් කළ ද මේවා විනාශ නොවේ. එබැවින්, MC-LR (1.0g/L) සහ CYN (2.0g/L) වශයෙන් ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් පානීය ජලයේ මෙම ද්‍රව්‍ය පැවතිය යුතු නිර්දේශිත මට්ටම් ස්ථාපනය කර තිබේ. එසේ වුව ද, අනුගමනය කරනු ලබන සාම්ප්‍රදායික ජල පිරිපහදු තාක්ෂණික ක්‍රම මගින් පිරිපහදු කිරීමට බඳුන් කරන ජලයේ ඇති ද්‍රවණය වූ බහිස්සෛලීය ජියොස්මින්, 2-මෙතිලිසෝබෝර්නියෝල්, සයනෝටොක්සීන් සහ අනෙකුත් දූෂක; පලිබෝධනාශක, බැර ලෝහ, සහ ප්‍රතිජීවක ඉවත් නොවේ. ශ්‍රී ලංකාවේ සංදර්භය තුළ, දැනට කෙරී ඇති පර්යේෂණ පිළිබඳ පත්‍රිකා සහ දැනට කෙරීගෙන යමින් පවතින පර්යේෂණ මගින් පෙන්වා දෙනුයේ ජියොස්මින්, 2-මෙතිලිසෝබෝර්නියෝල්, සයනෝටොක්සීන් සහ අනෙකුත් කාබනික සහ අකාබනික දූෂක පානීය ජල ප්‍රභවවල මතුපිට ජලයේ සහ භූගත ජලයේ පවතින බව යි. එබැවින්, විවිධ ජල ප්‍රභවවල ගන්ධය හා රසය ඇතිකරන සංයෝග, සයනෝටොක්සීන්ස්, පලිබෝධනාශක, බැර ලෝහ සහ ප්‍රතිජීවක ඉවත්කිරීම සඳහා ප්‍රකාශ උත්ප්‍රේරිත හායනය සහ අවශෝෂණ තාක්ෂණයන් උපයෝගී කරගන්නා ගෘහස්ත ජල ෆිල්ටර වැඩිදියුණු මට්ටමට පත්කිරීම සහ වාණිජකරණය මෙම අධ්‍යයනයේ දී අරමුණු විය. ෆිල්ටරය සඳහා කාර්මික සැලසුමක් සමඟින් සකස් කළ ජල ෆිල්ටරයේ නිෂ්පාදනය වැඩිදියුණු කිරීම ද පර්යේෂණ කණ්ඩායම විසින් සාර්ථක ආකාරයෙන් සිදුකරන ලදී.



රූප සටහන 12: වැඩිදියුණු කළ ජල ෆිල්ටරය

ප්‍රදාන අංකය : RG/2017/EB/03
ප්‍රධාන විමර්ශක : මහාචාර්ය එම්. ඩී. අමරසිංහ, උද්භිද විද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය
ව්‍යාපෘතියේ මාතෘකාව : බූන්දල ප්‍රදේශයේ මිනිස් හා ජෛව තෙත් බිම් සංරක්ෂිතවල දී හම්බු පන් (*Typha angustifolia*) විශේෂයේ ආක්‍රමණය පාලනය කිරීම සඳහා ප්‍රජා පාදක කළමනාකරණ ක්‍රමෝපායක් වැඩිදියුණු කිරීම

එකී ශාකයේ පරිසර විද්‍යාව, එහි වර්තමාන හා විභව්‍ය භාවිතයන් පිළිබඳව අධ්‍යයන සංක්‍රමණික පක්ෂීන් ශීත සෘතුවේ පැමිණෙන බිම් සඳහා බලපෑම් ඇතිකරමින්, මාලු දැල්/ ඇමවල් එළීම සඳහා පවතින විවෘත නිරාවරණ ජල ප්‍රදේශවල වපසරිය අඩුවීම මගින් එම කටයුතුවල නිරත පිරිස්වල ප්‍රධාන ජීවනෝපාය වෙත බලපෑම් ඇතිකරමින්, ශ්වසන පද්ධතිය

ආශ්‍රිත සෞඛ්‍ය තත්ත්වය කෙරෙහි බලපෑම් ඇතිකරමින්, විශේෂයෙන් සුළඟ මගින් විසිරෙන මල්/බීජ හේතුවෙන් ළමුන් කෙරෙහි බලපෑමක් ඇතිකරමින් *Typha angustifolia,* (හම්බු පන්) නැමති කිවුල් ජලයේ වැඩෙන පැලෑටිය බොහෝ දුරට ආක්‍රමණශීලි මට්ටමකට ව්‍යාප්ත වීමෙන් බූන්දල තෙත් බිම් සංරක්ෂිතයේ එඹිලිකල සහ මලාල කලපු කලාපීය ලවණ මිශ්‍රිත තෙත්බිම් ස්වරූපයෙන් ස්ථිර මිරිදිය තෙත්බිම් ස්වරූපයට මෑතකාලීනව වෙනස් වී තිබේ. එබැවින්, තෙත් බිම්වල ජෛව ආධාරක ක්‍රියාවලි සහ කාර්යයන්වල තිරසාරත්වය පවත්වාගැනීම පිණිස එහි පාලනය ප්‍රමුඛතාවය ලබාදිය යුතු තත්ත්වයක් වශයෙන් සැලකේ. මෙම ශාකයේ ව්‍යාප්ත වීම පාලනය කිරීම සඳහා උපයෝගිතා ක්‍රමෝපායක් වැඩිදියුණු කිරීමේ අදහසින් තෙත් බිම්වල භූ ජලයේ ඇතිවූ වෙනස සඳහා හේතු වූ මෙහෙයැවීම්, ජලීය මහා ශාඛ, විශේෂයෙන් මෙම තෙත් බිම්වල ආක්‍රමණශීලී ශාකයක් වූ *T. angustifolia* හටගැනීම සඳහා එහි බලපෑම හඳුනාගැනීම මෙම අධ්‍යයනය මගින් අරමුණු විය. පුෂ්පීය, ඒකල, සහ ගහණ මට්ටම්වල චක්‍රීය හා සෘතුමය ස්වභාවික සංසිද්ධීන් අධ්‍යයනය, පරාග සහ බීජ ජීව විද්‍යාව, අභිජනන ක්‍රමවේදය සහ පාරිසරික වෙනස්වීම් සඳහා එහි අනුගතබව ඇතුළුව *Typha* හි සාපේක්ෂ වශයෙන් ඉහළ ආක්‍රමණශීලි විභවය මෙම ප්‍රජනන ජීව විද්‍යා හා ජීවන චක්‍රය පිළිබඳ පර්යේෂණ අධ්‍යයනවලින් අනාවරණය විය. මෙම වෙනස් වූ භූ ජලය සඳහා හේතුව ඉහළ ගිය වර්ෂාපතනය නොව, බූන්දල තෙත් බිම්වලට ආසන්නතම ජල පෝෂක වෙත 1980 දශකයේ මැදභාගයේ සිට කෘෂිකාර්මික ජලය වාරිමාර්ග ඔස්සේ මුදා හැරීම බවට 1988 සිට 2019 වර්ෂය දක්වා (වසර 30) වූ කාල පරාසයේ දත්ත සමඟින් බූන්දල ප්‍රදේශයේ වර්ෂාපතන රටාව විශ්ලේෂණය මගින් අනාවරණය විය. කලපු භූමිය තුළ සහ අවට *T. angustifolia* පැතිරීම නිරීක්ෂීම සඳහා 2005 සිට 2019 දක්වා කාල සීමාව තුළ තෙත් බිම්වල ඉහළ විභේදනයකින් යුතු චන්ද්‍රිකා ඡායාරූප විශ්ලේෂණය කරන ලද අතර මිරිදිය ජලයේ වැඩෙන ජලීය මහා ශාකවල ව්‍යාප්තිය ඔස්සේ තෙත් බිම්වල විවෘත ජල ප්‍රදේශ ක්‍රම ක්‍රමයෙන් අඩුවීම සහ *Nymphea stellata* ශාකය මගින් වැසී ඇති ප්‍රදේශය ඔග'බටමිඑසදෙකස් ශාකය මගින් වැසී ඇති ප්‍රදේශය ඉක්මවා යන බව ද එමගින් අනාවරණය විය. මෙම තෙත් බිම්වල ජලීය මහා ශාකවල සුලභතාවය සහ ව්‍යාප්තිය සඳහා හේතුවන ප්‍රධාන සාධකය මලාල-එඹිලිකල කලපු වෙත වාරි ක්‍රම ඔස්සේ ගලා එන ජලය සමඟින් පෝෂණ ද්‍රව්‍ය ගලා ඒම බවට මෙම අධ්‍යයනය මගින් අනාවරණය වූ කරුණුවලින් සනාථ විය. මත්ස්‍යයින් සහ උරගයන් (කිඹුලන්) සඳහා පෝෂණය, අභිජනනය හා වාසස්ථාන පරිසරය සැපයීම සඳහා *T. angustifolia* පැවතීම දායකවන බව කලපුවල මත්ස්‍යයින්ගේ විවිධත්වය සහ සුලභතාවය පිළිබඳව සිදුකළ සොයාගැනීම්වලින් අනාවරණය විය. සුපෝෂක තත්ත්වය අවම කිරීමට සහ පසෙහි පවතින කාබන් වෙන් කිරීම සඳහා *Typha* ශාකයේ දායකත්වය සැලකිය යුතු මට්ටමක පවතී. ග්‍රාමීය ප්‍රජාවන් විසින් කවර ආකාරයකින් හෝ දැනට *Typha* භාවිතා නොකරන හෙයින්, එය ආහාරයක් සහ අමුද්‍රව්‍යයක් වශයෙන් භාවිතා කිරීමේ විභවය සම්බන්ධයෙන් පරීක්ෂා කරන ලද අතර, පෝෂණීය ආහාර ද්‍රව්‍ය, අතින් නිමකරන කඩදාසි, වියන ලද උපයෝගිතා සහ අලංකරණ භාණ්ඩ සහ ද්‍රව කාබනික පොහොර නිෂ්පාදනය කිරීම වැනි නව ජීවනෝපාය ආරම්භ කිරීම සඳහා අමුද්‍රව්‍යයක් වශයෙන් මෙය සැපයිය හැකි බව අනාවරණය විය. මිනිසා සහ ජෛව ගෝලය සංකල්පය (MAB concept) එනම් මානව සුබසාධනය ඔස්සේ පරිසර සංරක්ෂණය යොදා ගැනීම සඳහා ආදර්ශයක් වශයෙන් යෝග්‍ය වන්නා වූ මෙම තෙත් භූමිවල පවතින *T. angustifolia* ක්‍රමානුකූල ආකාරයෙන් උපයෝගී කරගනිමින් එහි ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා ප්‍රජා පාදක කළමනාකරණ ක්‍රමෝපායක් යෝජනා කෙරේ.

වාරිමාර්ග කටයුතු හේතුවෙන් වෙනස් වූ භූ ජලය මගින් *T. angustifolia* සඳහා හිතකර නව වාසස්ථානයක් නිර්මාණය කළ නමුදු, මෙම භූ ජල වෙනස්වීම්වලට යටත්ව තෙත් බිම්වල කොලනි ගත වූ අනෙකුත් ජලජ මහා ශාක සාර්ථක අයුරින් අභිබවා යෑමක් ද සිදු නොවූ බව මෙම වර්තමාන අධ්‍යයනය මගින් සිදුකළ සොයා ගැනීම්වලින් අවධානයට ලක්කෙරේ. එබැවින්, ආක්‍රමණශීලි ශාකයකට වඩා තෙත් බිම්වල වෙරළාසන්න ප්‍රදේශවල මිරිදිය/කිවුල් දිය ජලයේ ප්‍රබල කොලනිගත ශාකයක් වශයෙන් වඩාත් තථ්‍ය ලෙස *T. angustifolia* වර්ගීකරණය කළ හැකි ය. මෙම පර්යේෂණ කාර්යය ඔස්සේ පර්යේෂණ සන්නිවේදන 12ක් කරා යොමුවී තිබේ.

ප්‍රදාන අංකය : NSF-PSF/ICRP/2017/EA & ICT/01

ප්‍රධාන විමර්ශක : මහාචාර්ය කේ. විග්නාරූබන්, භෞතික විද්‍යා අධ්‍යයනාංශය, ඉංජිනේරු පීඨය, යාපනය විශ්වවිද්‍යාලය

ව්‍යාපෘතියේ මාතෘකාව : ද්විතීක සෝඩියම් අයන බැටරි සහ ඉන්ධන කෝෂවල ප්‍රෝටෝන හුවමාරු පටල සඳහා නව්‍ය ද්‍රව්‍ය

මෙම ව්‍යාපෘතිය සෝඩියම් අයන් බැටරි (SIBs) සහ ඉන්ධන කෝෂවල ප්‍රෝටෝන හුවමාරු පටල (PEMFCs) සඳහා නව්‍ය ද්‍රව්‍ය සකස් කිරීම සම්බන්ධයෙනි. සෝඩියම් සුලභ වශයෙන් පැවතීම හේතුවෙන්, මිල අධික ලිතියම් අයන් බැටරිවල රසායන සංයුතියට ආදේශකයක් වශයෙන් සෝඩියම් අයන් බැටරි (SIBs) නැඟී එමින් පවතී. එසේ වුව ද, Li+ අයනවලට සාපේක්ෂව Na+ අයනවල විශාලත්වය හේතුවෙන් සෑහෙන තරමේ අවට පරිසරයේ අයනික සන්නායකතාවයක් සහිත ඉලෙක්ට්‍රෝලයිට් වැඩිදියුණු කිරීම ප්‍රධාන අභියෝගයකි. මෙම ව්‍යාපෘතියේ දී, පර්යේෂණ කණ්ඩායම විසින් සෝඩියම් අයන් බැටරි (SIBs) සඳහා පොලිමර් ඉලෙක්ට්‍රෝලයිට් සංශ්ලේෂණය කර එහි ස්වභාවය විස්තර කරන ලදී. ඉන්ධන කෝෂවල ප්‍රෝටෝන හුවමාරු පටල (PEMFCs) එහි වාසි කිහිපයක් හේතුවෙන් බොහෝ ජනප්‍රිය වී ඇති නමුදු පුළුල් වශයෙන් යොදා ගැනීම සඳහා පවතින ප්‍රධාන බාධකය වනුයේ ප්ලැටිනම් පාදක උත්ප්‍රේරකවල ඉහළ පිරිවැයයි. PEMFCs සඳහා වඩාත්ම වැදගත් ප්‍රතික්‍රියා වනුයේ ඔක්සිහරණ ප්‍රතික්‍රියාව (ORR) සහ ඔක්සිකරණ ප්‍රතික්‍රියාව (OER) යි. මෙම ව්‍යාපෘතියේ දී, Zeolitic Imidazolate Frameworks (ZIFs) වලින් ව්‍යුත්පන්න කරගන්නා N-doped carbon nanotube (CNT) ඉලෙක්ට්‍රෝ උත්ප්‍රේරක වශයෙන් සංශ්ලේෂණය සහ වර්ගීකරණය කෙරේ. මෙම පර්යේෂණ කාර්යය ඔස්සේ SCIE ප්‍රකාශන 03ක් ප්‍රතිඵල වී තිබෙන අතර දර්ශනපති උපාධි 01 කට හා විද්‍යාපති උපාධි 01 කට යොමුවීමක් සිදුවී ඇත.

ප්‍රදාන අංකය : NSF-PSF/ICRP/2017/EA & ICT/03
ප්‍රධාන විමර්ශක : ආචාර්ය එන්. ගුණවර්ධන, භෞතික විද්‍යා අධ්‍යයනාංශය, විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
ව්‍යාපෘතියේ මාතෘකාව : ලිතියම් අයන් බැටරි සහ සූර්ය කෝෂ සඳහා නැනෝ අංශු/ ග්‍රැෆීන් පාදක නව්‍ය ද්‍රව්‍ය

මෙම පර්යේෂණයේ දී, ඔක්සිහෘත ග්‍රැෆීන් ඔක්සයිඩවල විවිධ ප්‍රභේද (RGOs) සංශ්ලේෂණය කිරීම සඳහා ඔක්සිකරණ ක්‍රියාවලිය පාලනය කරමින් ශ්‍රී ලංකාවේ ස්වාභාවික මිනිරන් සාර්ථක අයුරින් භාවිතා කරන ලද අතර ලිතියම් අයන් බැටරි (LIBs) සඳහා ඇනෝඩයක් ලෙස සාර්ථකව භාවිතා කළ හැකි ටයිටේනියම් ඩයොක්සයිඩ්/ග්‍රැෆීන් සංයෝජිත ද්‍රව්‍යයක් සංශ්ලේෂණය කරන ලදී. ලිතියම් අයන් බැටරි (LIBs) යනු විශිෂ්ට බලශක්ති ඝනත්ව අගයන් සහිත ඉතා නවීන මට්ටමේ නැවත ආරෝපණය කළ හැකි බැටරි වේ. එම ලිතියම් අයන් බැටරිවල කාර්යසාධනය වැඩිදියුණු කිරීම පිණිස, නැනෝ-ලෝහ ඔක්සයිඩ්/ග්‍රැෆීන් පාදක ඉලෙක්ට්‍රෝඩ නිර්මාණය කිරීම සඳහා සංශ්ලේෂිත ග්‍රැෆීන් විවිධ ලෝහ ඔක්සයිඩ සමඟ පරීක්ෂා කරන ලදී. නැනෝ පරිමාණික තඹ ආලේපිත ග්‍රැෆීන් යොදාගන්නා සූර්ය කෝෂවල පසුපැත්ත සඳහා නව්‍ය ද්‍රව්‍යයක් හඳුන්වාදෙමින් CdS/CdTe තුනී පටලමය සූර්යකෝෂ ප්‍රශස්ත කිරීම ද මෙම පර්යේෂණය ඔස්සේ අපේක්ෂා කෙරිනි. මෙම පර්යේෂණ කාර්යය ඔස්සේ SCIE ප්‍රකාශන 04ක්, පර්යේෂණ සන්නවේදන කිහිපයක් ප්‍රතිඵල වූ අතර දර්ශනපති උපාධි 02කට යොමුවීමක් සිදුවී ඇත.

ප්‍රදාන අංකය : RG/Covid2020/HS/01
ප්‍රධාන විමර්ශක : මහාචාර්ය පී. බී. ආර්. දිසානායක, ඉංජිනේරු පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
ව්‍යාපෘතියේ මාතෘකාව : බෝවෙන රෝග සම්බන්ධිතව නව්‍ය ආකාරයේ රූකවරණ රෝහල් ගොඩනැගිලි ඉදිකිරීමේ කටයුතු

ව්‍යසන තත්ත්වයක මුල් අදියරවල දී මිනිසුන්ගේ ජීවිත මරණයෙන් බේරා ගැනීම සඳහා රූකවරණ රෝහල් ප්‍රමාණවත් සංඛ්‍යාවක් පැවතීම ඔස්සේ සුවිශේෂී බලපෑමක් ඇතිවිය හැකි බවට වන කාරණය කොවිඩ්-19 වසංගත තත්ත්වය මගින් වැඩිදුරටත් අවධාරණය විය. වෛද්‍ය පහසුකම්, රෝග අධීක්ෂණය, ආහාර, රූකවරණය සහ සමාජ ක්‍රියාකාරකම් සපයන අතරම බෝවෙන රෝගයක සුළු මට්ටමේ සිට මධ්‍යම මට්ටම දක්වා රෝග ලක්ෂණ පෙන්නුම් කරන රෝගීන් ඔවුන්ගේ පවුල්වලින් හා ප්‍රජාව වෙතින් වෙන්කර තැබීම සඳහා එවැනි සෞඛ්‍ය සත්කාරක පහසුකම් භාවිතා කළ හැකි ය. ව්‍යසන අවස්ථාවක දී කෙටි දැනුම් දීමකින් සහ ව්‍යසනයකින් පසුව දිගු කාලීන යන අවස්ථා දෙකෙහිදීම ඔබින වාසස්ථාන සැපයීම ඔස්සේ සෞඛ්‍ය අංශයේ අවශ්‍යතා සපුරාලීම පිණිස අර්ධ-තාවකාලික ගොඩනැගිලි සඳහා නව්‍ය විසඳුම් පිළිබඳව පර්යේෂණ කිරීම හා වැඩිදියුණු කිරීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ. අවම කාලයකින් ගොඩනැංවීම සමඟින් දේශගුණික තත්ත්ව, දේශීයව සපයා ගත හැකි අමුද්‍රව්‍ය පැවතීම, පිරිවැය සීමා සහ සැපයුම් අවශ්‍යතා සුසංවිධිත කරමින් ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල මේවා ගොඩනැංවීම අවධානයට යොමුකරමින් මෙම ආකෘතිගත රූකවරණ රෝහල්වල ගොඩනැගිලි ඉදිකරනු ලැබේ. එක් මූලාකෘතියක් සකස් කර ඇති අතර, අනෙකුත් සැලසුම් ආකෘති හා විශ්ලේෂණ බොහෝ සංඛ්‍යාවක් මත පදනම් වී ඇත. මෙම යෝජිත රූකවරණ රෝහල් ආකෘතිය ඕනෑම හදිසි ව්‍යසනකාරී අවස්ථාවකට ප්‍රයෝජනවත් නිමැවුමක්ය යන අපේක්ෂාව සමඟින් මෙකී කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී.

ප්‍රදාන අංකය : RG/Covid2020/HS/02
ප්‍රධාන විමර්ශක : ආචාර්ය මුරුගදාස් තනිහායිචෙල්වන්, භෞතික විද්‍යා අධ්‍යයනාංශය, විද්‍යා පීඨය, යාපනය විශ්වවිද්‍යාලය
ව්‍යාපෘතියේ මාතෘකාව : SARS-CoV-2 මගින් හටගන්නා කොවිඩ් -19 රෝගය කඩිනමින් නිශ්චය කරගැනීම සඳහා ඉලෙක්ට්‍රොනික් හඳුනාගැනීමේ පද්ධතියක් සකස් කිරීම

ආසාදන තත්ත්වය ව්‍යාප්තවීම පාලනය කිරීම පිණිස රෝගීන් තුළ පවතින උග්‍ර තීව්‍ර ශ්වසන සහලක්ෂණ කොරෝනා වයිරස 2 (SARS-CoV-2) කඩිනමින් හඳුනාගැනීම ඉතා වැදගත් වේ. මෙම ව්‍යාපෘතියේ දී, SARS-CoV-2 වයිරසය වරණීය වශයෙන් හඳුනාගැනීම සඳහා carbon nanotube (CNT) field- effect transistor (FET) පාදක කරගත් ජෛව සංවේදකයක් වැඩිදියුණු කරන ලදී. නම්‍යශීලී Kapton උපස්තරයක් මත CNT FET සකස් කරන ලද අතර, CNT වෙත යොමුකළ ප්‍රතිවර්තන SARS-CoV-2හි RNA-dependent RNA polymerase ජාන අනුක්‍රමයක් යොදාගනිමින් සංවේදකය ගොඩ නංවන ලදී. සංශ්ලේෂිත ධන සහ පාලක ඉලක්කගත අනුක්‍රමයක් මත ජෛව සංවේදක පරීක්ෂා කරන ලදී. SARS-CoV-2 හඳුනාගැනීම සඳහා රෝග විනිශ්චය මෙවලමක් ලෙස CNT FET පාදක ජෛව සංවේදක යොදාගත හැකි බව මෙම අධ්‍යයනය තුළින් ලැබූ අපේක්ෂා සහගත ප්‍රතිඵල මගින් යෝජනා කෙරේ. කහටගහ පතලෙන් ලබාගත් ශ්‍රී ලංකාවේ මිනිරන් නිධි භාවිතා කරමින් මෙම සංවේදක නිපදවීම සඳහා ද ප්‍රයත්න දැරේ. SARS-CoV-2 වයිරසය හඳුනාගැනීම සඳහා විභව්‍ය මූලික ජෛව සංවේදකයක් මෙම ව්‍යාපෘතිය ඔස්සේ නිපදවන ලදී. ඩෙංගු වැනි අනෙකුත් වයිරස කඩිනමින් හඳුනාගැනීම සඳහා ද මෙම තාක්ෂණය තවදුරටත් වැඩිදියුණු කළ හැකි වනු ඇත.

ජාතික විද්‍යා පදනමේ තාක්ෂණ ප්‍රදානයන්

ප්‍රදානයට අදාළ මාතෘකා : පහතරට ප්‍රදේශවල "මධ්‍ය පරිමාණ පොලිටනල්" සහ ගෘහස්ත ගෙවතු වගා කිරීමේ ඒකකවල දී මධ්‍ය කඳුකර එළවළු වගා කිරීම සඳහා දැනටමත් සකස් කර ඇති IoT පාදක ආරක්ෂිත ගෘහස්ත ස්වයංක්‍රීයකරණ පද්ධතිය වැඩිදියුණු කිරීම
ප්‍රදානයට අදාළ අංකය : TD/2020/COVID/AG/01
ප්‍රදානලාභියා : ආචාර්ය කේ. කේ. එල්. බී. අදිකාරම්, පරිගණක ඒකකය, කෘෂි විද්‍යා පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකාවේ, නවීකරණය කළ ආරක්කු හැඩයේ (ගෝලාර්ධ/ බැරල හැඩය) ආරක්ෂිත ගෘහ බොහෝ ප්‍රදේශවල භාවිතා වේ. සම්පූර්ණ වශයෙන්ම ආවරණය කළ පොලිතීන් පටලය හේතුවෙන් ටනලය තුළ උණුසුම් වායුව සංසරණය වේ. පහතරට ප්‍රදේශවල "මධ්‍ය පරිමාණ පොලිටනල්" සහ ගෘහස්ත ගෙවතු වගා කිරීමේ ඒකකවල දී මධ්‍ය කඳුකර එළවළු වගා කිරීම සඳහා දැනටමත් සකස් කර ඇති IoT පාදක ආරක්ෂිත ගෘහස්ත ස්වයංක්‍රීයකරණ පද්ධතිය වැඩිදියුණු කිරීම මෙම ව්‍යාපෘතිය මගින් අරමුණු වේ. පාලිත පරිසරයක් යටතේ මධ්‍ය කඳුකර එළවළු වර්ග (සලාද පිපිඤ්ඤා, ගෝවා, බෙල් පෙපර්, සහ කෝලිෆ්ලා) පහතරට ප්‍රදේශවල වගා කිරීම මගින් එළවළු සැපයුම්දාමය සඳහා විසඳුමක් ලබාදීම සහ පසු-අස්වනු හානිය අවම කිරීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන නිමැවුම් වශයෙන් හඳුනාගෙන ඇත.

ප්‍රදානයට අදාළ මාතෘකා : පරිසර හිතකාමී කෘෂිකාර්මය හරහා එළවළු නිෂ්පාදනය කිරීම පිණිස ජෛව පොහොර
ප්‍රදානයට අදාළ අංකය : TD/2020/COVID/AG/02
ප්‍රදානලාභියා : මහාචාර්ය ආනන්ද කුලසූරිය, ජාතික මූලික අධ්‍යයන ආයතනය

ජාතික මූලික අධ්‍යයන ආයතනය විසින් ජෛව ප්‍රතික්‍රියාකාරක බඳුන් දෙකක්, එම බඳුන් ආනයනය සඳහා වැයවන පිරිවැයෙන් අඩකටත් වඩා අඩු මුදලකට දේශීයව සකස් කරන ලදී. ජාතික මූලික අධ්‍යයන ආයතනයේ ඇති බඳුනේ ධාරිතාවය ලීටර 30 ක් වන අතර සාරභූමි ආයතනයේ ඇති බඳුනේ ධාරිතාවය ලීටර 300 ක් වන අතර එය ප්‍රධාන නිමැවුම වේ. ආයතන ද්විත්වයේම ජෛව පොහොර නිෂ්පාදන ධාරිතාවය මෙමගින් ඉහළ නැංවිණි. ජාතික මූලික අධ්‍යයන ආයතනය විසින් සෝයා බෝංචි, මුං ඇට, බෝංචි සහ රටකජු වැනි රනිල කුලයේ එළවළු සඳහා පෝෂණ මාධ්‍ය සැපයුමට ද, සාරභූමි ලංකා ආයතනය විසින් වී, බඩ ඉරිඟු සහ රනිල කුලයේ නොවන එළවළු කිහිපයක් සඳහා බහු-ක්ෂුද්‍රජීවී පෝෂණ මාධ්‍ය හා පලිබෝධකයන් හා රෝග කාරක ජීවීන්ට එරෙහිව ජෛව-පාලන කාරක වශයෙන් සැපයුමට මෙම ඉහළ නිෂ්පාදන ධාරිතාවයන් ඔස්සේ හැකි විය.

ප්‍රදානයට අදාළ මාතෘකා : අඩු පිරිවැයකින් යුතු අංශු පෙරණ විශ්ලේෂකය
ප්‍රදානයට අදාළ අංකය: TD/2020/COVID/HS/01
ප්‍රදානලාභියා : මහාචාර්ය ගාමිණී රාජපක්ෂ, රසායන විද්‍යා අධ්‍යයනාංශය, විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

මුහුණු ආවරණ සහ පෙරහන් ද්‍රව්‍යවල පෙරීමේ ධාරිතාවය මැනීම සඳහා අඩු පිරිවැය පෙරණ විශ්ලේෂකයක් සකස් කිරීම සහ කොවිඩ්-19 වසංගත තත්ත්වය මැඩපැවැත්වීම සඳහා ආරක්ෂිත අයුරින් භාවිතා කළ හැක්කේ කුමන මුහුණු ආවරණ වර්ග ද යන්න හඳුනාගැනීම මෙම ව්‍යාපෘතිය මගින් අරමුණු විය. මුහුණු ආවරණ හරහා ද්‍රව්‍ය පෙරීම මැනීම පිණිස ස්වයංක්‍රීය උපකරණයක් සකස් කරන ලදී. අවශ්‍ය ප්‍රමාණයේ ඒකීය විසරිත කලීල අංශු භාවිතා කරමින්, පෙරීම නිරවද්‍ය ආකාරයෙන් මැනිය හැකි ය.

දේශගුණික විපර්යාස සහ ස්වාභාවික ආපදා පිළිබඳව ජාතික සංවර්ධනය සඳහා දායකත්වය ලබාදිය හැකි ජාතික අවශ්‍යතා අනුව සිදුකරන පර්යේෂණ වැඩසටහන (NTRP on CC&ND)

ජාතික අවශ්‍යතා සඳහා යොමුවීමේ සහ ජාතික සංවර්ධනය සඳහා උපයෝගී කරගත හැකි සහ අදාළ කරගත හැකි මනාව නිශ්චිත පර්යේෂණ නිමැවුම් බිහි කිරීම සඳහා ජාතික පර්යේෂණ පද්ධතිය මෙහෙයැවීමේ අරමුණුතිව මෙහෙවර නිශ්චිත, බහුවිෂයයික සහයෝගිතා පර්යේෂණ වැඩසටහනක් ලෙස ජාතික සංවර්ධනය සඳහා දායකත්වය ලබාදිය හැකි ජාතික අවශ්‍යතා අනුව සිදුකරන පර්යේෂණ වැඩසටහන (NTRP) සංකල්පනය විය. ඒ අනුව, 2010 වර්ෂයේ දී ජාතික විද්‍යා පදනම විසින් NTRP නමින් හැඳින්වෙන මෙම නව පර්යේෂණ වැඩසටහන ආරම්භ කිරීමට පියවර ගන්නා ලද අතර පර්යේෂණ තේමා තීරණය කරන ලද්දේ ජාතික ප්‍රමුඛතා අනුව ය. ජාතික විද්‍යා පදනම විසින් ආහාර සුරක්ෂිතතාවය, දේශගුණික විපර්යාස සහ ස්වභාවික ආපදා, ජල සුරක්ෂිතතාවය, බලශක්ති සුරක්ෂිතතාවය හා සාගර සහ සමුද්‍රීය සම්පත් යන තේමා හඳුනාගන්නා ලදී. ලබාගත් අත්දැකීම් සහ නිමා කළ ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ වැඩසටහනෙහි සාර්ථකත්වය මත පදනම්ව, 2018 වර්ෂයේ දී පර්යේෂණ ප්‍රදාන 05ක් පිරිනැමීමත් සමගින් අවම කිරීමේ සහ අනුගත වීමේ මූලාරම්භයන් සහිතව දේශගුණික විපර්යාස සහ ස්වාභාවික ආපදා පිළිබඳ වැඩසටහන ආරම්භ විය. දේශගුණික විපර්යාසවල බලපෑම් යනු ශ්‍රී ලංකා ආර්ථිකයේ බොහෝ ක්ෂේත්‍රවලට බලපෑම් ඇතිකරන සහ එහි ජනගහනයේ සෑම අංශයකටම සම්බන්ධිත වන පුළුල් වශයෙන් ප්‍රතිඵල ඇතිවන්නා වූ කරුණකි. වැඩිහිටි ජනගහනය, වතු අංශය, ගෙවතු වගා, ස්වභාවික සම්පත් සහ ශ්‍රී ලංකාවේ ඉදිරි කාලගුණය සඳහා දේශගුණික විපර්යාසවල බලපෑම මෙම ව්‍යාපෘති පහ ඔස්සේ විමර්ශනය කරනු ලබන අතර අවදානමට ලක්වීමේ නැඹුරුතාවය, අවදානම හා අවම කිරීමේ සහ/හෝ අනුගත වීමේ පියවර සම්බන්ධයෙන් හඳුනා ගැනීම අවශ්‍ය කරන ප්‍රතිපත්තිමය මට්ටමේ විභවීය පර්යේෂණ සොයාගැනීම් එමගින් ජනනය කරනු ඇත. මෙම වැඩසටහන ඔස්සේ ප්‍රතිලාභ ලබන විද්‍යාඥයන් හා ආයතන පහත දැක්වේ.



රූප සටහන 13: NTRP ඔස්සේ ප්‍රතිලාභ ලබන විද්‍යාඥයන් සහ ආයතන

මේ දක්වා සමපදස්ථ කණ්ඩායම් විසින් සමාලෝචනය කරනු ලබන ප්‍රකාශන 12 ක් සහ සන්නිවේදන 39 ක් සිදුකර ඇති අතර, මෙසේ දූනට ප්‍රදානය කරගෙන යමින් පවතින මෙම පර්යේෂණ ප්‍රදාන ඔස්සේ සිය මූලික උපාධිය හදාරන සිසුන් 18 දෙනෙකු විසින් සිය උපාධිවලට අදාළ පර්යේෂණ කටයුතු පිළිබඳ කොටස සිදුකර ඇත. මීට අමතරව, පශ්චාත් උපාධි 09ක් (ආචාර්ය උපාධි 02ක් සහ දර්ශනපති උපාධි 07ක්) මෙම ව්‍යාපෘති ඔස්සේ නිමාකරමින් පවතී. මේ දක්වා මෙම ව්‍යාපෘතිවලට අදාළව ලබාගෙන ඇති ප්‍රධාන සොයාගැනීම්/ දායකත්වයන් පහත පරිදි වේ.

ව්‍යාපෘති මාතෘකාව:

කාබන් සමතුලිතතාවය සහ ජෛව විවිධත්වය සම්බන්ධයෙන් ඉදිරි දේශගුණික වෙනස්වීම් පිළිබඳ පුරෝකතනය කිරීම සඳහා විචලනය වන වායු ගෝලීය උෂ්ණත්වය සඳහා ශ්‍රී ලංකාවේ නිවර්තන වැසි වනාන්තරවල ප්‍රතිචාරය ප්‍රමාණනය කිරීම.

නිමැවුම්/ ප්‍රතිඵල:

- නිදර්ශන ලබාගැනීමේ ස්ථිර ස්ථාන සහ ස්වයංක්‍රීය කාලගුණික මධ්‍යස්ථාන පෙළක් ස්ථාපනය කිරීම. මෙමගින් මෙම නිවර්තන වැසි වනාන්තරවල අදාළ ස්ථානවල කාලගුණික සහ පාංශු තත්ත්වයන් අඛණ්ඩව අධීක්ෂණය කරනු ඇත. ශ්‍රී ලංකාවේ නිවර්තන වැසි වනාන්තරවල දේශගුණයේ ස්වභාවය පිළිබඳ සවිස්තරාත්මක නිරූපණය කිරීමක් සහ එහි අනාගත විචලනයන් අධීක්ෂණය කිරීමට එමගින් හැකිවනු ඇත.

- ශ්‍රී ලංකාවේ නිවර්තන වැසි වනාන්තරවල පාරිසරික සහ ශාකවල ලක්ෂණ පිළිබඳ පූර්ණ වශයෙන් කරුණු ඇතුළත් දත්ත කට්ටලයක් සකස් වී ඇත. මෙය අවසානයේ දී දත්ත සමුදායක් බවට වැඩිදියුණු කරනු ඇති අතර මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන විමර්ශකවරයාගේ අනුමැතිය සහ පූර්ව අවසරය සහිතව මෙම දත්ත සමුදාය අනෙකුත් පර්යේෂකයන් හා ප්‍රතිපත්ති සම්පාදකවරු විසින් ද භාවිතාකළ හැකිවනු ඇත.

- අනාගත දේශගුණික විපර්යාස හමුවේ ශ්‍රී ලංකාවේ දූනට ඉතිරිව නිවර්තන වැසි වනාන්තර සංරක්ෂණය සහ ප්‍රතිස්ථාපනය සඳහා ක්‍රමෝපාය සම්පාදනය කිරීමට මෙම ව්‍යාපෘතියේ කරුණු අනාවරණය කරගැනීම් සමගින් හැකි වේ. ප්‍රධාන ගංගාවල වැසි ජල පෝෂක ලෙස ශ්‍රී ලංකාවේ වැසි වනාන්තර ක්‍රියාකරන අතර, බලශක්ති සහ ජල සුරක්ෂිතතාවය සඳහා වන ප්‍රධාන දායකත්වයන් සමගින් ජාතික කෘෂිකර්මය සහ ආහාර සුරක්ෂිතතාවය පවත්වාගෙන යෑම සඳහා එමගින් ප්‍රධාන කාර්යයක් ඉටු වේ. එනිසා, මෙම වැදගත් පාරිසරික පද්ධතියේ පැවැත්ම සහතික කිරීම සඳහා දායකත්වයක් ලබාදෙමින් මෙම ව්‍යාපෘතිය ඔස්සේ අනාවරණය වන කරුණුවලින් ශ්‍රී ලංකාවේ පුළුල් පරාසයක වූ ක්ෂේත්‍ර වෙත ප්‍රතිලාභ හිමිවනු ඇත.

ව්‍යාපෘති මාතෘකාව:

ශ්‍රී ලංකාවේ විවිධ කෘෂි-පාරිසරික කලාපවල ගෙවතු වගා පරිසර පද්ධතිවල පවතින දේශගුණික වෙනස්වීම් දරාගැනීමේ හැකියාව සහිත ජෛව විවිධත්වය පිළිබඳ තුලනාත්මක විශ්ලේෂණය.

නිමැවුම්/ ප්‍රතිඵල:

- ශ්‍රී ලංකාවේ විවිධ කෘෂි-පාරිසරික කලාපවල ගෙවතු වගා පරිසර පද්ධතිවල පවතින දේශගුණික වෙනස්වීම් දරාගැනීමේ හැකියාව සහිත ජෛව විවිධත්වය සහ දරාගැනීම පිළිබඳ දර්ශකවල තුලනාත්මක විශ්ලේෂණය නිමාකර ඇත.

- ආදර්ශ ගෙවතු වගා පද්ධති (තිරසර හා දරාගැනීම සහිත) පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘතියේ සියලු වැදගත් දත්ත සහ සොයා ගැනීම් අන්තර්ගත විවෘත ප්‍රවේශය සහිත දත්ත සමුදායක් සකස් කර ඇත. සමකාලීන පර්යේෂණ සඟයන්, ශාස්ත්‍රීය විද්වතුන් හා උපාධි අපේක්ෂක සිසුන් වෙත සිය පර්යේෂණ සහ අධ්‍යයන කාර්යයන් සඳහා මෙම දත්ත වෙත ප්‍රවේශවීමට හා එකී දත්ත උපයෝගී කරගැනීමට මෙමගින් අවස්ථාව හිමි වේ.

- ශ්‍රී ලංකාවේ ගෙවතු වගා පද්ධති සංවර්ධන වැඩසටහන් සඳහා ප්‍රතිපත්තිමය මට්ටමේ ව්‍යාපෘති සොයාගැනීම් මෙමගින් සිදුකර ඇත.

ව්‍යාපෘති මාතෘකාව:

ශ්‍රී ලංකාවේ වැවිලි කර්මාන්ත අංශය කෙරෙහි දේශගුණික විපර්යාසවලට අදාළව අවකාශීය බලපෑම් (භූගෝලීය, ආර්ථික සහ සමාජයීය අවදානම් සහගතබව) තක්සේරු කිරීම.

නිමැවුම්/ ප්‍රතිඵල:

- සමස්ත සාධකවල ඵලදායිතාවය වෙනස්වීම, තාක්ෂණික කාර්යක්ෂමතාවය, අස්වැන්න, සහ ලාභදායිතාවය පිළිබඳ සම්පූර්ණ විශ්ලේෂණයක් යොදාගනිමින් ශ්‍රී ලංකාවේ තේ සහ පොල් ආශ්‍රිත වැවිලි කර්මාන්තයේ දී දේශගුණික වෙනස්වීම් සහ ඉතා වැදගත් කාර්යසාධන දර්ශක අතර පවතින සංකීර්ණ සම්බන්ධතාවය විමර්ශනය කිරීම.

- විශේෂයෙන්ම අවම සහ උපරිම උෂ්ණත්ව අතර විෂමතා මෙන්ම වර්ෂාපතනයේ විෂමතා ආශ්‍රිත වාතාවරණයක දී, තේ කර්මාන්තය කෙරෙහි දේශගුණික විපර්යාසවල විභව්‍ය බලපෑම පිළිබඳ ඉතා වැදගත් කරුණු මෙම පර්යේෂණ අනාවරණය කරගැනීම් ඔස්සේ ලබාදී ඇත.

- තේ කර්මාන්ත අංශයේ දී, උපරිම උෂ්ණත්වය සහ වර්ෂාපතනයේ විෂමතා මගින් සමස්ත සාධකවල ඵලදායිතාවය වෙනස්වීම කෙරෙහි නිෂේධනාත්මක බලපෑමක් එල්ල කිරීමේ ප්‍රබල කාර්යයක් සිදුවන බව මෙම විශ්ලේෂණය මගින් අනාවරණය විය.

- පොල් කර්මාන්ත අංශයේ දී, අවම උෂ්ණත්වය සහ වර්ෂාපතනයේ විෂමතා සුවිශේෂී අයුරින් දායක වෙමින් සමස්ත සාධකවල ඵලදායිතාවය කෙරෙහි දේශගුණික වෙනස්වීම් මගින් සමස්තයක් ලෙස නිෂේධනාත්මක බලපෑමක් පවතින බව පර්යේෂණය මගින් අනාවරණය විය.

ව්‍යාපෘති මාතෘකාව:

ශ්‍රී ලංකාවේ මෝසම් වැසිවල විචල්‍යතාවය කෙරෙහි ඉන්දියන් සාගරයේ උණුසුම් තටාකයේ සහ ඉන්දියන් සාගරයේ ද්විධ්‍රැවකතාවයේ දිගු කාලීන බලපෑම අවබෝධ කරගැනීම.

නිමැවුම්/ ප්‍රතිඵල:

- පසුගිය වසර 100,000ක් මුළුල්ලේ ඉන්දියන් සාගරයේ සමුද්‍රීය මතුපිට උෂ්ණත්වයේ (SST) වෙනස්වීම් පිළිබඳව ප්‍රතිංසවිධානය කිරීම සිදුවිය.

- මෙම කාල පරිච්ඡේදය මුළුල්ලේ ඉන්දියන් සාගරයේ උණුසුම් තටාකයේ (IWOP) සහ ඉන්දියන් සාගරයේ ද්විධ්‍රැවකතාවයේ (IOD) විචලනයන් හඳුනාගන්නා ලදී.

- පසුගිය වසර 80,000ක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ නිරිතදිග ප්‍රදේශයේ වර්ෂාපතනයේ විචලනයන් පිළිබඳව ප්‍රතිංසවිධානය කිරීම සිදුවිය.

- ඉන්දියන් සාගරයේ වර්ෂාපතනයේ විචලනයන් සහ සමුද්‍රීය මතුපිට උෂ්ණත්වයේ (SST) වෙනස්වීම් අතර සම්බන්ධතාවය හඳුනාගන්නා ලදී.

- අතීත විචලනයන් මත පදනම්ව විභව්‍ය අනාගත වර්ෂාපතන විචලනයන් පුරෝකතනය කරන ලදී.

- ඉදිරි දේශගුණික සහ සමුද්‍රීය ආකෘතිකරණයේ දී පාදක දත්ත වශයෙන් යොදාගත හැකි දත්ත කට්ටලයක් සකස් කරගන්නා ලදී.

- රට තුළ සහ කලාපයේ ඉදිරි පර්යේෂණ සඳහා ප්‍රබල පදනමක් මෙම අධ්‍යයනයේ නිවැමුම් තුළින් ලබාදී ඇති අතර, දකුණු ආසියානු කලාපයේ ඉහළ ජනගහනය මත මානව ක්‍රියාකාරිත්වය මූලික ගෝලීය උෂ්ණත්වය ඉහළ යෑම් මතින් සිදුවන බලපෑම අවම කිරීමට මෙය රුකුලක් වනු ඇත.

- ශ්‍රී ලංකාව තුළ ක්ෂුද්‍ර පොසිල ආශ්‍රිතව පොළොව මත අතීත ජීවීන් පිළිබඳ අධ්‍යයන (micro paleontology) සහ කොරල් මත පාදකව පොසිල ආශ්‍රිතව පොළොව මත අතීත ජීවීන් පිළිබඳ අධ්‍යයන (coral-based paleoceanography) පිළිබඳ පර්යේෂණ ආරම්භ විනි.

- රුහුණ විශ්වවිද්‍යාලයේ සාගර විද්‍යා සහ සමුද්‍රීය භූ විද්‍යා අධ්‍යයනාංශය තුළ සමුද්‍රීය භූ විද්‍යා පර්යේෂණ විද්‍යාගාරයක් සකස්කර ගැනීම සිදුවිය.

ව්‍යාපෘති මාතෘකාව:

නාගරික ප්‍රදේශවල ජීවත්වන වැඩිහිටියන් සඳහා අධික උෂ්ණත්වය හේතුවෙන් ඇතිවන ආතතිය, ජීවිතවල ගුණාත්මක තත්ත්වය සහ යහපැවැත්ම: නාගරික කලාපවල අඩු ආදායම්ලාභී වාසස්ථාන ආශ්‍රිතව සිදුවන වියපත්වීම් සම්බන්ධිත පර්යේෂණාත්මක විමර්ශනයක්.

නිමැවුම්/ ප්‍රතිඵල:

- තරුණ වැඩිහිටි ජනගහනයට (අවුරුදු 60-74 දක්වා) සමානුපාතික අයුරින් අධ්‍යයන නිදර්ශන පැතිකඩ සකස් කරන ලදී (කොළඹ දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරී සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ)

- කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මට්ටක්කුළිය ග්‍රාමනිලධාරී වසම තුළ ජීවත්වන වැඩිහිටි ප්‍රතිචාරකරුවන් 220ක් යොදා ගනිමින් ව්‍යුහගත පුද්ගලික තොරතුරු අනාවරණය කරගැනීමේ සමීක්ෂණ ආකාරයෙන් අදාළ ස්ථාන ආශ්‍රිතවම පරීක්ෂණාත්මක විමර්ශන දෙකක් (නියමු ව්‍යාපෘතිය සහ සමීක්ෂණය) සිදු කරන ලදී.

- මට්ටක්කුළිය ග්‍රාමනිලධාරී වසම තුළ වාසය කරන තරුණ වැඩිහිටි ජනගහනයේ වියපත්වීමේ සිදුවන ලාක්ෂණික ගති ලක්ෂණ සහ ජීවිතයේ ගුණාත්මකබව තක්සේරු කිරීමට සහ සමාජීය අභියෝග, තරුණ වැඩිහිටියන් අතර උෂ්ණත්වය හමුවේ යහ පැවැත්ම හා සුවපහසුව හා චර්ම උෂ්ණත්වය පිළිබඳ සවිස්තරාත්මක විශ්ලේෂණයක් සිදුකිරීම සඳහා දත්ත සමුදායක් සකස් කරන ලදී.

- උෂ්ණත්වය සැලකීමේ දී සුවපහසු නොවන අභ්‍යන්තර පරිසර තුළ 38°C පමණ සාමාන්‍ය වායු උෂ්ණත්වයක් සහිත අධික උණුසුම සහිත නිවෙස්වල මෙම වැඩිහිටියන් වාසය කරන බව, 33°C සිට 36.9°C දක්වා වූ දරාගත හැකි පරාසයෙන් ඔබ්බට මෙම වැඩිහිටියන්ගේ චර්ම උෂ්ණත්වය පවතින බව, ඔවුන් වාසය කරන නිවාස අධික උෂ්ණත්වය හේතුවෙන් ඇතිවන ආතතියට තුඩුදෙන පරිසරයන් බව හා එබැවින් මෙම වැඩිහිටියන් අඩු ගුණාත්මක තත්ත්වයේ ජීවිතවල අත්දැකීමට මුහුණ දී ඇති බව මෙතෙක් සිදුකළ අධ්‍යයනවල දී විමර්ශනය කරන ලදී.

පර්යේෂණ ප්‍රතිඵල අනාවරණය කිරීම සමාප්ත කිරීමේ ඒකාබද්ධ හමුව: ජාතික විද්‍යා පදනම සහ චීනයේ ජාතික ස්වභාවික විද්‍යා පදනම (NSF-NSFC) අතර පළමු ඒකාබද්ධ පර්යේෂණ වැඩසටහන

යථොක්ත සහයෝගිතා වැඩසටහන යටතේ, 2019 වර්ෂයේ දී මුලින්ම චීන සහයෝගිතාවය යටතේ පර්යේෂණ ප්‍රදාන 05ක් පිරිනමන ලදී. සෑම පර්යේෂණ ප්‍රදානයකදී ම, ශ්‍රී ලංකාව තුළ සිදුකරන පර්යේෂණයේ කොටස සඳහා ජාතික විද්‍යා පදනම විසින් අරමුදල් සම්පාදනය කළ අතර, චීනය තුළ සිදුකරන පර්යේෂණයේ කොටස සඳහා චීනයේ ජාතික ස්වභාවික විද්‍යා පදනම විසින් අරමුදල් සම්පාදනය කරන ලදී. මෙම සහයෝගිත්ව පර්යේෂණ වැඩසටහන සමාප්ත කිරීමේ කාර්යය සඳහා චීනයේ ස්වභාවික විද්‍යා පදනම සමග සහයෝගිතාවයෙන් මෙරට ජාතික විද්‍යා පදනමේ ජාත්‍යන්තර සබඳතා අංශය සහ පර්යේෂණ අංශය විසින් ඒකාබද්ධ හමුවක් මාර්ගගත ක්‍රමවේදය යටතේ 2023 සැප්තැම්බර් 05 වැනි දින පවත්වන ලදී. එකී වැඩසටහනේ න්‍යාය පත්‍රය පහත පරිදි වේ (*රූප සටහන 14*).



Joint event on disseminating research findings of the NSF-NSFC
1st Joint research programme

Date: 05 September 2023
Time: 09.00 a.m. to 11.40 a.m.*
Mode: Hybrid meeting

Provisional Programme

09.00 a.m. Welcome and Opening Remarks
(Dr Sepalika Sudasinghe, Director General, NSF, Sri Lanka)

09.05 a.m. Welcome and Opening Remarks
(Prof. Zhong Yongtao, Acting Director General, Bureau of International Cooperation, NSFC)

09.10 a.m. Introductions to this collaborative research programme
(Dr Li Wencong, Director, Division of Asia, Africa and International Organizations, Bureau of International Cooperation, NSFC)

09.15 a.m. Four Presentations by the Principal Investigators of the Joint Research Projects and Remarks (per each project)

1. Enrichment mechanisms of CKDu-risk factors in groundwaters, their uptake pathways and potential remedies (SL Presentation)
2. Corresponding Chinese Presentation
3. Assessment of aquifer quality in relation to chronic kidney disease with unknown aetiology in dryzone of Sri Lanka through an integrated approach using isotopes and water chemistry
4. Corresponding Chinese Presentation
5. Membrane fouling mechanism and control of high-pressure membrane processes (NF/RO) and electrodialysis (ED) purifying groundwater with DOM and high hardness in CKDu affected areas of Sri Lanka
6. Corresponding Chinese Presentation
7. Novel urinary biomarkers for early detection of Chronic Kidney Disease of Unknown Aetiology (CKDu) in Sri Lanka
8. Corresponding Chinese Presentation

Moderators: Dr Indra Sandanayake/Ms Sumudu Gunasekara, Scientific officer, Research Division, NSF, Mr Xianhe Rong, Programme Officer, Division of Asia, Africa International Organizations, Bureau of International Cooperation, NSFC (10 minutes per project – 10 minutes for the Sri Lankan PI and 10 minutes for the Chinese PI to present on key results/output and the potential impact).

10.45 a.m. Q and A and Discussion

11.25 a.m. Overall Summary of Projects
(Eng. Mahesh Dissanayake, Head, Research Division, NSF, Sri Lanka)

11.35 a.m. Concluding Remarks
(Dr Shantha Siri, Head, International Affairs Division, NSF, Sri Lanka)

11.40 a.m. Concluding Remarks
(Prof. Zhong Yongtao, Acting Director General, Bureau of International Cooperation, NSFC)

11.45 a.m. End

(*Time mentioned here are Sri Lanka standard time)
Compere: Mr Xianhe Rongh, Programme Officer, Division of Asia, Africa and International Organizations, National Natural Science Foundation of China)

රූප සටහන 14: ජාතික විද්‍යා පදනම සහ චීනයේ ස්වභාවික විද්‍යා පදනම (NSF-NSFC) අතර පළමු ඒකාබද්ධ පර්යේෂණ වැඩසටහනෙහි සමාප්ති සැසියේ න්‍යාය පත්‍රය

දර්ශනශූරී උපාධි 01ක්, දර්ශනපති උපාධි 07ක්, SCIE ප්‍රකාශන 15ක්, SCIE ප්‍රකාශන නොවන වෙනත් ප්‍රකාශන 04ක්, ග්‍රන්ථ පරිච්ඡේද 03ක් සහ සන්නිවේදන 17ක් මෙම සහයෝගිත්ව වැඩසටහන ඔස්සේ ප්‍රතිඵල විය. මෙම පර්යේෂණ ප්‍රදාන අතුරින් එක් ප්‍රදානයකට අදාළව පේටන්ට් අයදුම්පත්‍රයක් ද යොමු කර තිබේ.



රූප සටහන 15: ජාතික විද්‍යා පදනමේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සේපාලිකා සුදසිංහ මහත්මිය මෙම සැසිය ඇමතීමේ අවස්ථාව



රූප සටහන 16: චීනයේ පර්යේෂණ කණ්ඩායම් සහ චීනයේ ජාතික ස්වභාවික විද්‍යා පදනමේ නිලධාරීන්

චීනයේ ජාතික ස්වභාවික විද්‍යා පදනම සහ මෙරට ජාතික විද්‍යා පදනම අතර ජාත්‍යන්තර සහයෝගිතාවය ශක්තිමත් කිරීම

ද්විපාර්ශ්වික සහයෝගිතාවය අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා මහජන චීන සමූහාණ්ඩුවේ ජාතික ස්වභාවික විද්‍යා පදනම වෙතින් ලැබූ ආරාධනය පරිදි, ජාතික විද්‍යා පදනම විසින් විභව්‍ය පාර්ශවකරුවන් සමග ක්‍රියාකාරකම් කිහිපයක් සංවිධානය කරන ලදී.

චීනයේ ජාතික ස්වභාවික විද්‍යා පදනම සහ ජාතික විද්‍යා පදනම අතර ඇතිකරගත් අවබෝධතා ගිවිසුම යටතේ පළමු ද්විපාර්ශ්වික සාකච්ඡාව 2023 සැප්තැම්බර් මාසයේ දී සාර්ථකව අවසන් විය. තිරසර සංවර්ධන ඉලක්ක අරමුණු කරගත් නව මානයකින් ද්විපාර්ශ්වික සහයෝගිතාවය අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා චීනයේ ජාතික ස්වභාවික විද්‍යා පදනම විසින් ජාතික විද්‍යා පදනම වෙත ආරාධනා කරන ලදී. එබැවින්, ජාතික විද්‍යා පදනම විසින් චීනයේ ජාතික ස්වභාවික විද්‍යා පදනම සමග සහයෝගිතාවයෙන් දෙවන ද්විපාර්ශ්වික සාකච්ඡාව සඳහා නව භෞතික සහ මූල්‍ය ආකෘතියක් සකස් කිරීමේ කාර්යයේ නියැලී සිටී.

නව ප්‍රයත්නය සඳහා විභව්‍ය හවුල්කරුවන් හඳුනාගැනීම පිණිස ජාතික විද්‍යා පදනම විසින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය, කර්මාන්ත හවුල්කරුවන්, සහ චීනයේ විශේෂඥවරු සමග වූ මූලික සාකච්ඡා 2022 දෙසැම්බර් සහ 2023 ජූනි මාසයේ දී පවත්වන ලදී.

චීන විද්‍යා ඇකඩමියේ (CAS) මහාචාර්ය යුඇන්සොන්ග් වෙයි සහ මහාචාර්ය ටියැන් බිංග්හියු විසින් චීනයේ පාරිසරික කර්මාන්ත උද්‍යානයක් සකස්කිරීම පිළිබඳව වූ සිය විශේෂඥ දැනුම බෙදා ගන්නා ලදී.

මූලික සාකච්ඡාවලින් අනතුරුව, 2023 සැප්තැම්බර් මාසයේ දී ශ්‍රී ලාංකික දූත පිරිස චීනයේ කර්මාන්ත උද්‍යාන කිහිපයක සංචාරයක් සිදුකරන ලදී. කර්මාන්ත උද්‍යානවල තත්‍ය කාලීන මෙහෙයුම් සහ ඒවායේ සංවර්ධිත තත්ත්වයන් වෙත යොමුවීමේ අවස්ථාවක් මෙම සංචාරය ඔස්සේ දූත පිරිස වෙත ලැබී තිබුණි. ඉන් අනතුරුව, 2023 දෙසැම්බර් මාසයේ දී චීන විශේෂඥ පිරිස බස්නාහිර හා මධ්‍යම පළාත්වල තෝරාගත් අයෝජන මණ්ඩල කලාප වෙත සංචාරයක් සිදුකරන ලදී.



රූප සටහන 17: චීන නිලධාරීන් සමග පැවති පළමු සාකච්ඡා



රූප සටහන 18: චීන දූත පිරිසේ දෙවැනි සංචාරය



රූප සටහන 19: චීනයේ බීජිං e-නගරය වෙත ජාතික විද්‍යා පදනමේ නිලධාරීන් විසින් සිදුකළ සංචාරය



රූප සටහන 20: ආයෝජන මණ්ඩල කලාප වෙත ක්ෂේත්‍ර චාරිකාව

ජාතික විද්‍යා පදනමේ හවුල්කාරිත්ව වැඩසටහන

ජාතික පර්යේෂණ සහ සංවර්ධන රාමුව සමග අනුකූලව ජාතික වශයෙන් වැදගත් ගැටලුවලට පිළියම් සොයමින් රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතන සමග සහයෝගිතාවයෙන් "ජාතික විද්‍යා පදනමේ හවුල්කාරිත්ව වැඩසටහන" 2021 වර්ෂයේ දී ආරම්භ කරන ලදී.

ශ්‍රී ලංකාවේ බතික්වල ගුණාත්මකබව වැඩිදියුණු කිරීම

නිෂ්පාදන ක්‍රියාවලිය, තිරසාරත්වය වැඩිදියුණු කිරීම සහ බතික් නිෂ්පාදනවල ගුණාත්මකබව වැඩිදියුණු කිරීම ඔස්සේ ජාතික ආර්ථිකය සඳහා දායකත්වය ලබාදීමට ශ්‍රී ලංකාවේ බතික් කර්මාන්තය නඟා සිටුවීමේ කාර්යය සඳහා ජාතික මෝස්තර මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සහ ජාතික ශිල්ප සභාව යන ආයතන සමඟ එක්වී මනා නිෂ්පාදන පරිචයන් (GMP) පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස් කිරීම සඳහා ජාතික විද්‍යා පදනම විසින් සහාය ලබා දෙන ලදී. මෙම GMP) පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහය SLS 1770:2023 වශයෙන් ප්‍රකාශයට පත්කරන ලදී. බතික් කර්මාන්තය ආශ්‍රිත පාරිසරික ගැටලු අවම කරමින් බතික් නිෂ්පාදන කර්මාන්තයේ නියැලෙන පිරිස්වල ජීවත්වීය සෞඛ්‍යය වැඩිදියුණු කරන අතරතුර ශ්‍රී ලංකාවේ බතික් සඳහා වන විදේශීය වෙළඳපොළ වැඩිදියුණු කරගැනීම සඳහා මෙය රුකුලක් වනු ඇත.

මෙම ව්‍යාපෘතිය යටතේ, පහත කාර්යයන් සිදුකරන ලදී.

- ජාතික මෝස්තර මධ්‍යස්ථානය සමග බුද්ධි කලම්හන සැසියක් පැවැත්වීම (මෙම සැසියේ දී ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, ජාතික ශිල්ප සභාව සහ පාරිභෝගික නිෂ්පාදන විශ්ලේෂණයේ නියුතු විද්‍යාගාර සහ බතික් නිෂ්පාදකයන් පාර්ශවකරුවන් ලෙස හඳුනාගන්නා ලදී).

- බස්නාහිර පළාතේ විවිධ නිෂ්පාදන පරිමාණවල සිටින තෝරාගත් බතික් නිෂ්පාදකයන් සඳහා ප්‍රශ්නාවලියක් ආශ්‍රයෙන් සමීක්ෂණයක් සිදුකිරීම. Analysis of the data gathered.

- රැස්කරගත් දත්ත විශ්ලේෂණය කිරීම.

- "බතික් කර්මාන්තයේ දී රසායනික සුරක්ෂිතතාවය" මැයෙන් වූ දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ දෙකක් බතික් නිෂ්පාදකයන් වෙනුවෙන් පැවැත්වීම.

- බතික් නිෂ්පාදන සඳහා සහතිකකරණ ක්‍රමයක් (certification system) පිළිබඳව රාජ්‍ය අංශයේ සහ රාජ්‍ය නොවන අංශයේ සංවිධාන සහ සමාගම් (ජාතික මෝස්තර මධ්‍යස්ථානය, ජාතික ශිල්ප සභාව, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සහ සමාගම්, පුද්ගලික අංශයේ ප්‍රමුඛ කර්මාන්ත ආයතනය දෙකක්) සමග පාර්ශවකරුවන්ගේ රැස්වීම් හතරක් පැවැත්වීම.

- බතික් අංශයේ සුලභව භාවිතා කරන ආනයනික ඩයි සහ වැක්ස් වර්ග පිළිබඳ තොරතුරු රැස්කිරීම.


SRI LANKA STANDARD 1770: 2023

GUIDELINES ON GOOD MANUFACTURING PRACTICES (GMP) FOR THE BATIK INDUSTRY

SRI LANKA STANDARDS INSTITUTION

- ගෘහස්ත, මධ්‍ය පරිමාණ හා මහා පරිමාණ මට්ටම්වල එකිනෙකට වෙනස් සැකසුම් අදියර හඳුනාගැනීම සඳහා ක්ෂේත්‍ර චාරිකා තුනක් සිදුකරන ලදී.

- බතික් කර්මාන්ත අංශය සඳහා මනා නිෂ්පාදන පරිචයන් (GMP) පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහය ඉංග්‍රීසි සහ සිංහල භාෂාවෙන් එකවර සකස් කිරීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් "නව ශ්‍රී ලංකා ප්‍රමිති පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම: බතික් කර්මාන්තය සඳහා මනා නිෂ්පාදන පරිචයන් (GMP)" මැයෙන් කණ්ඩායමක් නිර්මාණය කිරීම.



රූප සටහන 21: ක්ෂේත්‍ර චාරිකාවල දී නිරීක්ෂණය කරන ලද බතික් නිෂ්පාදන ක්‍රියාවලියේ විවිධ පියවර

පර්යේෂණ සහ විශ්ලේෂණ උපකරණ ජාතික දත්ත සමුදාය (NID)

https://nid.nsf.gov.lk



විද්‍යා සහ තාක්ෂණ අංශයේ මෙරට ප්‍රමුඛතම කේන්ද්‍රීය ආයතනය වශයෙන්, ජාතික විද්‍යා පදනම විසින් විශ්වවිද්‍යාල, පර්යේෂණ සහ සංවර්ධන ආයතන හා රාජ්‍ය අංශයේ ආයතන සමගින් දිවයින පුරා ව්‍යාප්ත සිය ජාලය උපයෝගී කරගනිමින් එම ආයතනවල පවතින නවීනතම උපකරණ පිළිබඳ ඩිජිටල් දත්ත සමුදායක් සකස් කරන ලදී. තාර්කිකකරණය තහවුරු කිරීම සහ ඉහළ වටිනාකමින් යුතු උපකරණවල අනවශ්‍ය ආකාරයෙන් ද්විකරණයවීම වැළැක්වීම හැරුන විට, විශේෂයෙන් අවශ්‍ය විද්‍යාගාර පහසුකම් හා තාක්ෂණික විශේෂඥතාවයන් නොමැති අධ්‍යයන ආයතන, පර්යේෂණ සහ සංවර්ධන ආයතන හා ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ඇතුළු කර්මාන්ත සඳහා එමඟින් පරිශීලක-හිතකාමී, පිරිවැය-ඵලදායී, විශ්ලේෂණාත්මක හා පරීක්ෂණ සේවා සැපයීම සිදු කෙරේ.

පර්යේෂණ සහ විශ්ලේෂණ උපකරණ ජාතික දත්ත සමුදාය සම්බන්ධීකරණය කිරීමේ කාර්යය සඳහා ජාතික විද්‍යා පදනම විසින් පුද්ගලික අංශයේ විද්‍යාගාරද ඇතුළුව විශ්වවිද්‍යාල සහ පර්යේෂණ සහ සංවර්ධන ආයතන සමග සම්බන්ධ වී කටයුතු සිදුකරන අතර දැනට කටයුතු කෙරීගෙන යමින් පවතින මෙම දත්ත සමුදාය එමඟින් සවිමත් වනු ඇත. මේ වනවිට, මේ සඳහා විශ්වවිද්‍යාල/ ආයතන 61ක් හා පරිශීලකයන් 397 දෙනෙකු ලියාපදිංචි වී ඇති අතර, නිෂ්පාදිත කාණ්ඩ 253 ක්, විද්‍යාගාර 487 ක් සහ උපකරණ පිළිබඳ වාර්තා 1,120 ක් දත්ත පද්ධතියට ඇතුළත් කර තිබේ.



මෙම ප්‍රයත්නය ජාතික වශයෙන් පිළිගන්නා අතරතුර, 2023 සැප්තැම්බර් මාසයේ දී ජනාධිපති ලේකම් කාර්යාලය මගින් අමාත්‍යාංශ කිහිපයක් වෙත ලිපියක් නිකුත් කිරීම සඳහා ශ්‍රී ලංකාවේ කටයුතු පිළිබඳව විදේශයන්හි දී කටයුතු කිරීමේ කාර්යාලය විසින් මැදිහත් වූ අතර එහිදී එකී අමාත්‍යාංශවල පවතින උපකරණ පිළිබඳ තොරතුරු ජාතික විද්‍යා පදනම සමග හුවමාරු කරගන්නා ලෙස ඉල්ලා සිටින ලදී. ජාතික විද්‍යා පදනමෙහි පර්යේෂණ සහ විශ්ලේෂණ උපකරණ ජාතික දත්ත සමුදාය සවිමත් කරගැනීම පිණිස අවශ්‍ය කරන තොරතුරු ලබාගැනීම පිණිස මෙම ක්‍රමෝපායික මැදිහත්වීම වැදගත් වනු ඇත. තව ද, පර්යේෂණ සහ විශ්ලේෂණ උපකරණ ජාතික දත්ත සමුදායෙහපරිශීලකයන් පිළිබඳ සංඛ්‍යාලේඛනවලට අනුව, 2023 වර්ෂයේ දී රටවල් නවයක පුද්ගලයන් මෙම දත්ත සමුදාය වෙත ප්‍රවේශ වී තිබේ. පර්යේෂණ සහ විශ්ලේෂණ උපකරණ ජාතික දත්ත සමුදායෙහි තොරතුරු යාවත්කාලීන කිරීම සහ වැඩිදියුණු කිරීම අඛණ්ඩව සාර්ථක අයුරින් සිදුවෙමින් පවතී.

පරිශීලකයන් රටවල් වශයෙන්



රට	පරිශීලකයන්
ශ්‍රී ලංකාව	807
චීනය	74
ඇමරිකා එක්සත් ජනපදය	61
ඉන්දියාව	17
සිංගප්පූරුව	17
ජර්මනිය	11
එක්සත් රාජධානිය	11
ඉන්දුනීසියාව	8
ජපානය	8

වැඩසටහන: විද්‍යා සහ තාක්ෂණ විශිෂ්ටත්වය සඳහා පිළිගැනීමක් ලබාදීම

ජාතික විද්‍යා පදනම විසින් ක්‍රියාත්මක කරන පර්යේෂණ උපාධිවල අධීක්ෂණ කටයුතු සඳහා සහාය යෝජනා ක්‍රමය (SUSRED)

මනා මට්ටමක සහ උද්‍යෝගී පර්යේෂණ සංස්කෘතියක් තුළ පුහුණු/සුදුසුකම් සපුරා ලූ පර්යේෂකයන් ඉහළ සංඛ්‍යාවක් සමඟින් ජාතික පර්යේෂණ පද්ධතිය සවිමත් කිරීමේ අරමුණින් 2011 වර්ෂයේ දී ජාතික විද්‍යා පදනම විසින් පර්යේෂණ උපාධිවල අධීක්ෂණ කටයුතු සඳහා සහාය යෝජනා ක්‍රමය (SUSRED) ක්‍රියාත්මක කරන ලදී. පශ්චාත් උපාධි (දර්ශනපති සහ දර්ශනශූරී) සඳහා විද්‍යා සහ තාක්ෂණ සියලුම අංශවල පර්යේෂණ සිදුකරන සිසුන් අධීක්ෂණය කිරීමේ නියැලෙන විද්‍යාඥයන්/ ඉංජිනේරුවරුන් අභිප්‍රේරණය කිරීම, සහාය ලබාදීම සහ පිළිගැනීම ලබාදීම ඔස්සේ මෙම අරමුණ සාක්ෂාත් කරගනු ලැබේ.

මෙම යෝජනා ක්‍රමයේ අරමුණු වනුයේ:

- පශ්චාත් උපාධි මට්ටමේ පර්යේෂණ උපාධි අධීක්ෂණය සඳහා ජ්‍යෂ්ඨ පර්යේෂකයන් දිරිමත් කිරීම.
- පශ්චාත් උපාධි පර්යේෂණ පුහුණු ප්‍රවර්ධනය කිරීමට හා පහසුකම් සැලසීම සඳහා විශ්වවිද්‍යාල සහ පර්යේෂණ ආයතන උනන්දු කරවීම.
- පර්යේෂණවල ගුණාත්මකබවට හානියක් සිදුනොවන පරිදි පශ්චාත් උපාධි මට්ටමේ පර්යේෂණ උපාධි එම උපාධි සඳහා නිශ්චිතව දක්වා ඇති කාල සීමාව තුළ සම්පූර්ණ කිරීම සඳහා අධික්ෂකවරු උනන්දු කරවීම.

මෙම වර්ෂයේ දී පර්යේෂකවරු 93 දෙනෙකුගෙන් සමන්විත පර්යේෂණ කණ්ඩායම් 42කට මෙම යෝජනා ක්‍රමය යටතේ ප්‍රදානයන් ලබාගැනීම සඳහා සුදුසුකම් ලබාගැනීමට හැකි විය (දර්ශනශූරී උපාධි - පර්යේෂණ ප්‍රදාන 20, දර්ශනපති උපාධි - පර්යේෂණ ප්‍රදාන 22). ප්‍රදාන සම්මානලාභීන්ගේ විස්තර *ඇමුණුම 06* හි දක්වා ඇත. සම්මාන ප්‍රදාන පිරිනැමීමට අදාළ අයදුම්පත් පරීක්ෂා කිරීමේ කටයුතු අවසන් කර තිබුණ ද, මෙම වර්ෂයේ දී ඒ සම්බන්ධයෙන් පවත්වන උත්සවය නොපැවැත්විණි.



රූප සටහන 22: SUSRED යටතේ ප්‍රදානයන් හිමිකරගත් විවිධ ආයතනවලට අයත් පිරිස්වල ව්‍යාප්තිය

පර්යේෂණ ශිෂ්‍යත්ව

දර්ශනපති හා දර්ශනශූරී උපාධි දක්වා යොමුවන පූර්ණ කාලීන පර්යේෂණ (ශ්‍රී ලංකාව තුළ) සිදුකිරීම සඳහා ශ්‍රී ලාංකික උපාධිධාරීන්ට මූල්‍ය සහාය ලබාදීම ජාතික විද්‍යා පදනමේ ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය මගින් සිදුවේ. 2023 නොවැම්බර් මාසයේ දී, මෙම යෝජනා ක්‍රමය සඳහා අයදුම්පත් කැඳවූ අතර, ලැබී තිබූ අයදුම්පත් 63ක් පරීක්ෂා කිරීමේ කටයුතු දැනට සිදුකරමින් පවතී.

දැනට කෙරීගෙන යමින් පවතින පර්යේෂණ ශිෂ්‍යත්ව පහක (05) කටයුතු අධීක්ෂණය කළ අතර *(ඇමුණුම 02)*, දර්ශනපති උපාධි දෙකක් හා දර්ශනශූරී උපාධි එකක් ප්‍රතිඵල වශයෙන් ඇති වී එයින් ශිෂ්‍යත්ව තුනක් (03) 2023 වර්ෂයේ දී නිමාකර ඇත *(ඇමුණුම 04)*. එසේ නිමා වූ පර්යේෂණ ශිෂ්‍යත්ව තුන ඔස්සේ ප්‍රකාශන විසි දෙකක් (22) (සන්නිවේදන 17ක් සහ පූර්ණ පත්‍රිකා 05ක්) ප්‍රතිඵල වී තිබේ.

පවතින පරතරයන් සම්පූර්ණ කිරීමේ පර්යේෂණ ප්‍රදාන (GapF) - පර්යේෂණ ප්‍රදානවලට අදාළ නව යෝජනා ක්‍රමය

ප්‍රදාන අංකය: RG/GAPF/2021/EB/01
ප්‍රධාන විමර්ශක: ආචාර්ය අයි. ආර්. එම්. කෝට්ටෙගොඩ, කාර්මික තාක්ෂණ ආයතනය
ව්‍යාපෘතියේ මාතෘකාව: ඉහළ අගය එකතු කිරීමක් ආකාරයෙන් ශ්‍රී ලංකාවේ ග්‍රැෆයිට් පවිත්‍රීකරණය

ආර්ථික ශක්‍යතාවය හා දේශීය කර්මාන්ත අංශය සඳහා ග්‍රැෆයිට් පවිත්‍රීකරණ තාක්ෂණයේ දැනුම නුවමාරු කිරීම සැලකිල්ලට ගෙන ග්‍රැෆයිට් පවිත්‍රීකරණය ඔස්සේ කාබන් සංයුතිය 99.9%කට වැඩි මට්ටමක වාණිජ පරිමාණයක් දක්වා වැඩිකිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ විය. මෙම ව්‍යාපෘතිය 2022 ජනවාරි මාසයේ දී ආරම්භ විණි. ව්‍යාපෘතියේ මුල් මාස 6ක කාල සීමාව තුළ දී, භෞතික ක්‍රමවේදයක් භාවිතා කරමින් අඩු කාබන් සංයුතියක් සහිත ග්‍රැෆයිට්වල කාබන් සංයුතිය 99% කට වඩා වැඩි මට්ටමක් කරා පරිවර්තනය කර අඩු ගුණාත්මක තත්ත්වයේ ග්‍රැෆයිට් පවිත්‍රීකරණ ක්‍රමවේදය වැඩිදියුණු කිරීමට ව්‍යාපෘති කණ්ඩායමට හැකි විය. අඩු කාබන් සංයුතියක් සහිත ග්‍රැෆයිට් පවිත්‍රකරණය සඳහා උපකරණයක් ද සකස් කරන ලද අතර, එහි ක්‍රමවේදය සඳහා පේටන්ට් බලපත්‍රයක් ලබාගන්නා ලදී. පර්යේෂණයේ දෙවන මාස 6ක කාල සීමාව තුළ එම උපකරණය තවදුරටත් නවීකරණය කළ අතර, නව නිපැයුම සඳහා පේටන්ට් බලපත්‍රයක් ලබාගන්නා ලදී. 2023 වර්ෂයේ "ජාතික නව නිපැයුම්කරුවන්ගේ දිනය" සැමරුම් උත්සවවල දී සහ 2023 වර්ෂයේ සහසක් නිමැවුම් ප්‍රදර්ශනයේ දී පර්යේෂණ කණ්ඩායම විසින් පහත සම්මාන දිනා ගන්නා ලදී:

- 40% කට වඩා අඩු කාබන් සංයුතියක් සහිත ග්‍රැෆයිට්වල කාබන් සංයුතිය 98-99% ක මට්ටමක් කරා පරිවර්තනය කිරීම පිණිස මහා පරිමාණ මට්ටමින් භාවිතා කළ හැකි උපකරණයක් සහ ක්‍රමවේදය වෙනුවෙන් DASIS සම්මානය - 2023 වර්ෂයේ දී ජාතික නව නිපැයුම්කරුවන්ගේ දිනය සැමරුම් උත්සවය.
- ඉහත සඳහන් කළ නව නිපැයුම සඳහා රන් පදක්කම - 2023 වර්ෂයේ සහසක් නිමැවුම් ප්‍රදර්ශනය.
- මිනිත්තු කිහිපයක් තුළ දී මහා පරිමාණ මට්ටමින් ග්‍රැෆීන් සහ අඩු ග්‍රැෆීන් ඔක්සයිඩ් ප්‍රමාණයක් නිපදවීමේ උපකරණය සහ ක්‍රමවේදය සඳහා රන් පදක්කම - 2023 වර්ෂයේ සහසක් නිමැවුම් ප්‍රදර්ශනය.
- අගය එකතු කිරීමේ ක්‍රමවේදයක් ලෙස ඉහළ මට්ටමේ යෙදවුම් සඳහා ස්වාභාවික ග්‍රැෆයිට් එහි ග්‍රැෆයිට්වල කාබන් සංයුතිය 99.9% ක මට්ටමක් කරා පිරිසිදු කිරීමේ ක්‍රමවේදය සඳහා රිදී පදක්කම.



රූප සටහන 23: 2023 වර්ෂයේ ජාතික නව නිපැයුම්කරුවන්ගේ දිනය සැමරුම් උත්සවයේ දී පර්යේෂණ කණ්ඩායම විසින් DASIS සම්මානය දිනාගැනීම

ව්‍යාප්ත වැඩසටහන්

ඉන්දු - ශ්‍රී ලංකා සහයෝගිත්ව පර්යේෂණ වැඩසටහන පිළිබඳ සම්මන්ත්‍රණය

ජාතික විද්‍යා පදනම විසින් අධ්‍යාපන අමාත්‍යාංශයේ සහයෝගිතාවයෙන් ඉන්දු - ශ්‍රී ලංකා සහයෝගිත්ව පර්යේෂණ වැඩසටහන පිළිබඳ දෙවන සම්මන්ත්‍රණය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ සංකතනී ශාලාවේ දී 2023 ජනවාරි 20 වැනි දින පවත්වන ලදී. අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්, එම්. එන්. රණසිංහ මහතා සහ ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයේ පළමු ලේකම් (අධ්‍යාපන), විවේක් ගුප්තා මහතා මෙම අවස්ථාවට සහභාගි විය. ආයතන ප්‍රධානීන්, අමාත්‍යාංශ නිලධාරීන්, පර්යේෂකවරු සහ ජාතික විද්‍යා පදනමේ කාර්ය මණ්ඩලය යන පිරිසගෙන් සමන්විත පැමිණි සිටි පිරිස ජාතික විද්‍යා පදනමේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සේපාලිකා සුදසිංහ මහත්මිය විසින් පිළිගැනීම සිදුකළ අතර මෙම ඉන්දු-ශ්‍රී ලංකා වැඩසටහනෙහි පසුබිම පිළිබඳ කෙටි හැඳින්වීමක් ද ලබාදුනි.

ඉන්දීය ජනරජයේ සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රජයන් විසින් ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර විද්‍යාත්මක සහයෝගිතාවය දිරිමත් කිරීම සඳහා ගිවිසුමකට එළැඹී අවස්ථාවේ දී, මෙම ඉන්දු-ශ්‍රී ලංකා ඒකාබද්ධ පර්යේෂණ වැඩසටහන 2008 වර්ෂයේ දී ආරම්භ විණි.

ආහාර තාක්ෂණය, ශාක ආශ්‍රිත ඖෂධ, මිනුම් අධ්‍යයන, අභ්‍යවකාශ පර්යේෂණ හා යෙදුම්, රෝබෝ සහ ස්වයංක්‍රීයකරණය, කාර්මික ඉලෙක්ට්‍රොනික්, සහ අපද්‍රව්‍ය කළමනාකරණය වැනි ජාතික වශයෙන් වැදගත් වන්නා වූ පර්යේෂණ ක්ෂේත්‍ර ආශ්‍රිතව ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ පර්යේෂණ කණ්ඩායම්වලින් සහයෝගිතාවයෙන් කටයුතු කරන සහයෝගිතා වැඩසටහන (PoC) සඳහා 2017 වර්ෂයේ දී අත්සන් තැබීමත් සමඟින් මෙම සම්මන්ත්‍රණය ප්‍රතිඵල විය. මෙම පර්යේෂණ ප්‍රදාන වාරයේදී, ජර්නල් ප්‍රකාශන 28ක්, සම්මන්ත්‍රණ පත්‍රිකා 211ක් සහ සංක්ෂේප 21 සමඟ ව්‍යාපෘති 17ක් සාර්ථකව නිමාකරන ලද අතර දෙරටේම විද්‍යාඥයන් හා පර්යේෂකයන් දැනුම හුවමාරුව සහ පර්යේෂණ අත්දැකීම් ඔස්සේ ප්‍රතිලාභ හිමිකර ගන්නා ලදී.

නිර්මාණය වූ නව දැනුම පාර්ශවකරුවන් සහ විද්‍යාත්මක ප්‍රජාව සමඟින් හුවමාරු කරගැනීම සඳහා මෙම සම්මන්ත්‍රණය මඟින් වේදිකාවක් නිර්මාණය කරන ලදී. සම්මන්ත්‍රණයේ දී විද්‍යාඥවරු පහළොස් දෙනෙකු විසින් සිය පර්යේෂණ සොයාගැනීම් ඉදිරිපත් කළ අතර, මහාචාර්ය අජිත් ද අල්විස් විසින් ප්‍රධානත්වය දුරු සහ මහාචාර්ය ධම්මික තන්තිරිගොඩ සහ ආචාර්ය ඒ. එම්. මුබාරක් අනෙකුත් සාමාජිකයන් වශයෙන් කටයුතු කළ ත්‍රි-සාමාජික මඩුල්ලක් සමඟින් එම ව්‍යාපෘතිවල ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී. මෙහි පසු-විපරම් කටයුතු සිදුවෙමින් පවතී.



රූප සටහන 24: ජාතික විද්‍යා පදනමේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සේපාලිකා සුදසිංහ මහත්මිය සහභාගී වූ පිරිස පිළිගැනීම සිදුකිරීම



රූප සටහන 25: අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්, එම්. එන්. රණසිංහ මහතා විසින් පැමිණි සිටි පිරිස අමතමින්



රූප සටහන 26: ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයේ පළමු ලේකම් (අධ්‍යාපන), විවේක් ගුප්තා මහතා විසින් පර්යේෂණ ප්‍රදානලාභීන් වෙත සහතික ප්‍රදානය කිරීම



රූප සටහන 27: සම්මන්ත්‍රණය සඳහා සහභාගී වූ පිරිස ආරාධිත පිරිස හා සංවිධායක කමිටුව සමඟ

ශ්‍රී ලංකාවේ කාර්මික අංශයේ අගය දාම විශ්ලේෂණය සඳහා එක් එක් අංශවලට සුවිශේෂී වූ රැස්වීම්

ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්තය, සෙරමික් හා පෝසිලේන් කර්මාන්තය, ආහාර කර්මාන්තය සහ රෙදිපිළි කර්මාන්තය යන කර්මාන්ත අංශවල නියෝජිතයන් සමඟ 2023 වර්ෂයේ දී එක් එක් කර්මාන්ත අංශයට සුවිශේෂී වූ කරුණු අළලා වෙන් වෙන් රැස්වීම් හතරක් පවත්න ලදී.

ජාතික විද්‍යා පදනමේ තාක්ෂණ සංවර්ධන සහ නවෝත්පාදන අංශය (TDIA) යටතේ වූ කර්මාන්ත අංශය සංවර්ධනය පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම විසින් සිදුකළ කාර්යයක අඛණ්ඩ දිගුවක් ලෙස මෙය සැලකිය හැකි ය. ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය සඳහා ප්‍රධාන දායකත්වයක් දරන අංශ කිහිපයක් (2021 වර්ෂයේ ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව සහ වෙනත් මූලාශ්‍ර කිහිපයක් මත පදනම්ව) මෙම ක්‍රියාකාරී කණ්ඩායම විසින් හඳුනාගන්නා ලද අතර ජාතික ආර්ථිකය සඳහා ප්‍රතිලාභ එක්කළ හැකි අගය එකතු කිරීම පිණිස විද්‍යා හා තාක්ෂණය සහ පර්යේෂණ හා සංවර්ධන කටයුතු හරහා විසඳිය හැකි ඒවායේ පවතින පරතරයන් හෝ ගැටලු හඳුනාගැනීම සඳහා අගය දාම විශ්ලේෂණයක් සිදුකරන ලදී. ජාතික විද්‍යා පදනම විසින් විද්‍යා හා තාක්ෂණ ප්‍රගමනය උදෙසා පර්යේෂණ සහ සංවර්ධන කටයුතුවලට පහසුකම් සැලසීමට සහාය සහ සහයෝගීතාවය දක්වනු ඇත.

එක් එක් කර්මාන්ත අංශයේ ඊට සුවිශේෂී අගය දාමවල ගැටලු සාකච්ඡා කර විශ්ලේෂණය කිරීමට හා විසඳුම් ලබාගැනීම සඳහා එක් එක් කර්මාන්ත අංශයට අදාළව රැස්වීම් පවත්වන ලදී. අගය දාම විශ්ලේෂණය කිරීමේ ක්‍රියාවලිය තුළ පහත ක්‍රියාකාරකම් ඇතුළත් විය:

1) ආර්ථිකය සහ සමාජය සඳහා දායකත්වය විශ්ලේෂණය කිරීම
2) සෑම අගය දාම උප - අංශයක්ම විශ්ලේෂණය කිරීම
3) අනාවරණය කරගැනීම් හා ඒවා පොදු වශයෙන් අදාළ කරගැනීම සම්බන්ධයෙන් බුද්ධි කලම්භනය
4) සෑම අංශයක් සඳහාම විශේෂඥ මතය ලබාගැනීම සඳහා රැස්වීම් පැවැත්වීම
5) පාර්ශවකරුවන්ගේ සාකච්ඡා කව පැවැත්වීම
6) විශේෂඥවරු සමඟ පසු-විපරම් රැස්වීම් පැවැත්වීම (අවශ්‍ය පරිදි)

එහි අවසාන අදියර වශයෙන්, මෙම රැස්වීම්වල සහ පසුගිය වර්ෂයේ පැවති අනෙකුත් ආංශික රැස්වීම්වල ප්‍රතිඵල ආශ්‍රිතයෙන් වාර්තාවක් සම්පාදනය කරමින් පවතී.

සාක්ෂි පදනම් කරගත් තීරණ ගැනීම පිළිබඳ වැඩසටහන: පර්යේෂණ ප්‍රායෝගික භාවිතයට යොදා ගැනීම

වෘත්තීන්ගේ නියැලෙන්නන් වෙත පර්යේෂණ රැගෙන යෑම සඳහා පර්යේෂණ තොරතුරු ව්‍යාප්තිය වැදගත් බව ජාතික විද්‍යා පදනම විසින් හඳුනාගැනීමෙන් අනතුරුව, "සාක්ෂි පදනම් කරගත් තීරණ ගැනීම පිළිබඳ වැඩසටහන: පර්යේෂණ ප්‍රායෝගික භාවිතයට යොදා ගැනීම" මැයෙන් වූ වැඩසටහනක් 2023 වර්ෂයේ දී ආරම්භ කරන ලදී. මෙම වැඩසටහනෙහි පළමු සැසිය ලෙස, සෞඛ්‍ය විද්‍යාව පිළිබඳ පර්යේෂණ වැඩසටහනෙහි (RPHS) නිමාකර ඇති ව්‍යාපෘති කිහිපයක්

තෝරාගන්නා ලදී. 2023 සැප්තැම්බර් මස 12 වැනි දිනැතිව පැවති පළමු රැස්වීමේ දී ඩෙංගු පර්යේෂණවලට අදාළව RPHS වැඩසටහන යටතේ නිමාකර ඇති පර්යේෂණ ව්‍යාපෘති පහක් සාකච්ඡා කරන ලදී. පර්යේෂකයන් විසින් සිය ප්‍රධානතම පර්යේෂණ සොයාගැනීම් සෞඛ්‍ය අමාත්‍යාංශයේ, විශේෂයෙන්ම ඩෙංගු පාලන ඒකකයේ කාර්ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී. මෙම පර්යේෂණ සොයාගැනීම් ඉදිරියට රැගෙන යන්නේ කෙසේ ද යන්න පිළිබඳ සිය අදහස් ලබාදෙමින් අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන් ද මෙම රැස්වීම සඳහා සහභාගී විය.

RPHS වැඩසටහනේ එක් ප්‍රදානලාභියෙකු විසින් වැඩිදියුණු කළ "පූර්ව ක්‍රියාකාරී ඩෙංගු කළමනාකරණ පද්ධතිය" යොදා ගැනීමේ හැකියාව ඩෙංගු පාලන ඒකකය සමඟ සාකච්ඡා කිරීම සඳහා සාක්ෂි පදනම් කරගත් තීරණ ගැනීම පිළිබඳව වූ මෙම වැඩසටහනෙහි දෙවැනි රැස්වීම 2023 දෙසැම්බර් මස 12 වැනි දින ජාතික විද්‍යා පදනමේ ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදී. මේ සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිචාරය සාධනීය නොවූ නමුදු, හදිසි ඩෙංගු වසංගත තත්ත්වයන් පුරෝකතනය හා ආකෘතිකරණය සඳහා සහ වාහක පාලනය හා ඩෙංගු කළමනාකරණය කිරීම සඳහා උපකාරී වන වෙනත් බොහෝ අංග සහිත මෙම පරිපූර්ණ පද්ධතිය යොදා ගැනීම පිළිබඳව නැවත සලකා බලන ලෙස ජාතික විද්‍යා පදනම විසින් ඔවුන් වෙත යෝජනා කරන ලදී.



රූප සටහන 28: 2023 සැප්තැම්බර් 12 වැනි දින පැවති පළමු රැස්වීම - සිදුකළ ඉදිරිපත් කිරීම් සඳහා සවන්දෙමින් සිටින සහභාගික පිරිස



රූප සටහන 29: පොත් පිංචෙහි මුල් පිටුව



රූප සටහන 30: 2023 දෙසැම්බර් 12 වැනි දින පැවති දෙවැනි රැස්වීම සඳහා පැමිණි පිරිස

කර්මාන්ත සහ වැවිලි කර්මාන්ත යන අමාත්‍යාංශ සමඟ සාකච්ඡාව

කර්මාන්ත සංවර්ධනය සඳහා විද්‍යාව, තාක්ෂණය හා නවෝත්පාදන මැදිහත්වීම් මැයෙන් වූ ඉදිරිපත් කිරීමක් ජාතික විද්‍යා පදනමේ පර්යේෂණ අංශය විසින් ගරු අමාත්‍යතුමා, අමාත්‍යාංශ නිලධාරීන් සහ කර්මාන්ත සහ වැවිලි කර්මාන්ත යන අමාත්‍යාංශ යටතේ වන ආයතනවල ආයතන ප්‍රධානීන් සඳහා 2023 සැප්තැම්බර් මස 25 වැනි දින වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ දී පවත්වන ලදී. කර්මාන්තවල පර්යේෂණ අවශ්‍යතා සපුරාලීම පිණිස සහ පර්යේෂණ ප්‍රතිඵල වාණිජකරණය සඳහා ජාතික විද්‍යා පදනම සහ අමාත්‍යාංශය යටතේ පවතින ආයතන සම්බන්ධ කරනුයේ කෙසේ ද යන්න මෙහිදී සාකච්ඡා කරන ලදී. ජාත්‍යන්තර වෙළඳපොළ අවස්ථා වැඩිවශයෙන් ලබාගැනීම සඳහා වැවිලි භෝගවලින්, විශේෂයෙන් තේ (සිලෝන් ටී) වලින්, අගය එකතුකළ නිෂ්පාදිත ලබාගැනීම පිණිස විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන මැදිහත්වීම් අවශ්‍ය බව ගරු අමාත්‍ය වෛද්‍ය රමේෂ් පතිරණ මැතිතුමා විසින් මෙහි දී අවධාරණය කරන ලදී. පර්යේෂණ අංශයේ අංශ ප්‍රධානී ඉංජිනේරු මහේෂ් දිසානායක මහතා සහ මනුජ කරුණාරත්න මහතා ජාතික විද්‍යා පදනම නියෝජනය කරමින් මෙම රැස්වීමට සහභාගී විය.

පර්යේෂණ ප්‍රදාන කළමනාකරණය පිළිබඳව ආරක්ෂක පර්යේෂණ සහ සංවර්ධනය මධ්‍යස්ථානයේ (CDRD) නිලධාරීන් වෙනුවෙන් පැවති දැනුවත් කිරීමේ වැඩසටහන

පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන් සඳහා ජාතික විද්‍යා පදනම සමඟ කටයුතු කිරීමේ අවස්ථාවක් ලබාදෙමින් ජාතික විද්‍යා පදනම විසින් සියලු අමාත්‍යාංශ සහ රජය සතු ව්‍යවසායන් වෙත සිදුකළ සන්නිවේදනය සඳහා ප්‍රතිචාර වශයෙන් ආරක්ෂක පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය විසින් හෝමාගම, පිටිපන පිහිටි සිය පරිශ්‍රයේ දී රැස්වීමක් සඳහා සහභාගීවන ලෙස ආරාධනා කරන ලදී. මෙම රැස්වීම 2023 ඔක්තෝබර් 03 වැනි දින පැවති අතර, ජාතික විද්‍යා පදනම නියෝජනය කරමින් ඉංජිනේරු මහේෂ් දිසානායක මහතා (ප්‍රධානී/පර්යේෂණ අංශය), ක්‍රිස්ටීන් දසනායක මහත්මිය (ජ්‍යෙෂ්ඨ විද්‍යාත්මක නිලධාරී/ පර්යේෂණ අංශය) සහ ආචාර්ය ඉනෝකා සන්දනායක මහත්මිය (විද්‍යාත්මක නිලධාරී/ පර්යේෂණ අංශය) මීට සහභාගී විය. ආරක්ෂක පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය විසින් එම මධ්‍යස්ථානය සහ ඔවුන්ගේ කාර්යයන්, ඔවුන්ගේ සාර්ථකත්වයට පත් වූ කටයුතු සහ ජාතික විද්‍යා පදනම වෙතින් අපේක්ෂා කරන දෑ පිළිබඳව ඉදිරිපත් කිරීමක් සිදුකරන ලදී. ක්‍රිස්ටීන් දසනායක මහත්මිය විසින් ජාතික විද්‍යා පදනම පිළිබඳව සහ එහි කටයුතු පිළිබඳව ද ආචාර්ය ඉනෝකා සන්දනායක මහත්මිය විසින් පර්යේෂණ ප්‍රදාන කළමනාකරණය, සමාලෝචනය සහ ඇගයීමේ ක්‍රියාවලිය පිළිබඳව ද වශයෙන් ජාතික විද්‍යා පදනම විසින් ඉදිරිපත් කිරීම් දෙකක් සිදුකරන ලදී. ආරක්ෂක පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල් මේජර් ජනරාල් ආර්. ඇල්විටිගල මහතා, ප්‍රධාන පාලක ගෘප් කපිතාන් ඒ. එස්. ඇල්ලේගොඩ මහතා, පළමු මාණ්ඩලික නිලධාරි ලුතිනන් කර්නල් ඒ. එල්. ආර්. පී. අමරසිංහ මහතා සහ අනෙකුත් නිලධාරීන් බොහොමයක් ද මෙම රැස්වීමට සහභාගී විය.

මෙම සාකච්ඡා සැසිවාරයෙන් අනතුරුව, පර්යේෂණ ප්‍රදාන කළමනාකරණය පිළිබඳ දැනුම හා අදාළ ලේඛන ආරක්ෂක පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය සමඟ බෙදා ගැනීමටත්, අනාගත සහයෝගිතාවයන් සඳහා ජාතික විද්‍යා පදනම සහ ආරක්ෂක පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමටත් එකඟතාවයන් ඇතිකරගන්නා ලදී.



රූප සටහන 31: CDRD නිලධාරීන්ගේ ඉදිරිපත් කිරීම



රූප සටහන 32: රැස්වීම සඳහා වූ **CDRD** නිලධාරීන් අතුරින් පිරිසක්



රූප සටහන 33: CDRD හි අධ්‍යක්ෂ ජනරාල් සමඟ පැවති සාකච්ඡාව අතරතුර



රූප සටහන 34: පුහුණු මධ්‍යස්ථානය නිරීක්ෂණය කරමින්

"පර්යේෂණ ප්‍රදාන ලබාගැනීමේ දී සාර්ථකත්වයට පත්වනුයේ කෙසේ ද" පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ පර්යේෂණ සභාව විසින් සිදුකර ආරාධනාවකට අනුව එම විශ්වවිද්‍යාලයේ ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලය වෙනුවෙන් විශේෂයෙන් සැලසුම්කළ බාහිර/අභ්‍යන්තර පර්යේෂණ ප්‍රදාන ලබාගැනීම සඳහා ගුණාත්මක බවින් හෙබි පර්යේෂණ යෝජනා සකස් කිරීම මැයෙන් වූ නේවාසික වැඩසටහන සඳහා පර්යේෂණ අංශයේ විද්‍යාත්මක නිලධාරී ආචාර්ය ඉනෝකා සන්දනායක මහත්මිය සම්පත් දායකයෙකු වශයෙන් එක්විය. මෙම වැඩසටහන කොළඹ 07, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ දී 2023 ඔක්තෝබර් 12 වැනි දින පවත්වන ලදී.

විශ්වවිද්‍යාල ව්‍යාපාරික සම්බන්ධතා ඒකක (UBLs) සමඟ ජාතික විද්‍යා පදනම සම්බන්ධ කිරීම පිණිස මූලික පියවර

විශ්වවිද්‍යාල ව්‍යාපාරික සම්බන්ධතා ඒකක ජාලය එකතු කිරීමේ භව්‍යතාවයන් හඳුනාගැනීම සඳහා 2023 නොවැම්බර් මාසයේ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් කැඳවනු ලැබූ විශ්වවිද්‍යාල ව්‍යාපාරික සම්බන්ධතා ඒකකවල ස්ථාවර කමිටු රැස්වීම සඳහා පර්යේෂණ අංශයේ ඉංජිනේරු මහේෂ් දිසානායක සහ ආචාර්ය මහේෂා නාදුගල සහභාගි විය. පර්යේෂණ ප්‍රදාන යෝජනා ක්‍රම පිළිබඳ තොරතුරු සහ ජාතික විද්‍යා පදනම පිළිබඳ කෙටි හැඳින්වීමක් ද ඒ සඳහා සහභාගී වූ පිරිස වෙත ලබාදෙන ලදී. සාකච්ඡා වාරයේ දී පොදු කැමැත්ත සහිත ක්ෂේත්‍ර හඳුනාගන්නා ලදී.

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨයේ පැවති දැනුවත් කිරීමේ වැඩමුළුව

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ, තාක්ෂණ පීඨයේ උපාධි අපේක්ෂක සිසුන් හා අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ජාතික විද්‍යා පදනමේ පර්යේෂණ සහ තාක්ෂණ ප්‍රදාන පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් 2023 දෙසැම්බර් 18 සහ 19 යන දෙදින තුළ පැවත්විණි.

ජාතික විද්‍යා පදනමේ කාර්ය මණ්ඩලය විසින් පහත මාතෘකා ආවරණය කරන ලදී.

- ජාතික විද්‍යා පදනම පිළිබඳ හැඳින්වීම: ජාතික පර්යේෂණ, සංවර්ධන සහ නවෝත්පාදන පරිසරය (National RDI ecosystem) සවිමත් කිරීම - පර්යේෂණ අංශ ප්‍රධානී ඉංජිනේරු මහේෂ් දිසානායක මහතා.
- ජයග්‍රහණය කළ හැකි පර්යේෂණ යෝජනාවක් ලිවීම සිදුකරන්නේ කෙසේ ද: ජාතික විද්‍යා පදනමේ තරඟකාරී පර්යේෂණ ප්‍රදාන, පවතින පරතරයන් පියවීමේ පර්යේෂණ ප්‍රදාන, පර්යේෂණ ශිෂ්‍යත්ව - පර්යේෂණ අංශයේ විද්‍යාත්මක නිලධාරිනී ආචාර්ය ඉනෝකා සන්දනායක මහත්මිය.
- ජයග්‍රහණය කළ හැකි තාක්ෂණික යෝජනාවක් ලිවීම සිදුකරන්නේ කෙසේ ද: ජාතික විද්‍යා පදනමේ තාක්ෂණික ප්‍රදාන, තාක්ෂණ සංවර්ධන හා අංකුර ව්‍යවසායන් - පර්යේෂණ අංශයේ විද්‍යාත්මක නිලධාරිනී සරනි මෙනේරිපිටිය මහත්මිය.
- පර්යේෂණ වාණිජකරණය (විද්‍යාගාරයේ සිට වෙළඳපොළ දක්වා) යම්කිසි තාක්ෂණයක පරිපූර්ණතා මට්ටම (TRL), නවෝත්පාදන/ව්‍යවසායන් - පර්යේෂණ අංශ ප්‍රධානී ඉංජිනේරු මහේෂ් දිසානායක මහතා.
- ජාතික විද්‍යා පදනම තුළ පර්යේෂකයන් සඳහා පවතින පහසුකම් සහ සේවා - පර්යේෂණ අංශයේ විද්‍යාත්මක නිලධාරිනී ආචාර්ය ඉනෝකා සන්දනායක මහත්මිය.





ශ්‍රී ලංකාව තුළ ආහාර සුරක්ෂිතතාවය සහතික කිරීම

තාක්ෂණ සංවර්ධන සහ නවෝත්පාදන අංශය යටතේ ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමේ නිර්දේශ සහිත "ශ්‍රී ලංකාව තුළ ආහාර සුරක්ෂිතතාවය සහතික කිරීම: පෝෂණය සඳහා නිරාවරණය සහ ආශ්‍රිත අවදානම්" මැයෙන් වූ වාර්තාව පහත සඳහන් මාතෘකා ආවරණය කරමින් ජාතික විද්‍යා පදනමේ වෙබ් අඩවියේ පළ කරන ලදී.

- ආහාර සුරක්ෂිතතාවය සහ ශ්‍රී ලංකාවේ සංදර්භය
- ගැටලු සහ අවධානීත කරුණු
- නිර්දේශ

සිවුවැනි කාර්මික විප්ලවය (4IR) සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම

සිවුවැනි කාර්මික විප්ලවය ප්‍රධාන වශයෙන්ම ක්‍රියාත්මක වනුයේ ඉහළ මට්ටමේ තාක්ෂණයන් භාවිතයෙනි. පුද්ගලයන්ගේ ජීවිත පරිවර්තනයට ලක්කරන සිවුවන කාර්මික විප්ලවයේ ලාක්ෂණික අංගය වනුයේ මෙම තාක්ෂණයන් වේ. එබැවින්, ශ්‍රී ලාංකික සංදර්භය සඳහා මෙම ඉහළ මට්ටමේ තාක්ෂණයන්ගේ යෝග්‍යතාවය පිළිබඳව පොදු ජනතාව දැනුවත් කිරීම පිණිස 'කෘත්‍රිම බුද්ධිය පිළිබඳ වෙබිනාර් වැඩමුළුව: සංවර්ධනය වන ලෝකය තුළ පවතින අවස්ථා' මැයෙන් වූ වැඩමුළුව ජාතික විද්‍යා පදනම විසින් සංවිධානය කරන ලදී. මෙල්බර්න් විශ්වවිද්‍යාලයේ, විද්‍යුත් යාන්ත්‍රික සහ යටිතල පහසුකම් ඉංජිනේරු පාසැලේ යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යයනාංශයේ මහාචාර්ය සමන් හල්ගමුගේ මෙහි සම්පත්දායකයා වශයෙන් සහභාගී විය. සහභාගිකයන් 180කට අධික පිරිසකගේ සහභාගිත්වයෙන් මෙම වැඩසටහන සාර්ථක අන්දමින් පවත්වන ලදී.



කෘත්‍රිම බුද්ධිය පිළිබඳ වෙබිනාර් රැස්වීම: සංවර්ධනය වන ලෝකය තුළ පවතින අවස්ථා

ජාතික විද්‍යා පදනම වෙත පැවරී ඇති බලය ආ) විද්‍යා සහ තාක්ෂණ තොරතුරු ව්‍යාප්ත කිරීම

විද්‍යාත්මක පර්යේෂණ ප්‍රකාශයට පත්කිරීම

සඟරා කලාප පහක් (ජාතික විද්‍යා පදනමේ සඟරාවේ (JNSF) කලාප 04ක් සහ ශ්‍රී ලංකා සමාජ විද්‍යා සඟරාවේ (SLJSS) කලාපයක් ප්‍රකාශයට පත්කිරීම සහ වෘත්තිය ආයතනයක සිය තේමාගත සම්මන්ත්‍රණයක පොත් පිංච සහ වාර්ෂික සැසිවාරයේ මුද්‍රිත වාර්තාව ප්‍රකාශයට පත්කිරීම පිණිස සහාය ලබාදීම හරහා 2023 වර්ෂය තුළ දී සඟරා ප්‍රකාශන අංශය (JPD) විසින් තොරතුරු ව්‍යාප්ත කිරීම සඳහා ඔවුන් වෙත පැවරී ඇති බලය අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.

ජාතික විද්‍යා පදනමේ සඟරාව (JNSF)

ලිපි 54 ක් (පර්යේෂණ පත්‍රිකා 52, විචාර පත්‍රිකා 01 සහ පර්යේෂණ සන්නිවේදන පත්‍රිකා 01) සමඟින් 2023 වර්ෂය තුළ ජාතික විද්‍යා පදනමේ සඟරාවේ (JNSF) 51 වැනි වෙළුමේ කලාප හතරක් මාර්තු, ජූනි, සැප්තැම්බර් සහ දෙසැම්බර් මාසවලදී ප්‍රකාශයට පත්කරන ලදී. විද්‍යා සහ තාක්ෂණයට අදාළ සියලු අංග ආවරණය වන පරිදි බහුවිධ ක්ෂේත්‍රවලට අදාළ ස්වභාවයේ පත්‍රිකා මෙම කලාපවල අන්තර්ගත විය.

මෙම සඟරාව වර්තමානයේ දී Directory of Open Access Journals (DOAJ), EBSCO Applied Science & Technology Source Ultimate, Journal TOCs සහ SafetyLit යන නව දත්ත සමුදායන් හතරක් ද ඇතුළුව Clarivate Analytics Science Citation Index Expanded (SCIE), Chemical & Biological Abstracts, BIOSIS Previews, Zoological Records, SCOPUS, TEEAL, Ulrich's, AGRICOLA, EBSCOhost හි සුචිගත සඟරාවක් ලෙස පවතී.



රූප සටහන 35: 2023 වර්ෂයේදී ජාතික විද්‍යා පදනමේ සඟරාව සම්බන්ධිත සුවිශේෂී කරුණු

සංස්කරණ ක්‍රියාවලිය පිළිබඳ විග්‍රහය

සංස්කරණ ක්‍රියාවලියේ පිරිවැය ආවරණය කරගැනීම පිණිස ප්‍රකාශන ගාස්තුව ඇ.ඩො. 250 දක්වා වැඩිකරන ලද අතර මීට විදේශීය කර්තෘවරුන් වෙතින් අයකරනු ලබන ඇ.ඩො. 20 ක පත්‍රිකා සැකසුම් ගාස්තුව ද (APC) ඇතුළත් ය. 2023 වර්ෂයේ දී සමස්ත පත්‍රිකා ඉදිරිපත් කිරීම්වල 22% ක පහළ යෑමක් නිරීක්ෂණය වූ අතර, විදේශීය රටවලින් සිදුකරන පත්‍රිකා ඉදිරිපත් කිරීම්වල සුවිශේෂී අඩුවීම මෙම සමස්ත සමස්ත පත්‍රිකා ඉදිරිපත් කිරීමේ අඩුවීම කෙරෙහි බලපාන ලදී. පත්‍රිකා සැකසුම් ගාස්තුවක් හඳුන්වාදීම සහ ප්‍රකාශන ගාස්තුව ඇ.ඩො. 250 දක්වා වැඩිකිරීම මීට හේතුවිය හැකි ය. පූර්ව වශයෙන් තෝරා ගැනීමෙන් අනතුරුව සමපදස්ථ කණ්ඩායම් විසින් සිදුකරන සමාලෝචනය සඳහා සුදුසුකම් ලබන විදේශීය රටවලින් ඉදිරිපත් කළ පත්‍රිකා සංඛ්‍යාවේ ප්‍රතිශතය 2022 සහ 2023 වර්ෂවල දී සමාන මට්ටමක (පිළිවෙලින් 81ක් සහ 82%ක් වශයෙනි) පැවතිබව සහ පත්‍රිකා සැකසුම් ගාස්තුව (APC) හා පිටුවක් සඳහා වන ගාස්තුව ඉහළ නැංවීම හේතුවෙන් අපේක්ෂිත මට්ටමට වඩා පහළ මට්ටමක පවතින අත්පිටපත් ඉදිරිපත් කිරීම 2023 වර්ෂයේ දී පහළ ගොස් ඇති බව ද සඳහන් කළ යුතු ය.



රූප සටහන 36: ජාතික විද්‍යා පදනමේ සඟරාව (JNSF) සඳහා 2023 වර්ෂයේ දී ඉදිරිපත් කළ අත්පිටපත් සම්බන්ධිත විස්තර



රූප සටහන 37: 2022 හා 2023 වර්ෂවලදී ජාතික විද්‍යා පදනමේ සඟරාව සඳහා ඉදිරිපත් කළ පත්‍රිකා සම්බන්ධයෙන් සංසන්දනයක්



රූප සටහන 38: ජාතික විද්‍යා පදනමේ සඟරාවේ (JNSF) 51 වැනි වෙළුමේ කලාප හතර

කර්තෘවරුන්ගේ ව්‍යාප්තිය

2023 වර්ෂයේ දී ජාතික විද්‍යා පදනමේ සඟරාවේ ලිපි පළ කරන ලද කර්තෘවරු 247 අතුරින් 184 දෙනෙකු (74%) දේශීය විශ්වවිද්‍යාල/පර්යේෂණ ආයතන/රජයේ දෙපාර්තමේන්තු 30 නියෝජනය වන ශ්‍රී ලාංකික කර්තෘවරුන් වේ. ඉතිරි 26% විදේශීය කර්තෘවරුන් වේ. එයින් බහුතරයක් (23%) ක් ආසියානු කලාපයෙන් වන අතර ඉන්දියානු කර්තෘවරු (11%) විදේශීය කර්තෘවරු අතුරින් ප්‍රමුඛ ස්ථානයේ පසු වේ. විදේශීය කර්තෘවරු ද සමාන විශ්වවිද්‍යාල සහ පර්යේෂණ ආයතන සංඛ්‍යාවකට (30)ක් අනුබද්ධිත පිරිස් වන අතර වැඩිම දායකත්ව ආයතන සංඛ්‍යාවක් අයත් වනුයේ ඉන්දියාවට ය.



රූප සටහන 39: ජාතික විද්‍යා පදනමේ සඟරාවේ (JNSF) 51 වැනි වෙළුමේ කර්තෘවරුන්ගේ භූගෝලීය ව්‍යාප්තිය

ශ්‍රී ලාංකික කර්තෘවරුන්ගේ සම්බන්ධවීම සැලකූ විට, වැඩිම දායකත්වයක් (75%) ලැබී ඇත්තේ විශ්වවිද්‍යාල ඔස්සේ වන අතර එකී දායකත්වයන් පේරාදෙණිය විශ්වවිද්‍යාලය (15%), රුහුණ විශ්වවිද්‍යාලය (14%), ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය (12%), මොරටුව විශ්වවිද්‍යාලය (8%), කැළණිය විශ්වවිද්‍යාලය (8%) වශයෙන් පවතී. පේරාදෙණිය විශ්වවිද්‍යාලය සහ රුහුණු විශ්වවිද්‍යාලය වෙතින් වැඩිම දායකත්වයක් ලැබී ඇත. දේශීය වශයෙන් ප්‍රකාශයට පත්කළ සමස්ත පර්යේෂණ පත්‍රිකා වලින් 25% ක් පර්යේෂණ ආයතන, රජයේ දෙපාර්තමේන්තු සහ කර්මාන්ත අංශයෙන් ලැබී ඇත.



රූප සටහන 40: දේශීය විශ්වවිද්‍යාලවල කර්තෘවරුන්ගේ දායකත්වය

තනි සහ බහු කර්තෘත්වය

රූප සටහන 05 හි දැක්වෙන පරිදි, ජාතික විද්‍යා පදනමේ සඟරාවේ පළ කරන ලද පත්‍රිකාවලින් 93% ක් විවිධ ආකාරවල සහයෝගිත්ව සමඟින් බහු-කර්තෘත්වය සහිතව ප්‍රකාශයට පත්කර තිබේ; ජාත්‍යන්තර සහයෝගිත්ව (22%), අන්තර්-ආයතනික සහයෝගිත්ව (34%), අන්තර්-දෙපාර්තමේන්තු සහයෝගිත්ව (9%), අන්තඃ-දෙපාර්තමේන්තු සහයෝගිත්ව (28%). ප්‍රකාශයට පත්කරන ලද පත්‍රිකා 54 අතුරින් 7% ක් තනි කර්තෘත්වය සහිතව ප්‍රකාශයට පත්කර තිබේ. ප්‍රකාශයට පත්කරන ලද පත්‍රිකා වල දේශීය සහ විදේශීය කර්තෘත්වය අනුව වෙන්කිරීමක් පහත *02* වගුවෙහි දැක්වේ.

වගුව 02: 2023 වර්ෂයේ දී ප්‍රකාශයට පත්කරන ලද පත්‍රිකාවලට අදාළව නිරීක්ෂණය වන සහයෝගිත්වයන්

සහයෝගිත්ව ආකාරය	මූලාශ්‍ර වශයෙන් සඳහන් කළ හැකි පත්‍රිකා සංඛ්‍යාව (දේශීය)	මූලාශ්‍ර වශයෙන් සඳහන් කළ හැකි පත්‍රිකා සංඛ්‍යාව (විදේශීය)
ජාත්‍යන්තර (රටවල් 02 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක්)	9	3
අන්තර්-දෙපාර්තමේන්තු	5	0
අන්තර්-ආයතනික	15	3
අන්තඃ-දෙපාර්තමේන්තු	12	3
තනි කර්තෘත්වය සහිත	4	0



රූප සටහන 41: ප්‍රකාශයට පත්කරන ලද පත්‍රිකාවල සහයෝගිත්ව ආකාරයේ ස්වභාවය

තිරසර සංවර්ධන ඉලක්කවලට (SDGs) පවතින සම්බන්ධතාවය

පර්යේෂණ නිමැවුම් සහ ප්‍රකාශයට පත්කරන ලද සෑම පත්‍රිකාවකටම අදාළ ප්‍රධාන වචන සවිස්තරාත්මකව සැලකීමේ දී 2023 වර්ෂයේ දී ප්‍රකාශයට පත්කරන ලද පත්‍රිකා තිරසර සංවර්ධන ඉලක්ක 10 ක් හා සම්බන්ධිතබව අනාවරණය වූ අතර, 72% ක් වූ පත්‍රිකා තිරසර සංවර්ධන ඉලක්ක හතරක් සමඟ අනුරූප වේ: සාගින්න නැතිකිරීම (17%), යහපත් සෞඛ්‍යය සහ මනා පැවැත්ම (21%), කර්මාන්ත, නවෝත්පාදන සහ යටිතල පහසුකම් (19%), සහ පෘථිවිය මත ජීවය (15%).



රූප සටහන 42: 2023 වර්ෂයේ දී පළකරන ලද පත්‍රිකා අතුරින් තිරසර සංවර්ධන ඉලක්ක හා සම්බන්ධිත ප්‍රතිශතය

ආවරණිත විෂය කාණ්ඩ

2023 වර්ෂයේ දී පළකරන ලද පත්‍රිකා සම්බන්ධයෙන් සැලකූ විට භෞතික විද්‍යාව ආශ්‍රිත විෂයන්ට සාපේක්ෂව ජීව විද්‍යාව සම්බන්ධිත ලිපිවල ආසන්න වශයෙන් 2.5 ගුණයක ඉහළ යෑමක් පවතී. 2022 වර්ෂය සමඟ සංසන්දනය කිරීමේ දී 2023 වර්ෂයේ දී කෘෂිකර්මය, අණුක ජීව විද්‍යාව සහ රසායන විද්‍යාව යන විෂයවලට අදාළ පත්‍රිකා වල සුවිශේෂී ඉහළ යෑමක් පවතී. 2022 වර්ෂයට සාපේක්ෂව ඉංජිනේරු විද්‍යාව, භෞතික විද්‍යාව සහ තොරතුරු තාක්ෂණය යන විෂය ක්ෂේත්‍රවලට අදාළ පත්‍රිකා සංඛ්‍යාව සැලකීමේ දී 50% පහළ යෑමක් පවතී.



රූප සටහන 43: 2022 සහ 2023 වර්ෂවල දී පළකරන ලද පත්‍රිකා වල විෂය ක්ෂේත්‍ර

ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම සඳහා ගතවන කාලය (TAT) අඩුකිරීම

මෙම ජාතික විද්‍යා පදනමේ සඟරාව විසින් මුහුණදුන් ප්‍රධානතම අභියෝගය වූයේ පත්‍රිකා භාරදීමේ සිට ප්‍රකාශනය දක්වා වූ කාලයට අදාළව ඉහළ අගයක පැවති ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම සඳහා ගතවන කාලය (TAT) පිළිබඳ ගැටලුවයි. පත්‍රිකා භාරදීමේ සිට ප්‍රකාශනය සහ පත්‍රිකා පිළිගැනීමේ සිට ප්‍රකාශනය යන ක්‍රියාවලි සම්පූර්ණ කිරීම සඳහා ගතවන කාලය 2021 වර්ෂයේ සිට අඩුවීමක් සිදුවී ඇතිබව සඳහන් කළ යුතුය. 2020 පාදක වර්ෂය පදනම් කරගෙන 2023 වර්ෂය සැලකීමේ දී 15%ක අඩුවීමක් සිදුවී ඇත. 2020 වර්ෂයේ සිට SLJOL ඔස්සේ සමපදස්ථ කණ්ඩායම් විසින් සමාලෝචනය කරනු ලබන සඟරා මාර්ගගත වේදිකාවක් සැපයීම ආරම්භ කිරීම සහ 2021 වර්ෂයේ දී අවසන් සංස්කරණ අදියර සඳහා භාෂා සහ විෂය අන්තර්ගතය පිළිබඳ සංස්කාරකවරු පත්කිරීම මෙම වැඩිදියුණුවීම සඳහා දායකවී ඇත.



රූප සටහන 44: ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම සඳහා ගතවන කාලයේ (TAT) අඩුවීම (2021-2023)

2022 වර්ෂයේ ප්‍රකාශයට පත්කරන ලද පත්‍රිකා 2023 වර්ෂයේ ලිපි සඳහා යොමුගත වී තිබීම

2023 වර්ෂයේ ජාතික විද්‍යා පදනමේ සඟරාව මඟින් ප්‍රකාශයට පත්කළ පර්යේෂණ ලිපි අතුරින් 27% ක් ඇමරිකා එක්සත් ජනපදය, කැනඩාව, ජර්මනිය, ජපානය, චීනය, ඉතාලිය, එක්සත් ජනපදය, කෙන්යාව, ඉන්දියාව සහ පකිස්තානය යන රටවල පර්යේෂකයන් විසින් 2023 වර්ෂයේ දී සිය පර්යේෂණ ලිපිවල දී යොමුගත කර තිබේ. මෙසේ ජාතික විද්‍යා පදනමේ සඟරාව මඟින් ප්‍රකාශයට පත්කළ පර්යේෂණ පත්‍රිකා සඳහා යොමුගත වූ එකී පර්යේෂණ පත්‍රිකා Comprehensive Reviews in Food Science and Food Safety (IF 14.8) (IF 8.9), Waste Management (IF 8.1), Current Opinion in Environmental Science & Health (IF 8.1), Scientific Reports (IF 4.6), Soft Computing (IF 4.1), සහ Marine Policy (IF 3.8) වැනි ගෝලීය වශයෙන් ඉහළ බලපෑම් සාධක මට්ටමක් සහිත සඟරාවල ප්‍රකාශයට පත්වී ඇත.



සඟරාව සම්බන්ධිත බලපෑම් සාධකය (Journal Impact Factor)

2010 වර්ෂයේ සිට බලපෑම් සාධකයට අදාළ ඉහළ යමින් පැවති ප්‍රවණතාවය සහ 2022 වර්ෂයේ දී බලපෑම් සාධකය ගණනය කිරීම සඳහා උපයෝගී වූ යොමුගත පත්‍රිකාවල 9%ක ඉහළ යෑම මධ්‍යයේ වුව ද, JNSF ට අදාළ බලපෑම් සාධකය 2021 වර්ෂයේ දී පැවති 0.682 අගයේ සිට 2022 වර්ෂයේ දී 0.50 දක්වා පහළ බැස ඇතිබව 2023 වර්ෂයේ දී නිකුත් කළ Clarivate Analytics Journal Citation Report හි වාර්තා කර තිබේ. ජාතික විද්‍යා පදනමේ සඟරාව මඟින් ආවරණය වන විෂය ක්ෂේත්‍රවලට අදාළ යොමුගත වීම්වලට බලපෑමක් ඇතිකරමින් වෛද්‍ය සහ සෞඛ්‍ය විද්‍යා සම්බන්ධිත පර්යේෂණ හැර අනෙකුත් පර්යේෂණ ක්ෂේත්‍රවලට අදාළව කොවිඩ්-19 වසංගත තත්ත්වය මඟින් සෘණාත්මක බලපෑමක් එල්ල කර ඇතිබව උපකල්පනය කෙරේ.



රූප සටහන 45: JNSF හි බලපෑම් සාධකය **2010-2022**

ජාතික විද්‍යා පදනමේ සඟරාව නව දත්ත සමුදායන් තුළ සුචිගතවීම

2023 වර්ෂයේ දී ජාතික විද්‍යා පදනමේ සඟරාව නව සුචිගත දත්ත සමුදා තුළට ඇතුළත් වීම සඳහා ඉල්ලුම් කරන ලදී. Directory of Open Access Journals (DOAJ), EBSCO Applied Science & Technology Source Ultimate, Journal TOCs සහ SafetyLit හි සුචිගතවීම සඳහා මෙම සඟරාව පිළිගන්නා ලදී.

ආදායම් උත්පාදනය



2023 වර්ෂයේ දී, ජාතික විද්‍යා පදනමේ සඟරාව විසින් විදේශීය කර්තෘවරු වෙතින් ප්‍රකාශන ගාස්තු වශයෙන් ඇ.ඩො. 1,631 ක ආදායමක් උපයා තිබේ. මෙය ශ්‍රී ලංකා රුපියල් වලින් රු. 497,522.45 කි.

ශ්‍රී ලංකා සමාජ විද්‍යා සඟරාව (SLJSS)

ශ්‍රී ලංකා සමාජ විද්‍යා සඟරාව (SLJSS) යනු 1978 වර්ෂයේ සිට ජාතික විද්‍යා පදනම විසින් ප්‍රකාශයට පත්කරනු ලබන Scopus සහ ESCI හි සුචිගත වී ඇති ශාස්ත්‍රීය සඟරාවකි. පර්යේෂණ, සමාලෝචන, කෙරී ගෙන යමින් පවතින පර්යේෂණවලට අදාළ පත්‍රිකා සහ ග්‍රන්ථ පිළිබඳ විග්‍රහයන් මෙම සඟරාවේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පළ කරනු ලැබේ. මෙය අර්ධ වාර්ෂික සඟරාවක් ලෙස (ජූනි සහ දෙසැම්බර්) ප්‍රකාශයට පත් කරන අතර ශ්‍රී ලංකාව සහ/ හෝ දකුණු ආසියාවේ සමාජ විද්‍යාව ආශ්‍රිත ගැටලු සම්බන්ධයෙන් අවධානය යොමුකරනු ලැබේ. CC-BY-ND 4.0 Creative Commons License යටතේ විවෘත ප්‍රවේශයක් සමගින් සියලු පත්‍රිකා ප්‍රකාශයට පත් කෙරේ.

සංස්කරණ ක්‍රියාවලිය පිළිබඳ විග්‍රහය

2023 වර්ෂයේ දී මෙම සඟරාව සඳහා SLJOL මාර්ගගත වේදිකාව ඔස්සේ පර්යේෂණ පත්‍රිකා 242ක් ලැබී තිබුණි. මෙයින් සමාලෝචනය කිරීමට පෙර ප්‍රතික්ෂේපිත අත්පිටපත් සංඛ්‍යාව 139ක් වූ අතර පූර්ව වශයෙන් පරීක්ෂා කිරීමේ ක්‍රියාවලියට ඇතුළත් වූ අත්පිටපත් සංඛ්‍යාව 103 කි. සමාලෝචන ල පත්‍රිකා 36ක් ඇතුළුව 2022 වර්ෂයේ දී ලැබී මෙම වර්ෂයේ දී සමාලෝචනයට ලක් වූ ල පත්‍රිකා සංඛ්‍යාව 139ක් විය. මේ අතුරින් ප්‍රතිශතාත්මක වශයෙන් සැලකූ විට 4.3% ක් වූ අත්පිටපත් සංඛ්‍යාවක් පිළිගත් අතර 3.6%ක් අත්පිටපත් සංඛ්‍යාවක් ප්‍රතික්ෂේපිත විය. ඒ අනුව 92% ක් වූ අත්පිටපත් සංඛ්‍යාවක් සමාලෝචනය කර තිබේ.



රූප සටහන 46: 2023 වර්ෂයේ දී ශ්‍රී ලංකා සමාජ විද්‍යා සඟරාව (SLJSS) සඳහා ඉදිරිපත් කර ඇති පර්යේෂණ පත්‍රිකා (සංඛ්‍යාත්මක අගය වශයෙන්)

සමාලෝචන පත්‍රිකා 3ක් සහ පර්යේෂණ පත්‍රිකා 5ක් සමගින් සමස්ත ශාස්ත්‍රීය පත්‍රිකා 8කින් ශ්‍රී ලංකා සමාජ විද්‍යා සඟරාවේ 46 වැනි වෙළුමේ 01 වැනි කලාපය සමන්විත විය.

කර්තෘවරුන්ගේ භූගෝලීය ව්‍යාප්තිය

1 වැනි කලාපයේ දේශීය කර්තෘවරුන්ගේ පත්‍රිකා ප්‍රමුඛ වශයෙන් (75%) පැවති අතර විදේශීය කර්තෘවරුන්ගේ දායකත්වය 25% ක් වූ අතර එයින් වැඩිම දායකත්වය ලැබී ඇත්තේ ඉන්දීය කර්තෘවරු වෙතිනි (23.5%).



රූප සටහන 47: ශ්‍රී ලංකා සමාජ විද්‍යා සඟරාවේ (SLJSS) වෙළුම 46; කලාපය 01: කර්තෘවරුන්ගේ භූගෝලීය ව්‍යාප්තිය

දේශීය කතුවරු සම්බන්ධවීම

දේශීය කර්තෘවරුන්ගේ සම්බන්ධවීම සැලකූ විට, වැඩිම දායකත්වයක් ලැබී ඇත්තේ කැළණිය විශ්වවිද්‍යාලයෙන් වන අතර, රුහුණ විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය වෙතින් දෙවැනියට සමාන මට්ටමකින් දායකත්වය ලැබී ඇත.



රූප සටහන 48: ශ්‍රී ලංකා සමාජ විද්‍යා සඟරාවේ (SLJSS) වෙළුම 46; කලාපය 01: දේශීය කතුවරු සම්බන්ධවීම

2022 වර්ෂයේ ප්‍රකාශයට පත්කරන ලද පත්‍රිකා 2023 වර්ෂයේ ලිපි සඳහා යොමුගත වී තිබීම

2023 වර්ෂයේ දී ශ්‍රී ලංකා සමාජ විද්‍යා සඟරාව මඟින් ප්‍රකාශයට පත්කළ පර්යේෂණ ල පත්‍රිකා අතුරින් 22% ක් 2023 වර්ෂයේ දී සිදුකළ පර්යේෂණ පත්‍රිකාවල දී යොමුගත කර තිබේ. මෙම සඟරාව මඟින් ප්‍රකාශයට පත්කළ පර්යේෂණ පත්‍රිකා යොමුගත වූ එකී පර්යේෂණ පත්‍රිකා Advanced Education (IF 1.1) නැමති එක් සුචිගත සඟරාවක් ද ඇතුළුව බොහෝ සඟරාවල ප්‍රකාශයට පත්වී ඇත. දැනුම ව්‍යාප්ත කිරීම සඳහා වූ සිය දායකත්වය සමගින් මෙය, ශ්‍රී ලංකා සමාජ විද්‍යා සඟරාව සඳහා වූ සුවිශේෂී සංධිස්ථානයකි.



රූප සටහන 49: ශ්‍රී ලංකා සමාජ විද්‍යා සඟරාවේ (SLJSS) වෙළුම 46; කලාපය 01

2 වැනි කලාපයේ ප්‍රකාශන කටයුතු සිදුවෙමින් පැවතිණි.

විද්‍යා හා තාක්ෂණික කටයුතුවලට සම්බන්ධ වෘත්තීය ආයතනයකට එහි වාර්ෂික සැසිවාර ප්‍රකාශයට පත් කිරීම සඳහා සහාය ලබාදීම

මෙම යෝජනා ක්‍රමය යටතේ ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ (SLASS) 79 වැනි වාර්ෂික සැසිවාරයේ මුද්‍රිත වාර්තාව සහ එහි තේමාගත සම්මන්ත්‍රණ ග්‍රන්ථය ප්‍රකාශයට පත් කිරීම සඳහා සහාය ලබාදෙන ලදී. මෙම වර්ෂයේ වාර්ෂික සැසි සහ තේමාගත සම්මන්ත්‍රණ පවත්වන ලද්දේ 'ජාතීන් අතර ජාතික සමගිය සහ මිත්‍රත්වය සඳහා ප්‍රබල ශක්තියක් ලෙස විද්‍යා නිපුණතාවය' (Science Diplomacy as a Powerful Force for National Unity and Friendship among Nations) යන තේමාව යටතේ ය. වාර්ෂික සැසිවාරයේ මුද්‍රිත වාර්තාව ඔස්සේ වෙනස් තේමා 08ක් ඔස්සේ දිවෙන සංක්ෂේප පත්‍රිකා 160ක් ප්‍රකාශයට පත්විණි: වෛද්‍ය, දන්ත වෛද්‍ය සහ පශු වෛද්‍ය විද්‍යාව, කෘෂිකර්මය හා වන විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව, වාස්තු විද්‍යාව සහ මැනුම් විද්‍යාව, ජීව සහ පෘථිවි විද්‍යාව, භෞතික විද්‍යාව, රසායනික විද්‍යාව, පරිගණක විද්‍යාව සහ සමාජ විද්‍යාව යන තේමා මීට ඇතුළත් විය.





ශ්‍රී ලංකාවේ මාර්ගගත සඟරා (SLJOL)



ශ්‍රී ලංකාවේ සඟරාවල මාර්ගගත වේදිකාව (the Sri Lanka Journals Online - SLJOL) ඔස්සේ ශ්‍රී ලාංකික පර්යේෂකයන්ට සහ පුළුල් පරාසයක දිවෙන අධ්‍යයන ක්ෂේත්‍ර ඔස්සේ ඔවුන් විසින් සිදුකරනු ලබන කාර්යය අනාවරණය සඳහා ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කෙරේ. එක්සත් රාජධානියේ, International Network for the Availability of Scientific Publications (INASP) හි Journals Online (JOL) ව්‍යාපෘතියේ කොටසක් ලෙස ශ්‍රී ලංකා සඟරාවල මාර්ගගත වේදිකාව (SLJOL) විසින් සමපදස්ථ කණ්ඩායම් විසින් සමාලෝචනය කළ ශ්‍රී ලංකාවේ ශාස්ත්‍රීය ලිපි 131ක් මාර්ගගත වේදිකාව වෙත එකතු කරන ලදී. ශ්‍රී ලංකා විද්‍යා පදනමේ ජාතික විද්‍යා පුස්තකාල සහ සම්පත් මධ්‍යස්ථානය සහ Ubiquity Press විසින් ක්‍රියාත්මක කරනු ලබන මෙම SLJOL ශ්‍රී ලංකාව තුළ ශාස්ත්‍රීය ප්‍රකාශන කටයුතු සඳහා සුවිශේෂී වේදිකාවක් ලෙස ක්‍රියාත්මක වේ.

ශ්‍රී ලංකාවේ මාර්ගගත සඟරාවල වේදිකාවේ ප්‍රධානතම වාසිවලින් එකක් වනුයේ ශ්‍රී ලංකාවේ පර්යේෂණ නිමැවුම් සඳහා ලොව පුරා ව්‍යාප්ත වූ ප්‍රවේශයක් ලබාදීමේ හැකියාව යි. රට තුළ ක්‍රියාත්මක වන පර්යේෂණ සඳහා විහිදුම සහ බලපෑම, සහයෝගිත්ව වැඩිදියුණු කිරීම සහ ජාත්‍යන්තර මට්ටමින් අදහස් හුවමාරු කරගැනීම මෙම ගෝලීය අනාවරණය තුළින් වැඩිදියුණු වේ.

තව ද, ශ්‍රී ලංකා සඟරාවල මාර්ගගත වේදිකාව ඔස්සේ ප්‍රකාශන ගාස්තු දැරීමකින් තොරව පර්යේෂකයන්ට සිය කාර්යයන් ව්‍යාප්ත කිරීමේ මාර්ගයක් සැලසෙන අතර, මෙය විදේශීය සඟරාවල පර්යේෂණ ලිපි පළකිරීම ආශ්‍රිත මූල්‍ය අවහිරතා සැලකුවිට සුවිශේෂී කරුණකි. මෙම අවහිරතා මඟහැරීම තුළින්, ශ්‍රී ලංකාවේ විද්වත් ප්‍රජාව සහ එයින් ඔබ්බට ද ගුණාත්මක තත්ත්වයේ ප්‍රකාශන ව්‍යාප්ත කිරීම සඳහා ශ්‍රී ලංකාවේ සඟරාවල මාර්ගගත වේදිකාව හරහා පහසුකම් සැපයේ.

සමස්තයක් ලෙස, ශාස්ත්‍රීය සන්නිවේදනය ප්‍රවර්ධනය, අධ්‍යයන කටයුතු ආශ්‍රිත පර්යේෂණ සඳහා සහාය ලබාදීම, සහ ගෝලීය තලයේ දී ශ්‍රී ලංකාවේ පර්යේෂණ නිමැවුම් අනාවරණය කිරීමේ කටයුතුවල ප්‍රගමනය සඳහා ශ්‍රී ලංකා සඟරාවල මාර්ගගත වේදිකාවෙන් වැදගත් භූමිකාවක් ඉටුවේ. ශ්‍රී ලංකාවේ සඟරාවල මාර්ගගත වේදිකාවට ප්‍රවේශවීමේ පහසුව සහ දරාගත හැකි වියදම ඔස්සේ ශ්‍රී ලංකාව තුළ දැනුම සහ නවෝත්පාදනවල ප්‍රගමනය සඳහා කාලය සහ ශ්‍රමය යොදවන පර්යේෂකයන්, ආයතන සහ පාර්ශවකරුවන් වෙත මෙය අනගි සම්පතක් බවට පත්වී ඇත.

ශ්‍රී ලංකාවේ මාර්ගගත සඟරාවල (SLJOL) වැඩිදියුණුවීම

ශ්‍රී ලංකාවේ විද්‍යාත්මක ප්‍රජාව සඳහා විශිෂ්ට ජයග්‍රහණයක් සහ සුවිශේෂී දායකත්වයක් වශයෙන්, විද්‍යාත්මක ප්‍රජාව අතර පර්යේෂණ සඳහා ප්‍රවේශය වැඩිදියුණු කිරීමට සහයෝගිත්වය වැඩිදියුණු කිරීමට ඇති කැපවීම සනිටුහන් කරමින් SLJOL සඳහා නව වේදිකාවක් ආරම්භ කිරීම 2023 මාර්තු මාසයේ දී සිදුවිය. වසර 15ක් මුළුල්ලේ ශාස්ත්‍රීය සඟරා 131ක 20,000කට අධික පර්යේෂණ පත්‍රිකා සංඛ්‍යාවක් අධිලේඛනගත කිරීම සහ විවෘත ප්‍රවේශය ලබාදීම ආකර්ෂණීය දක්ෂතාවයකි. මෙතුළින්, ශ්‍රී ලංකාව තුළ සිදුවෙමින් පවතින විද්‍යාත්මක විමසුම්වල සාරවත්බව සහ විවිධත්වය විදහා දැක්වීමක් පමණක් නොව, පර්යේෂකයන්, ප්‍රතිපත්ති සම්පාදකයන්, අධ්‍යාපඥයන්, සහ පොදු ජනතාවට විද්‍යාත්මක අනාවරණය කිරීම් කරා පහසුවෙන් ළඟාවිය හැකිවීමේ වැදගත්කම ද අවධාරණය කෙරේ.



රූප සටහන 50: SLJOL වේදිකාව මගින් ආවරණය වන විෂය ක්ෂේත්‍ර

ස්වකීය සියුම් දෘෂ්ටිය හවුලේ බෙදා ගැනීම සඳහා කර්තෘවරු විසින් දක්වන කැපවීම ගෝලීය වශයෙන් විද්‍යා සහ තාක්ෂණ අංශවල ප්‍රගමනය සඳහා ඉතා තීරණාත්මක වේ. ඔවුන්ගේ දායකත්වයන් පිළිගැනීම හා පැසසුමට ලක්කිරීම ඔස්සේ වැඩිදුර සහයෝගිත්ව සහ දැනුම හුවමාරු කරගැනීම දිරිමත් කරන අතර, ප්‍රගතිය සහ නවෝත්පාදන සඳහා මෙහෙයැවේ.

විද්‍යාත්මක පර්යේෂණවල ප්‍රගමනය සහ දැනුම් ව්‍යාප්තිය ප්‍රගමනය සඳහා මෙවැනි ප්‍රයත්නයන් ඉතා වැදගත් භූමිකාවක් ඉටු කරන අතර, ශ්‍රී ලංකාවේ මෙන්ම ඉන් බැහැර රටවල ද සමාජ-ආර්ථික සංවර්ධනය සඳහා මෙමඟින් දායකත්වයක් ලැබෙන බව ප්‍රත්‍යක්ෂ කරුණකි. ශ්‍රී ලංකාවේ මාර්ගගත සඟරා සඳහා පවතින දැඩි නීති සහ ඉතා නිරවද්‍ය ආකාරයෙන් වූ ඇගයීම් නිර්ණායක සම්පූර්ණ කළ සඟරා හයක ඇතුළත් වීම ද සමඟින් 2023 වර්ෂයේ දී, ශ්‍රී ලංකාවේ මාර්ගගත සඟරාවල වේදිකාවේ සුවිශේෂී වර්ධනයක් සහ වැඩිදියුණුවීමක් දක්නට හැකි විය. ප්‍රමිතීන් පවත්වාගැනීමට සහ මෙම වේදිකාවේ පවතින ශාස්ත්‍රීය ප්‍රකාශනවල විවිධත්වය වැඩිදියුණු කිරීම සඳහා SLJOL වෙත පවතින කැපවීම මෙම පුළුල්වීම ඔස්සේ අවධානයට ලක්කෙරේ.

පසුගිය වසර මුළුල්ලේ, සඟරා කලාප 301 කින් ලබාගත් පර්යේෂණ පත්‍රිකා 2,550ක් SLJOLහි ප්‍රකාශයට පත්කර තිබේ. විවිධ අධ්‍යයන ක්ෂේත්‍ර හරහා සිදුකළ පර්යේෂණ සොයාගැනීම් ව්‍යාප්ත කිරීම සඳහා පහසුකම් සැලසීම සඳහා මෙම වේදිකාවේ පවතින කැපවීම මෙම ප්‍රකාශන ධාරිතාවයෙන් අවධාරණය කෙරේ. වඩාත් වැදගත් කරුණ වනුයේ ශාස්ත්‍රීය ප්‍රකාශනවලට අදාළව ජාත්‍යන්තර යහපත් පරිචයන්ට අදාළව කටයුතු කිරීම සඳහා SLJOLහි ඇති කැපවීම පිළිබිඹු කරමින් INASP සහ African Journals Online විසින් සඟරා ප්‍රකාශයට පත්කිරීමට අදාළව 2017 දී ප්‍රකාශයට පත්කළ Journal Publishing Practices Standards හි ප්‍රමිති සමඟ මෙම ප්‍රකාශන අනුකූල වීමයි.

අඛණ්ඩ වර්ධනය සහ ප්‍රමිත සඳහා අනුකූලවීම ඔස්සේ ශ්‍රී ලංකාව තුළ මෙන්ම ඉන් බැහැර රටවල් කරා ද ශාස්ත්‍රීය සන්නිවේදන සහ දැනුම ව්‍යාප්ත කිරීම සඳහා වඟකිවයුතු වේදිකාවක් ලෙස SLJOLහි භූමිකාව පැහැදිලි කෙරේ. පර්යේෂණ ලිපි පළකිරීම සහ ව්‍යාප්ත කිරීම සඳහා සවිමත් යටිතල පහසුකම් සැපයීම ඔස්සේ, ශාස්ත්‍රීය පර්යේෂණවල ප්‍රගමනය සඳහා SLJOL දායක වන අතර, ලොවපුරා පර්යේෂකයන්, ආයතන සහ පාර්ශවකරුවන් අතර සහයෝගිත්වයන් ද වැඩිදියුණු කෙරේ.



රූප සටහන 51: SLJOLහි වර්ධනය

SLJOL වෙබ් අඩවියේ පරිශීලක හිතකාමී සෙවුම් මෙවලමක් පවතින අතර, මෙය ඉතා සුපරීක්ෂාකාරී අයුරින් සැලසුම් කර ඇති මෙම මෙවලම ඔස්සේ පර්යේෂකයන්ට සිය නිශ්චිත අධ්‍යයන ක්ෂේත්‍රවලට අදාළ පත්‍රිකා සොයාගත හැකි ය. මෙම පහසුවෙන් භාවිතා කළ හැකි මෙවලම මගින් අදාළ ශාස්ත්‍රීය අන්තර්ගතයන් වෙත ප්‍රවේශවීමේ ක්‍රියාවලිය සරල හා සුසංවිධිත කරන අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් පර්යේෂණ ප්‍රයත්නයන්ගේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කෙරේ. 2023 වර්ෂයේ දී ලොවපුරා රටවල් 200ක විවිධ පරාසයක වූ නරඹන්නන් 1,597,301 ක් සමඟ ආකර්ෂණීය නියැලීමේ අනුපාතිකයක් SLJOL වෙබ් අඩවිය සඳහා වූ ගූගල් විශ්ලේෂණාත්මක (Google Analytics) සංඛ්‍යාලේඛනවලින් අනාවරණය විය. ශාස්ත්‍රීය ප්‍රජාව අතර SLJOL වේදිකාවේ ගෝලීය ව්‍යාප්තිය සහ බලපෑම මෙම පුළුල් නියැලීම මගින් අවධාරණය වේ.

සම්පූර්ණ පත්‍රිකාවකම බාගත කරගැනීම් 192,958 ක් වූ සාධකය සමගින් මෙම කාල සීමාව පුරා SLJOL විසින් ගෝලීය මට්ටමින් සැලකිය යුතු බලපෑමක් සිදුකර ඇත. ශාස්ත්‍රීය අන්තර්ගතයන් පුළුල් ප්‍රේක්ෂක ප්‍රජාවක් වෙත ව්‍යාප්ත කිරීමට පහසුකම් සැලසීම සඳහා SLJOL වේදිකාවේ වැදගත් භූමිකාව එම බාගත කරගැනීම් තුළින් හැඟවෙන අතර, ලොවපුරා පර්යේෂකයන්, අධ්‍යාපඥයන් සහ සිසුන් සඳහා ප්‍රමුඛ සම්පතක් ලෙස එහි සුවිශේෂිත්වය ද මෙයින් අවධාරණය කෙරේ.

සමස්තයක් ලෙස වටිනා ශාස්ත්‍රය සම්පත් සමගින් පර්යේෂකයන් සම්බන්ධ කිරීම සහ විවිධ අධ්‍යයන ක්ෂේත්‍රවල දැනුම ව්‍යාප්ත කිරීමේ ප්‍රගමනයෙහිලා එහි දායකත්වය සම්බන්ධයෙන් SLJOL හි සඵලතාවය මෙම සංඛ්‍යා ලේඛනවලින් මතුකර දැක්වේ.

වගුව 03: SLJOL පරිශීලකයන්ගේ ගෝලීය ව්‍යාප්තිය

SLJOL පරිශීලකයන්ගේ ගෝලීය ව්‍යාප්තිය (ප්‍රමුඛ රටවල් තිස්හය)	
රට	**පරිශීලකයන් සංඛ්‍යාව**
ශ්‍රී ලංකාව	**88,800**
ඉන්දියාව	**19,300**
ඇමරිකා එක්සත් ජනපදය	**9,800**
පිලිපීනය	**6,100**
එක්සත් රාජධානිය	**5,400**
චීනය	**4,800**
ඉන්දුනීසියාව	**4,300**
නයිජීරියාව	**3,200**
පකිස්තානය	**3,100**
ඕස්ට්‍රේලියාව	**2,700**
ජර්මනිය	**4,200**
මැලේසියාව	**1,800**
කැනඩාව	**1,500**
ඊජිප්තුව	**1,300**
සිංගප්පූරුව	**1,300**
ජපානය	**1,100**
ප්‍රංශය	**1,100**
බංග්ලාදේශය	**1,000**
තුර්කිය	**1,000**
දකුණු කොරියාව	**953**
නෙදර්ලන්තය	**864**
තායිලන්තය	**776**
බ්‍රසීලය	**741**
ඉතාලිය	**719**
හොංකොං	**696**
ඉතියෝපියාව	**689**
වියට්නාමය	**665**
නේපාලය	**603**
මෙක්සිකෝව	**563**
එක්සත් අරාබි එමීර් රාජ්‍යය	**491**
ස්පාඤ්ඤය	**457**
දකුණු අප්‍රිකාව	**447**
රුසියානු සමූහාණ්ඩුව	**443**
සවුදි අරාබිය	**424**
කෙන්යාව	**415**
ෆින්ලන්තය	**396**

SLJOL භාවිතා කිරීම සුවිශේෂී වශයෙන් ඉහළ යෑම සමගින් 2015 සිට 2023 වර්ෂය දක්වා කාල සීමාවේ දී පූර්ණ පත්‍රිකාවකම බාගත කරගැනීම් ඉහළ යෑමත් සැලකිය යුතු කරුණකි. මෙම නිශ්චිත කාල සීමාව තුළ එකී වේදිකාවේ බලපෑම හා ප්‍රවණතාවයේ සාධනීයත්වය මෙම ඉහළ යෑමේ ප්‍රවණතාවය තුළින් පිළිබිඹු වේ.

වටිනා ශාස්ත්‍රීය සම්පත් ලබාදෙමින් සහ අදාළ පර්යේෂණ පත්‍රිකා වෙත ප්‍රවේශය සඳහා පහසුකම් සැලසීමෙන් SLJOL මාර්ගගත වේදිකාව විසින් පර්යේෂකයන්ගේ, අධ්‍යයන පිරිස් සහ අනෙකුත් පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා කාර්යක්ෂම අයුරින් සපුරාලීම සිදුකර ඇති බව භාවිතා කිරීම ඉහළ යෑම තුළින් ඉදිරිපත් කෙරේ. මීට අමතරව, සම්පූර්ණ ලිපියම බාගත කරගැනීම් ඉහළ යෑමෙන් පුළුල් ප්‍රේක්ෂක පිරිසක් කරා ශාස්ත්‍රීය අන්තර්ගතයන් ව්‍යාප්ත කිරීමෙන් ශ්‍රී ලංකාව තුළ මෙන්ම ඉන් බැහැර රටවල් තුළ ද දැනුම හා පර්යේෂණවල ප්‍රගමනය සඳහා දායකවීම පිණිස එකී වේදිකාවේ භූමිකාව අවධාරණය කෙරේ.



රූප සටහන 52: SLJOL හි පරිශීලකයන්



රූප සටහන 53: SLJOL වෙතින් සිදුකර ඇති බාගත කරගැනීම්

සඟරාවල ගුණාත්මකබව සහ සවිමත් බව වැඩිදියුණු කිරීමට සහ ඒවායේ තිරසරබව පවත්වාගැනීම පිණිස SLJOL වේදිකාවේ පවතින සඟරා ඇගයීම



රූප සටහන 54: SLJOL හරහා සඟරා කලාප ප්‍රකාශයට පත්කිරීමේ කාර්යක්ෂමතාවය

ශ්‍රී ලංකාවේ මාර්ගගත සඟරාවල (SLJOL) අත්‍යවශ්‍ය වගකීමක් වනුයේ එහි සාර්ථකත්වය තක්සේරු කිරීම සඳහා නියමිත කාලන්තරවලදී ඇගයීම් පැවැත්වීම යි. විභව්‍ය අභියෝග හඳුනාගැනීම සහ සඟරා වැඩිදියුණු කිරීම සඳහා නිවාරක ක්‍රියාමාර්ග අවශ්‍ය කෙරේ ද යන්න නිර්ණය කිරීම, ශාස්ත්‍රීය කටයුතුවල නිරත ප්‍රජාවේ අවශ්‍යතා සපුරාලීම සඳහා මේවා වඩාත් සවිමත් කිරීම හා සාර්ථක කිරීම මෙම තක්සේරුවලින් අරමුණු කෙරේ. කාර්ය සාධනය අධීක්ෂණය කිරීම වැඩිදියුණු කිරීම සඳහා ක්ෂේත්‍ර හඳුනාගැනීම ඔස්සේ ශාස්ත්‍රීය ලිපි ප්‍රකාශයට පත්කිරීමේ දී ක්‍රමිකව ඇතිවෙමින් පවතින ප්‍රවණතා සහ ප්‍රමිති අනුගමනය කිරීම, සහ මෙම වේදිකාවේ පළ කරන සඟරාවල ගුණාත්මකබව හා අදාළත්වය සහතික කිරීම සඳහා SLJOL වෙත අවස්ථාව සැලසේ. මෙම ඇගයීමේ ඔස්සේ ශ්‍රී ලංකාව තුළ සහ ඉන් බැහැරට පර්යේෂකයන්ගේ, කර්තෘවරුන්ගේ සහ පාඨකයන්ගේ අවශ්‍යතා වෙනුවෙන් කටයුතු කිරීමේ දී SLJOL හි ඵලදායිතාවය පවත්වාගැනීම සිදුකළ හැකි ය.

යථොක්තව සඳහන් කර ඇති කාර්යයන් පහත දක්වා ඇති ආකාරයෙන් සම්පූර්ණ කරගැනීම සඳහා 2023 වර්ෂයේ දී SLJOL විසින් කර්තෘවරුන් වෙත සහාය ලබාදී ඇත.

- පත්‍රිකා මාර්ගගත ආකාරයෙන් ඉදිරිපත් කිරීමට හැකිවීම, SLJOL විසින් මෙහෙයැවෙන සඟරා කළමනාකරණ පද්ධතිය ඔස්සේ ඩිජිටල් පරිසරයක දී සමස්ත සංස්කරණ ක්‍රියාවලියට ඉඩහැරීම සඳහා සඟරා 18කට පහසුකම් සලස්වන ලදී.

- SLJOL වේදිකාව ඔස්සේ සිය සංස්කරණ හා ප්‍රකාශන ක්‍රියාවලි වැඩිදියුණු කරගැනීම සඳහා සඟරා හතරකට 2023 වර්ෂය තුළ දී පහසුකම් සලස්වන ලදී. මෙම පද්ධතිය, එහි විශ්වාසනීයත්වය හා සංගතබව හේතුවෙන් විවිධ භූගෝලීය කලාපවලින් ඉතා ඉහළ ගුණාත්මක තත්ත්වයේ පර්යේෂණ ලිපි ඉදිරිපත් කිරීම් ලබාගැනීමට සමත්වී ඇත. සංස්කරණ මණ්ඩලයේ විසින් කාර්යයයේ නියැලීමේ ප්‍රශස්තකරණය, අවම කාර්ය මණ්ඩලයක් සමගින් සමස්ත කාර්ය මණ්ඩල කාර්යක්ෂමතාවය වැඩිදියුණුවීම හරහා අනෙකුත් ලිපිවලදී මෙම වේදිකාව සඳහා යොමුගතවීම් සහ සඟරා පිළිබඳ දැනුවත්බව ඉහළ යෑමට දායකවන ලද අතර සුචිගතවීම හා ශ්‍රේණිගතවීම් සඳහා ද මෙමගින් රුකුලක් ලැබුණු අතර එම සියලු කරුණු හේතුවෙන් එකී සඟරාවල පිළිගැනීම වැඩිදියුණු විය.

- SLJOL සඳහා අදාළ Gold Open Access Journals - "Gold Open Access Journal" යන යෙදුම මගින් අදහස් වනුයේ Creative Commons (CC) Attribution 4.0 International Public License *(https://creativecommons.org/licenses/by/4.0/)* යටතේ සඟරාවක පත්‍රිකා වෙත විවෘත ප්‍රවේශය ලබාදීම යි. මේ සඳහා සහායක් ලෙස SLJOL මාර්ගගත වේදිකාවේ පළවන සඟරා 12 ක කර්තෘවරු සඳහා එම CC ප්‍රකාශ ජනනය කරගැනීමට සහාය ලබාදෙන ලදී. ඉන් අනතුරුව, එකී බලපත්‍රයේ කොන්දේසි ප්‍රකාරව ලිපිවල අන්තර්ගතයන් උපුටාගත හැක්කේ කෙසේ ද යන්න පාඨකයන් වෙත පැහැදිලි කරමින් මෙම CC ප්‍රකාශ එකී සඟරාවල වෙබ් අඩවි තුළට සහ සියලුම පත්‍රිකාවල පළමු පිටුවට ඇතුළත් කරන ලදී.

- වර්ෂය පුරා SLJOL පරිශීලකයන් සඳහා පරිශීලක සහාය සහ දැනුවත් කිරීම් නිරතුරුව ලබාදෙන ලදී.

- පරිශීලකයන් 128 ක් සංස්කාරකවරු, ආංශික සංස්කාරකවරු, කර්තෘවරු, සමාලෝචකවරු සහ පිටපත් කිරීමේ සංස්කාරකවරු වශයෙන් වර්ෂය පුරා ලියාපදිංචි කරන ලදී.

- සඟරාවල මුල් පිටුවල පහත දක්වෙන කොටස්වලට අදාළව තොරතුරු සැපයීමේ තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා වෙබ් අඩවි යාවත්කාලීන කිරීම් 192ක් සිදුකරන ලදී.

    1. සංස්කාරක සහ සංස්කාරක මණ්ඩලය පිළිබඳ යාවත්කාලීන සහ නිරවද්‍ය විස්තර
    2. කර්තෘවරු සඳහා පැහැදිලි සහ සවිස්තරාත්මක මාර්ගෝපදේශ
    3. සංස්කරණ ප්‍රතිපත්ති, දත්ත ප්‍රතිපත්ති සහ සමපදස්ථ කණ්ඩායම් විසින් සමාලෝචනය කිරීමේ ක්‍රියාවලි පිළිබඳ විස්තර
    4. මාර්ගගත ආකාරයෙන් සිදුකරන සමපදස්ථ කණ්ඩායම් විසින් සමාලෝචනය කිරීමේ ක්‍රියාවලියට අදාළ සමාලෝචනය කිරීමේ ආකෘති
    5. නිල බලපත්‍රය පිළිබඳ ප්‍රකාශය ඇතුළත්ව විධිමත් ප්‍රකාශන හිමිකම් ප්‍රකාශ
    6. ප්‍රකාශන කටයුතුවලට අදාළ ආචාර ධර්ම පිළිබඳ කමිටුවේ (COPE) සාමාජිකත්වයට අදාළ ප්‍රකාශන

- සංස්කාරකවරු විසින් ඉල්ලා සිටි පරිදි 'පර්යේෂණ ඒකාග්‍රතාවය' යන කාණ්ඩය සඟරා හතරක (04) මුල් පිටු සඳහා අලුතින් එක් කරන ලදී. උපුටාගැනීම්වලට අදාළ දත්ත සමුදාවල සුචිගතවීම සඳහා සපුරාගැනීම අත්‍යවශ්‍ය වූ සංස්කාරකවරුන්ගේ, සමාලෝචකවරුන්ගේ, කර්තෘවරුන්ගේ සහ සදාචාරාත්මක වූ පර්යේෂණයක වගකීම්වලට අදාළ විස්තර මෙම නව එකතු කිරීමත් සමඟ ඇතුළත් විය.

සඟරාවක කලාපවල සෑම පත්‍රිකා සඳහාම Digital Object Identifiers (DOIs) ලබාදීම

මෙම වර්ෂය තුළ සඟරා කලාප 301 ක පත්‍රිකා 2,532 ක් සඳහා crossref.org වෙත මෙටාදත්ත ගොනු ඉදිරිපත් කිරීමේ දී Digital Object Identifiers (DOIs) ලබාදෙන ලදී. යම් පත්‍රිකා වෙත ලබාදෙන DOI මගින් අනන්‍ය හඳුනාගැනීමක් ලබාදෙන අතර, අන්තර්ජාලය තුළ ස්ථානගතවීමේ හෝ මෙටාදත්තවල වෙනසක් සිදුවුව ද අදාළ පත්‍රිකාව විශ්වාසනීය අයුරින් ලබාගැනීම හා යොමුගත වීම මෙමගින් සහතික කෙරේ.

ජාතික ඩිජිටල්කරණ ව්‍යාපෘතිය (National Digitization Project)

විද්‍යා සහ තාක්ෂණ තොරතුරුවලින් සවිබල ගැන්වීම හා එම තොරතුරු ව්‍යාප්ත කිරීම සඳහා ජාතික විද්‍යා පදනම විසින් 2011 වර්ෂයේ දී ජාතික ඩිජිටල්කරණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. මෙරට ආයතනවල ශාස්ත්‍රීය ලිපිලේඛන එකතු ඩිජිටල්කරණය, මාර්ගගත ඉ-කෝෂ්ඨාගාර හරහා සම්පත් වෙත ගෝලීය වශයෙන් ප්‍රවේශය ඇතිකිරීම මෙම ව්‍යාපෘතිය මගින් අරමුණු විය. DSpace නැමති මෘදුකාංගය භාවිතා කරමින් ජාතික විද්‍යා පදනම විසින් ඉ-කෝෂ්ඨාගාර විශාල සංඛ්‍යාවක් ඇතිකරන ලද අතර, මෙම ජාතික ඩිජිටල්කරණ ව්‍යාපෘතියෙහි තුන්වන අදියර 2023 වර්ෂයේ දී සාර්ථකව නිමකරන ලදී. පුස්තකාල එකතු 25ක් සහ ආයතනික කෝෂ්ඨාගාර (IRs) 25ක් ස්ථාපනය කිරීම පසුගිය වසර කිහිපය මුළුල්ලේ සිදුකරන ලද ඩිජිටල්කරණ ප්‍රයත්නයන් යටතට ඇතුළත් වේ. 2023 වර්ෂය අවසානයට එළැඹීමේ දී, මෙම ආයතනික කෝෂ්ඨාගාර හරහා ආසන්න වශයෙන් ලේඛන 144,876ක් සඳහා මාර්ගගත ප්‍රවේශය ලබාදී ඇත.

තවද, 2023 වර්ෂයේ දී තවත් ආයතන හයක ඉ-කෝෂ්ඨාගාර ජාතික විද්‍යා පදනමේ සර්වරය සමග සම්බන්ධ වී ලිපි 8,289ක් සඳහා මාර්ගගත ප්‍රවේශය ලබාදෙන ලදී. ශාස්ත්‍රීය තොරතුරු වෙත ප්‍රවේශය වැඩිදියුණු කිරීමට සහ ශ්‍රී ලංකාවේ විද්‍යා කටයුතුවල නිරත ප්‍රජාව තුළ දැනුම ව්‍යාප්ත කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා දැනට කෙරිගෙන යමින් පවතින ප්‍රයත්නයන් මෙමගින් පිළිබිඹු කෙරේ.



රූප සටහන 55: ආයතන මගින් ප්‍රකාශයට පත්කළ ලිපි සංඛ්‍යාව

පසුගිය වසර කිහිපය මුළුල්ලේ ඩිජිටල්කරණ සේවා සහ ජාතික විද්‍යා පුස්තකාල සහ සම්පත් මධ්‍යස්ථානය විසින් සපයනු ලබන කෝෂ්ඨාගාර සඳහා ඇති ඉල්ලුමේ සැලකිය යුතු ඉහළ යෑමක් පවතී. මෙම ඉල්ලුම සඳහා ප්‍රතිචාරාත්මක වශයෙන්, 2023 වර්ෂයේ දී සිය ලේඛන එකතුව ඩිජිටල්ගත කිරීම හා කෝෂ්ඨාගාර ස්ථාපනය කිරීම සඳහා කොළඹ ශ්‍රී ලංකා වෛද්‍ය පුස්තකාලය සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ඉල්ලීම් කරන ලදී. මෙම ව්‍යාපෘති ද්විත්වය 2024 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති අතර, ශ්‍රී ලංකාවේ ඩිජිටල්ගත කර ඇති සම්පත් තවදුරටත් පුළුල් කිරීම හා වටිනා තොරතුරු සඳහා වන ප්‍රවේශය වැඩිදියුණු කිරීම සිදුකරමින් පවතී.

ජාතික විද්‍යා පදනමේ සර්වරය සමඟ සම්බන්ධ කර ඇති කෝෂ්ඨාගාර සඳහා ඇති ප්‍රවේශය අඛණ්ඩව අධීක්ෂණය කරන අතර, සෑම වර්ෂයක් තුළම සිදුකළ බාගත කරන ලද පත්‍රිකා සංඛ්‍යාවේ සහ සෙවුම් සංඛ්‍යාවේ කැපීපෙනෙන වර්ධනයක් පවතී. සමාලෝචිත වර්ෂය තුළ දී, මේ වෙත ප්‍රවේශ වී සිදුකරන ලද පත්‍රිකා නිරීක්ෂීම් මිලියන 8කට වැඩි සංඛ්‍යාවක් සහ සම්පූර්ණ පත්‍රිකාවකම බාගත කරගැනීම් 359,000කට වැඩි සංඛ්‍යාවක් වාර්තා වී ඇත. ලේඛන භාවිතයේ සුවිශේෂී ඉහළ යෑම මගින් ශාස්ත්‍රීය තොරතුරු සඳහා වටිනා ප්‍රවේශයක් ලබාදීම සඳහා මෙම කෝෂ්ඨාගාරවල වැදගත්කම අවධාරණය වන අතර පර්යේෂණ සහ දැනුම ව්‍යාප්ත කිරීමට පහසුකම් සැලසීම සඳහා ඒවායේ බලපෑම ද පෙන්නුම් කෙරේ.

විද්‍යාත්මක තොරතුරුවල ජාතික දත්ත සමුදාය වැඩිදියුණු කිරීම හා නඩත්තු කිරීම



රූප සටහන 56: 2023 වර්ෂයේ දී සිදුකරන ලද සෙවුම් සංඛ්‍යාව



රූප සටහන 57: 2023 වර්ෂයේ දී සිදුකරන ලද සම්පූර්ණ පත්‍රිකාවකම බාගත කරගැනීම් සංඛ්‍යාව

පොදු ප්‍රවේශය සහිත පුස්තකාල කළමනාකරණ මෘදුකාංග භාවිතා කරමින් ජාතික විද්‍යා පදනම සහ අනෙකුත් විද්‍යා සහ තාක්ෂණ ආයතන සඳහා ඉ-කෝෂ්ඨාගාර, ආශ්‍රිත ග්‍රන්ථ පිළිබඳ නාමාවලි, පුස්තකාල ග්‍රන්ථ නාමාවලි සකස් කිරීම/ නඩත්තු කිරීම

මාර්ගගත ඉ-කෝෂ්ඨාගාර, විද්‍යා ආශ්‍රිත ග්‍රන්ථ පිළිබඳ නාමාවලිවලින්ගේ දත්ත සමුදා සඳහා වේදිකා, සහ පුස්තකාල නාමාවලි කිහිපයක් සකස් කිරීමේ කටයුතුවල ශ්‍රී ලංකාවේ ජාතික විද්‍යා පදනමේ ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානය (NSLRC) විසින් නියැලෙන ලදි. මෙම ප්‍රයත්නයන් සඳහා අදාළ ආයතන අතරට ජාතික විද්‍යා පදනම, SLSTINETහි සාමාජික පුස්තකාල (ශ්‍රී ලංකා විද්‍යාත්මක සහ තාක්ෂණික තොරතුරු ජාලය) සහ පාසැල් පුස්තකාල ද ඇතුළුව අනෙකුත් පුස්තකාල ඇතුළත් විය. ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානයේ තොරතුරු තාක්ෂණ විශේෂඥයන් විසින් DSpace, Koha, Java CDS/ISIS සහ JavaScript, HTML5 හා jQuery වැනි ඉහළ මට්ටමේ GUI මෙවලම් වැනි පොදු ප්‍රවේශය සහිත පුස්තකාල කළමනාකරණ මෘදුකාංග මෙම කාර්යයන් සඳහා යොදාගන්නා ලදී.

ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානය විසින් සකස් කරනු ලැබූ ජාතික විද්‍යාත්මක දත්ත සමුදායන් හා පුස්තකාල නාමාවලියේ විශිෂ්ටත්වය සහතික කිරීම සඳහා මෙම අංශය විසින් දත්ත සමුදායන්ගේ මෙටා දත්ත අන්තර්ගතයන් කාර්යක්ෂමව පරීක්ෂාකරන ලදී. විශේෂයෙන්ම, ශ්‍රී ලාංකික කර්තෘවරු විසින් ප්‍රකාශයට පත්කළ පර්යේෂණ ලිපි 70,000කට අධික සංඛ්‍යාවකින් සමන්විත ශ්‍රී ලංකා විද්‍යා සුචිගත දත්ත සමුදායේ (SLSID) සෑම පත්‍රිකාවක්ම සඳහාම සාරාංශ එක්කිරීම සඳහා NSLRC කාර්ය මණ්ඩලය විසින් අවධානය යොමු කරන ලදී. 2023 වර්ෂයේ දී, මෙම දත්ත සමුදායේ සංක්ෂේප ද ඇතුළුව 11,317ක් වූ වාර්තා සංඛ්‍යාවක් සංස්කරණය කරන ලදී.

මීට අමතරව, KOHA ඒකාබද්ධ පුස්තකාල කළමනාකරණ මෘදුකාංගය යොදාගෙන පුස්තකාල නාමාවලියේ දත්ත සංස්කරණය හා යාවත්කාලීන කිරීම සඳහා කටයුතු කරන ලදී. ලබාදෙන තොරතුරුවල නිරවද්‍යතාවය සහ අදාළත්වය සහතික කරමින් සංස්කරණය කළ වාර්තා 2,225 ක ප්‍රගතියක් වාර්තා කරන ලදී. තව ද, සමස්ත ගුණාත්මකභාවය සහ විශ්වාසනීයත්වය සඳහා දායකත්වය ලබාදෙමින් පර්යේෂණ සහ තාක්ෂණ ප්‍රදාන දත්ත සමුදායේ (RTGRA) වාර්තා 1,034 ක් ද සංස්කරණය කරන ලදී.



රූප සටහන 58: NSLRC දත්ත සමුදායන් වෙත එකතු කරන ලද වාර්තා සංඛ්‍යාව

ශ්‍රී ලංකා විද්‍යා සුචිගත දත්ත සමුදාය (SLSID) සඳහා වාර්තා 820ක්, ජාතික විද්‍යා පදනමේ ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානය (NSLRC) සඳහා වාර්තා 241ක් සහ ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය (SLASS) (ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ වාර්ෂික සැසියේ සංක්ෂේප) සඳහා වාර්තා 160ක් සමඟින් සමාලෝචිත වර්ෂයේ දී ජාතික විද්‍යා පදනම විසින් සිය විද්‍යාත්මක තොරතුරු සම්පත් සවිමත් කරන ලදී. ශ්‍රී ලංකාවේ විද්‍යාත්මක තොරතුරු සඳහා විශ්වාසනීය ප්‍රභවයක් වශයෙන් වූ අගය වැඩිදියුණු කරමින් මෙම දත්ත සමුදායන්ගේ සවිස්තරාත්මක හා යාවත්කාලීන ස්වභාවය සඳහා මෙම එකතු කිරීම් දායක විය.



රූප සටහන 59: විවිධ දත්ත සමුදායන් වෙත ඇතුළත් කළ වාර්තා සංඛ්‍යාව

ආයතනවලට සිය මාර්ගගත සම්පත් තුළ සවිස්තරාත්මක, නිරවද්‍ය, සහ කාලීන බුද්ධිමය වාර්තා පවත්වාගෙන යෑම සඳහා ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානය (NSLRC) විසින් ආයතන වෙත අඛණ්ඩව සහාය ලබාදෙන ලදී. මෙම ප්‍රයත්නය සඳහා රුකුලක් වශයෙන් NSLRC විසින් පුස්තකාල සහ තොරතුරු තාක්ෂණ විශේෂඥයන් සඳහා මෘදුකාංග මෙවලම්, මාර්ගගත වේදිකා ආයතනික අවශ්‍යතානුකූලව සකස්කිරීම, අත්‍යවශ්‍ය මෙහෙයුම් පද්ධති, ජාල සැකසුම්, මෘදුකාංග ඉංජිනේරු මෙවලම් සඳහා සහාය, විවිධ තොරතුරු ආකෘති, සහ දත්ත සංක්‍රමණය වැනි විවිධ කරුණු ආශ්‍රිතව අඛණ්ඩව පුහුණුව ලබාදෙන ලදී. දත්ත හසුරුවාලීම, පරිශීලකයන් සඳහා සහාය, මාර්ගගත ප්‍රවේශය ලබාදීම සහ සකස්කරන ලද දත්ත සමුදා සඳහා වෙබ් අඩවිය ලබාදීම ආදිය ඵලදායී අයුරින් සිදුකිරීමට මෙම පුහුණු ඔස්සේ වෘත්තිකයන්ට හැකි විය.

තවද, විද්‍යා සහ තාක්ෂණ ආයතන අතර සම්පත් හුවමාරු කරගැනීමේ හැකියාව අනාවරණය කරගැනීමට ද මෙම ප්‍රයත්නයන් ඔස්සේ අවස්ථාව විවර විය. ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානයේ මූලාරම්භයන් ඔස්සේ සකස් වූ විශේෂඥ දැනුම හා සම්පත් උපයෝගි කරගනිමින් විද්‍යාත්මක හා තාක්ෂණික අංශයේ දී වඩා ඵලදායී අයුරින් සහයෝගිත්ව ඇති කරගැනීම, දැනුම හුවමාරුව සහ පර්යේෂණ ප්‍රතිඵල වැඩිදියුණු කරගැනීම සිදුකිරීමට ආයතන වෙත හැකි වේ.

2023 වර්ෂයේ දී ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානය විසින් අනුරාධපුරයේ ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය සඳහා පුස්තකාල නාමාවලි සහ ඩිජිටල් කෝෂ්ඨාගාර ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී. වර්ෂය තුළ දී මෙම ව්‍යාපෘති සාර්ථකව නිම කිරීමට හැකිවූ අතර, එම ව්‍යාපෘති 2023 නොවැම්බර් 17 වැනි දින භික්ෂු විශ්වවිද්‍යාලයේ උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කනත්තේගොඩ සද්ධාරතන අනුනායක හිමි විසින් නිල වශයෙන් ආරම්භ කරන ලදී.



2023 වර්ෂයේ දී ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානය විසින් තිඹිරිගස්කටුව, මාරිස්ටෙලා විදුහල සඳහා පුස්තකාල නාමාවලියක් සහ ජනාධිපති ලේකම් කාර්යාලය සඳහා ඩිජිටල් කෝෂ්ඨාගාරයක් ස්ථාපනය කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී. පුස්තකාල කාර්ය මණ්ඩලය සඳහා පුහුණුවක් ලබාදීම පිණිස NSLRC කණ්ඩායම 2023 දෙසැම්බර් මාසයේ දී මාරිස්ටෙලා විදුහලට පැමිණෙන ලදී. වර්ෂය තුළ දී මාරිස්ටෙලා විදුහල සඳහා වූ ව්‍යාපෘතිය සාර්ථකව නිමාකරන ලද අතර, එය 2024 වර්ෂයේ දී ආරම්භ කිරීමට නියමිතව ඇත.

මීට අමතරව, ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානය විසින් ජනාධිපති ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය සඳහා ඩිජිටල් කෝෂ්ඨාගාරයක් ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතියේ කොටසක් වශයෙන් DSpace මෘදුකාංගය සම්බන්ධයෙන් තවත් පුහුණු වැඩසටහනක් 2023 දෙසැම්බර් මාසයේ දී සංවිධානය කරන ලදී.



Koha පුස්තකාල නාමාවලි පුහුණු වැඩසටහන, මාරිස්ටෙලා විදුහල, තිඹිරිගස්කටුව



ජාතික විද්‍යා පදනමේ දී ජනාධිපති ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය සඳහා පවත්වන ලද DSpace ඩිජිටල් කෝෂ්ඨාගාරය පිළිබඳ පුහුණු වැඩසටහන

නාමාවලිය සාර්ථකව දියත් කිරීමට පහසුකම් සැලැස්වීම පිණිස Koha ඒකාබද්ධ ඩිජිටල් පුස්තකාල මෘදුකාංගය සම්බන්ධයෙන් ආදර්ශනයක් සිය කාර්ය මණ්ඩලය සඳහා පවත්වන ලෙස ශ්‍රී ලංකාවේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානය වෙත ආරාධනාවක් සිදුකරන ලදී. මෙම කාර්යය 2023 ජූලි මස 14 වැනි දින සිදුකරන ලදී. මීට අමතරව, ජාතික විද්‍යා පදනමේ ජාතික ඩිජිටල්කරණ ව්‍යාපෘතිය යටතේ ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානය විසින් සකස් කරන ලද වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉ-කෝෂ්ඨාගාරය තවදුරටත් වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් ද සාකච්ඡා පවත්වන ලදී.



Koha ඩිජිටල් පුස්තකාල මෘදුකාංගය සහ *DSpace* මෘදුකාංගය සම්බන්ධයෙන්
වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ දී පැවති ආදර්ශන වැඩසටහන

ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානය විසින් සිය සහයෝගය යටතේ සකස් කරන ලද දත්ත සමුදායන් හෝ කෝෂ්ඨාගාර සම්බන්ධයෙන් සම්පත් හා ඵලදායී දෝෂ නිවාරණ කාර්යය, දත්ත සංක්‍රමණ, සහ සංස්කරණ වැඩිදියුණු කිරීමේ සේවා සඳහා අනෙකුත් ආයතන වෙත අඛණ්ඩව සහාය ලබා දෙනු ලැබේ. වෙනත් ආයතනවල හෝ ජාතික විද්‍යා පදනමේ සර්වරය ආශ්‍රිතව මෙම වේදිකා මාර්ගගත කරන ලදී. 2023 වර්ෂයේ දී, ජාතික විද්‍යා පදනම මෙන්ම වෙනත් ආයතන සඳහා ද 100කට අධික දෝෂ නිවාරණ කාර්යයන් සිදුකර තිබේ.

තවද, ශ්‍රී ලංකාවේ ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2023 වර්ෂයේ දී සිය ඉ-කෝෂ්ඨාගාරය 4.1 සංස්කරණයේ සිට 6.3 සංස්කරණය දක්වා වැඩිදියුණු කරදෙන ලෙස ඉල්ලා සිටින ලදී. දත්තවල ඒකීයබව සහතික කරමින් මෙම කාර්යය සුපරීක්ෂාකාරී අන්දමින් මෙහෙයවන ලද අතර, නව සංස්කරණය වෙත සංක්‍රමණය වීම 2023 සැප්තැම්බර් මාසයේ දී නිමාකරන ලදී.

වගුව 04: NSLRC විසින් සපයන ලද සේවාවල සාරාංශයක්

	ආයතනයේ නම	කාර්යය	අදාළ මෘදුකාංගය	2023 වර්ෂයේ දී එකතු කරන ලද මුළු වාර්තා සංඛ්‍යාව
01	අනුරාධපුරය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ පුස්තකාල නාමාවලිය http://catalogue.busl.ac.lk/	2023	Koha	නාමාවලි – 5,963 බෙදාහැරීම් – 901
02	අනුරාධපුරය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ ඉ-කෝෂ්ඨාගාරය https://repo.busl.ac.lk/	2023	DSpace	1851
03	මාරිස්ටෙලා විදුහල, තිඹිරිගස්කටුව පුස්තකාල නාමාවලිය http://38.242.147.208	2023	Koha	නාමාවලි – 5,879 බෙදාහැරීම් – දැනට කෙරීගෙන යමින් පවතී
04	ජනාධිපති ලේකම් කාර්යාලයේ ඉ-කෝෂ්ඨාගාරය https://dlib.presidentsoffice.gov.lk/	2023	DSpace	දැනට කෙරීගෙන යමින් පවතී
05	අනු/ ස්වර්ණපාලි බාලිකා මහා විද්‍යාලය, අනුරාධපුරය ඩෙස්ක්ටොප් යෙදුම	2023	JAVA CDS/ISIS	දැනට කෙරීගෙන යමින් පවතී
06	ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල කාන්තා සම්මේලනය (SLFUW), කොළඹ ඩෙස්ක්ටොප් යෙදුම	2023	JAVA CDS/ISIS	2192
07	පොල් පර්යේෂණ ආයතනය http://viduketha.nsf.gov.lk/cribib	2022	JAVA CDS/ISIS	2000



අනුරාධපුරය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ පුස්තකාල නාමාවලිය



අනුරාධපුරය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ ඉ-කෝෂ්ඨාගාරය

ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය (SLAAS) සඳහා එහි සාමාජිකයන් පිළිබඳ දත්ත සමුදාය සකස් කිරීම

2023 වර්ෂයේ දී ජාතික විද්‍යා පදනමේ ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානය (NSLRC) විසින් ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය සඳහා එහි සාමාජිකත්වයට අදාළව සවිස්තරාත්මක හා පරිශීලක-හිතකාමී මාර්ගගත දත්ත සමුදායක් සාර්ථක අයුරින් සකස් කරන ලදී. සාමාජිකත්වය ලබාගැනීමේ කටයුතු කඩිනමින් ඉටුකිරීමට හැකියාව ඇතිකරමින් සහ සංගමයේ ලියාපදිංචි විද්‍යාත්මක පර්යේෂණවල නියුතු විශේෂඥයන් සඳහා පහසු ප්‍රවේශයක් ලබාදෙමින් මෙම දත්ත සමුදාය විසින් දත්ත කළමනාකරණයේ සාම්ප්‍රදායික ක්‍රමවේද විප්ලවීය වෙනසකට බඳුන් කරන ලදී. ශාස්ත්‍රපති හා ආචාර්ය උපාධි වැනි ඉහළ මට්ටම්වල උපාධි හදාරන විභව්‍ය අපේක්ෂකයන් (HDR candidates), රජයේ නියෝජිතායතන, සහ මාධ්‍ය වෙත තොරතුරු ඉදිරිපත් කළ යුතු විශේෂඥයන් වැනි ප්‍රධාන බාහිර සහභාගිකයන් ඉලක්ක කරගෙන මෙම දත්ත සමුදාය මගින් විද්‍යාත්මක පර්යේෂණ විශේෂඥ දැනුම පිළිබඳ තොරතුරු ලබාගැනීමට පහසුකම් සලස්වමින් සහයෝගිත්ව අවස්ථාවන් සඳහා රුකුලක් ලබාදේ.

මෙම සාමාජිකත්වය පිළිබඳ දත්ත සමුදාය සකස් කරන ලද්දේ ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ ප්‍රධානි සහ ජාතික විද්‍යා පදනමේ සභාපති වන මහාචාර්ය රංජිත් සේනාරත්න විසින් සිදුකරන ලද ඉල්ලීමක් අනුව ය. සාමාජිකත්ව සහ පර්යේෂකයන් පිළිබඳ තොරතුරු කළමනාකරණය සඳහා මෙම සාමාජිකත්වය පිළිබඳ දත්ත සමුදාය මගින් හැකියාව ලැබෙන අතර, එමගින් ඔවුන්ගේ පර්යේෂණ පිළිබඳව නිරාවරණය හා එහි බලපෑම් වැඩිදියුණු කෙරේ. දත්ත සමුදාය හරහා පර්යේෂකයන්ට ඔවුන්ගේ සුදුසුකම් හා පර්යේෂණ ප්‍රකාශන ඇතුළත් සවිස්තරාත්මක පැතිකඩවල් නිර්මාණය කළ හැකි ය. මෙම කාර්යය ඔස්සේ පර්යේෂකයන්ට සිය විශේෂඥතාවය ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලැබීම පමණක් නොව ගෝලීය වශයෙන් සිටින විභව්‍ය සහයෝගිතාකරුවන් සමඟ ජාලගතවීමට හා සහයෝගිත්ව අවස්ථා සඳහා පහසුකම් ද සැලසේ.

2023 දෙසැම්බර් 10 වැනි දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවති ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ 79 වැනි වාර්ෂික සැසිවාරයේ දී මෙම දත්ත සමුදාය නිල වශයෙන් එළි දක්වන ලදී. ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ ප්‍රධානි සහ ජාතික විද්‍යා පදනමේ සභාපති මහාචාර්ය රංජිත් සේනාරත්න මහතා සහ ජාතික විද්‍යා පදනමේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සේපාලිකා සුදසිංහ මහත්මිය සමඟ ප්‍රධාන ආරාධිත වශයෙන් මහාචාර්ය මොහාන් මුණසිංහ මහතා මෙම අවස්ථාවට එක්විණි. තව ද, ජාතික විද්‍යා පදනමේ ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානයේ ප්‍රධානී සහ ප්‍රධාන තොරතුරු නිලධාරී මනුජ කරුණාරත්න මහතා සහ මෙම සාමාජිකත්ව දත්ත සමුදාය සැකසීමේ කාර්යයේ වගකීම උසුලන ලද තොරතුරු නිලධාරිනි තස්නීම් නියාස් මහත්මිය ද මෙම විශේෂ අවස්ථාව සඳහා එක්විය.

http://192.248.80.26/slaasmemb









පවත්වන ලද පුහුණු වැඩසටහන්

ජාතික විද්‍යා පදනමේ ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානය විසින් WINISIS library management software, Java CDS/ISIS (J-ISIS) හි නවතම සංස්කරණය පිළිබඳ මාර්ගගත පුහුණු වැඩමුළුවක් 2023 ඔක්තෝබර් 19 සහ 20 දිනැතිව පවත්වන ලදී. ඩිජිටල් පුස්තකාල කළමනාකරණය සඳහා නවතම තාක්ෂණය යොදාගැනීම සඳහා පුස්තකාල හා තොරතුරු තාක්ෂණ වෘත්තිකයන්ගේ කුසලතා වැඩිදියුණු කිරීම සහ ඔවුන්ගේ පරිශීලක ප්‍රජාව සඳහා සුහුරු පුස්තකාල සේවා වැඩිදියුණු කිරීම මෙම වැඩමුළුවේ අරමුණ විය. ජාතික විද්‍යා පදනමේ තොරතුරු නිලධාරිනි තස්නීම් නියාස් මහත්මිය මෙම වැඩමුළුව සඳහා සම්පත්දායකයා වශයෙන් සහභාගි වූ අතර, ශ්‍රී ලංකා විද්‍යාත්මක සහ තාක්ෂණික තොරතුරු ජාලයේ එනම් SLSTINET පුස්තකාලවලින් සහ අනෙකුත් පුස්තකාලවලින් වෘත්තිකයන් 21 දෙනෙකු මීට සහභාගි විය. පුද්ගලික ආයතනවල ආයතනික කළමනාකරුවන් සහ ජාතික උපකරණ දත්ත සමුදාය (NID) සඳහා මෑතක දී එක්වූ රජයේ ආයතන සඳහා ජාතික විද්‍යා පදනමේ ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානය විසින් තවත් මාර්ගගත පුහුණු වැඩසටහනක් 2023 ජූලි 19 වැනි දින පවත්වන ලදී. ජාතික විද්‍යා පදනමේ තොරතුරු නිලධාරිනි තස්නීම් නියාස් මහත්මිය මෙම වැඩසටහන සඳහා සම්පත්දායකයා වශයෙන් සහභාගි වූ අතර, මීට 20 දෙනෙකු සහභාගි විණි.

ජාතික පර්යේෂණ සහ සංවර්ධන සමීක්ෂණය



ජාතික පර්යේෂණ සහ සංවර්ධන සමීක්ෂණය ඔස්සේ මෙරට පර්යේෂණ සහ සංවර්ධන කටයුතුවල කාර්ය සාධනය විමර්ශනය කෙරේ. 2020 මූල්‍ය වර්ෂය සඳහා සිදුකළ සමීක්ෂණය නිමාකළ අතර ඒ අනුව පර්යේෂණ සහ සංවර්ධන සංඛ්‍යානමය අත්පොත -2020 ප්‍රකාශයට පත්කරන ලදී. උසස් අධ්‍යාපන අංශය, රජයේ පර්යේෂණ සහ සංවර්ධන අංශය, වෙළඳ ව්‍යවසාය අංශය සහ ලාභ නොලබන පුද්ගලික අංශය යන සිව් අංශවලට අදාළව රට තුළ පර්යේෂණ සහ සංවර්ධන කටයුතුවල කාර්ය සාධනය මෙම සංඛ්‍යානමය අත්පොත මගින් පිළිබිඹු වේ.

පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සඳහා දළ වියදම (GERD), පර්යේෂණ සහ සංවර්ධන කටයුතුවල අරමුදල් මූලාශ්‍ර, පර්යේෂණ සහ සංවර්ධන කටයුතුවල නියැලි විද්‍යාඥයන් හා තාක්ෂඥයන්ගේ සංඛ්‍යාව වැනි පර්යේෂණ සහ සංවර්ධන යෙදවුම් හා සුචිගත සඟරාවල පළ වූ පර්යේෂණ ප්‍රකාශන සංඛ්‍යාව, පේටන්ට් හා කාර්මික සැලසුම් පිළිබඳ තොරතුරු, පශ්චාත් උපාධි සංඛ්‍යාව වැනි පර්යේෂණ සහ සංවර්ධන නිමැවුම් මෙම අත්පොතෙහි ඇතුළත්ව තිබේ. ආර්ථික සහයෝගිතාවය හා සංවර්ධනය සඳහා වූ සංවිධානය (OECD) විසින් සකස් කරන ලද ජාත්‍යන්තර ප්‍රමිති මත පදනම්ව මෙම සමීක්ෂණය සිදුකරනු ලැබේ.

2020 වර්ෂයේ පර්යේෂණ සහ සංවර්ධන සමීක්ෂණයේ සුවිශේෂී කරුණු

- 2020 වර්ෂය සඳහා පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සඳහා දළ වියදම (GERD) රටෙහි දළ දේශීය නිෂ්පාදිතයෙන් 0.12% කි.
- පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සඳහා ඉහළම අරමුදල් ප්‍රමාණයක් ප්‍රදානය කර ඇත්තේ රාජ්‍ය අංශය විසිනි (44%).



රූප සටහන 60: අරමුදල් මූලාශ්‍රය අනුව පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සඳහා වියදම

- පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සඳහා ඉහළම අරමුදල් ප්‍රමාණයක් වැයකර ඇත්තේ වෙළඳ ව්‍යවසාය අංශය විසිනි (37.94%).



රූප සටහන 61 : අංශ අනුව පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සඳහා දළ වියදම (GERD)

- පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සඳහා ඉහළම අරමුදල් ප්‍රමාණයක් වැයකර ඇති විෂය වනුයේ කෘෂි විද්‍යාවයි (27.65%)



රූප සටහන 62 : විද්‍යා විෂයයන් අනුව පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සඳහා දළ වියදම (GERD)



රූප සටහන 63 : පර්යේෂකයන් සංඛ්‍යාව

ජාත්‍යන්තර පාඨක පිරිස හා භාවිතය වැඩිදියුණු කිරීම සඳහා 2020 වර්ෂයේ පර්යේෂණ සහ සංවර්ධන සංඛ්‍යාලේඛන යුනෙස්තෝවේ සංඛ්‍යාලේඛන ආයතනය (UNESCO - UIS) වෙත ඉදිරිපත් කරන ලදී. මීට අමතරව, සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථවලට අදාළ 2020 වර්ෂයේ පර්යේෂණ සහ සංවර්ධන සංඛ්‍යාලේඛන, ශ්‍රී ලංකාවේ සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ දත්ත ආශ්‍රිත SDG data portal වෙත ඇතුළත් කරන ලදී. 2022 මූල්‍ය වර්ෂයට අදාළ පර්යේෂණ සහ සංවර්ධන සමීක්ෂණය සිදුකිරීම සඳහා වූ මූලික කාර්යයන් සම්පූර්ණ කරතිබේ.

විද්‍යා සහ තාක්ෂණ කළමනාකරණ තොරතුරු පද්ධතිය (STMIS)

විද්‍යා සහ තාක්ෂණ කළමනාකරණ තොරතුරු පද්ධතිය යනු ජාතික විද්‍යා පදනම විසින් 2004 වර්ෂයේ සිට සකස් කර පවත්වා ගෙන එනු ලබන පරිගණකගත තොරතුරු පද්ධතියකි. විද්‍යා සහ තාක්ෂණ කටයුතුවලට අදාළ ආයතන, විද්‍යා සහ තාක්ෂණ කටයුතුවල නිරත පුද්ගලයන්, ආයතන තුළ පවතින වැඩිදියුණු මට්ටමේ විද්‍යාත්මක උපකරණ, දැනට කෙරීගෙන යමින් පවතින පර්යේෂණ කටයුතු, ආයතන විසින් වැඩිදියුණු කර හුවමාරු කරගන්නා තාක්ෂණයන්, පොදු ජනතාව වෙත විද්‍යා සහ තාක්ෂණ ආයතන විසින් පිරිනමනු ලබන සේවා හා පුහුණු වැඩසටහන්, තනි විද්‍යාඥයන් විසින් සකස් කළ පර්යේෂණ ප්‍රකාශන ආදිය මෙම STMIS දත්ත සමුදායේ අන්තර්ගත වේ. වඩාත් හොඳ සේවාවක් සැපයීම සඳහා STMIS තුළ ක්‍රියාවලි මනාව සංවිධිත කිරීම සඳහා විවිධ පියවර ගෙන තිබේ.

ජාතික විද්‍යා පදනම විසින් පාලනය කරන තොරතුරුවල අයිතිය තහවුරු කරගන්නා අතර, වාණිජමය අරමුණුවලින් තොර නීත්‍යානුකූල කාර්යයන් සඳහා අදාළ පාර්ශවකරුවන් වෙත මෙම STMIS දත්ත පද්ධතිය තුළ ඇති හුවමාරු කරගත හැකි දත්ත වෙත ප්‍රවේශ වීම සඳහා වන මාර්ගෝපදේශ සකස් කිරීමේ අරමුණුතිව, විද්‍යා සහ තාක්ෂණ කළමනාකරණ තොරතුරු පද්ධතියට අදාළව දත්ත හුවමාරු ප්‍රතිපත්තියක් හඳුන්වාදෙන ලදී. මහජන අරමුදලින් ක්‍රියාත්මක වත්කමක් පිටපත් කිරීම වළක්වා ගැනීම අපේක්ෂා කරමින් STMIS පද්ධතිය තුළ ඇති දත්ත ප්‍රකීය ආකාරයෙන් අනාවරණය කිරීමට මෙමගින් හැකිවේ.

2023 වර්ෂයේ අවසානය වනවිට STMIS දත්ත පද්ධතිය තුළ ලියාපදිංචි සංඛ්‍යාව 7,300 ක් වශයෙන් වාර්තා වූ අතර, එයින් 163ක් මෙම වර්ෂය තුළ අලුතින් සිදුකළ ලියාපදිංචි කිරීම් වේ.



රූප සටහන 64: 2006 -2023 වර්ෂය දක්වා STMISහි ලියාපදිංචි සංඛ්‍යාව

විද්‍යාත්මක ප්‍රජාවගේ ප්‍රතිලාභ පිණිස විද්‍යාත්මක පාඨමාලා සහ විවිධ ඉසව්, ප්‍රදානයන් පිළිබඳ කැඳවීම් සහ අනෙකුත් රැකියා අවස්ථා ආවරණය කරමින් STMIS හරහා තොරතුරු ව්‍යාප්ත කිරීම

ලියාපදිංචි පිරිසේ ප්‍රයෝජනය සඳහා STMIS ඔස්සේ විද්‍යාත්මක පාඨමාලා සහ විවිධ ඉසව්, ප්‍රදානයන් පිළිබඳ කැඳවීම් සහ අනෙකුත් රැකියා අවස්ථා වැනි වැදගත් යාවත්කාලීන කිරීම් ව්‍යාප්ත කිරීමේ පහසුකම 2020 වර්ෂයේ මුල් භාගයේ දී හඳුන්වාදෙනු ලැබීය. පැහැදිලි මාර්ගෝපදේශ සහ සංවිධිත ක්‍රියාවලියක් සමඟ හඳුන්වා දුන් මෙම පහසුකම මගින් විද්‍යාත්මක ඉසව් සංවිධානය කිරීමේ කටයුතුවල නිරත බාහිර ආයතනවලට පුළුල් ප්‍රජාවක් වෙත සිය කටයුතු පිළිබඳ යාවත්කාලීන කිරීම් හා තොරතුරු ප්‍රචලිත කිරීමට පහසුකම් සලස්වන ලදී. මෙම පහසුකම විධිමත් පරිදි හඳුන්වාදීම තුළින් STMIS හි ලියාපදිංචි වී ඇති පිරිස්වලට ඔවුන් සඳහා ජාතික සහ ජාත්‍යන්තර දෙඅංශයේම පවතින අවස්ථා පිළිබඳ නවතම යාවත්කාලීන කිරීම් ලබාගැනීමේ වාසිය උදා කර ඇත. පොදුවේ සියලු දෙනා වෙත අදාළ තොරතුරු

බෙදා හැරීම හෝ පූර්ව වශයෙන් නිශ්චිත ක්ෂේත්‍රය/ ක්ෂේත්‍රවල විශේෂඥයන් අතර අදාළ තොරතුරු ඉල්ලුම්කිරීමේ රුචිකත්වය හා අන්තර්ගතය අදාළවීම වන කරුණු මත පාදකව තෝරාගත් පිරිස් වෙත මෙම තොරතුරු බෙදාහැරීම වශයෙන් වූ දෙයාකාරයෙන්ම මෙම තොරතුරු බෙදා හැරීම සිදුකෙරේ.

ජාතික විද්‍යා පදනම වෙත රු. 127,000/- ක ආදායමක් ලබාදෙමින් 2023 වර්ෂය තුළ සමස්ත බෙදාහැරීම් 120ක් සිදුකර තිබේ. පුළුල් නමුදු අදාළ පාර්ශව වෙත විශ්වාසනීය ආකාරයෙන් ළඟාවීමේ ප්‍රවේශයක් වශයෙන් විද්‍යා සහ තාක්ෂණ ප්‍රජාව අතර ප්‍රචලිතවෙමින් ජාතික විද්‍යා පදනමේ තොරතුරු තාක්ෂණ ඒකකයේ සහාය ඇතිව STMIS හරහා මෙම සේවාව ලබාදී ඇත.



රූප සටහන 65: **STMIS** හරහා සිදුකර ඇති තොරතුරු බෙදාහැරීම් සංඛ්‍යාත්මක වශයෙන් සහ එයින් ලබා ඇති ආදායම

තොරතුරු ලබාගැනීම සඳහා ඉල්ලීම්

විවිධ පාර්ශවකරුවන් වෙතින් ලැබූ ඉල්ලීම් අනුව එකී පාර්ශවරකරුවන්ගේ අවශ්‍යතානුකූලව සවිස්තරාත්මක වාර්තා හයක් පද්ධතිය ඔස්සේ ලබාදී ඇත. අදාළ ක්ෂේත්‍රවල විශේෂඥවරු 1,000 ක් පමණ විසින් සත්‍යාපනය කළ තොරතුරු මෙම වාර්තාවල ඇතුළත් විය.

මීට අමතරව, ජනතාව අතර මෙම පද්ධතිය භාවිතා කිරීම ඉහළ ගොස් ඇති ආකාරය පෙන්නුම් කරමින් වර්ෂය තුළ ජනප්‍රියත්වය තහවුරු කිරීම් 16,200 ක් STMIS (*https://stmis.nsf.gov.lk/*) විසින් ලබාඇත.



රූප සටහන 66: STMIS ඔස්සේ සිදුකර ඇති නිරීක්ෂීම් සංඛ්‍යාව

ආසියානු සමාජ විද්‍යා පර්යේෂණ සභාවල සංවිධානය (AASSREC) සමඟ සම්බන්ධීකරණය ඇතිව කටයුතු කිරීම

ආසියාවේ සමාජ විද්‍යා ආයතන සමූහයක එකතුවෙන් සැදී ආසියානු සමාජ විද්‍යා පර්යේෂණ සභාවල සංවිධානයෙහි (AASSREC) ජාතික විද්‍යා පදනම සාමාජිකයෙකි. AASSREC විසින් සමාජයට අදාළ වැදගත් ප්‍රවර්තන මාතෘකා සම්බන්ධයෙන් ද්විවාර්ෂිකව සම්මන්ත්‍රණ පවත්වනු ලැබේ. AASSRECහි 25 වැනි ද්විවාර්ෂික සම්මන්ත්‍රණය "ආසියාව තුළ සමාජ විද්‍යාව, අතීතය, වර්තමානය සහ අනාගතය" මැයෙන් 2023 ජූනි 14-16 දක්වා කොරියාවේ සියෝල් නගරයේ දී පැවැත්විණි.

මෙම සම්මන්ත්‍රණය සඳහා සාරාංශය කැඳවන ලද අතර, ඒ සඳහා ලැබී තිබූ සාරාංශය සමාලෝචක මණ්ඩලයක් විසින් සමාලෝචනය කිරීමෙන් අනතුරුව ඉහළතම ලකුණු ලැබූ සංක්ෂේප දෙකක් AASSREC වෙත යොමු කරන ලදී. 'ශ්‍රී ලංකාවේ සමාජ විද්‍යා පර්යේෂකයන් විසින් මුහුණ දෙන වර්තමාන අභියෝග සහ අනාගත අවස්ථා' මැයෙන් ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ, සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨයේ, පාරිසරික කළමනාකරණ අධ්‍යයනාංශයේ අංශාධිපති මහාචාර්ය රණගලගේ විසින් ඉදිරිපත් කර තිබූ සංක්ෂේපය සම්මන්ත්‍රණයේ දී ඉදිරිපත් කිරීම සඳහා AASSREC විසින් තෝරා ගන්නා ලදී.

සමාජ විද්‍යා ක්ෂේත්‍ර ආශ්‍රිතව මෙම ආයතන දෙක අතර සහයෝගිත්ව ක්‍රියාකාරකම් ආරම්භ කිරීමේ අරමුණුතිව, ආසියාවේ ඒකාබද්ධ කලාපීය පර්යේෂණ වැඩසටහන සඳහා ගෝලීය සංවර්ධන ජාලය (GDN) ව්‍යාපෘති යෝජනාව සම්බන්ධයෙන් AASSREC සමඟ සාකච්ඡා කිහිපයක් සිදුකරන ලදී. AASSRECහි ප්‍රතිපත්ති සහ ක්‍රමෝපාය කමිටුව සඳහා ශ්‍රී ලංකාවෙන් නාමයෝජනාවක් ඉදිරිපත් කරන ලදී.



මහාචාර්ය රණගල විසින් මෙරට නියෝජනය කරමින් ඉදිරිපත් කරන වාර්තාව වැඩිදියුණුකර සකස් කිරීම සඳහා ඒ සම්බන්ධයෙන් අදහස් ලබාගැනීම හා මත විමසුම සඳහා වූ විශේෂඥ කමිටුව සමඟ පැවති සාකච්ඡාව

සමාජ විද්‍යාව පිළිබඳ ජාතික විද්‍යා පදනමේ කාර්යය නව පණගැන්වීම

සමාජ විද්‍යාව ආශ්‍රිතව කටයුතු කිරීම සඳහා පත්කළ නව කමිටුව විසින් සිය කටයුතු 2023 නොවැම්බර් මාසයේ දී ආරම්භ කරන ලදී. සමාජ විද්‍යාවේ විවිධ වූ ක්ෂේත්‍රවල විශේෂඥවරු කණ්ඩායමකින් මෙම කමිටුව සමන්විත අතර කමිටුවේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා ඔවුන්ගේ විශේෂඥතා දැනුම මෙමගින් එක්තැන් කෙරෙනු ඇත. මෙම කමිටුවේ කාර්ය නිර්ණය අනුදේශ අනුව, පර්යේෂණය තුළ ප්‍රබල සමාජ සංරචක සමඟින් අන්තර්-විෂයයික පර්යේෂණ දියත් කිරීමට කමිටුවට හැකිවන අතර එමඟින් වඩාත් උපයෝගික පර්යේෂණ ප්‍රතිඵල බිහිවනු ඇත. තව ද, සමාජ විද්‍යාත්මක මැදිහත්වීම් අවශ්‍ය කරන වැදගත් ගැටලු සම්බන්ධයෙන් කමිටුව විසින් සාකච්ඡා කරනු ලැබිය හැකි අතර, එවැනි සාකච්ඡාවලින් පැනනඟින නිර්දේශ තීරණ ගන්නා පාර්ශවයන් වෙත සන්නිවේදනය කරනු ඇත. තරුණ විද්‍යාර්ථීන්ගේ ධාරිතා ගොඩනැංවීම ඔස්සේ පර්යේෂණවල සහ ඒ ආශ්‍රිත අනාවරණය කරගැනීම්වල ගුණාත්මකතාවය වැඩිදියුණු කෙරේ. වර්තමාන ගැටලු සම්බන්ධයෙන් වන සමාජ විද්‍යාත්මක මතවාදයන් ව්‍යාප්ත කිරීම ඔස්සේ මනා දැනුවත්බවකින් යුත් සමාජයක් බිහිවනු ඇති අතර එවිට විවිධ වූ සමාජීය වෙනස්කම්වලට තාර්කික අයුරින් අනුගත විය හැකිවනු ඇත. සබඳතා ඇතිකර ගැනීම හා සහයෝගිත්ව ප්‍රයත්න ඔස්සේ කමිටුව විසින් ජාත්‍යන්තරව පිළිගත් සමාජ විද්‍යා සංවිධාන සමඟ සම්බන්ධීකරණය සිදුකරගනු ඇත. යථොක්තව සඳහන් කළ අරමුණු ඉටුකරගන්නා අතර, ජාතික විද්‍යා පදනම තුළ සමාජ විද්‍යාව ආශ්‍රිත සවිමත් පර්යේෂණ වැඩසටහනක් හා අනෙකුත් ක්‍රියාකාරකම් සඳහා කමිටුව විසින් බලගැන්වීමක් සිදුකිරීමට අපේක්ෂිත ය.



ජාතික විද්‍යා පදනමේ සමාජ විද්‍යාව පිළිබඳ ක්‍රියාකාරී කමිටුවේ ආරම්භක රැස්වීම

දැනුවත් කිරීමේ වැඩසටහන්

ශ්‍රී ලංකා විද්‍යාත්මක හා තාක්ෂණික තොරතුරු ජාලයේ (SLSTINET) කේන්ද්‍රීය මධ්‍යස්ථානය වශයෙන් ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානය (NSLRC) විසින් විශ්වවිද්‍යාල, පර්යේෂණ හා සංවර්ධන ආයතන ඔස්සේ ස්ථාපිත කර ඇති SLSTINET පුස්තකාල සහ රටපුරා ව්‍යාප්තව ඇති අනෙකුත් SLSTINET පුස්තකාල සඳහා පුස්තකාල දැනුවත් කිරීමේ වැඩසටහන් කිහිපයක් සංවිධානය කරන ලදී. 2023 වර්ෂයේ දී දියත් කරන ලද පුස්තකාල දැනුවත් කිරීමේ වැඩසටහන්වල දී, මූලික අවධානය යොමුවූයේ ජාතික විද්‍යා පදනම විසින් ලබාදෙන විවිධ විද්‍යාත්මක සම්පත් පිළිබඳ සවිස්තරාත්මක විග්‍රහයක් ලබාදීමට සහ විශ්වවිද්‍යාල සහ පර්යේෂණ ආයතනවල පර්යේෂකයන්ට මෙම සම්පත්වලින් වාසි ලබාගැනීම සඳහා පවතින අවස්ථා අවධානයට ලක්කිරීමයි.

තව ද, පුස්තකාල සඳහා වූ දැනුවත් කිරීමේ වැඩසටහන්වල දී ජාතික විද්‍යා පදනම වෙත පැවරී ඇති බලතල, සෑම අංශයකම කාර්යයන්, ජාතික විද්‍යා පදනම හරහා තොරතුරු ලබාගත හැකි දේශීය හා ගෝලීය දත්ත සමුදායන් පෙළ සම්බන්ධයෙන් විස්තරාත්මක පැහැදිලි කිරීම්වලට ද අවධානය යොමු කරන ලදී. ජාතික විද්‍යා පදනමේ ආධාර ප්‍රදාන වැඩසටහන්, විද්‍යා සහ තාක්ෂණ කළමනාකරණ තොරතුරු පද්ධතිය (STMIS), ගෝලීය ඩිජිටල් වේදිකාව (GDP), ජාතික උපකරණ දත්ත සමුදාය (NID), ශ්‍රී ලංකාවේ මාර්ගගත සඟරා (SLJOL), ජාතික ඩිජිටල්කරණ ව්‍යාපෘතිය (NDP), ඉ-කෝෂ්ඨාගාර, ආශ්‍රේය ග්‍රන්ථ පිළිබඳ දත්ත සමුදාය සහ ජාතික විද්‍යා පදනම මගින් සපයනු ලබන අනෙකුත් සේවා සම්බන්ධයෙන් ද සහභාගිකයන්ට දැනුම ලබාදෙන ලදී.

මෙම සැසිවලදී, ජාතික විද්‍යා පදනමේ සම්පත් පිළිබඳ අවබෝධය හා එහි උපයෝගිතාවය වැඩිදියුණු කිරීමේ අරමුණැතිව ප්‍රායෝගික දැනුම හා ක්‍රමෝපායන් පිළිබඳ තොරතුරු සහභාගිකයන් සමඟ හුවමාරු කරගන්නා ලදී. මෙසේ ලබාදුන් තොරතුරු වර්තමාන පර්යේෂණ කටයුතුවල දී ප්‍රයෝජනවත් වන අතර, විශ්වවිද්‍යාල හා පර්යේෂණ සහ සංවර්ධන ආයතනවල අනාගත ව්‍යාපෘති ක්‍රමානුකූලව හැඩගැස්සවීමෙහිලා ද වැදගත් වේ.

පුස්තකාල සඳහා වූ දැනුවත් කිරීමේ වැඩසටහන්වල දී සහභාගිකයන්ට ජාතික විද්‍යා පදනමෙන් ප්‍රශ්න ඇසීම හා පැහැදිලි කිරීම් ලබාගැනීම සඳහා දිරිමත් කරන ලදී. සාකච්ඡා කළ කරුණු සම්බන්ධයෙන් ගැඹුරු අවබෝධයක් ලබාගැනීමට සහ අධ්‍යයන හා පර්යේෂණ ප්‍රජාව වෙත ජාතික විද්‍යා පදනම වෙතින් වැඩි දැනුමක් හා අදහස් ලබාගැනීමට මෙම අන්‍යෝන්‍ය ප්‍රවේශය මඟින් අරමුණු විය. විවෘත සන්නිවේදන සහ සංවාද වැඩිදියුණු කිරීම ඔස්සේ ජාතික විද්‍යා පදනමේ නියෝජිතවරු සමඟ සෘජුව කටයුතු කිරීම, අවිනිශ්චිතතා මඟහරවා ගැනීම, සහ ජාතික විද්‍යා පදනමේ සම්පත් උපයෝජනය වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් වටිනා සියුම් දැක්මක් ලබාගැනීම යන අවස්ථා ලබාගැනීමට සහභාගිකයන්ට හැකි විය.

වගුව 05: 2023 වර්ෂයේ දී ක්‍රියාත්මක කළ පුස්තකාල සඳහා වූ දැනුවත් කිරීමේ වැඩසටහන්

අනු අංකය	ආයතනය	දිනය	සහභාගිකයන් සංඛ්‍යාව
01	පේරාදෙණිය විශ්වවිද්‍යාලය	23.02.2023	34
02	ජාතික කෘෂිකර්ම තොරතුරු සහ සන්නිවේදන මධ්‍යස්ථානය (NAICC), ගන්නෝරුව	23.02.2023	127
03	ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව	08.03.2023	41
04	ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE)	20.06.2023	30
05	ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය (EUSL)	09.08.2023	39
06	ප්‍රධාන පුස්තකාලය, ඔලුවිල්, ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය (SEUSL)	10.08.2023	47
07	ව්‍යවහාරික විද්‍යා පීඨයේ පුස්තකාලය, සමන්තුරේ, ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය (FAS, SEUSL)	11.08.2023	48
08	ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුරය	26.09.2023	14



ගන්නෝරුව, ජාතික කෘෂිකර්ම තොරතුරු සහ සන්නිවේදන මධ්‍යස්ථානයේ (NAICC) පැවති දැනුවත් කිරීමේ වැඩසටහන



වෙන්කලාඩි, වනතරුමෝලායිහි ශ්‍රී ලංකා නැඟෙනහිර විශ්වවිද්‍යාලය (EUSL) පැවති දැනුවත් කිරීමේ වැඩසටහන



අම්පාර, ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ (SEUSL) ප්‍රධාන පුස්තකාලයේ දී පැවති දැනුවත් කිරීමේ වැඩසටහන



ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ, ව්‍යවහාරික විද්‍යා පීඨයේ (FAS, SEUSL)
පුස්තකාලයේ දී පැවති දැනුවත් කිරීමේ වැඩසටහන

පොත් සහ සඟරා පරිත්‍යාග කිරීම

ජාතික විද්‍යා පදනමේ ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානය (NSLRC) සඳහා 2018 සහ 2022 කාලසීමාව අතර සිදුකළ භාණ්ඩ සමීක්ෂණයේ නිර්දේශ අනුව, ද්විත්වකරණය, පළුදු වී තිබීම, කල්පවත්වා ගත නොහැකිබව, සහ මාර්ගගත ප්‍රවේශය පැවතීම යනාදී හේතු මත පොත් 486ක්, ජාතික විද්‍යා පදනමේ ප්‍රකාශන 123ක්, විද්‍යා සඟරා 377ක්, සහ ජාතික විද්‍යා පදනමේ වෙනත් සඟරා 177ක් ඉවත් කිරීම සඳහා හඳුනාගන්නා ලදී. ජාතික විද්‍යා පදනමේ ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානය විසින් මෙම අනවශ්‍ය ද්‍රව්‍ය ඉවත් කර වෙනත් විද්‍යා සහ තාක්ෂණ ආයතනවලට පරිත්‍යාග කිරීම 2023 වර්ෂයේ දී සිදුවිය.



ජාතික විද්‍යා පදනමට අනවශ්‍ය වශයෙන් සලකා ඉවත් කළ පොත් International College of Business & Technology (ICBT) සහ ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය වෙත පරිත්‍යාග කිරීම

දායකත්ව, අත්පත් කරගැනීම් සහ තොරතුරු ව්‍යාප්ත කිරීමේ සේවා

ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානය (NSLRC) විසින් විද්වත් ප්‍රජාවගේ තොරතුරු අවශ්‍යතා සපුරාලීම, පුද්ගලයන් විසින් පැමිණීම්, දුරකතන ඇමතුම් හා විද්‍යුත් තැපැල් පණිවිඩ ඔස්සේ සිදුකරන ලේඛන සඳහා වන ඉල්ලීම් භාරගැනීම සිදුකෙරේ. 2023 වර්ෂයේ දී, මෙම අංශය වෙත පොදු පරිශීලකයන් වෙතින් ලේඛන ඉල්ලීම් සහ විමසීම් 2,011ක් ලැබී ඇත. NSLRC සියලු දත්ත සමුදායන් වෙත ලබාදී ඇති මාර්ගගත ප්‍රවේශයේ සැලකිය යුතු ඉහළ යෑමක් පැවතිය ද, පුද්ගලයන් වශයෙන් පැමිණ දේශීය දත්ත සමුදා මත සිදුකළ සෙවුම් 271 ක් ද, TEEAL ජාත්‍යන්තර දත්ත සමුදාය වෙතින් සම්පූර්ණ වාර්තා බාගත කිරීම් 84 ක් ද වාර්තා විය.

අත්පත් කරගැනීම් කළමනාකරණය කිරීම සැලකීමේ දී, මෙම අංශය විසින් ශාස්ත්‍රීය ප්‍රජාවගේ ආශ්‍රය ලේඛන අවශ්‍යතා සපුරාලීම සඳහා විවිධ විෂයයන්ගේ ප්‍රකාශන මාලාවන් රැස්කිරීම සිදුකරන ලදී. 2023 වර්ෂය තුළ දී නව පොත් 12 ක් අංශය වෙත ලැබී තිබුණි. මෙයින් ඇතැම් පොත් මිලට ගෙන තිබූ අතර අනෙකුත් පොත් ප්‍රදානයන් වශයෙන් ලැබී තිබුණි. මීට අමතරව, දේශීය සඟරා 12ක්, විදේශීය සඟරා 6ක්, සහ සම්මේලන මුද්‍රිත වාර්තා 22ක් ලැබී තිබුණි. මීට අමතරව, පර්යේෂණ වාර්තාවල භෞතික එකතුවට නිබන්ධන 4ක් හා අවසන් පර්යේෂණ වාර්තා 12ක් එකතුකර තිබුණි.

ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානයේ (NSLRC) පවතින සම්පත් සහ සේවා පිළිබඳව පැවත්වූ දැනුවත් කිරීමේ සැසි

1. කොළඹ 07, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ සහ පුහුණු කිරීමේ ආයතනයේ දී 2023 ඔක්තෝබර් 12 දිනැතිව පැවති, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ පර්යේෂණ සභාව විසින් විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා සංවිධානය කරන ලද "පර්යේෂණ ප්‍රදාන පිරිනැමීම සඳහා යෝජනා ඇගයීම පිළිබඳ විශේෂ වැඩසටහන" (Special Programme on Evaluating Proposals for Awarding Research Grants), මැයෙන් වූ නේවාසික දෙදින වැඩසටහන සඳහා ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානයේ (NSLRC) ප්‍රධානි මනුජ කරුණාරත්න මහතා සම්පත්දායකයෙකු වශයෙන් සහභාගී වූ අතර එහි දී බාහිර/අභ්‍යන්තර පර්යේෂණ ප්‍රදාන ලබාගැනීම සඳහා ගුණාත්මක තත්ත්වයේ ව්‍යාපෘති යෝජනා සකස් කිරීමේ දී පර්යේෂණ ප්‍රජාව සඳහා ජාතික විද්‍යා පදනමේ පවතින පුස්තකාල සම්පත් සහ සේවා සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ සැසියක් පවත්වන ලදී.



ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන

2. බත්තරමුල්ල වෝටර්ස් එජ් හෝටලයේ දී 2023 නොවැම්බර් 02 දිනැතිව ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද ජාත්‍යන්තර ඉංජිනේරු පර්යේෂණ සම්මන්ත්‍රණයේ දී ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානයේ (NSLRC) ප්‍රධානී මනුජ කරුණාරත්න මහතා සහ පර්යේෂණ අංශ ප්‍රධානී ඉංජිනේරු මහේෂ් දිසානායක මහතා සම්පත්දායකයන් වශයෙන් "පර්යේෂකයන් සඳහා ජාතික විද්‍යා පදනමේ සම්පත් සහ අවස්ථා (NSF Resources and Opportunities for Researches)" මැයෙන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.



ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද ජාත්‍යන්තර ඉංජිනේරු පර්යේෂණ සම්මන්ත්‍රණයේ දී සිදුකළ දැනුවත් කිරීමේ වැඩසටහන









ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානයේ (NSLRC) ප්‍රධානී මනුජ කරුණාරත්න මහතා ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පුස්තකාලයාධිපතිවරුන්ගේ සංගමයේ 13 වැනි ජාත්‍යන්තර සම්මන්ත්‍රණය සඳහා විශේෂ ආරාධිතයෙකු වශයෙන් සහභාගි විය.







ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානය (NSLRC) විසින් 2023 නොවැම්බර් 17 දිනැතිව අනුරාධපුර ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ ඉ-කෝෂ්ඨාගාරය සහ Koha පුස්තකාල කළමනාකරණ මෘදුකාංගය ක්‍රියාත්මක කිරීමේ අවස්ථාවට NSLRC ප්‍රධානී මනුජ කරුණාරත්න මහතා සහභාගි විය.



ජාතික ඩිජිටල් පුස්තකාල කොන්සෝටියම ක්‍රියාත්මක කිරීම සහ ඒ සඳහා අරමුදල් සම්පාදනය කරගැනීම සාකච්ඡා කිරීම පිණිස ආචාර්ය ලිවාන් ලියනගේ හමුවීම



කේම්බ්‍රිජ් යුනිවර්සිටි ප්‍රෙස් සහ ඇසෙස්මන්ට් විසින් a Cambridge Education Conclave මැයෙන් වූ හමුවක් ශ්‍රී ලංකාවේ දී පවත්වන ලද අතර, අධ්‍යාපනික වර්ධන ගමන් මඟ එහි අනාගතය පිළිබඳ අපේක්ෂා කිරීම් අනාවරණය කරගැනීම පිණිස මෙරට අධ්‍යාපන ක්ෂේත්‍රයේ විශිෂ්ට විශේෂඥයන් සහ අධ්‍යාපඥයින් එකට රැස්විණි. මෙම හමුව 2023 සැප්තැම්බර් 11 දින කොළඹ දී පවත්වන ලදී.







T Asia Pacific Advanced Network (APAN56) සම්මන්ත්‍රණය ශ්‍රී ලංකාවේ, කොළඹ දී 2023 අගෝස්තු 21 සිට 25 දක්වා පවත්වන ලදී. ජාතික විද්‍යා පදනම නියෝජනය කරමින් මනුජ කරුණාරත්න මහතා සහ ආචාර්ය මහේෂා නාඩුගල මහත්මිය මෙම සම්මන්ත්‍රණය සඳහා සහභාගිවිය. විවෘත ප්‍රවේශය හරහා විද්‍යා සන්නිවේදනය සවිමත් කිරීමේ අරමුණින් ජාතික විද්‍යා පදනම විසින් ක්‍රියාත්මක කරන විවෘත ප්‍රවේශය සහිත විද්‍යා වැඩසටහන් මෙහි දී ඉදිරිපත් කරන ලදී. තව ද, ජාත්‍යන්තර සහයෝගිත්වයන් ඔස්සේ උපයෝගි කරගත හැකි අවස්ථා හඳුනාගැනීම සඳහා විශේෂ දූත පිරිසක් සමඟ විශේෂ රැස්වීමක් ජාතික විද්‍යා පදනමේ දී පවත්වන ලදී.

ජාතික විද්‍යා පදනම වෙත පැවරී ඇති බලය
ඇ) විද්‍යා සහ තාක්ෂණය ආශ්‍රිත ධාරිතා ගොඩනැංවීම

රට තුළ පැවති කැලැඹිලිකාරී සහ දරුණු ආර්ථික තත්ත්වය මධ්‍යයේ වුව ද, සිය ඩිජිටල් උපකරණ උපයෝගී කරගනිමින් ඵලදායි අන්දමින් ප්‍රතිඵල ඇති කරවමින්, 2023 වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම යටතේ සැලසුම් කළ කාර්යයන් සාර්ථක අයුරින් දියත් කිරීමට ජාතික විද්‍යා පදනමේ ජාත්‍යන්තර සබඳතා අංශයට හැකි විය. එවැනි පියවර ඔස්සේ ඇතිකරන ලද පිරිවැය ඉතිරිය ඉතා අගනා බව සඳහන් කළ යුතු ය.

ජාත්‍යන්තර සබඳතා අංශය විසින් 2023 වර්ෂයේ සිය ක්‍රියාකාරකම් ඔස්සේ ඉතිරිකරන ලද මුදල් ප්‍රමාණයන් පහත ප්‍රස්තාරය මගින් නිරූපණය කෙරේ. මෙහි දී ජාතික විද්‍යා පදනමේ ගෝලීය ඩිජිටල් වේදිකාව (GDP) සමඟ ලියාපදිංචි වී ඇති සම්පත්දායකයන් විසින් ප්‍රධාන වශයෙන් ගාස්තු අය කිරීමකින් තොරව සිදුකළ වැඩසටහන් කාණ්ඩ 03ක් යටතේ අවධානයට යොමුකරන ලදී; එනම්, පුහුණු වැඩසටහන්, රැස්වීම්, සම්මන්ත්‍රණ සහ අනෙකුත් ධාරිතා සංවර්ධන ක්‍රියාකාරකම් වශයෙනි. සෑම මිනිස් පැයක් සඳහා ඇස්තමේන්තුගත පිරිවැය ඇ.ඩො. 100ක් වන අතර, එය මිනිස් පැය ගණනින් වැඩිකර ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කරන ලදී. වැඩිම පිරිවැය ඉතිරිය ලැබී ඇත්තේ රැස්වීම්, සම්මන්ත්‍රණ සහ අනෙකුත් ධාරිතා සංවර්ධන ක්‍රියාකාරකම් වලිනි.



රූප සටහන 67: ජාත්‍යන්තර සබඳතා අංශය විසින් 2023 වර්ෂයේ දී සිය ක්‍රියාකාරකම් ඔස්සේ ඉතිරිකරන ලද පිරිවැය (ශ්‍රී ලංකා රුපියල් වලිනි).



රූප සටහන 68: ඩිජිටල් වේදිකාව ඔස්සේ ධාරිතා ගොඩනැංවීම

- නව ලියාපදිංචිකරුවන් සමඟ ගෝලීය ඩිජිටල් වේදිකාව පුළුල් කිරීම

ගෝලීය ඩිජිටල් වේදිකාවේ ලියාපදිංචි වන ලෙස විදේශගතව වාසය කරන ශ්‍රී ලාංකිකයන් 195 දෙනෙකු වෙත ආරාධනා යොමුකරන ලදි. ඒ අනුව, විදේශගතව වාසය කරන ශ්‍රී ලාංකිකයන් 90 දෙනෙකු අලුතින් ලියාපදිංචි වන ලදී. විභව්‍ය සහයෝගිත්ව අනාවරණය කරගැනීම සහ ශ්‍රී ලාංකික පර්යේෂණකරුවන්ගේ ධාරිතා ගොඩනැංවීම සඳහා විශේෂඥ දැනුම් පදනමේ උපයෝගීතාවය, පර්යේෂණ සහ සංවර්ධන නිමැවුම් සහ ශ්‍රී ලංකාවේ විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන වපසරිය ගෝලීය වශයෙන් දර්ශනය වීම වැඩිදියුණු කිරීම සඳහා ආසියා-ශාන්තිකර කලාපය, ඇමරිකා එක්සත් ජනපදය, කැනඩාව, එක්සත් රාජධානිය සහ ජපානය නියෝජනය කරමින් විදේශරටවල සිටින ශ්‍රී ලාංකික විද්‍යාඥයන්, වෘත්තිකයන් හා පර්යේෂකවරු සමඟ මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ රැස්වීම් මාලාවක් සංවිධානය කරන ලදී.

- ගෝලීය ඩිජිටල් වේදිකාව තුළ තොරතුරුවල ආරක්ෂාව වැඩිදියුණු කිරීම, පවත්වාගෙන යෑම සහ සහතික කිරීම

ආරම්භක අවස්ථාවල දී ඇතිවන ගැටලුවලට පිළියම් යෙදීම, ක්‍රියාවලි සියුම් ආකාරයෙන් සකස් කිරීම, සහ තොරතුරුවල ආරක්ෂාව සහතික කිරීම සඳහා ගෝලීය ඩිජිටල් වේදිකාව සම්බන්ධිත වෙබ් අඩවි සැකසුම්කරුවන් සහ ශ්‍රී ලංකාවේ මෘදුකාංග සේවා සමාගම්වල සංවිධානය (SLASSCOM) සමඟ මාර්ගගත රැස්වීම් දෙකක් පවත්වන ලදී. මෙම කෙරීගෙන යමින් පවතින ක්‍රියාවලිය සක්‍රීය ආකාරයෙන් අධීක්ෂණය කරන ලද අතර ඒ සම්බන්ධිත පසුවිපරම් කටයුතු ද කෙරීගෙන යන ලදී.

- පර්යේෂණ සහයෝගිත්ව සහ තාක්ෂණික සහයෝගය සඳහා ගෝලීය ඩිජිටල් වේදිකාව ඔස්සේ හවුල්කාරිත්වයන් ගොඩනැංවීම

ගෝලීය ඩිජිටල් වේදිකාව ඔස්සේ පර්යේෂණ සහයෝගිත්ව සහ තාක්ෂණික සහයෝගිතාවය සඳහා විභව්‍ය විදේශගත ශ්‍රී ලාංකිකයන් සම්බන්ධ කරගැනීමේ අරමුණින් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල, පර්යේෂණ සහ සංවර්ධන ආයතන සහ අනෙකුත් රාජ්‍ය අංශයේ ආයතනවල අවශ්‍යතා ජාත්‍යන්තර සබඳතා අංශය විසින් සොයාබලන ලදී. ඒ අනුව, ශ්‍රී ලංකාවේ විද්වත් ප්‍රජාව සහ එතෙර සිටින ශ්‍රී ලාංකික විද්‍යාඥයන් සහ වෘත්තිකයන් අතර පහත දැක්වෙන පරිදි ජාත්‍යන්තර සබඳතා නවයක් ස්ථාපිත කරන ලදී:

- උෆව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම අධ්‍යයනාංශය සහ කැනඩාවේ සැස්කැට්චිවුවාන් විශ්වවිද්‍යාලය
- මිනිස්බල සහ රැකියා දෙපාර්තමේන්තුව සහ ඇල්බර්ටා විශ්වවිද්‍යාලයේ ආචාර්ය අනාස් යූසුෆ්
- ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය සහ ඕස්ට්‍රේලියාවේ බටහිර සිඩ්නි විශ්වවිද්‍යාලයේ ආචාර්ය ලිවාන් ලියනගේ
- ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය සහ ඕස්ට්‍රේලියාවේ සිඩ්නි විශ්වවිද්‍යාලයේ ආචාර්ය අශානි අමරසිංහ
- මොරටුව විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ ආචාර්ය සුබෝධ චාල්ස් සහ ඇමරිකා එක්සත් ජනපදයේ හූස්ටන් විශ්වවිද්‍යාලයේ ඖෂධ අනාවරණය කරගැනීමේ ආයතනයේ මහාචාර්ය ගෝමික උඩුගමසූරිය
- කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය පීඨයේ මහාචාර්ය ස්වර්ණා හපුආරච්චි හා මහාචාර්ය කමල් පෙරේරා සහ ඇමරිකා එක්සත් ජනපදයේ හූස්ටන් විශ්වවිද්‍යාලයේ ඖෂධ අනාවරණය කරගැනීමේ ආයතනයේ මහාචාර්ය ගෝමික උඩුගමසූරිය
- කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ මහාචාර්ය ෂර්මිනී ගුණවර්ධන සහ ඇමරිකා එක්සත් ජනපදයේ හූස්ටන් විශ්වවිද්‍යාලයේ ඖෂධ අනාවරණය කරගැනීමේ ආයතනයේ මහාචාර්ය ගෝමික උඩුගමසූරිය
- කොළඹ විශ්වවිද්‍යාලයේ ශාක විද්‍යා අධ්‍යයනාංශයේ මහාචාර්ය චන්ද්‍රික නානායක්කාර සහ ඕස්ට්‍රේලියාවේ සදර්න් ක්වීන්ස්ලන්ඩ් විශ්වවිද්‍යාලයේ ආචාර්ය නිරෝෂණී ගුණසිංහ
- උඩවලව, උක් පර්යේෂණ ආයතනයේ භෝග නිෂ්පාදන අංශයේ මාලිකා පෙරේරා මෙය සහ ඕස්ට්‍රේලියාවේ ඇඩිලේඩ් විශ්වවිද්‍යාලයේ, විද්‍යා, ඉංජිනේරු සහ තාක්ෂණ පීඨයේ ආචාර්ය ශෂී ගුණතිලක

මෙම සාර්ථකත්වය ඔස්සේ ධාරිතා ගොඩනැංවීමේ කටයුතුවල වැඩිදියුණු වීම පමණක් නොව, පර්යේෂණ හා සංවර්ධන කටයුතුවලට අදාළ ඵලදායි සහයෝගිතාවයන් වැඩිදියුණුවීමක් ද සිදුවී ගෝලීය වශයෙන් කටයුතුවල නියුක්තවීම සහ ගෝලීය නිපුණතා සංචිතයේ ප්‍රතිලාභ ලබාගැනීමක් ඔස්සේ දේශීය නවෝත්පාදන පරිසරය තුළ සුවිශේෂී ප්‍රගමනයක් සනිටුහන් කරයි.

ජාතික විද්‍යා පදනම සහ විදේශගත ශ්‍රී ලාංකිකයන්ගේ සේවය සහජීවන හා අනුපූරක වශයෙන් ජාතික සංවර්ධනය සඳහා යොදා ගැනීම පිණිස ජනාධිපති කාර්යාලයේ ස්ථාපිත කරන ලද විදේශගත ශ්‍රී ලාංකිකයන්ගේ කටයුතු පිළිබඳ කාර්යාලය (OOSLA) අතර ක්‍රමෝපායික සහයෝගිත්ව හවුල්කාරිත්වයක් ඇරඹීම ද සිදුවිණි.



අන්‍යෝන්‍ය සහයෝගිත්වය ශක්තිමත් කිරීම සඳහා ජාතික විද්‍යා පදනමේ සහ විදේශගත ශ්‍රී ලාංකිකයන්ගේ කටයුතු පිළිබඳ කාර්යාලයේ නිලධාරීන් අතර රැස්වීම (2025.05.04 දිනැතිව පවත්වන ලදී)

විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන ආශ්‍රිත කටයුතුවල නියැලෙන පිරිස්වල ධාරිතා ගොඩනැංවීම

• දත්ත විද්‍යාව පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා විෂයමාලාවක් සකස් කිරීම පිණිස ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය සමඟ හවුල්කාරිත්වයක් ඇතිකරගැනිම

වර්තමානයේ දී ගොඩනැගෙමින් පවතින දත්ත විද්‍යාව වැනි ක්ෂේත්‍ර ආශ්‍රිතව ග්‍රෝලීය ශ්‍රම වෙළඳපොළ තුළ බිහිවෙමින් පවතින අවස්ථාවලට යොමුවීම අවධාරණය කරමින් තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනයේ කාර්ය සාධනය වැඩිදියුණු කිරීම සඳහා ජාතික විද්‍යා පදනම විසින් ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය සමඟ හවුල්කාරිත්වයක් ඇතිකර ගන්නා ලදී.

ඒ අනුව, ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ ඉල්ලීම පරිදි, දත්ත විද්‍යාව පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා වන සම්පූර්ණ විෂයමාලාවක් සකස්කර ඔවුන් වෙත ඉදිරිපත් කරන ලදී. ආචාර්ය චරිනි විමංසා (පර්යේෂඥ, ඕස්ට්‍රේලියන් නැෂනල් යුනිවර්සිටි), ආචාර්ය රසික රාජපක්ෂ (පශ්චාත් ආචාර්ය උපාධි පර්යේෂඥ, වියෝමින්ග් විශ්වවිද්‍යාලය, ඇමරිකා එක්සත් ජනපදය සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පරිගණක සහ තාක්ෂණ පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය) සහ ආචාර්ය නුවන් ලියනගේ (දත්ත විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, බටහිර සිඩ්නි විශ්වවිද්‍යාලය, ඕස්ට්‍රේලියාව) යන විදේශගත ශ්‍රී ලාංකික සහ මෙරට එම ක්ෂේත්‍රය පිළිබඳ විශේෂඥ දැනුමෙන් හෙබි කණ්ඩායමක් විසින් මෙම කාර්යයයේ දී නොමසුරු සහායක් ලබාදෙන ලදී. ග්‍රෝලීය ශ්‍රම වෙළඳපොළ තුළ පවතින ඉල්ලුමට සරිලන නව පාඨමාලා හඳුන්වාදීම සඳහා මෙම ප්‍රවේශය ඔස්සේ එම අධිකාරියට හැකිවනු ඇත.



දත්ත විද්‍යාවට අදාළව ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය වෙත විෂයමාලාවක් සකස් කිරීම

- Internet of Things (IoT) ක්ෂේත්‍රයට අදාළව වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ (UNIVOTEC) තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශයේ කාර්ය මණ්ඩලයේ ධාරිතා ගොඩනැංවීම.

දැනට, Internet of Things (IoT) ක්ෂේත්‍රයට අදාළව වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය සතු විශේෂඥතා දැනුම සීමාසහිත වන අතර, මෙම ක්ෂේත්‍රයට අදාළ ඉගැන්වීම් කටයුතු සඳහා ඔවුන් විසින් එකී විෂයය පිළිබඳ විශේෂඥ දැනුම සහිත බාහිර තැනැත්තන්ගේ සේවය ලබාගනු ලැබේ. මෙම පරතරය පියවීම පිණිස, වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශයේ කථිකාචාර්යවරු ඉලක්ක කරගත් ධාරිතා ගොඩනැංවීමේ වැඩසටහනක් විදුලි සංදේශ සහ 5G ඉංජිනේරු තාක්ෂණය පිළිබඳ උපදේශක, ජාල විසඳුම් පිළිබඳ ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු සහ ඕස්ට්‍රේලියාවේ ක්වැල්කොම් ඉන්ටර්නැෂනල්හි කණ්ඩායම් නියමු - වැඩසටහන් කළමනාකාර ඉංජිනේරු වසන්ත පෙරේරාගේ සහයෝගයෙන් පවත්වන ලදී. විශේෂයෙන්ම, Internet of Things (IoT) ක්ෂේත්‍රයට අදාළව විශේෂඥ දැනුම සහිත බාහිර තැනැත්තන් මත නොරැඳී තොරතුරු තාක්ෂණය පිළිබඳ සිය උපාධි වැඩසටහන් පැවැත්වීම පිණිස වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර ධාරිතාවන් සවිමත් කිරීම සඳහා මෙම වැඩසටහන මගින් හැකියාව ලැබේ.

- සිවුවැනි කාර්මික විප්ලවයේ අවශ්‍යතා සඳහා රාජ්‍ය අංශයේ නොවන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපනික සහ පුහුණු (TVET) ආයතන සවිමත් කිරීම.

නැඟී එන තාක්ෂණයන් පිළිබඳ දැනුම ලබාගැනීම, විශේෂයෙන් දත්ත විද්‍යාව ආශ්‍රිත ප්‍රතිලාභ ලබාගැනීම පිණිස රජය විසින් අනුමත කර ඇති රාජ්‍ය අංශයේ නොවන ප්‍රමුඛතම තෘතීයික හා වෘත්තීය අධ්‍යාපනික සහ පුහුණු (TVET) ආයතනයක් වන වයඹ කාර්මික විදුහල විසින් සිය කැමැත්ත දන්වා සිටින ලදී. ඒ අනුව, ජාතික විද්‍යා පදනම විසින් වයඹ කාර්මික විදුහලේ නිලධාරීන් සහ ආචාර්ය රසික රාජපක්ෂ (ඇමරිකා එක්සත් ජනපදයේ වියෝමින්ග් විශ්වවිද්‍යාලයේ පශ්චාත් ආචාර්ය උපාධි අපේක්ෂක සහ කැළණිය විශ්වවිද්‍යාලයේ පරිගණක සහ තාක්ෂණ පීඨයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය) අතර මාර්ගගත රැස්වීමක් සඳහා පහසුකම් සලස්වන ලදී. ගෝලීය ශ්‍රම වෙළඳපොළෙහි නැඟී එමින් පවතින අවස්ථා අනාවරණය කරගනිමින් වයඹ කාර්මික විදුහල සහ එහි පුහුණුලාභීන්ගේ ප්‍රතිලාභය පිණිස එකී කටයුතු තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා පසු විපරම් ක්‍රියාමාර්ග ගනිමින් පවතී.

- ජාන ඉංජිනේරු සහ ජෛව තාක්ෂණ ජාත්‍යන්තර මධ්‍යස්ථානයේ (ICGEB) රැස්වීම් සහ පාඨමාලා වැඩසටහන සහ ICGEB Arturo Falaschi වැඩසටහන යටතේ විදේශ අරමුදල් ලබාගැනීම සඳහා පහසුකම් සැලසීම.

ICGEB රැස්වීම් සහ පාඨමාලා වැඩසටහන යටතේ සලකා බැලීම සඳහා යෝජනා තුනක් ඉදිරිපත් කරන ලද අතර, එක් පර්යේෂකයෙකු විසින් රු. මිලියන 4.2 ක වටිනාකමකින් යුතු ප්‍රදානයක් හිමිකරගැනීමට සමත්වී ඇත. මෙය Advancing Next Generation Sequencing in Sri Lanka; ජාත්‍යන්තර සහ දේශීය සහභාගිකයන් සඳහා වන නේවාසික වැඩමුළුව නමින් වූ ව්‍යාපෘතියකි.

Arturo Falaschi අධිශිෂ්‍යත්ව 2023 යටතේ තරුණ ශ්‍රී ලාංකික පර්යේෂකයෙකු වෙත රු.මිලියන 5.7 ක පශ්චාත් ආචාර්ය උපාධි දිගු කාලීන අධිශිෂ්‍යත්වයක් ප්‍රදානය කර තිබේ. මෙය ක්ෂුද්‍ර ප්ලාස්ටික් හායනය සඳහා *Aspergillus flavus* නැමති දිලීර විශේෂයක් යොදාගැනීම සම්බන්ධයෙන් වූ ව්‍යාපෘතියකි. (engineering an *Aspergillus flavus* long chain alkaline degrading monocytogenase to degrade LDPE microplastics) ඒ අනුව, ජාතික විද්‍යා පදනමේ අගනා සම්බන්ධීකරණය ඔස්සේ පසුගිය දශකය පුරා ICGEB අරමුදල් ප්‍රදානයන් හරහා ජාතික පර්යේෂණ සහ සංවර්ධන ධාරිතාවයන් සවිමත් කිරීමක් සිදුවී ඇතිබව සඳහන් කිරීම වැදගත් වේ.



රූප සටහන 69: ජාතික විද්‍යා පදනම විසින් පහසුකම් සැලැස්වීම ඔස්සේ පසුගිය දශකය මුළුල්ලේ ශ්‍රී ලාංකික පර්යේෂණ සහ සංවර්ධන ප්‍රජාව විසින් ICGEB වෙතින් හිමිකර ගෙන ඇති අරමුදල් ප්‍රමාණය

සිව්වන කාර්මික විප්ලවය ඔස්සේ පෝෂිත වන පරිදි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපනික සහ පුහුණු අංශය (TVET sector) සවිමත් කිරීම

කෘත්‍රිම බුද්ධිය සහිත රොබෝවරු, අන්‍යෝන්‍ය වශයෙන් සම්බන්ධිත උපාංග ඔස්සේ දත්ත හුවමාරු (IoT), දත්ත විද්‍යාව, ක්වන්ටොම් පරිගණකකරණය සහ අනෙකුත් පැනනැගෙමින් පවතින තාක්ෂණයන්ගේ සීඝ්‍ර වැඩිදියුණුවීම්වලින් මෙහෙයැවෙන සිව්වන කාර්මික විප්ලවය සවිමත් වෙමින් පවතින වාතාවරණයක දී, කුසලතා පරතරය ("skills gap") සම්බන්ධයෙන් පවතින අවධානය ඉහළ යමින් පවතී. සිව්වන කාර්මික විප්ලවය යන සංදර්භය තුළ සිදුවන තාක්ෂණික වැඩිදියුණුවීම් ඔස්සේ ශ්‍රම වෙළඳපොළ අවස්ථා සහ තරුණ කාන්තාවන් සහ පිරිමින් විසින් මුහුණ දෙන අභියෝග පරිවර්තනයකට ලක්කෙරේ. සිවුවන කාර්මික විප්ලවය යනු අඩු සහ මධ්‍යම ආදායම්ලාභී රටවලට සංවර්ධනයේ වඩාත් වැඩිදියුණු අවධි කරා අධිවේගයකින් පැමිණිය හැකි විභව්‍ය ආකාරයකි. එමෙන්ම, එමඟින් පුළුල්වන අසාමානත්වය සමඟ ශ්‍රම වෙළඳපොළවල් ව්‍යාකුල කරවීමක් ද සිදුවිය හැකි ය. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සියුම් දැක්මට අනුව, නව තාක්ෂණය වැලඳ ගැනීම සඳහා වැඩිම කැමැත්තක් දක්වන පිරිස අතර තරුණ ප්‍රජාව ද සිටින නමුදු, සිය අනාගත රැකියා නියුක්තිය සම්බන්ධයෙන් මොවුන් සතුව මුල් බැසගත් අවුල් සහගත තත්ත්වයන් ද පවතී. විශේෂයෙන්ම, වෘත්තීය පුහුණු ආශ්‍රිතව හිමිවෙන පසුකාලීන රැකියා නියුක්තිය සම්බන්ධයෙන් සැලකූ විට එම රැකියා යාන්ත්‍රිකකරණය වීම සඳහා වැඩි නැඹුරුතාවයක් පවතී.

ශ්‍රී ලංකාව විසින් සමස්ත තිරසර සංවර්ධනයේ ඉතා වැදගත් ආධාරකයක් වශයෙන් මානව ප්‍රාග්ධන සංවර්ධනය සඳහා සිදුකරන ආයෝජනය සලකනු ලබන හෙයින් තෘතීයික හා වෘත්තීය අධ්‍යාපනික සහ පුහුණු (TVET) ආයතන ඉහළ මට්ටමකින් නව්‍යකරණය හා අනුගත වීම සහ කර්මාන්ත අංශයේ ඉල්ලුම කෙරෙහි නැඹුරුව සිටීම අවශ්‍ය කෙරේ. මෙම අවශ්‍යතාවය සපුරාලීම සඳහා, ගෝලීය ශ්‍රම වෙළඳපොළෙහි නැඟී එමින් පවතින අවස්ථා කෙරෙහි යොමු වෙමින් ජාතික විද්‍යා පදනම විසින් තෘතීයික හා වෘත්තීය අධ්‍යාපනික සහ පුහුණු අංශය ශක්තිමත් කිරීම සඳහා වැඩසටහනක් ආරම්භ කළ අතර එහිදී ජාතික විද්‍යා පදනමේ ගෝලීය ඩිජිටල් වේදිකාව (GDP) හරහා අදාළ විශේෂඥතා උත්ප්‍රේරණය කිරීමේ සහ මෙහෙයැවීමේ කටයුතු ක්‍රියාත්මක වෙමින් පැවතිණි.

ගෝලීය නවීනතම දැනුම හුවමාරුව

ශ්‍රී ලංකාවෙන් බැහැරව විදේශ රටවල වාසය කරන ශ්‍රී ලාංකිකයන් එකී විදේශීය රටවල ප්‍රමුඛතම විශ්වවිද්‍යාල, ඉතා ඉහළ මට්ටමේ පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානවල සේවයේ නියුක්තව සිටින බැවින් ඔවුන් සෑම විටම අදාළ විෂය ක්ෂේත්‍රවල නවීනතම දැනුමෙන් යාවත්කාලීන වී සිටී. එබැවින්, දැනුම් හුවමාරුව සඳහා ඔවුන්ගේ සහභාගිත්වය ඉතා වැදගත් වන අතර, එමඟින් ශ්‍රී ලාංකික පර්යේෂකයන්ටද නවීනතම දැනුමෙන් යාවත්කාලීන විය හැකි ය. ඒ අනුව, විශ්වවිද්‍යාල, පර්යේෂණ සහ සංවර්ධන ආයතන, කර්මාන්ත සහ තනි පුද්ගලයන් වශයෙන් පර්යේෂණවල නියැලෙන පර්යේෂකයන්ගේ අවශ්‍යතා සපුරාලමින් ජාතික විද්‍යා පදනමේ ගෝලීය ඩිජිටල් වේදිකාව (GDP) හරහා විදේශ රටවල සම්පත්දායකයින්ගේ දායකත්වයෙන් දැනුම හුවමාරු වැඩසටහන් හතක් පහත දැක්වෙන පරිද්දෙන් පවත්වන ලදී.

- කටුනායක, ඉංජිනේරු තාක්ෂණ ආයතනය සමඟ හවුල්කාරිත්වයෙන්, ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ කථිකාචාර්යවරු සහ අවසන් වසර සිසුන් ඉලක්ක කරගෙන Internet of Things (IoT) සම්බන්ධයෙන් නවීනතම කරුණු රැගත් දැනුම හුවමාරු වැඩසටහනක් පවත්වන ලදී.

- 'Wisdom beyond chemistry: Novel technologies to expedite the drug lead discovery process' මැයෙන් වූ දැනුම හුවමාරු සැසියක් පවත්වන ලද අතර, එහිදී සම්පත්දායකයා වශයෙන් කටයුතු කරන ලද්දේ, ඇමරිකා එක්සත් ජනපදයේ හූස්ටන් විශ්වවිද්‍යාලයේ නව ඖෂධ අනාවරණය කරගැනීමේ ආයතනයේ මහාචාර්ය ගෝමික උඩුගමසූරිය මහතා ය. පිළිකා සම්බන්ධිත පර්යේෂණ සහ නව ඖෂධ නිපදවීමේ කාර්යයේ නියැලි පර්යේෂකයන් අරමුණු කරගෙන මෙය පවත්වන ලදී. මෙම දැනුම හුවමාරු සැසිය මඟින් සම්පත්දායකයා සහ දේශීය පර්යේෂකයන් අතර සහයෝගිතා හවුල්කාරිත්ව තුනක් ඇතිකර ගැනීම සඳහා ද පහසුකම් සැලසිණි.

- 'Electronic Industry: From R&D to Practice and Future Projections' මැයෙන් වූ දැනුම හුවමාරු වැඩසටහනක් පවත්වන ලද අතර, එහිදී සම්පත්දායකයා වශයෙන් කටයුතු කරන ලද්දේ දකුණු කොරියාවේ, සන්චොන් ජාතික විශ්වවිද්‍යාලයේ පර්යේෂණ මහාචාර්ය ආචාර්ය සන්දීප විමලානන්ද මහතා ය. මෙම වැඩසටහන මඟින් දේශීය ඉලෙක්ට්‍රොනික් කර්මාන්ත අංශයේ ඉදිරිපෙළ සිටින පිරිස් සඳහා ද පහසුකම් සලස්වන ලදී.

- රජයේ ආයතනවල තොරතුරු තාක්ෂණ නිලධාරීන්, සිසුන් හා පර්යේෂකයන් සඳහා 'Cyber threats and Information Security' මැයෙන් වූ දැනුම හුවමාරු වැඩසටහනක් පවත්වන ලද අතර, එහිදී සම්පත්දායකයා වශයෙන් කටයුතු කරන ලද්දේ, එක්සත් රාජධානියේ, කාඩිෆ් මෙට්රෝපොලිටන් විශ්වවිද්‍යාලයේ, පරිගණක විද්‍යා අධ්‍යයනාංශයේ ආචාර්ය චමින්ද තුෂාර හේවගේ මහතා ය. වර්තමාන අභියෝගාත්මක පරිසරය තුළ සිය ආයතනවල තොරතුරු පද්ධතිවල ආරක්ෂාව සහතික කරනුයේ කෙසේද යන්න සම්බන්ධිත නවීනතම දැනුම ලබාගැනීමට මෙයට සහභාගීවූ පිරිස වෙත හැකි විය.

- කැනඩාවේ, මනිටෝබා විශ්වවිද්‍යාලයේ, සෙන්ට් පෝල්ස් කොලේජ්හි, අධ්‍යයන පීඨාධිපති මහාචාර්ය ඩිලන්ත ප්‍රනාන්දු මහතා ජාතික විද්‍යා පදනම වෙත පැමිණි අවස්ථාවේ දී, සහයෝගිත්ව සඳහා පවතින අවස්ථාවන් සම්බන්ධයෙන් දැනුම හුවමාරු කරගැනීමේ සැසියක් පැවත්වීම සඳහා ජාත්‍යන්තර සබඳතා අංශය විසින් පහසුකම් සලස්වන ලදී. මෙම සැසියට පසුවිපරමක් ලෙස, වැඩිදුර අධ්‍යයන සහ පර්යේෂණ සහයෝගිත්වයන් සඳහා පවතින අවස්ථා සම්බන්ධිත යෝජනාවක් සම්පත්දායකයා සමඟ හුවමාරු කරගන්නා ලදී.

- එක්සත් රාජධානියේ, ලැන්කැස්ටර් විශ්වවිද්‍යාලයේ, ආර්ථික විද්‍යාව පිළිබඳ මහාචාර්ය දක්ෂිණ ද සිල්වා මහතා ජාතික විද්‍යා පදනම වෙත පැමිණි අවස්ථාවේ දී, සහයෝගිත්ව සඳහා පවතින අවස්ථාවන් සම්බන්ධයෙන් දැනුම හුවමාරු කරගැනීමේ සැසියක් පැවත්වීම සඳහා ජාත්‍යන්තර සබඳතා අංශය විසින් පහසුකම් සලස්වන ලද අතර එහිදී ආර්ථික විද්‍යාව පිළිබඳ ගැඹුරු අධ්‍යයනවලදී ගණිතය සහ සංඛ්‍යානයේ වැදගත්කම සම්බන්ධයෙන් ද සාකච්ඡා කරන ලදී. මෙම කරුණට අදාළව හිතකර පරිසරයක් ගොඩනැංවීම හා ධාරිතා සංවර්ධනය සඳහා පියවර ගැනීමේ වැදගත්කම ද එම සාකච්ඡාවේ දී අවධානයට ලක් විය.



එක්සත් රාජධානියේ සිට පැමිණි මහාචාර්ය දක්ෂිණ ද සිල්වා සමඟ 2023.12.07 වැනි දිනැතිව ජාතික විද්‍යා පදනමේ දී පැවති රැස්වීම

- ඇමරිකා එක්සත් ජනපදයේ වෙසෙන සුපසිද්ධ ජෛව-වෛද්‍ය විශේෂඥයෙකු වන ආචාර්ය බන්දුල විජේ මහතා ජාතික විද්‍යා පදනම වෙත පැමිණි අවස්ථාවේ දී, අදාළ පර්යේෂකවරු මෙන්ම එකී කර්මාන්ත ක්ෂේත්‍රය ඉලක්ක කරගත් සහයෝගිත්ව සඳහා පවතින අවස්ථාවන් සම්බන්ධයෙන් දැනුම හුවමාරු කරගැනීමේ සැසියක් පැවත්වීම සඳහා ජාත්‍යන්තර සබඳතා අංශය විසින් පහසුකම් සලස්වන ලදී.

- ජාතික විද්‍යා පදනමේ සහ චීනයේ ජාතික ස්වභාවික විද්‍යා පදනමේ පළමු ඒකාබද්ධ පර්යේෂණ වැඩසටහන යටතේ දියත් කළ පර්යේෂණ ව්‍යාපෘතිවල අනාවරණය කරගැනීම් ව්‍යාප්ත කරගැනීම සඳහා ශ්‍රී ලංකාවේ සහ චීනයේ පර්යේෂකවරුන්, ජාතික විද්‍යා පදනම සහ චීනයේ ජාතික ස්වභාවික විද්‍යා පදනම යන ආයතන ද්විත්වයේම නිලධාරීන් සහ අනෙකුත් අදාළ පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් යුතු දැනුම හුවමාරු කරගැනීම් සැසියක් චීනයේ ජාතික ස්වභාවික විද්‍යා පදනම සමඟ ඒකාබද්ධව සංවිධානය කරන ලදී.

- පර්යේෂණ කටයුතුවල නියැලීමේ ආරම්භ අවධිවල සිටින පර්යේෂකවරු සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකරමින් ඵලදායී යෝජනා ලිවීම මැයෙන් වූ දැනුම් හුවමාරු සැසියක් ජාන ඉංජිනේරු සහ ජෛව තාක්ෂණ ජාත්‍යන්තර මධ්‍යස්ථානය (ICGEB) සමඟ ඒකාබද්ධව පවත්වන ලදී. මෙම සැසියේ අරමුණ වූයේ ICGEB සහයෝගිත්ව පර්යේෂණ වැඩසටහනහි (CRP) 2023 වර්ෂය සඳහා වන පර්යේෂණ ප්‍රදාන සඳහා කැඳවීමට සිය පර්යේෂණ යෝජනා නිශ්චිතව සාර්ථක අයුරින් ඉදිරිපත් කරනුයේ කෙසේද යන්න පිළිබඳව පර්යේෂකයන් දැනුවත් කිරීමයි. මෙම ICGEB – CRP ඔස්සේ මූලික විද්‍යා, මානව සෞඛ්‍ය සත්කාර, කාර්මික සහ කෘෂිකාර්මික ජෛව තාක්ෂණය හා ජෛව බලශක්ති වැනි ක්ෂේත්‍රවලට අදාළව සත්කාරක රටෙහි සහ කලාපීය වශයෙන් වැදගත්වන මූලාරම්භක විද්‍යාත්මක ගැටලු සඳහා විසඳුම් ලබාදෙන සහයෝගිත්ව පර්යේෂණ දියත් කිරීම සඳහා ICGEB වෙතින් මූල්‍යමය සහයෝගය ලබාදීම සිදුවේ. ICGEB හි විද්‍යා කටයුතු පිළිබඳ සම්බන්ධීකාරක ආචාර්ය විටෝරි වෙන්ටූරි සහ එහි විදේශ සබඳතා පිළිබඳ ප්‍රධානී එම් මරියානා මැකියුලන් විසින් සහයෝගිත්ව පර්යේෂණ වැඩසටහනහි පර්යේෂණ ප්‍රදාන සඳහා කැඳවීම් සහ එහි පූර්ව උගත් පාඩම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන ලදී. ICGEB වෙතින් අරමුදල් ලබාගැනීම ඉලක්ක කරගත් තරඟකාරී පර්යේෂණ යෝජනා සකස් කිරීමට මෙමගින් ශ්‍රී ලාංකික පර්යේෂකයන් වෙත හැකියාව ලබාදෙන ලදී.

ජාතික වශයෙන් ඉහළ ප්‍රමුඛතාවයක් සහිත ගැටලු විසඳීම පිණිස වූ මැදිහත්වීම්

- මිනිස්බල සහ රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් සඳහා වූ පුහුණු සැසි

ක්‍රමානුකූල අන්දමින් අන්වේෂ අධ්‍යයනයන් සිදුකරන්නේ කෙසේද යන්න සම්බන්ධයෙන් වූ ධාරිතා සංවර්ධන වැඩසටහනක් අන්වේෂ මිනිස්බල සහ රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් සඳහා පවත්වන ලදී. ඔවුන් සඳහා සවිස්තරාත්මක දත්ත විශ්ලේෂණය සහ අර්ථ විවරණය පිළිබඳ පුහුණු සැසි දෙකක් ද පැවැත්වූ අතර ඉන් අනතුරුව ඵලදායී ප්‍රශ්නාවලියක් සකස් කරනුයේ කෙසේ ද යන්න පිළිබඳව තෙවන සැසියක් ද පවත්වන ලදී. මෙම සැසිවලින් අනතුරුව එම දැනුම ඒ වහාම සිය රාජකාරී කටයුතු සඳහා යොදා ගැනීම පිණිස සහභාගිකයන් සඳහා න්‍යායාත්මක දැනුම මෙන්ම ප්‍රායෝගික නිපුණතා ද ලබාගැනීම තහවුරු කිරීම සඳහා මෙම සැසිවලට ප්‍රායෝගික නිදසුන් සහ අන්‍යෝන්‍ය ක්‍රියාකාරී අභ්‍යාස ද ඇතුළත්ව තිබුණි. මෙහි ඉලක්කය වූයේ දෙපාර්තමේන්තුව තුළ වැඩිදියුණු පර්යේෂණ පරිචයන් සඳහා දායකත්වය ලබාදෙමින් ප්‍රතිඵලදායී අන්වේෂ අධ්‍යයන සිදුකිරීම සඳහා එකී මාණ්ඩලික නිලධාරීන්ගේ හැකියාවන් ගොඩනැංවීම වන අතර එමඟින් වඩාත් ඵලදායී සහ විශ්වාසනීය ප්‍රතිපත්තිමය දර්ශක ඇතිකරගැනීම සිදුවේ. විදේශගත ශ්‍රී ලාංකික විද්‍යාඥ ආචාර්ය අනාස් මොහමඩ් යූසුෆ් (පශ්චාත් ආචාර්ය උපාධි අපේක්ෂ, ජීව විද්‍යා අධ්‍යයනාංශය, ඇල්බර්ටා විශ්වවිද්‍යාලය, කැනඩාව) සහ මාහාචාර්ය නිලන්ත ද සිල්වා (කෘෂි ආර්ථික විද්‍යා මහාචාර්ය සහ කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය, රුහුණු විශ්ව විද්‍යාලය) මෙම ධාරිතා සංවර්ධන වැඩසටහනේ සම්පත්දායකයන් ලෙස කටයුතු කරන ලදී.



ක්‍රමානුකූල අන්දමින් අන්වේෂ අධ්‍යයන සිදුකිරීම සම්බන්ධිත පුහුණු වැඩසටහනක් මිනිස්බල සහ රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් සඳහා පවත්වන ලදී.

- ශ්‍රී ලංකාවේ පරිසරය තුළ රතු පරිප්පු වගාකිරීම සඳහා පවතින විභවය අනාවරණය කරගැනීම

ආනයන ආදේශකයක් වශයෙන් ශ්‍රී ලංකාවේ පරිසරය තුළ රතු පරිප්පු වගාකිරීම සඳහා පවතින විභවය අනාවරණය කරගැනීම සඳහා වූ මූලික ප්‍රයත්නයක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ සහයෝගිතාවයෙන් සිදුකරන ලදී. විදේශගත ශ්‍රී ලාංකික විද්‍යාඥ ආචාර්ය මංජුල බණ්ඩාර (සහකාර මහාචාර්ය - ක්ෂේත්‍ර භෝග, සස්කෙච්වාන් විශ්වවිද්‍යාලය සහ ලීත්බ්‍රිජ් විශ්වවිද්‍යාලය, කැනඩාව) සහ වියළි ප්‍රදේශවල කෘෂි පර්යේෂණ සඳහා වන ජාත්‍යන්තර මධ්‍යස්ථානය (ICARDA), ඉන්දියාව මේ සඳහා සහාය ලබාදෙන ලද අතර, ප්‍රශස්ත කෘෂි-දේශගුණික තත්ත්ව නිශ්චය කර යෝග්‍යතාව අනාවරණය කර ගැනීමේ අරමුණ සහිතව නියමු මට්ටමේ ක්ෂේත්‍ර පරීක්ෂණ ක්‍රියාත්මක වෙමින් පැවතිණි.



ක්ෂේත්‍ර පරීක්ෂණ ඔස්සේ වගාකරන ලද පරිප්පු ශාක

- රබර් ශාකවල පොත්ත තිරසර ආකාරයෙන් කළමනාකරණය කිරීම ඔස්සේ රබර් වගාවල ඵලදායිතාවය වැඩිදියුණු කිරීම සඳහා නව දැනුම් හුවමාරුව

රට තුළ රබර් කර්මාන්තයේ දිගු කාලීන සාධ්‍යතාවය සඳහා වගකීමැති සහ තිරසර භාවිතයන්ගේ වැදගත්කම මෙම ප්‍රයත්නය ඔස්සේ අවධාරණය කෙරේ. විදේශ විශේෂ පුහුණු වැඩසටහන (OSTP) යටතේ ජාතික විද්‍යා පදනමේ ප්‍රදානයක් ලෙස ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනයේ (RRISL) භෝග වගා අංශයේ ප්‍රධානී ආචාර්ය ටී.යූ.කේ. සිල්වා වෙත ලබාදුන් ප්‍රදානයේ දිගුවක් ලෙස ක්‍රියාත්මක කළ මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වූයේ තිරසර රබර් කැපීමේ ක්‍රමයක් හඳුන්වාදීම මගින් රටපුරා තිරසර අයුරින් රබර් කිරි අස්වැන්න වැඩිදියුණු කිරීම ඉදිරියට සිදුකරගෙන යෑම වේ.

බිම් මට්ටම කරා අත්‍යවශ්‍ය දැනුම හා තාක්ෂණය පැවරීම සහතික කරමින්, රබර් වගා ක්ෂේත්‍රය තුළ ආසන්න වශයෙන් 1,000ක පමණ සේවක පිරිසක් වෙත එහි ප්‍රතිඵල ව්‍යාප්ත කරවීම මෙම පරිපූර්ණ ප්‍රයත්නය ඔස්සේ සිදුවිණි. මෙම ක්‍රමෝපායික ප්‍රවේශය ඔස්සේ, ශාකවල සමස්ත ඵලදායි ජීවකාලය පුරා රබර් අස්වැන්න ප්‍රශස්ත කරවීම, වැඩි ආර්ථික ප්‍රතිලාභ සහ ඵලදායි ආකාරයෙන් පොත්ත කළමනාකරණය කිරීම මගින් දිගු කාලීන තිරසාරත්වය වැඩිදියුණු කිරීම මෙම ව්‍යාපෘතිය මගින් අපේක්ෂා කෙරිනි. සුළු පරිමාණ සහ මහා පරිමාණ වැවිලි සමාගම් ඉලක්ක කරගනිමින් කළුතර, රත්නපුරය, කෑගල්ල සහ මොනරාගල යන රබර් වගාකරන දිස්ත්‍රික්ක හතරක දී නියමු ආකාරයේ ව්‍යාපෘතියක් ලෙස මෙය දියත් කරන ලදී. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය ද මෙම ව්‍යාපෘතිය ඔස්සේ පුහුණු කරවන ලදී.

ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනයේ ව්‍යාපෘති කණ්ඩායම විසින් ලබාදුන් ඇස්තමේන්තු අනුව, ව්‍යාපෘති බලපෑම ඔස්සේ ඵලදායිතාවයේ සුවිශේෂී ඉහළ යෑමක් අපේක්ෂා කෙරෙන අතර මෙය දිගු කාලීන වශයෙන් වැඩිදියුණු වූ සමාජ ආර්ථික ප්‍රතිලාභවලට පරිවර්තනය වේ. තිරසර ආකාරයෙන් රබර් කිරි කැපීමේ භාවිතයන් පිළිබඳ දැනුම සාර්ථක ආකාරයෙන් හුවමාරුවීම තුළින් ශ්‍රී ලංකාවේ රබර් වගා අංශයේ සමස්ත යහපත සඳහා සාධනීය ආකාරයෙන් දායකවනු ඇත.



විදේශ විශේෂ පුහුණු වැඩසටහනෙහි දිගුවක් යටතේ කළුතර පිහිටි රබර් වතු යායක සිදුකරන ක්ෂේත්‍ර අධීක්ෂණය

වගුව 06 : තිරසර ආකාරයෙන් රබර් කිරි කැපීම හරහා ප්‍රක්ෂේපිත ආර්ථික ප්‍රතිලාභ

තිරසර අස්වැනු නෙලීමේ බලපෑම හේතුවෙන් දීර්ඝ වන අස්වැන්න ලබාගැනීමේ කාලසීමාව (වර්ෂ වලින්)	අපේක්ෂිත අස්වැන්න (කි.ග්‍රෑම්/ හෙක්ටයාර/වර්ෂයකට)	ශුද්ධ අලෙවි සාමාන්‍යය (රු.)	නැවත ලබාගත හැකි ආදායම (රු.මිලියන/ හෙක්ටයාර)	මෙය හෙක්ටයාර 100 ක සිදුවුවහොත් අපේක්ෂිත ආදායම (රු.මිලියන)	මෙය හෙක්ටයාර 1,000 ක සිදුවුවහොත් අපේක්ෂිත ආදායම (රු.මිලියන)
1	1000	400	0.4	40	400
2	2000	400	0.8	80	800
3	3000	400	1.2	120	1200
4	4000	400	1.6	160	1600
5	5000	400	2	200	2000



තිරසර ආකාරයෙන් රබර් කිරි කැපීම සම්බන්ධයෙන් වූ පුහුණු පැවැත්වූ ප්‍රදේශ නිරූපණය කරන ශ්‍රී ලංකාවේ සිතියම

- එප්පාවල රොක් පොස්ෆේට් (ERP) සමඟ දිලීර බැක්ටීරියා ජෛව පටල ක්‍රියාකාරිත්වය ඔස්සේ එළවළු භෝගවල ඵලදායිතාවය වැඩිදියුණු කිරීම පිණිස ඵලදායි පොහොර සංයෝජනයක් සකස් කිරීමේ පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සඳහා පහසුකම් සැලැස්වීම

2021 වර්ෂයේ දී පොස්ෆේට් පොහොර තහනම් කිරීමට පෙර, 2018 වර්ෂයේ දී පොස්ෆේට් පොහොරවල ජාතික අවශ්‍යතාවය මෙට්‍රික් ටොන් 96,000ක් වූ අතර, ත්‍රිපල් සුපර් පොස්ෆේට් (TSP) සහ සින්ගල් සුපර් පොස්ෆේට් (SSP) ඇතුළු පොහොර වර්ග මෙරටට ආනයනය කිරීම සඳහා රජය විසින් වාර්ෂිකව රුපියල් බිලියන ගණනින් වැය කරන ලදී. ශ්‍රී ලංකාවට ආනයනය කරන ප්‍රධානම පොස්ෆරස් පොහොර වර්ගය වන ආනයනික ත්‍රිපල් සුපර් පොස්ෆේට්වල (TSP) අපද්‍රව්‍ය වශයෙන් ඉහළ ප්‍රතිශතවලින් කැඩ්මියම් (Cd) සහ ආසනික් (As) අන්තර්ගතබව පර්යේෂණ වාර්තා ඇසුරින් හඳුනාගෙන තිබේ. එසේම මෙම ආනයනික පොහොරවල අධික භාවිතය තුළින් අහිතකර පාරිසරික සහ සෞඛ්‍ය බලපෑම් ප්‍රතිඵල වී ඇති බව ද හඳුනාගෙන තිබේ. කැඩ්මියම් (Cd) සහ ආසනික් (As) අවම වශයෙන් පවතින පොහොර වශයෙන් එප්පාවල රොක් පොස්ෆේට් (ERP) හඳුනාගෙන ඇති නමුදු එමගින් පෝෂ්‍ය ද්‍රව්‍ය මුදාහරින්නේ සෙමින් බැවින් වාර්ෂික සහ ද්විවාර්ෂික වගා සඳහා එකී පොහොර යෝග්‍ය නොවේ. සිට්රික් අම්ලය, ග්ලූකොනික් අම්ලය, ලැක්ටික් අම්ලය සහ ඔක්සැලික් අම්ලය වැනි කාබනික අම්ල ස්‍රාවය කරන ජෛව පටලවලට අද්‍රාව්‍ය පොස්ෆරස් ද්‍රාව්‍ය ආකාරයට සීඝ්‍රයෙන් ද්‍රවණය කිරීමේ හැකියාව ඇත. ඵලදායි පොහොරක් වශයෙන් එප්පාවල රොක් පොස්ෆේට් භාවිතා කිරීමට නොහැකිවීමේ අවහිරතා අවම කරමින් රටෙහි පොස්ෆරස් පොහොර අවශ්‍යතාවය සඳහා එහි ගුණාත්මක බව ඉහල නංවමින් ඵලදායි පොහොරක් වශයෙන් එප්පාවල රොක් පොස්ෆේට් භාවිතා කිරීම පිළිබඳ ක්ෂේත්‍ර අධ්‍යයන කෙරෙහි මෙම ව්‍යාපෘතියේ දී අවධානය යොමුකර තිබේ.

මීට පෙර විදේශ විශේෂ පුහුණු වැඩසටහන (OSTP) යටතේ ප්‍රදානයක් ලෙස මහාචාර්ය අමිල හේනගමගේ (අංශ ප්‍රධාන සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, විද්‍යා සම තාක්ෂණ අධ්‍යයනාංශය, ව්‍යාහාරික විද්‍යා පීඨය, උඟව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය) වෙත ලබාදුන් ප්‍රදානයේ දිගුවක් ලෙස මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

පූර්ව පරීක්ෂණවලදී විශ්වාසනීය ප්‍රතිඵල ලබාදී ඇත. ක්ෂුද්‍රජීවී ජෛවපටල භාවිතා කරමින් ඇඹරීම් සහ ජෛව විකරණ හරහා අංශු විශාලත්වය අඩු කිරීම වැනි ඇතැම් භෞතික විකරණ සමඟ අර්තාපල් සහ ගෝවා වැනි කෙටි කාලීන වෙළඳ භෝග සඳහා ආනයනික පොස්ෆරස් පොහොරවල ගුණාංග සමඟ අනුකූලවන පොස්ෆරස් පොහොරක් ලෙස එප්පාවල රොක් පොස්ෆේට් සතුව විභවතාවයක් ඇති බව පෙන්නුම් කර තිබේ.

යථොක්තව සඳහන් කළ පර්යේෂණ සහ සංවර්ධන කාර්යයයේ මීළඟ පියවර වනුයේ විවිධ කාලගුණික තත්ත්ව යටතේ තත්‍ය ගොවි බිම්වල සහ වී වැනි අනෙකුත් කෙටි කාලීන භෝග සම්බන්ධයෙන් මෙම එප්පාවල රොක් පොස්ෆේට් ජෛව පොහොර යොදාගැනීම වේ. විභව්‍ය ආර්ථික වාසි සඳහා මුල පුරන පරිදි, තවත් ඵලදායි ප්‍රතිඵලයක් වනුයේ කුඩු ආකාරයෙන් පවතින පිරියම් කළ එප්පාවල රොක් පොස්ෆේට් යෙදීමේ පහසුව සහ වාණිජකරණය සඳහා කාර්මික සහාය ඇතිව කැට සහිත ආකාරයට පත්කිරීම වේ.



එප්පාවල රොක් පොස්ෆේට් (ERP) සමඟ දිලීර බැක්ටීරියා ජෛව පටල ක්‍රියාකාරිත්වය ඔස්සේ එළවළු භෝගවල ඵලදායිතාවය වැඩිදියුණු කිරීම පිණිස ඵලදායි පොහොර සංයෝජනයක් වැඩිදියුණු කිරීමේ කටයුතුවල ප්‍රගතිය අධීක්ෂණය කිරීම

- ශ්‍රී ලංකාවේ උක් සහ කිරිගව ක්ෂේත්‍ර වැඩිදියුණු කිරීම පිණිස බ්‍රසීලය සමඟ තාක්ෂණික සහයෝගිතාවය සඳහා පහසුකම් සැලසීම

ශ්‍රී ලංකාව වර්තමානයේ දී සිය කිරි අවශ්‍යතාවයෙන් 60%කට වඩා වැඩි ප්‍රමාණයක් ආනයනය කරනු ලබන අතර, මේ සඳහා වාර්ෂිකව රු.බිලියන 56ක පමණ මුදලක් වැය වේ. 2022 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ සීනි සහ සීනි රසකැවිලිවල ආනයන වටිනාකම ඇ.ඩො. මිලියන 268.66ක් වූ අතර, මෙය ජාතික අවශ්‍යතාවයෙන් 90% කට වඩා වැඩි ප්‍රමාණයකි. මෙවැනි වාතාවරණයක දී, ආහාර සුරක්ෂිතතාවය තහවුරු කරමින් ජාතික අවශ්‍යතාවය සපුරාලීම පිණිස සිය අභ්‍යන්තර ධාරිතාවයන් සංවර්ධනය කරගැනීම සඳහා ශ්‍රී ලංකාවේ කිරි හා උක් කර්මාන්ත අංශය සතුව ඉහළ විභවයක් පවතී.

මෙම පරතරය පියවීම පිණිස සහ විදේශ කටයුතු අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි, ශ්‍රී ලංකාවේ උක් සහ කිරි ගව අංශ වැඩිදියුණු කිරීමේ තාක්ෂණික සහයෝගිතාවය සඳහා ජාතික විද්‍යා පදනම විසින් බ්‍රසීල සහයෝගිතා නියෝජිතායතනය (ABC Institute) සමග හවුල්කරුවන් ලෙස සම්බන්ධ වන ලදී. කිරි ගව අංශය සඳහා කේන්ද්‍රීය ස්ථානය ලෙස කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ පශු සම්පත් අංශයත් උක් කර්මාන්ත අංශය සඳහා කේන්ද්‍රීය ස්ථානය ලෙස උක් පර්යේෂණ ආයතනයත් වශයෙන් මෙම අංශ දෙකෙහිම ප්‍රධාන පාර්ශවකාර ආයතන සම්බන්ධ වන ලදී. බ්‍රසීල සහයෝගිතා නියෝජිතායතනය (ABC Institute) විසින් දෙරටෙහිම අදාළ තානාපති කාර්යාල සහ අදාළ විදේශ කටයුතු අමාත්‍යාංශ සමග සම්බන්ධ වී කටයුතු කරන ලදී.

මෙම ක්ෂේත්‍ර දෙකෙහිදීම අදාළ පාර්ශවයන්ට මනා ප්‍රතිලාභ අත්වන පරිදි තාක්ෂණික සහයෝගිතානය සඳහා පවතින විභවයන් තක්සේරු කිරීම සඳහා බ්‍රසීල සහයෝගිතා නියෝජිතායතනය (ABC Institute) විසින් 2023 වර්ෂයේ මැද භාගයේ දී ශ්‍රී ලංකාවට පැමිණ සිදුකළ කරුණු අනාවරණය කරගැනීමේ දූත මෙහෙවරක දී, මෙම ප්‍රයත්නය සම්බන්ධීකරණය සඳහා ජාතික විද්‍යා පදනම විසින් ප්‍රමුඛ කාර්යයක් ඉටු කරන ලදී. බ්‍රසීලයේ සාඕ කාලොස්මි ෆෙඩරල් විශ්වවිද්‍යාලයේ සහ විකෝසාහි ෆෙඩරල් විශ්වවිද්‍යාලයේ විශේෂඥ පිරිසක් ද මීට එක්වී සිටින ලදී. මෙම කරුණු අනාවරණය කරගැනීමේ දූත මෙහෙවර මත පදනම්ව, එම ක්ෂේත්‍ර ද්විත්වයේම ඉදිරි කටයුතු සඳහා වන තාර්කික රාමුවල කෙටුම්පත් සකස් කරන ලද අතර ඒ සම්බන්ධිත පසුපෙවුම් කටයුත ද සිදුකෙරිනි.



බ්‍රසීල දූත පිරිස සමඟ විදේශ කටයුතු අමාත්‍යාංශයේ දී 2023.06.20 දිනැතිව පැවති රැස්වීම

දේශීය විභවතාවයන් ශක්තිමත් කිරීම සඳහා ගෝලීය වශයෙන් ජාලගතවීම

- ජාන ඉංජිනේරු සහ ජෛව තාක්ෂණ ජාත්‍යන්තර මධ්‍යස්ථානය (ICGEB) - සහයෝගිත්ව පර්යේෂණ වැඩසටහන (CRP)

ජාන ඉංජිනේරු සහ ජෛව තාක්ෂණ ජාත්‍යන්තර මධ්‍යස්ථානය (ICGEB) විසින් සිය සහයෝගිත්ව පර්යේෂණ වැඩසටහන (CRP) හරහා වාර්ෂිකව ආධාර ප්‍රදාන අවස්ථා ලබාදෙන අතර එය ප්‍රදාන ලබන රටෙහි විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන අංශයේ ඉල්ලුම් ප්‍රවණතාවලට අදාළව සහ සාමාජික රටවල කලාපීය පොදු යහපත සඳහා විසඳුම් වශයෙන් වූ ව්‍යාපෘති වෙනුවෙන් ලබා දේ. ICGEB හි මෙරට ජාතික කේන්ද්‍රීය ආයතනය වශයෙන් කටයුතු කරන ජාතික විද්‍යා පදනම විසින් අයදුම්පත් කැඳවීමේ දී පුළුල් ප්‍රචාරයක් ලබා දුන් අතර, 2023 වර්ෂයේ දී ව්‍යාපෘති යෝජනා 23ක් ලැබිණි. ඒවා පූර්ණ වශයෙන් ඇගයීමෙන් අනතුරුව රටෙහි පර්යේෂණ සහ සංවර්ධන අවශ්‍යතාවල ප්‍රමුඛතාවයන් සඳහා විසඳුම් ඉදිරිපත් කෙරෙන අයදුම්පත් පහක් (early career return grant applications යන කාණ්ඩය යටතේ අයදුම්පත් දෙකක් සහ standard research grant applications කාණ්ඩය යටතේ අයදුම්පත් තුනක්) ICGEB වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. ICGEB විසින් සිදුකරන අවසන් ඇගයීමේ කටයුතු සිදුකරමින් පැවතිණි. ඒ අනුව, ICGEB හි ජාතික සම්බන්ධීකරණ ආයතනය වශයෙන් කටයුතු කරන ජාතික විද්‍යා ආයතනයේ පහසුකම් සැලසීම සමගින් ශ්‍රී ලාංකික විද්‍යා සහ පර්යේෂණ ප්‍රජාව විසින් ICGEB අරමුදල් ප්‍රදානවලින් පුළුල් වශයෙන් ප්‍රතිලාභ අත්පත් කරගෙන ඇතිබව සඳහන් කළ යුතු ය.



රූපසටහන 70: ජාතික විද්‍යා පදනමේ පහසුකම් සැලසීම සමගින් පසුගිය දශකය මුළුල්ලේ ශ්‍රී ලාංකික පර්යේෂණ සහ සංවර්ධන කටයුතුවල නියැලි ප්‍රජාව විසින් ICGEB වෙතින් ලබාගන්නා ලද ප්‍රදානයන්

- STEM ක්ෂේත්‍රවල පුම්තිරිබවට අදාළ කරුණු සම්බන්ධයෙන් පහසුකම් සැලසීම සඳහා සබඳතා

තිරසර පර්යේෂණ පිළිබඳ අවධානය ඇතිව ගෝලීය පර්යේෂණ සභාව විසින් මාර්ගගත සහ පුද්ගල සහභාගිත්වය යන ආකාර දෙකහිම සංකලනයකින් යුතුව සංවිධානය කළ සමානාත්මතාවය, විවිධත්වය සහ සැවොම අන්තර්ගත (EDI) ආසියා ශාන්තිකර කලාපීය රැස්වීම් සැසිය සඳහා නායකත්වය ලබාදෙන ලදී. 2023 වර්ෂයේ අග භාගයේ දී සංවර්ධනය වෙමින් පවතින රටවල විද්‍යා අංශයේ නියැලෙන කාන්තාවන් සඳහා වූ සංවිධානයේ ශ්‍රී ලංකා ශාඛාව සහ ජාතික විද්‍යා පදනම ඒකාබද්ධව තාක්ෂණය මත පදනම් වූ ශ්‍රී ලංකාවේ තිරසර සංචාරක කර්මාන්තයක් සඳහා විද්‍යා සහ තාක්ෂණ කටයුතුවල නියුක්ත කාන්තාවන්ගේ දායකත්වයී මැයෙන් වූ සම්මන්ත්‍රණය පවත්වන ලදී. විශේෂයෙන් විද්‍යා අංශයේ නියැලෙන කාන්තාවන් විසින් ඉතා වැදගත් කාර්යභාරයක් ඉටුකළ හැකි සංචාරක කර්මාන්තයේ මධ්‍යම හා ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටම්වල දී කාන්තා සහභාගිත්වය සම්බන්ධිත පරතරය මෙහිදී අවධානිත කරුණ විය.

මෙම ක්‍රියාකාරකම් ද්විත්වය ඔස්සේම යහපත් පරිචයන් හුවමාරු කරගැනීමට සහ STEM ක්ෂේත්‍රවල පුම්තිරිබවට අදාළව පවතින පරතරයන් සම්බන්ධයෙන් තවදුරටත් ක්‍රියාමාර්ග ගැනීමේ ඉඩප්‍රස්තාවන් (දේශීය මෙන්ම කලාපීය වශයෙන්) විවර විය.



OWSD/ SLNC සහයෝගිත්ව වැඩමුළුවේ සහභාගිකයන්



වැඩසටහනට අදාළව සකස් කළ පත්‍රිකාව

ජාතික විද්‍යා පදනම වෙත පැවරී ඇති බලය අ) විද්‍යා සහ තාක්ෂණ ප්‍රතිපත්ති පර්යේෂණ

ජාතික ජෛවතාක්ෂණ ප්‍රතිපත්තිය වැඩිදියුණු කිරීම සඳහා නැවත සලකා බැලීම

ඉතා සීඝ්‍රයෙන් පුළුල්වෙමින් පවතින තාක්ෂණ අතුරින් එකක් වන ජෛව තාක්ෂණ ක්ෂේත්‍රය සඳහා යාවත්කාලීන ප්‍රතිපත්තියක් පැවතීමේ අවශ්‍යතාවය හඳුනාගන්නා අතරම, 2009 වර්ෂයේ දී ජාතික විද්‍යා පදනම විසින් ජාතික විද්‍යා සහ තාක්ෂණ කොමිෂන් සභාවේ (NASTEC) සහයෝගීතාවයෙන් පිළියෙල කරන ලද දැනට පවතින ජාතික ජෛව තාක්ෂණ ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීමේ කටයුතු විද්‍යා සහ තාක්ෂණ ප්‍රතිපත්තිය පිළිබඳ ජාතික විද්‍යා පදනමේ කමිටුව යටතේ වන ජෛව තාක්ෂණය පිළිබඳ ජාතික විද්‍යා පදනමේ උප කමිටුව විසින් ආරම්භ කරන ලදී.

2022 වර්ෂයේ දී, එම ප්‍රතිපත්තිය විශේෂඥ දැනුමැති පුද්ගලයන් විසින් සමාලෝචනය කළ අතර, සෞඛ්‍ය, කෘෂිකර්මය, කර්මාන්ත, පරිසරය, සහ බලශක්ති වැනි ක්ෂේත්‍රවලට අදාළව ඔවුන්ගේ අදහස් ලබාගන්නා ලදී. පුළුල් පරාසයක් නියෝජනය කරන පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් ජාතික විද්‍යා පදනමේ දී 2023 සැප්තැම්බර් 19 වැනි දිනැතිව පැවති අන්‍යෝන්‍ය වශයෙන් අදහස් හුවමාරු කරගැනීමේ රැස්වීම සඳහා එසේ යථාවත් පරිදි සම්පාදනය කරන ලද නිර්දේශ මාලාව ඒ සම්බන්ධයෙන් අදහස් ලබාගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.

රට පුරා ව්‍යාප්ත අධ්‍යයන, පර්යේෂණ ආයතන, නියාමන මණ්ඩල, සහ කර්මාන්ත නියෝජනය කරමින් පාර්ශවකරුවන් 60කට අධික පිරිසක් මෙම අදහස් විමසීමේ රැස්වීමට සහභාගී විය. පාර්ශවකරුවන්ගේ අදහස් සෘජුවම විමසීම සඳහා පැවති මෙම සම්මන්ත්‍රණයට අමතරව, සවිස්තරාත්මක ආකෘතියක් ඔස්සේ දැනට පවතින ප්‍රතිපත්තිය සඳහා සුවිශේෂී ආකාරයෙන් වැඩිදියුණු කිරීම් අවශ්‍යවන ආකාරය පිළිබඳව ඔවුන්ගේ ප්‍රතිචාර ලබාගැනීම ද සිදුවිය.



පාර්ශවකරුවන් වෙතින් ප්‍රතිචාර විමසීමේ ආකෘතිය



පාර්ශවකරුවන්ගේ අදහස් විමසීමේ සාකච්ඡාවේ අවස්ථාවක්



පාර්ශවකරුවන්ගේ අදහස් විමසීමේ සාකච්ඡාවේ අවස්ථාවක්

මෙම ක්‍රියාකාරකම් ඔස්සේ දැනට පවතින ප්‍රතිපත්තිය සඳහා විධිමත් අයුරින් යළි සකස් කළ යෝජිත සංශෝධන, ජාතික ජෛව තාක්ෂණ ප්‍රතිපත්තියේ නව සංස්කරණය තුළට ඇතුළත් කිරීම සඳහා ජාතික විද්‍යා සහ තාක්ෂණ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ජාතික විද්‍යා පදනම වෙත පැවරී ඇති බලය
ඉ) විද්‍යාව ප්‍රචලිත කිරීම

එක් මාවතක් එක් තීරයක් මූලාරම්භය යටතේ චීනයේ පැවැත්වුණු 7 වැනි Belt and Road Teenager Maker Camp and Teacher Workshop 2023 සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් කණ්ඩායමක් සහභාගී වූ අතර හොඳම ඉදිරිපත් කිරීම් කාණ්ඩ යටතේ ජයග්‍රාහී ස්ථාන ලබාගැනීමට ඔවුන් සමත් විය.

විද්‍යා සාක්ෂරතාවය සඳහා වූ ලෝක සංවිධානය (WOSL) සමඟින් විද්‍යා සහ තාක්ෂණය සඳහා වූ චීන සංවිධානය (CAST) සහ චීනයේ විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය විසින් සංවිධානය කළ Belt and Road Teenager Maker Camp සහ ගුරුවරුන් සඳහා වූ වැඩමුළුව සඳහා සිසුන් (10) දෙනෙකු සහ ගුරුවරු (03) දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් සහභාගී විය. ඔවුන් විසින් කඳවුර තුළ සිදුකළ ක්‍රියාකාරකම් සඳහා හොඳම කණ්ඩායම, හොඳම ඉදිරිපත් කිරීම සහ හොඳම සෑදුම්කරු යන කාණ්ඩ යටතේ ජයග්‍රාහී ස්ථාන ලබාගැනීමට සමත් විය.

මෙම වැඩමුළුව සඳහා සහභාගී වූ ගුරුවරුන්ට විශේෂ පුහුණු වැඩසටහන්වල නිරතවීමේ අවස්ථාව ද හිමිවිණි.

අභිමානී රණතුංග මෙය, විද්‍යාත්මක නිලධාරි, ජාතික විද්‍යා පදනම
උපේක්ෂා දර්ශනී අබේසේකර මෙය, තර්ස්ටන් විදුහල, කොළඹ 07
තුෂාරි නෙල්කා මුණසිංහ මෙය, හරිස්චන්ද්‍ර ජාතික පාසැල, මීගමුව
ටෙක්ලා මනෝජා සුදර්ශනී මෙය, තංගල්ල බාලිකා විද්‍යාලය, තංගල්ල

මෙම වැඩසටහන සඳහා සහභාගීවූ පිරිසට ඇතුළත් විණි.

වගුව 07: සහතිකපත්‍රලාභීන්

ජයග්‍රාහී කාණ්ඩය	ශිෂ්‍යයාගේ නම	පාසැල
හොඳම කණ්ඩායම	නදීජා ප්‍රතිභාන	තර්ස්ටන් විදුහල, කොළඹ 07
හොඳම ඉදිරිපත්කිරීම	අනුසර වීරකෝන්	ධර්මරාජ විදුහල, මහනුවර
	සහන් ෂවින්ද ප්‍රනාන්දු	ජෝශප් වාස් විදුහල, වෙන්නප්පුව
	මෙදිනි ත්‍රිෂාලා තුඩාහේවගේ	ශාන්ත පාවුළු බාලිකා පාසැල, මිලාගිරිය, කොළඹ 05
	අමායා සංකලනී බණ්ඩාර	ශාන්ත තෝමස් බාලිකා පාසැල, මාතලේ
හොඳම සෑදුම්කරු	සිලුනි ද සිල්වා	මියුසියස් විදුහල, කොළඹ
	මොහමඩ් බහීජ් අල් බාරා	කින්නියා මධ්‍ය මහා විදුහල, කින්නියා
	සදීශා දේවේන්ද්‍ර රණවීර	මහමෙව්නා බෞද්ධ විදුහල, දෙමළගම
	සචිනි කෞෂල්‍යා බුළුමුල්ල	මහමායා බාලිකා විදුහල, මහනුවර
	මහේෂා පියුමි විරසිංහ	මහමායා බාලිකා විදුහල, මහනුවර



විද්‍යාත්මක සාක්ෂරතාවයෙන් හෙබි සමාජයක් නිර්මාණය කිරීමෙහිලා විද්‍යාව ප්‍රචලිත කිරීම

1. විද්‍යා අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සඳහා විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු, කලා සහ ගණිත අධ්‍යාපන ප්‍රවේශය (STEAM approach) හරහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
2. ප්‍රජාවේ විවිධ කොටස් කරා විද්‍යාව රැගෙනයෑම සඳහා විවිධ වැඩසටහන් සහ ක්‍රියාකාරකම් හරහා විද්‍යාව ප්‍රචලිත කිරීම ඔස්සේ විද්‍යාත්මක සාක්ෂරතාවයෙන් හෙබි සමාජයක් දියුණු කිරීමෙහිලා ජාතික විද්‍යා පදනම විසින් අවධානය යොමු කෙරේ.

යථොක්තව සඳහන් කළ ඉලක්ක සඳහා ඵලදායි අයුරින් පහසුකම් සැලැස්වීම පිණිස, ජාතික විද්‍යා පදනම විසින් 2005 වර්ෂයේ දී එහි අංශයක් වශයෙන් විද්‍යා සන්නිවේදන සහ ව්‍යාප්ති අංශය (SCOD) ස්ථාපනය කරන ලදී.

විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු, කලා සහ ගණිත අධ්‍යාපන ප්‍රවේශය හරහා විද්‍යා අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම

1.1 විද්‍යා සමාජ ජාලයක් ස්ථාපනය කිරීම



ඵලදායි සහ කාර්යක්ෂම අයුරින් විද්‍යාව සමාජය තුළට රැගෙන යෑම සඳහා, ප්‍රජාවේ විවිධ ස්තර විශේෂයෙන් පාසැල් ප්‍රජාව ආවරණය වන අයුරින් ජාතික විද්‍යා පදනම විසින් 2005 වර්ෂයේ සිට විද්‍යා සමාජ ජාලයක් ස්ථාපනය කර තිබේ. ඒ අනුව, 2023 වර්ෂය අවසාන වනවිට, ජාතික විද්‍යා පදනම විසින් පාසැල් විද්‍යා සංගම් 1,163 ක් සහ විශ්වවිද්‍යාල විද්‍යා සංගම් 55 ක් ලියාපදිංචි කර තිබේ. මෙම ප්‍රයත්නය ග්‍රාමීය මට්ටමේ දී ප්‍රජා පාදක විද්‍යා සංගම් පිහිටුවීම දක්වා රැගෙන යන ලදී. ජාතික විද්‍යා පදනම විසින් සංවිධානය කළ තරඟවල ජයග්‍රාහකයන්ගේ ව්‍යාප්තිය 2005-2023.

1.2 පරිසරය කෙරෙහි සංවේදී ස්වභාව ධර්මය වෙත ලැදියාවක් දක්වන අනාගත පරපුරක් බිහි කිරීම

1.2.1 ළමා පරිසරවේදියා වැඩසටහන (Kid Naturalist Programme)

කුඩා දරුවන් පරිසරයට අනුගත කිරීමේ වැඩසටහන යනු 1-6 දක්වා ශ්‍රේණිවල අධ්‍යාපනය ලබන දරුවන් ඉලක්ක කරගෙන ජාතික විද්‍යා පදනම විසින් 2020 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරන තවත් වැඩසටහනකි. සිය එදිනෙදා ජීවිතයේ දී විද්‍යාව සහ විද්‍යාත්මක සංකල්ප අධ්‍යයන කරන සහ භාවිතයෙහි යොදාගන්නා පරිසර සංවේදී සිසු පරපුරක් බිහිකිරීමේ අපේක්ෂාවෙන් විද්‍යාත්මක ක්‍රමවේද අනුගමනය කරමින් තමා ජීවත්වන පරිසරය නිරීක්ෂණය කිරීම සඳහා සිසුන් යොමු කිරීම මෙම වැඩසටහනෙහි ප්‍රධානතම අරමුණ වේ. මෙම වැඩසටහන සඳහා සහභාගී වන සිසුන් විසින් සති 6ක කාල සීමාවක් තුළ තමා විසින් සිදුකරන නිරීක්ෂණයන් පදනම් කරගත් ස්වාභාවික පරිසරය පිළිබඳ ජර්නලයක් සකස් කළ යුතුය. ජාතික විද්‍යා පදනම විසින් පත්කරනු ලබන අදාළ විෂයයන් පිළිබඳ විශේෂඥ දැනුමෙන් හෙබි පුද්ගල කමිටුවක් විසින් ස්වභාව ධර්මය පිළිබඳව සකස් කර ඉදිරිපත් කරනු ලබන ජර්නල් ඇගයීම සිදුකරනු ලබන අතර, තෝරාගනු ලබන හොඳම ව්‍යාපෘති ජාතික විද්‍යා පදනමේ සම්මාන ප්‍රදාන උත්සවයේ දී ඇගයීමට බඳුන් කරනු ලැබේ. ඒ අනුව, 2023 වර්ෂයේ දී පැවැත්වූ වැඩසටහනේ දී අයදුම්පත් 1,506ක් ලැබී තිබූ අතර, අවසාන අදියරේ ඇගයීම සඳහා ස්වාභාවික පරිසරය පිළිබඳ සකස් කරන මෙම ජර්නල් 331ක් තෝරාගන්නා ලදී. මෙම වැඩසටහනේ ජාතික ජයග්‍රාහකයන් වශයෙන් සෑම ශ්‍රේණියකම හොඳම ජර්නල් 10 බැගින් තෝරාගන්නා ලදී.

වගුව 08: 2023 වර්ෂයේ දී දියත් කළ කුඩා දරුවන් පරිසරයට අනුගත කිරීමේ වැඩසටහනෙහි හොඳම ක්‍රියාකාරී සිසුන්

කාණ්ඩය: 1 වැනි ශ්‍රේණිය		
අංකය	**ජයග්‍රාහකයාගේ නම**	**පාසැල**
01	මුරලිදරන් අකාරන්	ශාන්ත ජෝන් බොස්කෝ විද්‍යාලයම්, යාපනය
02	ඩබ්. ෂනුකි ෂෙහන්සා	කුඩාලහේන කණිෂ්ඨ විද්‍යාලය, මාතර
03	කවිනි නිහින්සා මෙනොන්	මහමායා බාලිකා විදුහල, මහනුවර
04	ආර්. රිෂිකා	ශුද්ධ වූ පවුලේ කන්‍යාරාමය, යාපනය
05	ඉමල්ෂා මිහිසර	එලමල්දෙණිය කණිෂ්ඨ විද්‍යාලය, මාතර
06	එස්. කවිනයා	ශුද්ධ වූ පවුලේ කන්‍යාරාමය, යාපනය
07	ආර්. ඩිරෝනි	ශුද්ධ වූ පවුලේ කන්‍යාරාමය, යාපනය
08	එස්. එම්. තරුෂි ලක්ෂානි	ඇත්තොට විද්‍යාලය, ඇත්තොට, ගල්ලේල, රත්තොට
09	එස්. සුජාලිනි	ශුද්ධ වූ පවුලේ කන්‍යාරාමය, යාපනය
10	ඒ. එස්. මරීටා	ශුද්ධ වූ පවුලේ කන්‍යාරාමය, යාපනය
කාණ්ඩය: 2 වැනි ශ්‍රේණිය		
අංකය	**ජයග්‍රාහකයාගේ නම**	**පාසැල**
01	නෙත්‍යා පල්ලියගේ	උසස් බාලිකා විදුහල, මහනුවර
02	සකිල ගේසර දුනුකේපොත	ශාන්ත ඇන්තනී පිරිමි විදුහල
03	එම්. ජී. සුවහස් දෙව්ෂාන්	දියදාව කණිෂ්ඨ විද්‍යාලය, මාතර
04	වගීෂ ප්‍රභාෂ්වර බණ්ඩාර	ශාන්ත සිල්වෙස්ටර් විදුහල, මහනුවර
05	ජේ. කස්විනී	ශුද්ධ වූ පවුලේ කන්‍යාරාමය, යාපනය
06	ජේ. වී. ජී. තිනුලි සෙහන්සා	රඹුකන කොඩිකාරගොඩ කණිෂ්ඨ විද්‍යාලය, මාතර
07	මත්යා පල්ලියගේ	උසස් බාලිකා විදුහල, මහනුවර
08	ඩී. ජී. ඉසදි දහම්සා	රඹුකන කොඩිකාරගොඩ කණිෂ්ඨ විද්‍යාලය, මාතර
09	ටී. එම්. ටෂේනි නෙතුසරි	සියඹළාගොඩ බටහිර ප්‍රාථමික පාසැල, මාතර
10	ටී. නජනිතා	ශුද්ධ වූ පවුලේ කන්‍යාරාමය, යාපනය
කාණ්ඩය: 3 වැනි ශ්‍රේණිය		
අංකය	**ජයග්‍රාහකයාගේ නම**	**පාසැල**
01	එච්. බී. ඉන්දීප ගීණුක හිටිබණ්ඩාර	ඩෙල්ටා ගැමුණුපුර මධ්‍ය මහා විද්‍යාලය
02	ඩබ්. එම්. දෙනිත් මින්රුක වීරසිංහ	තර්ස්ටන් විදුහල, කොළඹ 07
03	තෙසදි නවීත්මා දේශප්‍රිය	සීතාදේවි බාලිකා විද්‍යාලය, මහනුවර

04	සදිව් කිත්නුක විතානගේ	තර්ස්ටන් විදුහල, කොළඹ 07
05	ආර්.සන්ජනා	ශුද්ධ වූ පවුලේ කන්‍යාරාමය, යාපනය
06	කේ. ඕ. ජී. ජයමි මලිත්යා	රඹුකන කොඩිකාරගොඩ කණිෂ්ඨ විද්‍යාලය, මාතර
07	එච්. බී. චන්දීප ගෙත්ම හිටිබණ්ඩාර	ඩෙල්ටා ගැමුණුපුර මධ්‍ය මහා විද්‍යාලය
08	එන්. එච්. එච්. චමත්කාරා රුසරණී	හඟුරන්කෙත මතුරට මධ්‍ය මහා විද්‍යාලය
09	ආර්. කේ. තිසුම් තේජාන් නවරත්න	ඩෙල්ටා ගැමුණුපුර මධ්‍ය මහා විද්‍යාලය
10	ජී. ප්‍රහර්ෂ කෞෂාන් ෆොන්සේකා	කිංග්ස්වුඩ් විදුහල, මහනුවර
11	ඩී. ඊ. නදුලි ටමායා	රඹුකන කොඩිකාරගොඩ කණිෂ්ඨ විද්‍යාලය, මාතර

කාණ්ඩය: 4 වැනි ශ්‍රේණිය

අංකය	ජයග්‍රාහකයාගේ නම	පාසැල
01	වී. ඒ. තේමිය රනුමිත සමරවික්‍රම	මහනුවර ජාත්‍යන්තර පාසැල, මහනුවර
02	කේ. රෙහෙන් සෙනෙත් පෙරේරා	තර්ස්ටන් විදුහල, කොළඹ 07
03	කේ. ස්වර්ණී ක්‍රිෂ්මිනා	හයිලැන්ඩ්ස් ජාතික පාසැල, හැටන්
04	ඒ. වී. ඔසන්දි දෙව්දුනි	මොරවක ප්‍රාථමික පාසැල
05	ශාන්තකුමාර් ජයාෂ්විනි	උසස් බාලිකා විදුහල, මහනුවර
06	ඩබ්. ජී. සත්සිලු වේහර	ඩෙල්ටා ගැමුණුපුර මධ්‍ය මහා විද්‍යාලය
07	පී. ජී. ඉසේලි සර්යා ගාල්ලගේ	සංඝමිත්තා බාලිකා විදුහල, ගාල්ල
08	ටී. නෙතුම් මිහිසර රණසිංහ	තර්ස්ටන් විදුහල, කොළඹ 07
09	තෙදසි නදුල්යා කළුපහන	සංඝමිත්තා බාලිකා විදුහල, ගාල්ල
10	ඔකිත තනුජිත විදානගමගේ	ධර්මරාජ විදුහල, මහනුවර
11	රන්සිළු කවීෂ්වර වනිගසේකර	තල්පේකුඹුර ප්‍රාථමික විදුහල, මාතර

කාණ්ඩය: 5 වැනි ශ්‍රේණිය

අංකය	ජයග්‍රාහකයාගේ නම	පාසැල
01	ඩී. ඒ. චතුර දේශන්ජනා ධර්මරත්න	ඩෙල්ටා ගැමුණුපුර මධ්‍ය මහා විද්‍යාලය
02	එච්. ආර්. එල්. සනුකදෙව්සිතු	දෙනියාය මධ්‍ය විද්‍යාලය, මාතර
03	එල්. ටියොන් අභිෂ්ක පෙරේරා	සපුගස්කන්ද සෝභිත විද්‍යාලය
04	ඩබ්. එම්. සනුති අෂ්විනී වීරසේකර	විෂන් ජාත්‍යන්තර පාසැල, මහනුවර
05	යශෝදරා දම්සාරි වික්‍රමරත්න සිරිවර්ධන	ශාන්ත ජෝශප් බාලිකා මහා විද්‍යාලය, කෑගල්ල
06	සෙනුල ඉන්සිත විතානගේ	තර්ස්ටන් විදුහල, කොළඹ 07
07	එම්. ජී. බී. වයි. සී. බණ්ඩාර	මහානාම විදුහල, කළුතර
08	පී. ජී. සතුෂ නිම්නාද	ඩෙල්ටා ගැමුණුපුර මධ්‍ය මහා විද්‍යාලය
09	දුලිති නෙතුම්සා රොඩ්රිගෝ	සුජාතා විද්‍යාලය, මාතර
10	බී. ඒ. සනුදික සඳසැන් බණ්ඩාර	කඳන්ගොඩ ප්‍රාථමික විදුහල, රත්නපුරය

කාණ්ඩය: 6 වැනි ශ්‍රේණිය

අංකය	ජයග්‍රාහකයාගේ නම	පාසැල
01	ටී. ඩී. ඉන්දුමිනි මෙත්මා	කිරිලිපන කණිටු විදුහල, මාතර
02	එම්. අයි. එම්. ආතිෆ්	රණබිම රාජකීය විදුහල, මහනුවර
03	ඩී. කේ. බාෂිත තිමත් රත්නායක	රණබිම රාජකීය විදුහල, මහනුවර
04	ජේ. ජී. අශේන් නෙත්සර	කිරිලිපන කණිටු විදුහල, මාතර
05	ඩබ්. කේ. ජේ. සිතුමි සේයා	කිරිලිපන කණිටු විදුහල, මාතර
06	ආර්. කේ. ජී. අයි. උදේශ් බණ්ඩාර	රණබිම රාජකීය විදුහල, මහනුවර
07	ඩී. එල්. කේමිත සුහස් ලියනගේ	රණබිම රාජකීය විදුහල, මහනුවර
08	මයුරන් අජායිරාව්	තාවඩි හින්දු දමිළ මිශ්‍ර විදුහල, යාපනය
09	කණිෂ්ක බාලකුමාර්	නෙලුක්කුලන් කලායිමහල් මධ්‍ය මහා විද්‍යාලය
10	ආරන්‍යා ගනේෂදේවා	යාපනය හින්දු කාන්තා විදුහල

1.3 පාසැල් විද්‍යා තරඟ (SSC)

විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු, කලා සහ ගණිත අධ්‍යාපන ප්‍රවේශය (STEAM approach) සමඟින් පාසැල් ප්‍රජාව තුළ විද්‍යාව ප්‍රචලිත කිරීම සඳහා ජාතික විද්‍යා පදනමේ විද්‍යා සන්නිවේදන සහ ව්‍යාප්ති අංශය (SCOD) විසින් පාසැල් විද්‍යා තරඟ වාර්ෂිකව පවත්වනු ලැබේ. ඒ අනුව, "වඩා යහපත් අනාගතයක් උදෙසා STEAM අධ්‍යාපනය" මැයෙන් පැවති වැඩසටහන යටතේ 2023 වර්ෂයේ දී පහත දැක්වෙන පරිදි තරඟ හතක් පවත්වා තිබේ.

1. රචනා තරඟය
2. ඩිජිටල් මාධ්‍යයෙන් කතා කීම
3. විරිදු තරඟය
4. පෝස්ටර් තරඟය
5. විද්‍යා කෙටි කතා තරඟ (ප්‍රබන්ධ)
6. ගායන තරඟය
7. භූමිකා නිරූපණ තරඟය (Role play competition)

වගුව 08: තරඟවල ජයග්‍රාහකයන්

රචනා තරඟය			
අංකය	**ශිෂ්‍යාගේ නම**	**පාසැල**	**ස්ථානය**
සිංහල මාධ්‍යය			
01	ඩී. පී. කේ. ජී. තරුෂි දෙව්මිණි දසනායක	හන්දෙස්ස මහා විද්‍යාලය, දවුලගල, පේරාදෙණිය	1 වැනි
02	නිපුන් ධනන්ජය ප්‍රේමරත්න	ධර්මරාජ විදුහල, මහනුවර	2 වැනි
03	ඩබ්. ජී. සෙනුගි ලෙහන්සා	ඩෙල්ටා ගැමුණුපුර මහා විද්‍යාලය, පුස්සැල්ලාව	3 වැනි
ඉංග්‍රීසි මාධ්‍යය			
01	මොහමඩ් නවුෂාඩ් බීනා ධානීන්	මහමුඩ් බාලිකා විදුහල (ජාතික පාසැල), කල්මුණේ	1 වැනි
02	අයිෂා මොහිඩීන්	බදි-යුදින් මහමුඩ් බාලිකා විදුහල, මහනුවර	2 වැනි
03	ආත්තියා ජේසී	ශාන්ත සෙසිල්ලා බාලිකා විදුහල, මඩකලපුව	3 වැනි
04	එම්. එස්. ෂෆා	බ්‍රිතාන්‍ය ජාත්‍යන්තර පාසැල, පොල්ගහවෙල	3 වැනි
දෙමළ මාධ්‍යය			
01	පරනීහා සෙල්වෙන්ද්‍රරාඩාස්	ස්කන්ධවරෝදය විදුහල, යාපනය	1 වැනි
02	තේවසිහමානි කසන්දනාන්	ශ්‍රී රාමක්‍රිෂ්ණා විදුහල, අක්කරෙයිපත්තු	2 වැනි
03	එස්. ලෝගලක්ෂාන්	ශ්‍රී රාමක්‍රිෂ්ණා විදුහල, අක්කරෙයිපත්තු	3 වැනි

විද්‍යා කෙටිකතා තරඟ (ප්‍රබන්ධ) තෝරාගත් හොඳම විද්‍යා කෙටිකතා තරඟ පහ			
අංකය	**ශිෂ්‍යාගේ නම**	**පාසැල**	**ස්ථානය**
01	එච්. ඩබ්. එම්. රන්දිනී වන්දනු විජයසිංහ	මහමායා බාලිකා විදුහල, මහනුවර	හොඳම කෙටිකතා 5 අතර
02	රුබිගා අරුන්දවාම්	වෙම්බඩ් උසස් බාලිකා විදුහල, යාපනය	හොඳම කෙටිකතා 5 අතර
03	බී. එම්. චරනි සිපසන්දි	ජිනරාජා බාලිකා විදුහල, ගම්පොළ	හොඳම කෙටිකතා 5 අතර
04	ඇන්තනි රූපසිංහ	මාතලේ ජාත්‍යන්තර පාසැල	හොඳම කෙටිකතා 5 අතර
05	බිනාල් යෙසන්දු ඒකනායක	මාතලේ ජාත්‍යන්තර පාසැල	හොඳම කෙටිකතා 5 අතර
ඩිජිටල් මාධ්‍යයෙන් කතා කීම			
අංකය	**ශිෂ්‍යාගේ නම**	**මාතලේ ජාත්‍යන්තර පාසැල**	**ස්ථානය**
01	යානෙත් රණබාහු	තර්ස්ටන් විදුහල	1 වැනි
02	නෙතුනි හිමංගා ගමගේ	ශාන්ත ජෝශප් බාලිකා මහා විදුහල, ගම්පොළ	අගය කිරීම
03	තෙව්මාලි පියදාස	සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලය	පැසසුම

ගායනා තරඟය			
අංකය	**ශිෂ්‍යාගේ/ගුරුවරයාගේ නම**	**පාසැල**	**ස්ථානය**
01	එච්. ඒ. දීප් ඇන්චිතා ඒ. අබේසිරිවර්ධන මෙය (පද රචක)	රාජසිංහ මහා විද්‍යාලය, කොළඹ 09	1 වැනි
02	මන්සූර් ෆාතිමා හස්නා හරූන් ෆාතිමා හස්නා සම්සුදීන් අර්ෂාද් ෂෑම්ස් ආරිෆ් (පද රචක)	අක්කරෙයිපත්තු මුස්ලිම් මධ්‍ය මහා විද්‍යාලය, අක්කරෙයිපත්තු	2 වැනි
03	එම්. එම්. ඩී. ඊනා සාවන්ගි අයි. එම්. වෂිත හර්ෂණ ධම්මිකා චන්ද්‍රලතා මිය (පද රචක)	හරිස්චන්ද්‍ර විදුහල, මිගමුව	2 වැනි
04	පී. ඩී. දුලීමා ඉන්දීවරී එල්. ඩබ්. පී. තිසරි සඳසිලුනි එම්. එස්. කේ. මාරසිංහ මිය (පද රචක)	රාජකීය මධ්‍ය මහා විදුහල, පොළොන්නරුව	3 වැනි

විරිඳු තරඟය			
අංකය	**ශිෂ්‍යාගේ/ගුරුවරයාගේ නම**	**පාසැල**	**ස්ථානය**
01	අතීක් අහමඩ් ඒ. එල්. අන්සාර් මයා (පද රචක)	මක්කන් මාර්කාර් ජාතික පාසැල, එරාවූර්, මඩකලපුව	1 වැනි
02	හේෂාන් අතපත්තු හිරුෂාන් විජේසිංහ හේෂාන් අතපත්තු හිරුෂාන් විජේසිංහ (පද රචකයෝ)	තොරනකද ධර්මරාජ විද්‍යාලය, ඇහැළියගොඩ	2 වැනි
03	හෂිනි සංසලා දිනුක දිල්ෂාන් විදාන පතිරණ හෂිනි සංසලා (පද රචක)	අලපලදෙණිය ජාතික පාසැල	3 වැනි
04	දුලීමා ඉන්දීවරී තිෂානි සඳසිලුනි කේ. ඒ. තමරා ප්‍රියදර්ශනී මිය (පද රචක)	රාජකීය විදුහල, පොළොන්නරුව	3 වැනි

භූමිකා නිරූපණ තරඟය (Role Play Competition)

අංකය	**ශිෂ්‍යාගේ නම**	**පාසැල**	**ස්ථානය**
01	එම්. පී. ප්‍රහර්ෂන උඳුගොඩගගේ	රාජකීය මහා විදුහල, පොළොන්නරුව	1 වැනි
02	කේ. ඒ. නදින් තත්සර	තර්ස්ටන් විදුහල, කොළඹ 07	2 වැනි
03	වයි. ජී. බින්ද්‍යා ඉදුවරී විජේසිංහ	ශාන්ත ජෝශප් බාලිකා මහා විද්‍යාලය, ගම්පොල	3 වැනි

පෝස්ටර් තරඟය

අංකය	ශිෂ්‍යාගේ නම	පාසැල	ස්ථානය
13 වැනි ශ්‍රේණිය			
01	එම්. පී. ප්‍රහර්ෂන උඳුගොඩගගේ	රාජකීය මහා විදුහල, පොළොන්නරුව	1 වැනි
02	කේ. ඒ. නදින් තත්සර	තර්ස්ටන් විදුහල, කොළඹ 07	2 වැනි
03	වයි. ජී. බින්ද්‍යා ඉදුවරී විජේසිංහ	ශාන්ත ජෝශප් බාලිකා මහා විද්‍යාලය, ගම්පොල	3 වැනි
12 වැනි ශ්‍රේණිය			
01	ඒ. ජී. ඩබ්. යසාමි තේනුවර	රාජකීය මහා විදුහල, පොළොන්නරුව	1 වැනි
02	එස්. ජී. ඩබ් .ඩී. ඉඳුවර	රාජකීය මහා විදුහල, පොළොන්නරුව	2 වැනි
03	එම්. ෂීබා සිමිර්නා	ශාන්ත ආනා බාලිකා මහා විද්‍යාලය, කොළඹ 13	3 වැනි
11 වැනි ශ්‍රේණිය			
01	ඩී. ජී. උපේක්ෂා ඉන්දීවරී අබේසිංහ	රාජකීය මහා විදුහල, පොළොන්නරුව	1 වැනි
02	ජී. පී. ජී. එම්. කල්හාර	තොරනකද ධර්මරාජ විද්‍යාලය	2 වැනි
03	යූ. එස්. පූර්ණිමා	රාජකීය මහා විදුහල, පොළොන්නරුව	3 වැනි
04	යූ. ජී. චතුමිණී කෞෂල්‍යා	රාජකීය මහා විදුහල, පොළොන්නරුව	3 වැනි
10 වැනි ශ්‍රේණිය			
01	කේ. ඩී. එන්. සන්විදු	රාජකීය මහා විදුහල, පොළොන්නරුව	1 වැනි
02	ඒ. ජී. නෙත්මිණ තේජාන්	රාජකීය මහා විදුහල, පොළොන්නරුව	2 වැනි
03	ඩබ්. එච්. එම්. චමීෂා අවින්දි	මතුරට මහා විද්‍යාලය, හඟුරන්කෙත	3 වැනි
09 වැනි ශ්‍රේණිය			
01	හසිත් සස්මිත ද සිල්වා	තර්ස්ටන් විදුහල, කොළඹ 07	1 වැනි
02	ඩී. එම්. එම්. හෂාර දිසානායක	රාජකීය මහා විදුහල, පොළොන්නරුව	2 වැනි
03	ඩී. එම්. පී. වත්සල දිසානායක	රාජකීය මහා විදුහල, පොළොන්නරුව	3 වැනි
04	යූ. හරීෂ්	ශාන්ත ඇන්තනී පිරිමි මහා විද්‍යාලය, කොළඹ	3 වැනි
08 වැනි ශ්‍රේණිය			
01	බී. සවිෂ්කා	ශාන්ත ආනා බාලිකා මහා විද්‍යාලය	1 වැනි
02	ආර්. එම්. රායා රයිහාන්	මර්සි එඩියුකේෂන් ආයතනය	2 වැනි
03	එම්. ආර්. එෆ්. රිෆාත් රාෂා	ස්කූල් ඔෆ් එක්සෙලන්ස්	3 වැනි
07 වැනි ශ්‍රේණිය			
01	එම්. ජිනුලක්ෂයා	ශ්‍රී රාමක්‍රිෂ්ණා විදුහල, අක්කරෙයිපත්තු	1 වැනි
02	එස්. තාබූර්ෂාන්	ශ්‍රී රාමක්‍රිෂ්ණා විදුහල, අක්කරෙයිපත්තු	2 වැනි
03	කේ. ෂාර්මිදාන්	ශ්‍රී රාමක්‍රිෂ්ණා විදුහල, අක්කරෙයිපත්තු	3 වැනි
06 වැනි ශ්‍රේණිය			
01	ආර්. කිරුතිගන්	ශ්‍රී රාමක්‍රිෂ්ණා විදුහල, අක්කරෙයිපත්තු	1 වැනි
02	පී. කිරිත්තිකා	ශ්‍රී රාමක්‍රිෂ්ණා විදුහල, අක්කරෙයිපත්තු	2 වැනි
03	එස්. සුජාස්තිකන්	ශ්‍රී රාමක්‍රිෂ්ණා විදුහල, අක්කරෙයිපත්තු	3 වැනි

1.4 විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති පුහුණු වැඩසටහන සහ තරඟාවලිය 2023/24

පාසැල් ප්‍රජාව තුළ පර්යේෂණ සංස්කෘතියක් බිහිකිරීම සඳහා පාසැල් විද්‍යා පර්යේෂණ වැඩසටහන (SRP) 2018 වර්ෂයේ දී ආරම්භ කරන ලදී. පහත දක්වා ඇති පරිදි මෙම වැඩසටහන ප්‍රධාන අංග තුනකින් සමන්විත වේ:

1. විද්‍යා පර්යේෂණවල ප්‍රධාන සංකල්ප සහ පියවර සම්බන්ධයෙන් ගුරුවරුන් සඳහා පුහුණු වැඩසටහන
2. සිසුන්ට ඔවුන්ගේ අභිමතය පරිදි පර්යේෂණ ව්‍යාපෘතියක් දියත් කිරීම සඳහා පර්යේෂණ ව්‍යාපෘතිවල නියැලීමෙන් ලබන අත්දැකීම් ලබාදීම පිණිස වූ පුහුණු වැඩසටහන්
3. විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති තරඟාවලිය (SRPC)

තරඟාවලියේ පළමු අදියර සඳහා වූ සිසුන් 125 දෙනෙකු සහ ගුරුවරු 60 දෙනෙකුගේ සහභාගිත්වය සමඟ විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති තරඟාවලිය - 2022/2023, 2023 වර්ෂයේ මුල් භාගයේ දී සම්පූර්ණ කරන ලදී. 23/24 සඳහා වූ විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති තරඟාවලිය සඳහා සහභාගීවීමට ව්‍යාපෘති යෝජනා සමඟින් වූ අයදුම්පත් 2023 අගෝස්තු මාසයේ දී කැඳවන ලදී. එම ව්‍යාපෘති යෝජනා ඇගයීම අවසන් වී ඇති අතර, 2024 වර්ෂය අවසානයේ පවත්වන විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති තරඟාවලිය - 2023/2024 සඳහා සහභාගීවීමට ව්‍යාපෘති යෝජනා 75ක් තෝරාගන්නා ලදී.

1.5 විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු, කලා සහ ගණිත අධ්‍යාපන ප්‍රවේශය (STEAM approach) සමඟින් ජාතික විද්‍යා පදනමේ විශේෂ පාසැල් ව්‍යාපෘතිය

තෝරාගත් පාසැල් 50ක විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු, කලා සහ ගණිත අධ්‍යාපන ප්‍රවේශය හරහා විද්‍යා අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතියක් ජාතික විද්‍යා පදනම විසින් ආරම්භ කරන ලදී. අධ්‍යාපන අමාත්‍යාංශයේ විද්‍යා අංශය සහ කොමර්ෂල් බැංකුවේ ආයතනික සමාජ වගකීම් භාර අරමුදල සමඟ ඒකාබද්ධව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. පුහුණු කටයුතුවල එකිනෙකින් වෙනස් වූ අංග අටක් කෙරෙහි මෙම ව්‍යාපෘතියේ දී අවධානය යොමුකරන ලදී. පහත දැක්වෙන පාසැල් 05හි මෙහි නියමු ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී:

1. ඩඩ්ලි සේනානායක විද්‍යාලය, නාරාහේන්පිට, කොළඹ 05
2. අනුරුද්ධ බාලිකා විද්‍යාලය, දෙමටගොඩ, කොළඹ 09
3. රාජසිංහ මහා විද්‍යාලය, මාලිගාවත්ත, කොළඹ 09
4. ආවේ මරියා විද්‍යාලය, මට්ටක්කුලිය, කොළඹ 15
5. විජයබා මහා විද්‍යාලය, ස්ටේස් පාර, කොළඹ 14

මෙම ව්‍යාපෘතියෙහි ආරම්භක වැඩසටහන ජාතික විද්‍යා පදනමේ ශ්‍රවණාගාරයේ දී 2023 මැයි 16 වැනි දින පවත්වන ලදී. ජාතික විද්‍යා පදනමේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සේපාලිකා සුදසිංහ මහත්මිය විසින් පිළිගැනීමේ දේශනය පැවැත්වූ අතර, විද්‍යා සන්නිවේදන හා ව්‍යාප්ති අංශයේ අංශ ප්‍රධානී ආචාර්ය පී. ආර්. එම්. පී දිල්රුක්ෂි මහත්මිය විසින් මෙම ව්‍යාපෘතියේ පසුබිම සම්බන්ධයෙන් පැහැදිලි කරන ලදී. අධ්‍යාපන අමාත්‍යාංශයේ විද්‍යා අංශයේ අධ්‍යක්ෂ බන්දුල සරත් මහතා සහ කොමර්ෂල් බැංකු සමාගමේ තිරසර, කාන්තා බැංකු කටයුතු සහ ආයතනික සමාජ වගකීම් ඒකකයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරනී කමලිනී එල්ලාවල මහත්මිය විසින් මෙම ව්‍යාපෘතියෙහි වැදගත්කම සහ ඒ සම්බන්ධයෙන් ඔවුන්ගේ භූමිකාව අවධානයට ලක් කරන ලදී. විද්‍යාව ප්‍රචලිත කිරීම සඳහා වූ ජාතික විද්‍යා පදනමේ ක්‍රියාකාරී කමිටුවේ සභාපති, ආචාර්ය ජයන්ත වත්තේ විදානගේ, කොමර්ෂල් බැන්ක් පීඑල්සීහි ව්‍යාපෘති සම්බන්ධීකාරක මහේෂ් රත්නායක මහතා, අධ්‍යාපන අමාත්‍යාංශයේ විද්‍යා අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ විපුල කුලතුංග මහතා, කාර්මික තාක්ෂණ ආයතනයේ ඖෂධ හා ආහාර පැලෑටි පිළිබඳ තාක්ෂණ අංශයේ අධ්‍යක්ෂ, ආර්. එම්. ධර්මදාස මහතා, කළුතර උතුර, සුගත කණිෂ්ඨ විද්‍යාලයේ ඒ. කේ. ඒ. එන්. කොඩිතුවක්කු මහතා, සහ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ වෘත්තීය මාර්ගෝපදේශන සහ ප්‍රවර්ධන අංශයේ අධ්‍යක්ෂ ඊ. ඒ. ඩී. සේනාරත්න මහතා ඉන් අනතුරුව පැවති තාක්ෂණික සැසිය සඳහා සම්පත්දායකයින් වශයෙන් දායකවිය. තාක්ෂණික සැසිය අවසානයේ දී පාසැල් 05ක් නියෝජනය කරමින් ගුරුවරු සහ විදුහල්පතිවරු 30 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් විසින් 2023 වර්ෂයට අදාළව ඔවුන්ගේ ක්‍රියාකාරී සැලසුම් ඉදිරිපත් කරන ලදී.

1.6 විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු, කලා සහ ගණිත අධ්‍යාපන (STEAM) ක්ෂේත්‍රයේ අනාගත රැකියා වෙළඳපොළ සඳහා නිපුණතා සපිරි සිසුන් බිහි කිරීමේ වැඩසටහන

21 වැනි සියවසේ රැකියා වෙළඳපොළෙහි ඉල්ලුම සපුරාලීම සඳහා නිපුණතා සහ කුසලතාවයන් වැඩිදියුණු කිරීම සඳහා වන වැඩසටහන අධ්‍යාපන අමාත්‍යාංශයේ විද්‍යා අංශය සහ කොමර්ෂල් බැංකුවේ ආයතනික සමාජ වගකීම් භාර අරමුදල සමඟ එක්ව 2023 අගෝස්තු මස 16 වැනි දින නාරාහේන්පිට, ඩඩ්ලි සේනානායක විද්‍යාලයේ දී ආරම්භ

කරන ලදී. රජය, අධ්‍යාපන අමාත්‍යාංශය සහ අනෙකුත් ආයතන නියෝජන කරන නිලධාරීන් මේ සඳහා සහභාගී විය. කොමර්ෂල් බැංකුවේ සහයෝගීතාවයෙන් ඩඩ්ලි සේනානායක විද්‍යාලයෙහි සකස් කරන ලද විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු සහ ගණිත අධ්‍යාපනයට අදාළ පංති කාමරය (STEM classroom) සිසුන්ගේ භාවිතය සඳහා උත්සවාකාරයෙන් විවෘත කිරීම ද, මෙම අවස්ථාවට සමගාමීව සිදුවිය. ඩඩ්ලි සේනානායක විද්‍යාලය, නාරාහේන්පිට; අනුරුද්ධ බාලිකා විද්‍යාලය, දෙමටගොඩ; රාජසිංහ මහා විද්‍යාලය, මාලිගාවත්ත; විජයබා මහා විද්‍යාලය, කොළඹ 14; සහ ආවේ මරියා විද්‍යාලය, මට්ටක්කුලිය යන තෝරාගත් පාසැල් පහකින් 300කට අධික සිසුන් හා ගුරුවරු පිරිසක් මෙම වැඩසටහන සඳහා සහභාගී විය. සමාරම්භක උත්සවයෙන් අනතුරුව, වෘත්තීය පුහුණු අධිකාරිය, ලංකා-ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය, සහ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් සිසුන්ට සක්‍රිය ආකාරයෙන් ප්‍රායෝගික කාර්යයන්හි නියැලී අත්දැකීම් ලබාගත හැකි තාක්ෂණික සැසි පවත්වන ලදී. වෘත්තීය පුහුණු අධිකාරිය විසින් වයස අවුරුදු 15 සහ ඊට ඉහළ වයස්වල සිසුන් සඳහා "skill text"ද පවත්වන ලදී. මේ සඳහා සිසුන් 150ක් පමණ සහභාගී විය. කොමර්ෂල් බැංකුව සමඟ සහයෝගීතාවයෙන් ඩඩ්ලි සේනානායක විද්‍යාලයේ සිසුන් සඳහා "coding" සහ "mobile phone repairing" වශයෙන් වූ පුහුණු වැඩසටහන් දෙකක් ද පවත්වන ලදී. තව ද, සිසුන් අතර නාගරික කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම උදෙසා කාර්මික තාක්ෂණ ආයතනයේ පර්යේෂණ විද්‍යාඥ මහාචාර්ය ආර්. එම්. ධර්මදාස මහතා විසින් පස් රහිතව ශාක වගා කිරීමේ ක්‍රියාවලිය (hydroponic culture) සම්බන්ධිත සැසියක් පවත්වන ලද අතර මෙහිදී සගන්ධ තෙල් නිස්සාරණය කිරීම සහ ගෙවතු වගාව ආශ්‍රිතව ගැබ් වී ඇති විද්‍යාව සම්බන්ධයෙන් වූ දැනුම ද සිසුන් වෙත ලබාදෙන ලදී. මෙම ව්‍යාපෘතිය වසර තුනක් දක්වා පැවත්වෙනු ඇත.

විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු, කලා සහ ගණිත අධ්‍යාපනික ප්‍රවේශය (STEAM Educational Approach) පොදු අධ්‍යාපනය සඳහා හඳුන්වාදීමේ ජාතික වැඩසටහන

විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු, කලා සහ ගණිත අධ්‍යාපනය (STEAM Education) ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය සඳහා හඳුන්වාදීමේ ජාතික වැඩසටහන, ගරු අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය සුසිල් ප්‍රේමජයන්ත මහතාගේ ප්‍රධානත්වයෙන් 2023 මාර්තු මස 31 වැනි දිනැතිව කොළඹ 07, රාජකීය විදුහලේ නව රඟහල ශාලාවේ දී පැවත්විණි. අධ්‍යාපන අමාත්‍යාංශය, ජාතික විද්‍යා පදනම සහ ජාතික අධ්‍යාපන ආයතනය එක්ව මෙම වැඩසටහන සංවිධානය කරන ලදී. සිසුන්, ගුරුවරුන්, විදුහල්පතිවරුන්, විද්‍යාඥයන්, අධ්‍යාපනඥයන්, විදේශ නියෝජිතවරුන්, සහ අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල නිලධාරීන් වශයෙන් 1200ක පමණ පිරිසක් මෙම අවස්ථාව සඳහා සහභාගී විය.

ගරු අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය සුසිල් ප්‍රේමජයන්ත මහතා ප්‍රධාන ආරාධිතයා වශයෙන් මීට සහභාගී විය. පරිවර්තනයට බඳුන්වී ඇති ප්‍රවර්තන අධ්‍යාපනික ක්‍රියාවලිය ඔස්සේ මෙම විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු, කලා සහ ගණිත අධ්‍යාපන ක්‍රමය ශ්‍රී ලංකාවට හඳුන්වා දුන්බව ඔහුගේ දේශනයේ දී සඳහන් කරන ලදී. ආචාර්ය චන්ද්‍රා ඇඹුල්දෙනිය විසින් ආරම්භක කතාව සිදුකළ අතර, පාසැල් ප්‍රජාව තුළ මේ සම්බන්ධයෙන් වූ දැනුවත්බව ඉහළ නැංවීම සඳහා තෝරාගත් පාසැල් කිහිපයක සිසුන් විසින් "පාසැල් සඳහා විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු, කලා සහ ගණිත අධ්‍යාපනය" මැයෙන් වූ කෙටි නාට්‍යමය ඉදිරිපත් කිරීමක් සිදුකරන ලදී. අදාළ ආයතන නියෝජනය කරන විද්‍යාඥයන්, අධ්‍යාපනඥයන් සහ නිලධාරින්ගෙන් සමන්විත මඩුල්ලකගේ සහභාගිත්වයෙන් "සෑමතැනකම පවතින STEAM", "පාසැල් සඳහා STEAM" සහ "අනාගතය සඳහා STEAM" මැයෙන් වූ සාකච්ඡා තුනක් පැවැත්විණි. සිය පාසැල් අධ්‍යාපන සමයේ දී සිදුකළ පර්යේෂණ සඳහා සම්මාන කිහිපයක් ලබාගෙන ඇති ලෝචන ප්‍රනාන්දු මහතා, දැනට විදේශගත වී සිටින සුප්‍රසිද්ධ තරුණ ඉංජිනේරුවරුන් වන නිපුණී කරුණාරත්න මෙය සහ ග්‍රේෂාන් ප්‍රනාන්දු මහතා ද සහභාගිකයන් සමඟින් සිය අත්දැකීම් බෙදා ගනිමින් මෙම මඩුල්ලට සහභාගි විනි. සියලුම පළාත්වලින් පාසැල් කණ්ඩායම් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ මෙම වැඩසටහනට සහභාගී වන ලදී.















යටිතල පහසුකම් සංවර්ධනය සහ විද්‍යාව ප්‍රචලිත කිරීමේ වැඩසටහන් සඳහා සහාය ලබාදීම පිණිස ජාතික විද්‍යා පදනමේ ආධාර ප්‍රදාන යෝජනා ක්‍රමය

පාසැල්වල විද්‍යාගාර සහ විශේෂ විද්‍යා අධ්‍යාපන පහසුකම් සංවර්ධනය කිරීමට සහ විද්‍යාව ප්‍රචලිත කිරීමට අදාළව පාසැල් සහ විශ්වවිද්‍යාල විසින් පවත්වනු ලබන වැඩසටහන් සඳහා පහසුකම් සැලසීම සඳහා ජාතික විද්‍යා පදනම විසින් විද්‍යා අධ්‍යාපනය සහ ප්‍රචලිත කිරීමේ වැඩසටහනෙහි (SEPP) ආධාර ප්‍රදාන යෝජනා ක්‍රමය පවත්වාගෙන යනු ලැබේ.

2023 වර්ෂය තුළ දී මේ යටතේ සහාය ලබාදුන් පාසැල් සහ ක්ෂේත්‍ර අධ්‍යයන මධ්‍යස්ථාන වනුයේ:

1. දෙනියාය විද්‍යා ක්ෂේත්‍ර අධ්‍යයන මධ්‍යස්ථානය
2. කෑගල්ල, ශාන්ත මේරි විදුහලේ තාරකා විද්‍යා අධ්‍යයන මධ්‍යස්ථානය
3. ඩඞ්ලි සේනානායක විද්‍යාලය, කොළඹ 05

ප්‍රජාවේ විවිධ කොටස් කරා විද්‍යාව රැගෙන යෑම සඳහා විවිධ වැඩසටහන් හා ක්‍රියාකාරකම් ඔස්සේ විද්‍යාව ප්‍රචලිත කිරීම සිදුකරනු ලැබේ.

2.1 විදුරාව විද්‍යා සඟරාව

1978 වර්ෂයේ සිට විද්‍යාත්මක සඟරාවක් ලෙස ප්‍රකාශයට පත්කර පවත්වාගෙන එනු ලබන "විදුරාව" විද්‍යා සඟරාව යනු මෙම යුගයේ පැරණිතම සඟරාවලින් එකකි. ජාතික හෝ ගෝලීය වශයෙන් වැදගත්වන තෝරාගත් මාතෘකාවක් ඔස්සේ කාර්තුමය වශයෙන් වර්ෂයක් තුළ කලාප හතරක් භාෂා ත්‍රිත්වයෙන්ම (සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි) පළකරනු ලැබේ. ඒ අනුව, 2023 වර්ෂයේ දී පහත මාතෘකා යටතේ වූ කලාප ප්‍රකාශයට පත් කර තිබේ:

1. ගණිතමය නිරූපකරණය (Mathematical modelling)
2. සාම්ප්‍රදායික කෘෂි දැනුමෙහි විද්‍යාත්මක පසුබිම (Science behind traditional agriculture)
3. අවමකරණය (Minimalism)







2.2 සමාජයීය-ආර්ථිකමය වශයෙන් සවිබල ගැන්වූ ජාතියක් වශයෙන් නැඟී සිටීම සඳහා විද්‍යාත්මක සාක්ෂරතාවය ඉහළ නැංවීම පිණිස රට තුළ ප්‍රජා පාදක විද්‍යා සංගම් ජාලයක් ස්ථාපනය කිරීම

2.2.1 ගම සහ ජාතික විද්‍යා පදනම අතර සංවාදය

ප්‍රජාවන්ගේ සමාජයීය-ආර්ථිකමය යහ පැවැත්ම වැඩිදියුණු කිරීම සඳහා වැඩසටහන් පවත්වන අතරතුර ප්‍රජාව වෙත විද්‍යාව රැගෙන යෑම සඳහා සමාජයේ විවිධ ස්තර ඇතුළත්ව ප්‍රජා පාදක විද්‍යා සංගම් පිහිටුවීම ජාතික විද්‍යා පදනම

විසින් ආරම්භ කරන ලදී. ඒ අනුව, සර්වෝදය ශ්‍රමදාන ව්‍යාපාරය සමඟ එක්ව ජාතික විද්‍යා පදනම විසින් එහි පළමු ප්‍රජා පාදක විද්‍යා සංගමය කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුලියපිටියෙහි කනතෝලුව ග්‍රාමයේ ස්ථාපිත කරන ලදී.

කනතෝලුව ගමෙහි ප්‍රජාව සහ සර්වෝදය ශ්‍රමදාන ව්‍යාපාරයේ සභාපති වෛද්‍ය විනීතා ආරියරත්න සහ ඔහුගේ කණ්ඩායම සමඟ මූලික සාකච්ඡාවක් පවත්වන ලදී. කනතෝලුව ග්‍රාමයේ වාසය කරන පවුල් 105ක සහභාගිත්වයෙන් 2023 මැයි මස 25 වැනි දිනැතිව එම රැස්වීම පවත්වන ලදී.




2.2.2 ජාතික විද්‍යා පදනමේ පළමු ප්‍රජා පාදක විද්‍යා සංගමය ස්ථාපනය කිරීම (CSS)

පළමු ප්‍රජා පාදක විද්‍යා සංගමය 2023 ජූලි මස 26 දිනැතිව කනතෝලුව ග්‍රාමයේ ස්ථාපනය කරන ලදී. අ) ප්‍රජාවේ අධ්‍යාපන සහ විද්‍යා සාක්ෂරතාවය ආ) සමාජයීය-ආර්ථිකමය තත්ත්වය සහ ඇ) ගමෙහි යටිතල පහසුකම් සංවර්ධනය වැඩිදියුණු කිරීම ඉලක්ක කරගෙන ප්‍රජා වැඩසටහන් ආරම්භ කරන ලදී. ඒ අනුව, සනීපාරක්ෂක තත්ත්වයන්, පිරිසිදු පානීය ජලය සහ විදුලි සැපයුම ආශ්‍රිතව පවතින ගැටලු සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී. තව ද, පාසැල් යන වයසේ පසුවන ළමුන් විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු, කලා සහ ගණිත අධ්‍යාපනය මත පදනම් ක්‍රියාකාරකම්වල ද තරුණ පිරිස් යම් ආර්ථික කටයුතුවල ද නියුක්ත කරවන ලදී. මෙම වැඩසටහන වසර 3ක් පුරා ක්‍රියාත්මක වනු ඇත.






මාධ්‍ය සහ ඉසව් කළමනාකරණ අංශය (MEMD)

1.0 විෂය නිශ්‍රීත විද්‍යා තොරතුරු වාර්තාකරණ වැඩසටහන

බොහෝ මාධ්‍ය ආයතන විසින් විෂය නිශ්‍රීත විද්‍යා තොරතුරු වාර්තාකරණය නොසලකා හැර ඇති බවත් ඔවුන්ගේ මුද්‍රිත සහ ඉලෙක්ට්‍රොනික් මාධ්‍ය නාළිකා ඔස්සේ විද්‍යා ප්‍රවෘත්ති පළකිරීම සඳහා අඩු අවකාශයක් සැලසීම සහ අඩු උනන්දුවක් දැක්වීමත් නිරීක්ෂණය වී තිබේ.

විෂය නිශ්‍රීත විද්‍යා තොරතුරු වාර්තාකරණය යනු ප්‍රවෘත්ති වෘත්තාන්තයක්, විශේෂාංග වාර්තාවක්, වාර්තාමය චිත්‍රපටියක් හෝ ගුවන්විදුලි වැඩසටහනක් ආකාරයෙන් විද්‍යාත්මක සොයාගැනීම්වලට/නවෝත්පාදනවලට/හෝ වෙනත් ඕනෑම විද්‍යාත්මක වශයෙන් අලුතින් මතුවන තත්ත්වයකට අදාළ සත්‍ය කරුණු සහ විශ්වාසනීය තොරතුරු වාර්තා කිරීමයි. විද්‍යා තොරතුරු වාර්තාකරණය මගින් පොදු ජනතාවගේ විද්‍යා සාක්ෂරතාවය ඉහළ යන අතර, ඒ තුළින් විද්‍යාව පිළිබඳව ජනතාවගේ අවබෝධය ඉහළ ගොස් සිය දෛනික කටයුතුවල දී මැනවින් සලකා බලා එළඹෙන තීරණ ගැනීමට අවස්ථාව සැලසේ.

එබැවින් පහත දැක්වෙන අරමුණු සමඟින් විද්‍යා තොරතුරු පිළිබඳ සාවද්‍ය වාර්තාකරණය අවම කිරීමේ අභිප්‍රායෙන් ජාතික විද්‍යා පදනම විසින් වැඩසටහනක් ආරම්භ කිරීම සඳහා මූලාරම්භයක් ගෙන තිබේ.

- පොදු ජනතාව, ප්‍රතිපත්ති සම්පාදකයන් සහ අනෙකුත් රජයේ නිලධාරීන් වෙත විද්‍යාව රැගෙන යෑම සඳහා විද්‍යා ජනමාධ්‍යවේදීන් පුහුණු කිරීම සහ හැකියාවන් ගොඩනැංවීම.
- විෂය නිශ්‍රීත විද්‍යා තොරතුරු වාර්තාකරණය සඳහා ජනමාධ්‍යවේදීන්ගේ නිපුණතා සහ ආකල්ප හා මාධ්‍ය ආයතනවල කළමනාකරණය ශක්තිමත් කිරීම.
- විද්‍යාත්මක වශයෙන් අලුතින් මතුවන තත්ත්වයන් පිළිබඳ විශ්වාසනීය කරුණු සහ තොරතුරු ලැබීම සහතික කිරීම.

මෙම වැඩසටහන ප්‍රධාන කාණ්ඩ දෙකකින් සමන්විත වේ; එනම්, "විද්‍යා දැනුම් පදනම" - "Science Knowledge Base"(එනම් පාර්ශවකරුවන් වන විද්‍යා කටයුතුවල නිරත ආයතනවල "සම්බන්ධ වියහැකි ස්ථාන"- මාධ්‍ය විසින් ඔවුන් සමඟ සෘජුවම සම්බන්ධ වන අතර විද්‍යාත්මක ගැටලු ආශ්‍රිත ප්‍රවෘත්ති පිළිබඳ වැඩිදුර විශ්ලේෂණය සඳහා වන"ස්වාධීන විද්‍යා කණ්ඩායම්" මීට ඇතුළත් ය) සහ "මාධ්‍ය පදනම" - "Media Base" (විද්‍යා තොරතුරු වාර්තාකරුවන්ගෙන් සමන්විත වේ).

මාධ්‍ය සහ ඉසව් කළමනාකරණ අංශය විසින් 2023 වර්ෂය තුළ පාර්ශවකරුවන් වන විද්‍යා කටයුතුවල නිරත ආයතන, විද්‍යාඥයන් සහ පාර්ශවකරුවන් වන විද්‍යා කටයුතුවල නිරත ආයතනවලින් විශ්‍රාම ලැබූ විෂය කරුණු විශේෂඥයන් අතුරින් "සම්බන්ධ වියහැකි ස්ථාන" හඳුනාගෙන තිබේ. මෙම වැඩසටහනේ අරමුණු, යාන්ත්‍රණය සහ ඉදිරි කටයුතු පිළිබඳව ඔවුන් දැනුවත් කිරීම සඳහා වූ එක් "දිශානුගත කිරීමේ සැසියක්" 2023 දෙසැම්බර් මාසයේ දී පවත්වන ලදී. "ස්වාධීන විද්‍යා කණ්ඩායම්" සඳහා වන මීළඟ "දිශානුගත කිරීමේ සැසිය" 2024 වර්ෂයේ මුල් භාගයේ දී සංවිධානය කරනු ලැබේ.

2.0 2023 මාර්තු 31 වැනි දිනැතිව ජාතික විද්‍යා පදනම සහ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පැවැත්වූ —STEAM අධ්‍යාපන ක්‍රමවේදය ඇරඹුම" සංවිධානය කිරීම සඳහා දායකත්වය

ජාතික විද්‍යා පදනම විසින් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ජාතික අධ්‍යාපන ආයතනය සමඟ සහයෝගීතාවයෙන් STEAM අධ්‍යාපන ක්‍රමවේදය ඇරඹුම ගරු අධ්‍යාපන අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් 2023 මාර්තු මස 31 වැනි දින කොළඹ 07, රාජකීය විදුහලේ නව රඟහලේ දී සංවිධානය කරන ලදී.

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ "සුභාරතී වැඩසටහන" ඔස්සේ "ශ්‍රී ලංකාවේ පොදු අධ්‍යාපනය සඳහා STEAM ප්‍රවේශය හඳුන්වාදීම" මැයෙන් වූ වැඩසටහනක් 2023 මාර්තු 29 වැනි බදාදා දින (පෙ.ව. 7.00 සිට 8.00 දක්වා) නොමිලේ විකාශනය කිරීමේ කටයුතු මාධ්‍ය සහ ඉසව් කළමනාකරණ අංශය විසින් සංවිධානය කරන ලදී. ජාතික විද්‍යා පදනමේ අධ්‍යක්ෂ ජනරාල් නියෝජනය කරමින් මාධ්‍ය පිළිබඳ ක්‍රියාකාරී කමිටුවේ සභාපති ආචාර්ය ජයන්ත වත්තවිදානගේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන හා තාක්ෂණ අධ්‍යක්ෂ සහ ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න මෙම වැඩසටහන සඳහා සම්පත්දාරී කණ්ඩායම වශයෙන් සහභාගී විය.

මීට අමතරව, මාධ්‍ය සහ ඉසව් කළමනාකරණ අංශය විසින් ජාතික විද්‍යා පදනමේ දත්ත සමුදායන් පිළිබඳ ඉදිරිපත් කිරීමක් ද ඇතුළුව ජාතික විද්‍යා පදනමේ ක්‍රියාකාරකම් ප්‍රදර්ශනය කරන කුටියක් විදුහල් පරිශ්‍රය තුළ සංවිධානය කරන ලදී.

3.0 STEAM අධ්‍යාපනය සම්බන්ධයෙන් පෙළඹවීමක් ඇති කිරීමේ චාරිකාව (ISEE) (පාසැල් විෂය මාලාවෙන් ඔබ්බට ගිය වැඩසටහන - 2023 ඔක්තෝබර් 12-14 වැනි දින දක්වා)

ගරු අධ්‍යාපන අමාත්‍යවරයාගේ සංකල්පයක් මත පදනම්ව –STEAM අධ්‍යාපනය සම්බන්ධයෙන් පෙළඹවීමක් ඇති කිරීමේ චාරිකාව (ISEE): පාසැල් විෂය මාලාවෙන් ඔබ්බට" මැයෙන් වූ ප්‍රවර්ධන වැඩසටහනක් 2023 ඔක්තෝබර් 12-14 වැනි දින දක්වා ජාතික විද්‍යා පදනම, අධ්‍යාපන අමාත්‍යාංශය, ජාතික අධ්‍යාපන ආයතනය සහ මහරගම ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය ඒකාබද්ධව සාර්ථකව සංවිධානය කරන ලදී. විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු, කලා සහ ගණිත (STEAM) අධ්‍යාපනයට අදාළ විෂයයන් ඇතුළත් විෂය ධාරා හැදෑරීමට සිසුන් දිරිමත් කිරීම හා ඒ පිළිබඳ උනන්දුවක් ඇති කිරීමට සහ එම විෂය ධාරාවන්ට අදාළව ඉහළ මට්ටමකින් පවතින රැකියා වෙළඳපොළ පිළිබඳව සිසුන් අතර දැනුවත්බාවයක් ඇතිකිරීමේ අරමුණු ඇතිව මෙම වැඩසටහන සංවිධානය කරන ලදී.

ගරු අධ්‍යාපන අමාත්‍යවරයාගේ මඟපෙන්වීම යටතේ වැඩසටහන සංවිධානය කිරීමට සහ අනුග්‍රාහකයන් හරහා ඊට අවශ්‍ය අරමුදල් සපයා ගැනීම සඳහා ජාතික විද්‍යා පදනම විසින් ප්‍රමුඛතම කාර්යභාරයක් ඉටු කරන ලදී. මෙම සමස්ත වැඩසටහනෙහි සැලසුම සකස් කරන ලද්දේ ජාතික විද්‍යා පදනම (මාධ්‍ය සහ ඉසව් කළමනාකරණ අංශය) විසිනි. සෑම දිස්ත්‍රික්කයක්ම නියෝජනය වන පරිදි තෝරාගත් පාසැල්වලට මෙම වැඩසටහන සඳහා ආරාධනා කරන ලදී. (සෑම පාසැලකින්ම සිසුන් 20 දෙනෙකු සහ ගුරුවරු 01 අයෙකු බැගිනි). සමස්ත සිසුන් හා ගුරුවරු පිරිස කණ්ඩායම් දෙකකට බෙදා වෙන් කරන ලදී; එනම් A කණ්ඩායම (පාසැල් 13) සහ B කණ්ඩායම (පාසැල් 12) වශයෙනි. පාසැල් 25ක් නියෝජනය වන පරිද්දෙන් 12 වැනි ශ්‍රේණියේ ඉගෙනුම ලබන පාසැල් ළමුන් හාරසිය අනූපස් දෙනෙකු (495) සහ ගුරුවරු පනස් දෙදෙනෙකු (52) (සෑම දිස්ත්‍රික්කයකින්ම එක් පාසැල බැගිනි) මෙම වැඩසටහන සඳහා සහභාගී වෙන ලදී.

මෙම වැඩසටහනේ සමාරම්භක උත්සවය ගරු අධ්‍යාපන අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් මහරගම ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ ශ්‍රවණාගාරයේ දී පැවැත්විණි. නවීනතම කාලීන විද්‍යාත්මක දැනුම පදනම් කරගෙන කටයුතු කරන ආයතන පහක්; එනම් ජාතික නැනෝ තාක්ෂණ ආයතනය (SLINTEC)" ශ්‍රී ලංකා ජෛව තාක්ෂණ ආයතනය (SLIBTEC)" NSBM හරිත සරසවිය, කොළඹ වරාය නගරය සහ කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය මේ සඳහා සහභාගි විය. සෑම ආයතනයක්ම ඔවුන් විසින්ම සකස් කරන ලද කෙටි වැඩසටහනක් ඉදිරිපත් කරන ලද අතර ඒවා මනා තොරතුරු රැගත් සිසුන් ඒ කෙරෙහි උනන්දුවක් ඇතිකරන ස්වභාවයේ වැඩසටහන් විය. එබැවින් සිසුන්ට STEAM යෙදුම් පිළිබඳ නවතම අත්දැකීමක් ලබාගැනීමට අවස්ථාව උදා විය. කොළඹ විශ්වවිද්‍යාලයේ භෞතික විද්‍යා අධ්‍යයනාංශය විසින් ළමුන් සඳහා රාත්‍රී අහස නිරීක්ෂණය කිරීමේ වැඩසටහනක් ජාතික අධ්‍යාපන ආයතනයේ ක්‍රීඩා පිටියේ දී සූදානම් කරන ලදී. මෙහි අවසන් උත්සවය ඔක්තෝබර් 14 වැනි දින සවස් භාගයේ දී කොළඹ වෛද්‍ය පීඨයේ නව ගොඩනැගිල්ලේ පිහිටි ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදී.

අරමුදල්, ද්‍රව්‍ය ලබාදීම හෝ ඇතැම් අවස්ථාවල ප්‍රවාහන පහසුකම් පවා ලබාදීම සිදුකරමින් සාර්ථක හා ඵලදායී වැඩසටහනක් පැවැත්වීම උදෙසා පුද්ගලික සහ රාජ්‍ය ආයතන 13ක් පමණ මේ සඳහා සිය උපරිම සහයෝගය ලබාදෙන ලදී.

4.0 කියවීමේ අවකාශය ඇති කිරීම සඳහා ශූන්‍ය අයවැය පාදක ව්‍යාපෘතිය

ජාතික විද්‍යා පදනමේ පවතින එහි ප්‍රකාශන 14ක අතිරික්ත තොග අදාළ අවසන් පරිශීලකයන් සඳහා බෙදා හැරීම පිණිස වූ ශූන්‍ය අයවැය පාදක ව්‍යාපෘතියක් සඳහා පහත අරමුණු පෙරදැරිව ජාතික විද්‍යා පදනමේ කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබාදී ඇත.

- මහජනතාවට සිය කාලය වඩාත් ඵලදායී අයුරින් උපයෝගී කරගැනීමට අවස්ථාවන් නිර්මාණය කිරීම සඳහා
- මුද්‍රිත මාධ්‍ය හරහා විද්‍යාව ප්‍රචලිත කිරීම සඳහා දායකත්වය ලබාදීම සඳහා
- ජාතික විද්‍යා පදනමේ ප්‍රකාශනවල අතිරික්ත තොග නිදහස් කිරීම සඳහා

කුඩා අත්පත්‍රිකා දෙකක් නිර්මාණය කළ අතර, එය පෞද්ගලික අංශයේ රෝහල් (රෝහල් 15), සහ විශ්වවිද්‍යාලවල විද්‍යා පීඨ (පීඨ 51) වෙත යොමු කරන ලදී. විද්‍යා සහ තාක්ෂණ ආයතන, විශ්වවිද්‍යාල (විද්‍යා පීඨ), පුද්ගලික අංශයේ රෝහල්, පාසැල් ළමුන් සහ පොදු ජනතාව අතර එම ප්‍රකාශනවල පිටපත් 1,461ක් (2,599ක් වූ සමස්ත පිටපත් සංඛ්‍යාවෙන්) බෙදා හරින ලදී. 2023 වර්ෂය සඳහා ඉලක්කය වූයේ පිටපත් 1,500ක් බෙදා හැරීම යි (ඉලක්කයෙන් 97%ක් සපුරා තිබේ).

5.0 පර්යේෂණ පිළිබඳ තොරතුරු සාමාන්‍ය පොදු ජනතාව වෙත ලබාදීම සම්බන්ධයෙන් වූ ලිපි (Lay Articles) සකස් කිරීම පිළිබඳ වැඩමුළුව

ජාතික විද්‍යා පදනම විසින් අරමුදල් සපයනු ලබන පර්යේෂණ ව්‍යාපෘතිවලට අදාළව අවසාන වාර්තා රාශියක් ලැබෙන අතර, විද්‍යාත්මක කටයුතුවල නිරත ප්‍රජාවන් විසින් පිළියෙල කරන එම පර්යේෂණ වාර්තාවල අන්තර්ගත ප්‍රතිඵල විද්‍යා විෂයානුරූප භාෂාවෙන් ඉදිරිපත් කර ඇති හෙයින් සාමාන්‍ය පොදු ජනතාවට ඒවා තේරුම් ගැනීම අපහසු ය. සිය පර්යේෂණ ප්‍රතිඵල පිළිබඳව පුවත්පත් සඳහා ලිපි සකස් කිරීමට සහ පොදු ජනතාව සමඟ ගුවන්විදුලිය සහ/හෝ රූපවාහිනිය හරහා සම්බන්ධ වීමට පර්යේෂකයන්/විද්‍යාඥයන් වෙත කාලය සහ ඒ වෙනුවෙන් උනන්දුවක් නොපැවතීම යන වාතාවරණය තුළ ජාතික විද්‍යා පදනමේ විද්‍යාත්මක නිලධාරී තනතුරුවල කාර්ය මණ්ඩලය විසින් හෝ මෙම පර්යේෂණ පිළිබඳ තොරතුරු සාමාන්‍ය පොදු ජනතාව වෙත ලබාදීම සම්බන්ධයෙන් වූ ලිපි (Lay Articles) සකස් කිරීම වැදගත් වේ. මෙම කාර්යය මගින් සිදුවනුයේ සාමාන්‍ය පොදු ජනතාව වෙත පහසුවෙන් අවබෝධ කරගත හැකි ආකාරයෙන් වූ ලිපි බවට විද්‍යාත්මක ලිපි සකස්කිරීම යි.

ජාතික විද්‍යා පදනම, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ සහ පුහුණු කිරීමේ ආයතනය, කාර්මික තාක්ෂණ ආයතනය යන ආයතනවල විද්‍යාත්මක නිලධාරී කාර්ය මණ්ඩලය සඳහා මාධ්‍ය සහ ඉසව් කළමනාකරණ අංශය විසින් 2023 නොවැම්බර් 2 සහ 21 යන දිනවලදී දෙදින වැඩමුළුවක් ජාතික විද්‍යා පදනමෙහි දී සංවිධානය කරන ලදී. ආචාර්ය ජයන්ත වත්තවිදාන සහ තුසිත මලලසේකර යන මහතුන් සම්පත්දායකයන් ලෙස දායකත්වය ලබාදෙමින් එම ලිපි සකස් කිරීම පිළිබඳ වූ සිය දැනුම සහභාගිකයන් වෙත ලබාදෙන ලදී. තමන් වෙත ලබාදුන් ආදර්ශ "සංක්ෂේපය" (Abstract) මත පදනම්ව, සහභාගිකයන් විසින් සාමාන්‍ය පොදු ජනතාව වෙත අවබෝධකර ගත හැකි ආකාරයෙන් වූ ලිපියක් සකස් කර වැඩමුළුවේ දෙවැනි දින සඳහා ඉදිරිපත් කරන ලදී.

6.0 පාසැල් ළමුන් ඇතුළුව පොදු ජනතාව අතර ජාතික විද්‍යා පදනමේ ක්‍රියාකාරකම් සහ සරල විද්‍යාත්මක කරුණු ("Science ABC") සම්බන්ධයෙන් පවතින දැනුවත්බව

ජාතික විද්‍යා පදනමේ ක්‍රියාකාරකම් සඳහා ප්‍රචාරණයක් ලබාදීමට සහ සරල විද්‍යාත්මක කරුණු ("Science ABC") අලළා මාධ්‍ය සහ ඉසව් කළමනාකරණ අංශය විසින් පිළියෙල කළ පණිවිඩ සහ ජාතික විද්‍යා පදනම විසින් නිෂ්පාදනය කළ "මිහිමඬල" වීඩියෝ වැඩසටහන් ඔස්සේ ජනතාව අතර විද්‍යාව ජනප්‍රිය කරවීම සඳහා මාධ්‍ය සහ ඉසව් කළමනාකරණ අංශය විසින් පහත ප්‍රදර්ශනවලදී ජාතික විද්‍යා පදනමේ කුටි සංවිධානය කරන ලදී.

වගුව 10: ප්‍රදර්ශනවලදී සංවිධානය කරන ලද ජාතික විද්‍යා පදනමේ කුටි

අනු අංකය	ප්‍රදර්ශනය	දිනයන්	ස්ථානය	සහභාගිකයන් සංඛ්‍යාව
01	විද්‍යා ප්‍රදර්ශනය	2023 ජූනි 27 සහ 28	ශාන්ත ජෝන් විදුහල, නුගේගොඩ	ආරාධිත පාසැල්වලින් පාසැල් සිසුන් සහ ගුරුවරු 350
02	ජාතික විද්‍යා ප්‍රදර්ශනය	2023 නොවැම්බර් 08-10	ජාතික කෞතුකාගාරය	පාසැල් සිසුන් සහ ගුරුවරු 600
03	"මහපොළ" අධ්‍යාපනික සහ වෙළඳ ප්‍රදර්ශනය	2023 දෙසැම්බර් 13-17	ජාඇල	පොදු මහජනතාව 1,000
04	"සතුටු පවුල" අධ්‍යාපනික සහ වෙළඳ ප්‍රදර්ශනය	2023 දෙසැම්බර් 25-31	කිරිඳිවැල මහා විද්‍යාලය	පොදු මහජනතාව 2,000

සරල විද්‍යාත්මක කරුණු පිළිබඳ පණිවිඩවලට අදාළ මාතෘකා වනුයේ:

- දේදුන්න නිර්මාණය වන්නේ කෙසේ ද?
- කාලගුණය සහ දේශගුණය අතර වෙනස.
- අහස නිල් පැහැති ඇයි?
- හිරු එළියට නිරාවරණය වන පරිදි නවත්වා ඇති වාහනයක ඇතුළත රස්නය සඳහා හේතු.
- අහස්යානයක් පොළොවේ සිට ගුවන්ගතවීමේ යාන්ත්‍රණය.

ප්‍රාග්ධන වත්කම් අත්පත් කරගැනීම, නඩත්තු කිරීම සහ පද්ධති පරිපාලනය

මානව සම්පත් සංවර්ධනය

සහජ දක්ෂතා/කුසලතා කළමනාකරණය යනු අඛණ්ඩ ක්‍රියාවලියක් වන අතර ඉහළ ගුණාත්මක හැකියාවෙන් හෙබි සේවකයන් ආකර්ෂණය කරගැනීම හා රඳවා ගැනීම, ඔවුන්ගේ නිපුණතා සංවර්ධනය, සහ ඔවුන්ගේ කාර්යසාධනය වැඩිදියුණු කරගැනීම සඳහා අඛණ්ඩව සිදුකරන අභිප්‍රේරණය මීට අවශ්‍ය වේ. සහජ දක්ෂතා/ කුසලතා කළමනාකරණයේ මූලික අරමුණ වනුයේ දිගු කාලීන වශයෙන් ආයතනය තුළ රැඳී සිටින අභිප්‍රේරිත ශ්‍රමබලකායක් නිර්මාණය කරගැනීම වේ. මානව සම්පත හා බැඳි බොහෝ වගකීම් එසේ සිදුවිය යුතු ආකාරයෙන්ම සහජ දක්ෂතා/කුසලතා කළමනාකරණය තුළ ඇතුළත් ය. මීට අදාළව, පහත ක්‍රියාකාරකම් ඔස්සේ සේවකයන් වෙතින් ප්‍රශස්තම ප්‍රතිඵල ලබාගැනීම සඳහා ජාතික විද්‍යා පදනම සතුව සහජ දක්ෂතා/ කුසලතා කළමනාකරණ ක්‍රමෝපායක් ස්ථාපිත කර ඇත: සේවකයන් පුහුණු කිරීමේ මෙවලම් භාවිතය (ආයතනය තුළ පවත්වන පුහුණු/ අනෙකුත් ආයතන විසින් පවත්වනු ලබන දැනුම හුවමාරු කරගැනීමේ ක්‍රියාකාරකම් සඳහා සහභාගීවීම ආදිය), කුසලතා සමාලෝචනය කිරීමේ කටයුතු ප්‍රමිතිගත කිරීම හා අලුතින් බඳවා ගන්නා සේවකයන් ආයතනික පරිසරය සඳහා අනුගත කරවීමේ ක්‍රියාවලීන්, කාර්යසාධනය නිරීක්ෂීම සහ තක්සේරු කිරීම (එනම් කාර්යසාධන ඇගයුම්), ප්‍රතිපෝෂණයන් හා සමාලෝචන ලබාදීම, ඉහළ මට්ටමේ කුසලතා දක්වන පිරිස් හඳුනාගැනීම සහ ඇගයීමට ලක්කිරීම, සේවක අභිප්‍රේරණය ඉහළ නැංවීම, වෘත්තීය සංවර්ධන මාර්ගයන් ලබාදීම. ඉහත ක්‍රියාකාරකම් සපුරා ගැනීම සඳහා 2023 වර්ෂය තුළ පවත්වන ලද පුහුණු වැඩසටහන් විස්තරාත්මක වශයෙන් *ඇමුණුම 07* හි දක්වා තිබේ.

තොරතුරු සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් පවත්වා ගැනීම

ආයතනික තොරතුරු සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් පවත්වා ගැනීමට සහ ජාතික විද්‍යා පදනමේ කාර්ය මණ්ඩලය වෙත පරිශීලක තොරතුරු තාක්ෂණ සහාය ලබාදීම සඳහා තොරතුරු තාක්ෂණ ඒකකය වගකියනු ලැබේ.

මුද්‍රණ කටයුතු සඳහා සහාය

පවතින සම්පත් සමඟින් විද්‍යා කටයුතු හා සම්බන්ධිත අංශවල මුද්‍රණ අවශ්‍යතා සපුරාලීම සඳහා වන මුද්‍රණ කාර්යයන්හි මුද්‍රණ අංශය අඛණ්ඩව නිරතවී සිටී. ඒ අනුව, මුද්‍රිත නව විද්‍යාත්මක තොරතුරු වෙත පාර්ශවකරුවන් ආකර්ෂණය කරගැනීම සඳහා පහත දැක්වෙන ගුණාත්මක නිමැවුම් සකස් කිරීම සම්පූර්ණ කර තිබේ. සමාලෝචිත කාලසීමාව තුළ දී විවිධ ආකාරවල ප්‍රකාශන නවයක (09) මුද්‍රණ කටයුතු සිදුකර තිබේ. ඒ සම්බන්ධිත විස්තර *වගුව 11* හි දැක්වේ.

වගුව 11: මුද්‍රණය කරන ලද විවිධ ප්‍රකාශන

	ප්‍රකාශනය	ප්‍රමාණය
විදුරාව		
1.	විදුරාව ජන-මාර්තු 2020 (සිංහල) නැවත මුද්‍රණය	**1200**
2.	විදුරාව ජන-මාර්තු 2020 (සිංහල) නැවත මුද්‍රණය	**300**
3.	විදුරාව ජන-මාර්තු 2020 (දෙමළ)	**600**
4.	විදුරාව අප්‍රේල්-ජූනි 2021 (සිංහල)	**2000**
5.	විදුරාව ජූලි-සැප්තැම්බර් 2021 (සිංහල)	**2000**
6.	විදුරාව ජූලි-සැප්තැම්බර් 2022 (සිංහල)	**2000**
අත්පොත්		
7.	සංඛ්‍යාලේඛන අත්පොත 2020	**250**
අනෙකුත්		
8.	වාර්ෂික වාර්තාව 2022	**02**
9.	ජාතික විද්‍යා පදනමේ ලිපි ශීර්ෂ	**1550**

මීට අමතරව, වෙනත් මුද්‍රණ කටයුතු විසිනවයක් (29) සහ පොත් බැඳීම් කටයුතු දාහතක් (17) සමගින් මුද්‍රණ ඒකකය විසින් 2023 වර්ෂය තුළ ජාතික විද්‍යා පදනමේ අනෙකුත් මුද්‍රණ අවශ්‍යතාවයන් ද ඉටුකර තිබේ. එසේම, ඒකකයේ දැනට පවත්නා භෞතික සහ මානව සම්පත් ඵලදායි අයුරින් උපයෝගී කරගැනීමටත් මෙම සම්පත්වලින් ආයතනය වෙත ආදායම් උත්පාදනය කළහැකි අනෙකුත් ක්‍රම සහ විධි අනාවරණය කරගැනීම සඳහාත් ප්‍රයත්නයන් සිදුකර තිබේ. මේ සම්බන්ධයෙන් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ අදහස් හා යෝජනා ලබාගැනීමේ අරමුණින් ඔවුන් සමඟ අදහස් හුවමාරු කරගැනීම් කිහිපයක් සිදුකර තිබේ.

විගණන කමිටු වාර්තාව

රජය සතු ව්‍යවසායන් සඳහා වන ආයතනික පාලනය සඳහා වන මාර්ගෝපදේශවලින් ලබා දී ඇති නියෝග ප්‍රකාරව නව කළමනාකරණ මණ්ඩලයක් පත්කළ බැවින්, ජාතික විද්‍යා පදනමේ කළමනාකරණ මණ්ඩලය විසින් 2023 පෙබරවාරි 21 වැනි දිනැතිව පැවති රැස්වීමේ දී භාණ්ඩාගාර නියෝජිතවරයා ද ඇතුළුව කළමනාකරණ මණ්ඩලයේ විධායක නොවන නව සාමාජිකයන් තිදෙනෙකු විගණන හා කළමනාකරණ කමිටුවේ කටයුතු කිරීම සඳහා පත් කරන ලදී. 2023 මාර්තු මස 01 වැනි දින සිට බලාත්මක වන පරිදි, ඒ. වයි. හර්ෂණී අනුරුද්ධා මිය වෙනුවට එම්. කේ. එස්. ජයසේන මෙය නම් කරන ලදී. ජාතික විගණන කාර්යාලයේ නියෝජිතවරයෙකු සහ අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක මෙම කමිටුවේ නිරීක්ෂකවරු ලෙස කටයුතු කිරීම සඳහා ආරාධනා කරනු ලබනු ලැබේ.

නව කළමනාකරණ මණ්ඩලයක් පත්කළ බැවින්, එම මණ්ඩලය විසින් විගණන හා කළමනාකරණ කමිටුවේ නව සාමාජිකයන් වශයෙන් මහාචාර්ය සම්පත් පුංචිහේවා සහ ඩෙන්සිල් ඉන්ද්‍රජිත් පෙරේරා මයා පත්කරන ලදී.

ඒ අනුව, පහත දැක්වෙන සාමාජිකයන් වර්ෂය තුළ දී කමිටුවේ සාමාජිකයන් වශයෙන් කටයුතු කරන ලදී.

- එම්. කේ. එස්. ජයසේන මෙය (ජාතික විද්‍යා පදනමේ කළමනාකරණ මණ්ඩලයේ සභාපති සහ භාණ්ඩාගාර නියෝජිත)
- මහාචාර්ය සම්පත් පුංචිහේවා (ජාතික විද්‍යා පදනමේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජික)
- ඩෙන්සිල් ඉන්ද්‍රජිත් පෙරේරා මයා (ජාතික විද්‍යා පදනමේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජික)
- එච්. ඩී. අනුරුද්ධිකා මෙය (ප්‍රධාන අභ්‍යන්තර විගණක, අධ්‍යාපන අමාත්‍යාංශයේ නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන පර්යේෂණ හා නවෝත්පාදන අංශය)
- පී. ඒ. ඩී. ආර්. කේ. වික්‍රමතිලක මෙය (ජාතික විගණන කාර්යාලයේ නියෝජිත)

විගණන හා කළමනාකරණ කමිටුව විසින් එහි පළමු රැස්වීම 2023 මාර්තු 17 වැනි දිනැතිව පවත්වන ලද අතර, ඉන් අනතුරුව 2023 අගෝස්තු 11 වැනි දිනැතිව හා දෙසැම්බර් 27 වැනි දිනැතිව ද කමිටුව රැස්වන ලදී. ජාතික විද්‍යා පදනමේ කළමනාකරණ මණ්ඩලය සඳහා භාණ්ඩාගාර නියෝජිත වශයෙන් පත්කර ඇති එම්. කේ. එස්. ජයසේන මෙය විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම්වල සභාපති වශයෙන් කටයුතු කරන ලදී. රැස්වීම්වලින් අනතුරුව වහාම, රැස්වීම් සටහන් සමග කමිටුවේ නිර්දේශ කළමනාකරණ මණ්ඩලය වෙත වාර්තා කරන අතර, බාධාවලින් තොරව නිසි පරිදි ආයතනික කටයුතු සිදුකිරීමට අවශ්‍ය නිසි පියවර ගනු පිණිස විගණන හා කළමනාකරණ කමිටුවේ නිර්දේශ ජාතික විද්‍යා පදනමේ අභ්‍යන්තර විගණක විසින් ආයතනයේ අංශ ප්‍රධානීන් වෙත යොමුකරනු ලැබේ. ගනු ලබන පියවරවල ප්‍රගතිය සම්බන්ධ වාර්තා ද ඊළඟ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම සඳහා වාර්තා කරනු ලැබේ.

විගණන හා කළමනාකරණ කමිටුව විසින් එහි නිර්දේශ වශයෙන් පහත කරුණු සඳහා විශේෂ අවධානය යොමු කරන ලදී.

- අදාළ කටයුතු සම්පූර්ණයෙන් නිමාවන තෙක් සහ කාර්යයන් ද්විකරණයවීම වැළැක්වීම සඳහා ජාතික විගණන කාර්යාලයේ විගණන විමසුම් සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු කිරීම.
- වර්ෂය මුළුල්ලේම ජාතික විගණන කාර්යාලයේ සංස්ථාපිත අවශ්‍යතා පිළිබඳ පසු විපරම් කටයුතු කිරීම.
- ජාතික විද්‍යා පදනමේ කටයුතු සමාලෝචනය කිරීම සහ නිරවද්‍ය කිරීමේ හා වැළැක්වීමේ පියවර සම්බන්ධයෙන් නිර්දේශ ලබාදීම.
- අභ්‍යන්තර විගණන නිරීක්ෂණ සහ බාහිර විගණන වාර්තා, කළමනාකරණ ලිපි සමාලෝචනය කිරීම සහ ඒවා සම්බන්ධයෙන් නිර්දේශ ලබාදීම සහ පිළියම් වශයෙන් ගතයුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් කළමනාකරණ මණ්ඩලයට සහාය වීම.
- වාර්ෂික විගණන සැලැස්ම අනුමත කිරීම සහ අභ්‍යන්තර විගණන කටයුතු සම්බන්ධයෙන් සමාලෝචනය හා නියෝග ලබාදීම.

ඉදිරි සැලසුම් වාර්තාව

වැඩසටහන	ක්‍රියාමාර්ග	
	කෙටි කාලීන	මධ්‍ය කාලීන
1. ජාතික ප්‍රමුඛතා සඳහා විසඳුම් ඉදිරිපත් කරමින් පර්යේෂණවලට අරමුදල් සම්පාදනය කිරීම, ප්‍රදානයන් පරිපාලනය හා කළමනාකරණය, සහ විද්‍යා හා තාක්ෂණ ධාරිතා සංවර්ධනය සඳහා ප්‍රමුඛතම ආයතනය බවට පත්වීම.	පහළ මට්ටමේ සිට ඉහළට කේන්ද්‍රීය පර්යේෂණ අදහස් දිරිමත් කිරීමට සහ මනා පර්යේෂණ පරිසරයක් පවත්වා ගැනීම පිණිස ජාතික පර්යේෂණ අවශ්‍යතා සමඟ අනුකූල පර්යේෂණ, සංවර්ධන සහ නවෝත්පාදන මූලාරම්භයන් මෙහෙයවීම, ප්‍රවර්ධනය සහ සහාය ලබාදීම. පර්යේෂණ, සංවර්ධන සහ නවෝත්පාදන කාර්යන්ගේ ඵලදායි නියැලීම දිරිමත් කිරීමට සහ පොළඹවාලීම සඳහා පර්යේෂණ විශිෂ්ටතා සහ පර්යේෂකයන්ගේ සහ අධීක්ෂකවරුන්ගේ කුසලතා හඳුනාගැනීම.	• ජාතික වශයෙන් ඉහළ ප්‍රමුඛතාවයක් පවතින ගැටලු, සංකීර්ණ අභියෝග සඳහා විසඳුම් ලබාදීමට සහ ස්වාභාවික සම්පත් සඳහා අගය එකතු කිරීම, උපයෝගීතාවය සහ සංරක්ෂණය පිණිස අන්තර්-විෂයයික/ බහු-විෂයයික ප්‍රවේශයක් සහිත කාර්යය අභිමුඛ සහයෝගිතා පර්යේෂණ ව්‍යාපෘති ආරම්භ කිරීම, පහසුකම් සැලසීම සහ සහාය ලබාදීම. • රාජ්‍ය-පුද්ගලික හවුල්කාරිත්වයන් ඔස්සේ දේශීය කර්මාන්තවල පර්යේෂණ හා සංවර්ධන කටයුතු, දේශීය කර්මාන්ත ශක්තිමත් කරන පර්යේෂණ හා සංවර්ධන කටයුතු ප්‍රවර්ධනය කිරීම සහ සහාය ලබාදීම. • ඉහළ මට්ටමේ පර්යේෂණ නිපුණතාවයන්ගේ අවශ්‍ය කරන අවම මට්ටම ගොඩනැංවීම සඳහා පර්යේෂණ හා සංවර්ධන ධාරිතාවයන්ගේ ප්‍රගතිශීලී වැඩිදියුණු කිරීමට පහසුකම් සැලසීම.
2. තාක්ෂණ වැඩිදියුණු කිරීම්, තාක්ෂණ හුවමාරු, පර්යේෂණ හා සංවර්ධන කටයුතුවල වාණිජකරණය, බුද්ධිමය දේපළ ආරක්ෂා කිරීම හා වාණිජ උපයෝජනය සඳහා පහසුකම් සැලසීමේදී පුරෝගාමිත්වය.	තිරසර සංවර්ධනය උදෙසා ආයතනගත යාන්ත්‍රණ ඔස්සේ විභව්‍ය තාක්ෂණයන්, අංකුර ව්‍යවසායන්, බලපත්‍රකරණය සහ තාක්ෂණ හුවමාරු කිරීම් වැඩිදියුණු කිරීම සඳහා පහසුකම් සැලසීම. ශ්‍රී ලංකාව තුළ විද්‍යා, තාක්ෂණ සහ නවෝත්පාදන උපයෝගිතාවය ඔස්සේ ආර්ථික හා සමාජයීය සංවර්ධනය උදෙසා සුවිශේෂී දායකත්වයක් දැක්වූ විද්‍යාඥයන්,ඉංජිනේරුවන්, තාක්ෂඥයන් සහ ව්‍යවසායකයන් පිළිගැනීමට ලක්කිරීම.	• බුද්ධිමය දේපළ ආරක්ෂාව හා කළමනාකරණය සහ වාණිජකරණ උපයෝජනයන් සඳහා වන සහාය සේවා ශක්තිමත් කිරීම.
3. නවීන තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ වේදිකා භාවිතා කරමින් විද්‍යා, තාක්ෂණ සහ නවෝත්පාදන තොරතුරු රැස් කිරීමේ, විශ්ලේෂණය කිරීමේ, විවරණය කිරීමේ සහ ව්‍යාප්ත කිරීමේ විශිෂ්ටතම මධ්‍යස්ථානය බවට පත්වීම.	විශ්වවිද්‍යාල හා පර්යේෂණ සහ සංවර්ධන ආයතනවලට නවීනතම දැනුම වෙත ප්‍රවේශය සලස්වමින් ඩිජිටල් පුස්තකාල කොන්සෝටියම ස්ථාපනය කිරීම. පුළුල් පරිමාණයකින් සහ විෂය පථයකින් යුතුව විද්‍යා, තාක්ෂණ සහ නවෝත්පාදන තොරතුරු හා නිර්දේශ සකස් කිරීම සහ ප්‍රකාශයට පත්කිරීම. ජාතික ප්‍රමුඛතාවයකින් යුතු සමාජ-ආර්ථික ගැටලුවක් විසඳීම සඳහා සාක්ෂි පදනම් කරගත් ප්‍රතිපත්තිමය නිර්දේශ ලබාදීම.	• දේශීය හා අන්තර්ජාතික මුද්‍රිත කරුණු සහ ආශ්‍රිත සේවා මාර්ගගත ආකාරයෙන් ව්‍යාප්ත කිරීමේ කේන්ද්‍රීය මධ්‍යස්ථානය ලෙස ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානය (NSLRC) ශක්තිමත් කිරීම. • ජාතික විද්‍යා පදනමේ සඟරාව සහ සමාජ විද්‍යාව පිළිබඳ ශ්‍රී ලංකා සඟරාව අබණ්ඩව ප්‍රකාශයට පත්කිරීම හා සුචිගත දර්ශකයේ 1.2 ක අගයකින් යුතු බලපෑම් සාධක මට්ටමක් සහ සමාජ විද්‍යාව පිළිබඳ ශ්‍රී ලංකා සඟරාව දර්ශකගත සඟරාවක් ලෙස සුචිගත කිරීම සපුරා ගැනීම.

4. විද්‍යා සාක්ෂරතාවය වැඩිදියුණු කිරීම සහ විද්‍යා අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සඳහා පාසැල් ප්‍රජාව සහ පොදු මහජනතාව අතර විද්‍යා, තාක්ෂණ සහ නවෝත්පාදන කටයුතු ප්‍රචලිත කිරීමේ ප්‍රමුඛයා වශයෙන් කටයුතු කිරීම.	බහුවිධ යාන්ත්‍රණ භාවිතා කරමින් "සැමට විද්‍යාව" ප්‍රයත්නයන් ක්‍රියාත්මක කිරීම අඛණ්ඩව සිදුකිරීම. විද්‍යාව, තාක්ෂණ, ඉංජිනේරු, කලා සහ ගණිතය (STEAM) අධ්‍යාපන ප්‍රවේශය සමඟින් විද්‍යා අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමේ සහ ශක්තිමත් කිරීමේ කටයුතු අඛණ්ඩව සිදුකිරීම.	• ප්‍රජා විද්‍යා සාක්ෂරතාවය ඉහළ නැංවීම සහ STEAM අධ්‍යාපනික ප්‍රවේශයේ ඉදිරි පරම්පරාවේ නායකයන් බිහිකිරීමේ කටයුතු.
5. විද්‍යා, තාක්ෂණ සහ නවෝත්පාදන සංවර්ධන කටයුතුවලට අදාළ ගෝලීය සබඳතා ප්‍රවර්ධනය කිරීමේ සහ විදේශීය ප්‍රදානයන් යොදා ගැනීම සම්බන්ධයෙන් ප්‍රධාන පිවිසුම වශයෙන් කටයුතු කිරීම.	ධාරිතා සංවර්ධන සහ නවීනතම සහයෝගිතා පර්යේෂණ සඳහා ලැබී ඇති විදේශීය ප්‍රදානයන් ඉහළ නැංවීම. ජාතික විද්‍යා පදනම මගින් පහසුකම් සලසන ලද සහයෝගිතාවයන් හරහා ශ්‍රී ලංකාවේ සිටින ගෝලීය වශයෙන් විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන කටයුතුවල නිරත තැනැත්තන් සංඛ්‍යාව ඉහළ නැංවීම.	• විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන කටයුතුවල ප්‍රගතිශීලී, ප්‍රතිඵලදායක සාර්ථක ගෝලීය සබඳතා ඉහළ නැංවීම.
6. විද්‍යාව මත පදනම් වූ, ජනතා කේන්ද්‍රීය ඉගෙනුම් ආයතනයක් ලෙස පැවතිය යුතු තත්ත්වයන් සපුරාලීමට දක්ෂ හා තෘප්තිමත් කාර්ය මණ්ඩලයකින් යුත් නිර්මාණශීලී කණ්ඩායමක් තැනීම.	බාහිර පාර්ශවවල උපදේශාත්මක සහයෝගයෙන් යුතුව කාර්යයන් ඉටු කිරීම සඳහා විද්‍යාත්මක කටයුතුවල නිරත කාර්ය මණ්ඩලයේ තාක්ෂණික හැකියාවන් වැඩිදියුණු කිරීම. සෑම අවස්ථාවකදීම අවශ්‍යතා මත පදනම් කාර්ය මණ්ඩල සංවර්ධනයක් හරහා දක්ෂ, නිපුණතා සපිරි හා වගකීමැති, සවිබල, අභිප්‍රේරිත සහ තෘප්තිමත්බවින් යුතු කාර්ය මණ්ඩලයක් තැනීම.	• සමාජීය අන්‍යෝන්‍ය ක්‍රියාකාරකම් ඔස්සේ කාර්ය මණ්ඩලයේ සියලු දෙනා සම්බන්ධිත සමාජ ප්‍රාග්ධනය වැඩිදියුණු කිරීම, හෘදයාංගමබව සහ බැඳීම් ප්‍රවර්ධනය කිරීම. • සෑම අවස්ථාවකදීම කාර්ය මණ්ඩල තනතුරුවලින් 98% ක් සම්පූර්ණ කර පවත්වා ගැනීම සඳහා සුදුසුකම් සපුරා ඇති පිරිස් ආකර්ෂණය කරගැනීම සහ රඳවා ගැනීම.

මූල්‍ය සමාලෝචනය

පසුගිය වසර 10ට අදාළව මූල්‍ය කටයුතුවල සුවිශේෂී කරුණු (2013-2022)

ජාතික විද්‍යා පදනම විසින් මූල්‍ය කාර්යසාධනයට අදාළ සියලු වාර්තා පවත්වා ගෙන යන අතර එකී වාර්තා නිරන්තරයෙන් සමාලෝචනයට බඳුන් කරනු ලැබේ (මූල්‍ය අංශය සහ අභ්‍යන්තර සහ බාහිර විගණකවරු විසිනි). එළැඹෙන වසරේදී ආයෝජනය සඳහා ප්‍රමුඛතාවය දිය යුතු ක්ෂේත්‍රයන් ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය වාර්තා සේම මීට පෙර වර්ෂයේ මූල්‍ය වාර්තා ඇසුරින් තීරණය කරනු ලැබේ. විද්‍යා තාක්ෂණ සහ නවෝත්පාදන ක්ෂේත්‍රවල වඩාත්ම යෝග්‍ය සහ ජාතික වශයෙන් වැදගත්කමකින් යුතු අංශ සඳහා අරමුදල් සැපයෙන බවට එමගින් සහතිකවීමක් ලැබේ.

පසුගිය වසර 10ට අදාළව මූල්‍ය කටයුතුවල සුවිශේෂී කරුණු *වගුව 12* හි දැක්වේ.

වගුව 12: පසුගිය වසර 10ට අදාළව මූල්‍ය කටයුතුවල සුවිශේෂී කරුණු (2013-2022)

වර්ෂය	මූල්‍ය විස්තර (රු. මිලියනවලින්)		
	ප්‍රතිපාදනය	ලැබූ අරමුදල	වැය කළ මුදල
2013	250.00	135.00	140.00
2014	260.00	223.00	211.00
2015	290.00	235.00	246.00
2016	250.00	232.00	237.00
2017	260.00	243.00	259.97
2018	300.00	283.00	308.00
2019	342.32	307.19	277.51
2020	59.00	59.00	82.07
2021	67.89	61.67	67.85
2022	50.00	16.00	43.90

වෙන්කළ ප්‍රතිපාදනය සහ ලැබූ අරමුදල් අතර ප්‍රතිශතය සහ ලැබූ අරමුදල් හා වැය කළ මුදල අතර ප්‍රතිශතය අනුව පසුගිය වසර 10 ක මූල්‍ය තත්ත්වය රූපසටහන *71* මගින් දැක්වේ.



රූප සටහන 71: පසුගිය වසර 10ක මූල්‍ය තත්ත්වය (ප්‍රතිශතාත්මක වශයෙන්)

2023 වර්ෂයේ කාර්යසාධනය පිළිබඳව ගණන්දීමේ නිලධාරියාගේ නිරීක්ෂණය

ජාතික විද්‍යා පදනම යනු රජයේ අරමුදල් මත පමණක් රඳා පවතින, අරමුදල් ප්‍රදානය කරන ආයතනයකි. ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් "පුනරාවර්තන" සහ "ප්‍රාග්ධන" වියදම් යටතේ 2023 වර්ෂයේ දී ජාතික විද්‍යා පදනම වෙත නිර්දේශ කරන ලද අරමුදල් ප්‍රමාණය පිළිවෙලින් රුපියල් මිලියන 162.23 ක් සහ රුපියල් මිලියන 70 ක් විය.

භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් "පුනරාවර්තන" වියදම් සඳහා රුපියල් මිලියන 142.7ක් සහ "ප්‍රාග්ධන" වියදම් සඳහා රුපියල් මිලියන 14ක් වාරික වශයෙන් නිදහස් කළ අතර වර්ෂය තුළ සම්පූර්ණ කරන ලද ප්‍රදානවල ඉතිරිව ඇති ශේෂයන් ලෙස ජාතික විද්‍යා පදනම සතුව රුපියල් මිලියන 15.22 ක් ඇත. මෙම වියදම් පිළිබඳ විස්තර *වගුව 13* හි දැක්වේ.

වගුව 13 : 2023 වර්ෂයේ පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම්

විස්තරය	රු.'000	
	ඇස්තමේන්තුව	වියදම
පුනරාවර්තන වියදම්		
පුද්ගල පඩිනඩි	120,868	115,678
අනෙකුත් පුනරාවර්තන වියදම්	41,360	31,573
මුළු පුනරාවර්තන වියදම්	**162,228**	**147,251**
ප්‍රාග්ධන වියදම්	**70,000**	**25,432**

2023 වර්ෂයේ ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර *වගුව 14* හි දැක්වේ.

වගුව 14 : 2023 වර්ෂයේ ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර

පැවරී ඇති බලය	විස්තරය	වියදම- 2023 (රු.'000)
පැවරී ඇති බලය - 01	**පර්යේෂණ සහ සංවර්ධන කටයුතු ප්‍රවර්ධනය කිරීම**	10,738
පැවරී ඇති බලය - 02	**විද්‍යා සහ තාක්ෂණ තොරතුරු ව්‍යාප්ත කිරීම**	4,236
පැවරී ඇති බලය - 03	**විද්‍යා සහ තාක්ෂණ ධාරිතා ගොඩනැංවීම**	2,751
පැවරී ඇති බලය - 04	**විද්‍යා සහ තාක්ෂණ ප්‍රතිපත්ති පර්යේෂණ**	1,429
පැවරී ඇති බලය - 05	**විද්‍යාව ප්‍රචලිත කිරීම**	5,439
පැවරී ඇති බලය - 06	**ප්‍රාග්ධන වත්කම් අත්පත් කරගැනීම, නඩත්තු කිරීම සහ පද්ධති පරිපාලනය**	839
	මුළු ප්‍රාග්ධන වියදම්	**25,432**

ජාතික විද්‍යා පදනම
2023 දෙසැම්බර් 31 වැනි දිනට
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

2022.12.31 දිනට		සටහන්	රු.	රු.
	වත්කම්			
	ජංගම වත්කම්			
9,982,539.00	මුදල් සහ මුදල් සමාන දෑ	**21**	10,239,927.06	
7,350,859.91	ලැබිය යුතු	**22**	3,922,317.14	
1,181,242.97	තොග	**23**	1,332,118.02	
2,049,185.57	පූර්ව ගෙවීම් - *(උපලේඛනය-09)*		1,939,319.63	
93,650.00	අනෙකුත් ජංගම වත්කම්	**24**	93,650.00	
20,657,477.45	මුළු ජංගම වත්කම්			17,527,331.85
	ජංගම නොවන වත්කම්			
9,914,532.00	ලැබිය යුතු	**22**	8,651,967.00	
1,252,333,560.21	දේපළ, පිරියත සහ උපකරණ	**25**	1,237,942,023.67	
4,203,449.88	අස්පෘශ්‍ය වත්කම්	**26**	3,073,873.07	
883,002,124.00	ආයෝජන	**27**	883,002,124.00	
2,149,453,666.09	මුළු ජංගම නොවන වත්කම්			2,132,669,987.74
2,170,111,143.54	**මුළු වත්කම්**			2,150,197,319.59
	වගකීම්			
	ජංගම වගකීම්			
7,760,037.00	උපචිත වියදම්	**28**	4,198,147.71	
2,951,949.60	ණය හිමියෝ	**29**	2,963,345.10	
10,711,986.60				7,161,492.81
	ජංගම නොවන වගකීම්			
43,532,122.50	විශ්‍රාමික පාරිතෝෂික සඳහා වෙන්කිරීම්	**30**	41,318,456.75	
49,679,397.69	විලම්භිත ආදායම්	**31**	43,742,434.34	
93,211,520.19				85,060,891.09
103,923,506.79	**මුළු වගකීම්**			92,222,383.90
2,066,187,636.75	**ශුද්ධ වත්කම්**			**2,057,974,935.69**
	හිමිකම් සහ සංචිත			
	සමුච්චිත අරමුදල			
(27,981,008.94)	රඳවාගත් ඉපැයීම්		(53,728,698.72)	
(38,548,294.33)	එකතු කළා: ආදායම ඉක්මවා ගිය වියදම්		(20,842,305.61)	
(66,529,303.27)	**මුළු සමුච්චිත අරමුදල්**			(74,571,004.33)
1,249,216,114.91	ප්‍රත්‍යාගණනිත සංචිතය			1,249,216,114.91
883,002,124.00	රජයේ ප්‍රදාන			883,002,124.00
498,701.11	ජාතික විද්‍යා පදනමේ අරමුදල	**32**		327,701.11
2,066,187,636.75	**මුළු හිමිකම්**			**2,057,974,935.69**

Head Administration & Finance (C)

NATIONAL SCIENCE FOUNDATION

Accountant
NATIONAL SCIENCE FOUNDATION
47/5, Maitland Place,
Colombo 7,
Sri Lanka.

The Accounting policies and Notes on pages 06 to 36 form an integral part of these Financial Statements. The Board of Directors is responsible for the preparation and presentation of these Financial Statements. These Financial Statements were approved by the Board of Directors and signed on their behalf,

Chairman

Director General

Board Member

Chairman
National Science Foundation
47/5, Maitland Place
Colombo 07
Sri Lanka

NATIONAL SCIENCE FOUNDATION

Director General
NATIONAL SCIENCE FOUNDATION
47/5, Maitland Place,
Colombo 07,
Sri Lanka.

M. K. Sithara Jayasena
Additional Director General
Department of Management Service
General Treasury
Colombo 01

ජාතික විද්‍යා පදනම
2023 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

2022.12.31 දිනට		රු.	රු.	රු.
	මහා භාණ්ඩාගාරයෙන් ලද ප්‍රදානයන්			
16,000,000.00	ප්‍රාග්ධන			14,000,000.00
141,060,000.00	පුනරාවර්තන			142,714,183.00
157,060,000.00				156,714,183.00
	වර්ෂය සඳහා ආදායම			
703,790.34	ලැබූ පොලිය	674,220.79		
45,320.25	විවිධ ආදායම්	672,315.00		
75,900.00	ප්‍රකාශන අලෙවිය - **(සටහන 19.1)**	18,827.50		
2,472.00	ඡායා පිටපත් කිරීමෙන් ලද ආදායම්	2,905.00		
710,812.18	ප්‍රකාශන ගාස්තු වශයෙන් ලද – ජාතික විද්‍යා පදනමේ සඟරාව	497,522.45		
373,900.00	ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානයේ ආදායම	545,000.00		
106,000.00	වැඩමුළුවලින් ලැබූ ආදායම	127,000.00		
159,080.00	ස්ථාවර වත්කම් බැහැර කිරීමෙන් ලද ආදායම	-	2,537,790.74	
2,177,274.77				
	අනෙකුත්			
7,956,449.55	විලම්බිත ආදායම (වත්කම්)	6,157,083.85		
2,662,611.00	විලම්බිත ආදායම (ප්‍රකාශන)	2,287,577.36		
586,359.00	ව්‍යාපෘතිවලින් ලද ආදායම	-	8,444,661.21	
11,205,419.55				
13,382,694.32				10,982,451.95
170,442,694.32				167,696,634.95
	අඩුකළා; වර්ෂය සඳහා වියදම්			
	පුනරාවර්තන වියදම්			
	කාර්යාලීය වියදම්			
649,500.00	කළමනාකරණ මණ්ඩල සාමාජිකයන් සඳහා ගමන් වියදම් සහ දීමනා	580,500.00		
86,236.85	රැස්වීම් සඳහා සංග්‍රහ කටයුතු	157,394.70	3,056,049.21	
3,550,673.84	අලෙවි පිරිවැය – ප්‍රකාශන **(සටහන 19.2)**	2,318,154.51		
4,286,410.69				
	කාර්ය මණ්ඩල පඩිනඩි			
77,085,102.47	වැටුප් සහ දීමනා	75,439,077.34		
11,081,558.67	සේවක අර්ථසාධක අරමුදල	10,747,206.08		
2,217,313.43	සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල	2,149,422.74		
19,635,419.93	අනෙකුත් දීමනා	19,992,578.77		
3,479,077.50	විශ්‍රාමික පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	3,367,046.75		
1,572,638.17	අතිකාල	1,704,094.83		
-	නිවාඩු දින සේවයට පැමිණීම වෙනුවෙන් ගෙවීම්	65,133.25	113,464,559.76	
-	නිල ඇඳුම්	-		
115,071,110.17				
	කාර්යාල පරිපාලනය			
799,568.13	ගමන් වියදම් – කාර්යාලය	108,751.59		
216,030.57	ලිපිද්‍රව්‍ය සහ පාරිභෝජන ද්‍රව්‍ය	948,261.16		
2,609,235.26	විදුලිය	5,113,172.18		
1,880,799.14	දුරකතන/ෆැක්ස්	567,750.72		
37,050.00	තැපැල් ගාස්තු	41,860.00		
375,000.00	විගණන ගාස්තු - විගණකාධිපති දෙපාර්තමේන්තුව	550,000.00		
61,825.00	බැංකු ගාස්තු	96,305.00		
183,545.74	වෛද්‍ය වියදම්	187,490.25		
-	ප්‍රචාරණ	-		
2,881,661.81	ඉන්ධන වියදම්	2,521,925.92		
2,273,166.11	මෝටර් වාහන නඩත්තුව	1,541,996.17		
2,852,233.03	කාර්යාල උපකරණ සහ ගෘහභාණ්ඩ නඩත්තුව	4,169,632.45		
682,513.51	ගොඩනැගිලි නඩත්තුව	717,665.76		

		Rs.	Rs.	Rs.
-	භූමි නඩත්තුව	-		
765,697.29	රක්ෂණය	777,094.00		
453,432.60	ජල පාරිභෝජන ගාස්තු	654,941.85		
1,759,115.00	ආරක්ෂක සේවා	2,017,386.00		
16,222,222.97	ක්ෂය කිරීම්	14,436,657.04		
1,318,376.58	අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය	1,304,576.81		
130,000.00	නීති ගාස්තු	12,500.00		
286,422.88	විවිධ වියදම්	354,048.75		
1,858,463.90	සනීපාරක්ෂක සේවා	1,917,458.25		
181,802.10	භාෂා පරිවර්තන ගාස්තු	7,092.75		
1,175.00	මුද්දර ගාස්තු	1,025.00		
-	කපා හැරි ණය ගැතියා	6,000.00		
-	නැවත ආපසු ගෙවන තැන්පතු අහිමිවීම	-		
1,728,475.68	මෘදුකාංග බලපත්‍ර අලුත්කිරීමේ ගාස්තු	1,268,041.11		
6,000.00	අඩමාණ ණය ගැතියන්ට ප්‍රතිපාදන වෙන් කිරීම්	-		
94,550.80	කපා හැරි සඟරා සහ ජර්නල් තොගය	3,578.82		
39,658,363.10			39,325,211.58	
	අනෙකුත්			
-	ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානය - **සටහන 19.3**	-		
566,078.58	මුද්‍රණ අංශය - **සටහන 19.4**	951,760.54		
5,509,134.08	අන්තර්ජාල සේවා සඳහා දායකත්ව මුදල්	6,308,675.40		
6,075,212.66			7,260,435.94	
	ප්‍රාග්ධන වියදම්			
24,309,046.55	ජාතික විද්‍යා පදනම සඳහා පැවරී ඇති බලය 01 - **සටහන 20.1**	10,738,386.13		
4,632,141.37	ජාතික විද්‍යා පදනම සඳහා පැවරී ඇති බලය 02 - **සටහන 20.2**	4,236,147.43		
6,176,717.09	ජාතික විද්‍යා පදනම සඳහා පැවරී ඇති බලය 03 - **සටහන 20.3**	2,750,598.82		
1,651,676.89	ජාතික විද්‍යා පදනම සඳහා පැවරී ඇති බලය 04 - **සටහන 20.4**	1,429,344.82		
4,119,231.77	ජාතික විද්‍යා පදනම සඳහා පැවරී ඇති බලය 05 - **සටහන 20.5**	5,439,075.37		
3,011,078.36	ජාතික විද්‍යා පදනම සඳහා පැවරී ඇති බලය 06 - **සටහන 20.6**	839,131.50		
43,899,892.03			25,432,684.07	
208,990,988.65				188,538,940.56
(38,548,294.33)	**වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය/(ඌනතාවය)**			**(20,842,305.61)**

ජාතික විද්‍යා පදනම
2023 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය
සඳහා ශුද්ධ වත්කම්/හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

සාරාංශය

	ප්‍රත්‍යාගණනිත සංචිත	අනෙකුත් සංචිත	අනෙකුත් අරමුදල්	රඳවාගත් ඉපැයුම	සමුච්චිතඅරමුදල	මුළු අරමුදල
2023.01.01 දිනට ශේෂය						
ගිණුම ප්‍රතිපත්තියේ වෙනස්වීම්	1,249,216,114.91	883,002,124.00	498,701.11	(66,529,303.27)	(66,030,602.16)	2,066,187,636.75
පූර්ව වර්ෂ ගැලපුම්	-	-	-	-	-	-
නැවත සඳහන් කළ ශේෂය	-	-		12,800,604.55	12,800,604.55	12,800,604.55
	1,249,216,114.91	883,002,124.00	498,701.11	(53,728,698.72)	(53,229,997.61)	2,078,988,241.30
2023 වර්ෂය සඳහා ශුද්ධ වත්කම්/හිමිකම්						
ප්‍රත්‍යාගණනිත අතිරික්තය						
ආයෝජන ගැලපුම	-	-	-	-	-	-
මහා භාණ්ඩාගාරයෙන් ලද ප්‍රදාන						
ප්‍රාග්ධන	-	-	-	-	-	-
පුනරාවර්තන						
අනෙකුත් මෙහෙයුම්	-	-	-	14,000,000.00	14,000,000.00	14,000,000.00
	-	-	-	142,714,183.00	142,714,183.00	142,714,183.00
වර්ෂය තුළ වියදම්						
ප්‍රාග්ධන						
පුනරාවර්තන	-	-	(171,000.00)	10,982,451.95	10,982,451.95	10,811,451.95
කාල සීමාව සඳහා හඳුනාගත් මුළු ආදායම සහ වියදම						
2023 දෙසැම්බර් 31 වැනි දිනට ශේෂය	-	-	-	(25,432,684.07)	(25,432,684.07)	(25,432,684.07)
	-	-	-	(163,106,256.49)	(163,106,256.49)	(163,106,256.49)
	-	-	(171,000.00)	(20,842,305.61)	(20,842,305.61)	(21,013,305.61)
	1,249,216,114.91	**883,002,124.00**	**327,701.11**	**(74,571,004.33)**	**(74,072,303.22)**	**2,057,974,935.69**

ජාතික විද්‍යා පදනම
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2023 රු.		2022 රු.	
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ				
වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය/(ඌනතාවය)	(20,842,305.61)		(38,548,294.33)	
එකතු කළා: ජාතික විද්‍යා පදනමේ අරමුදලේ පූර්ව වර්ෂ ගැලපුම්	12,800,604.55		11,037,305.65	
	(8,041,701.06)		**(27,510,988.68)**	
ගැලපුම් කළා				
ක්ෂය කිරීම්	14,436,657.04		16,222,222.97	
අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය	1,304,576.81		1,318,376.58	
වර්ෂය තුළ ගෙවන ලද පාරිතෝෂික	(5,580,712.50)		(1,336,550.00)	
ගෙවීම්	3,367,046.75		3,479,077.50	
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	-		(159,080.00)	
ස්ථාවර වත්කම් බැහැර කිරීමෙන් ලද ලාභය	6,000.00		-	
ණයකරුවන් කපා හැරීම	-		6,000.00	
අඩමාණ ණයකරුවන් සඳහා	(6,157,083.85)		(7,956,449.55)	
වෙන්කිරීම්				
විලම්බිත ආදායම				
කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය/(පාඩුව)	**(665,216.81)**		**(15,937,391.18)**	
වෙළඳ අනෙකුත් ලැබිය යුතු දෑ ශුද්ධ (වැඩිවීම්)/අඩුවීම්	4,794,973.71		(3,018,985.02)	
තොගවල ශුද්ධ (වැඩිවීම්)/අඩුවීම්	(150,875.05)		1,343,543.12	
වෙළඳ ගෙවිය යුතු දෑ ශුද්ධ වැඩිවීම්/(අඩුවීම්)	(3,550,493.79)		(1,039,259.93)	
මෙහෙයුම්වලින් ජනනය වූ මුදල්	1,093,604.87		(2,714,701.83)	
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ		**428,388.06**		**(18,652,093.01)**
ආයෝජන කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ				
ස්ථාවර වත්කම් බැහැරකිරීම්වලින් ලද ආදායම්	-		159,080.00	
වත්කම් මිලදී ගැනීම්	(220,120.50)		(2,250,692.80)	
ආයෝජන කටයුතුවලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ		**(220,120.50)**		**(2,091,612.80)**
මූල්‍ය කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ				
රජයෙන් ලද දායකත්වයන්	220,120.50		2,250,692.80	
ජාතික විද්‍යා පදනමේ සංරචකවලින් ලද දායකත්වයන්	(171,000.00)		-	
මූල්‍ය කටයුතුවලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ		**49,120.50**		**2,250,692.80**
මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම්/(අඩුවීම්)		257,388.06		(18,493,013.01)
කාල සීමාව ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දෑ		9,982,539.00		28,475,552.01
කාල සීමාව අවසානයේ දී මුදල් හා මුදල් සමාන දෑ		**10,239,927.06**		**9,982,539.00**
මුදල් හා මුදල් සමාන දෑ				
ලංකා බැංකුව - 0002323269		2,979,645.49		2,977,620.19
ලංකා බැංකුව - 0002323270		172,027.60		1,417,990.25
ලංකා බැංකුව - 0002322471		1,685,377.79		1,187,855.34
ලංකා බැංකුවේ ඉතිරුම් - 80771519		5,402,963.49		3,613,181.53
විශේෂ මුදල් අග්‍රිම		-		100,000.00
සුළු මුදල්		-		5,000.00
අතැති මුදල් හා චෙක්පත් තැන්පතු		(87.31)		680,891.69
		10,239,927.06		**9,982,539.00**

ජාතික විද්‍යා පදනම

2023 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

ගිණුම්කරණ ප්‍රතිපත්ති සඳහා සටහන්

1. පොදු

1.1 වාර්තාකරණ අස්තිත්වය

1994 අංක 11 දරන පනත යටතේ ජාතික විද්‍යා පදනම ස්ථාපනය කර ඇති අතර, ශ්‍රී ලංකාවේ, කොළඹ 7, මේට්ලන්ඩ් පෙදෙසේ අංක 47/5 දරන ස්ථානයේ පිහිටා තිබේ. ජාතික විද්‍යා පදනම ක්‍රියාත්මක වනුයේ අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ය.

1.2 වාර්තාකරණ කාල සීමාව

ජාතික විද්‍යා පදනමේ මූල්‍ය ගිණුම්කරණ කාලසීමාව වනුයේ 2023 ජනවාරි 01 සිට 2023 දෙසැම්බර් 31 දක්වා ය.

1.3 මූල්‍ය ප්‍රකාශ අනුමත කිරීම

2024 පෙබරවාරි 20 වැනි දින ප.ව. 4.00 ට ජාතික විද්‍යා පදනමේ කළමනාකරණ මණ්ඩල නිල කාමරයේ පැවති රැස්වීමේ දී 2023 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම සඳහා කළමනාකරණ මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇත.

1.4 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

ජාතික විද්‍යා පදනම විසින් දැනුම් ආර්ථිකයක් බිහි කිරීම උදෙසා පර්යේෂණ, සංවර්ධන සහ නවෝත්පාදන සඳහා පහසුකම් සලස්වනු ලැබේ. ජනතාවගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා විද්‍යා සහ තාක්ෂණ සියලු ක්ෂේත්‍රවල ධාරිතා සංවර්ධනය, යටිතල පහසුකම් සංවර්ධනය, තාක්ෂණ හුවමාරුව, දැනුම බිහිකිරීම සහ බෙදා හැරීම සඳහා ද ජාතික විද්‍යා පදනම විසින් පහසුකම් සලස්වනු ලැබේ.

ජාතික විද්‍යා පදනමේ කාර්යයන් වනුයේ;

- ✓ විශ්වවිද්‍යාල, විද්‍යා සහ තාක්ෂණ ආයතන සහ විද්‍යාඥයන් විසින් සිදු කරන මූලික සහ ව්‍යවහාරික විද්‍යාත්මක පර්යේෂණ ආරම්භ කිරීම, පහසු කිරීම සහ එහිලා සහායවීම.
- ✓ සමාජ විද්‍යාව පිළිබඳ පර්යේෂණ සහ විද්‍යා අධ්‍යාපන වැඩසටහන් ද ඇතුළුව, විද්‍යාත්මක පර්යේෂණ ශක්‍යතා ශක්තිමත් කිරීම.
- ✓ ශ්‍රී ලංකාවේ ස්වාභාවික සම්පත් සංවර්ධනය කිරීම.
- ✓ විද්‍යා සහ තාක්ෂණ කටයුතුවල නියැලෙන පර්යේෂකයන් පුහුණු කිරීම.
- ✓ ශ්‍රී ලංකාවේ සහ විදේශ රටවල විද්‍යාඥයන් අතර විද්‍යාත්මක තොරතුරු හුවමාරු කරගැනීම දිරිමත් කිරීම.
- ✓ විද්‍යා සහ තාක්ෂණ ආයතනවල කරනු ලබන විද්‍යාත්මක අධ්‍යයන හෝ විද්‍යාත්මක කටයුතු සම්බන්ධයෙන් ශිෂ්‍යත්ව සහ අධිශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම.
- ✓ පර්යේෂණ ප්‍රදාන හා තාක්ෂණ ප්‍රදාන පිරිනැමීම.
- ✓ විද්‍යාව ප්‍රචලිත කිරීම.

1.5 මූල්‍ය ප්‍රකාශ සඳහා වගකීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන අයුරින් මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

2. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

2.1 අනුකූලතා ප්‍රකාශය

ආයතනයේ මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLPSAS's) අනුකූලව පිළියෙල කර ඇති අතර ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත SLPSAS 01 - මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමට අනුව එම මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කර තිබේ. එසේ වුව ද, ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති නොමැති ගිණුම්කරණ ක්ෂේත්‍රවලදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ද උපයෝගී කර ගෙන තිබේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය, මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවලට ඇතුළත් වේ.

2.2 පිළියෙල කිරීමේ පදනම

උපචිත පදනම මත සහ ඓතිහාසික පිරිවැය සම්මතය යටතේ ජාතික විද්‍යා පදනමේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇති අතර එය සංගත ආකාරයෙන් යොදාගෙන තිබේ. සාධාරණ අගය මත මිනුම්කරණය කරන දේපළ, පිරියත හා උපකරණවල දී හැර මූල්‍ය ප්‍රකාශ සඳහා බලපාන උද්ධමන සාධක සඳහා ගැලපීම් සිදුකර නොමැත.

2.3 සංසන්දනාත්මක තොරතුරු

ආයතනය විසින් යොදා ගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති, අන්‍යාකාරයකින් සඳහන් කර නොමැති නම්, පෙර වර්ෂයේ භාවිතා කළ ප්‍රතිපත්ති සමඟ අනුකූල වේ. ප්‍රවර්තන වර්ෂයේ ඉදිරිපත් කිරීම්වලට අනුකූල වන පරිද්දෙන් අවශ්‍ය සෑම විටම පෙර වර්ෂයේ සංඛ්‍යාත්මක අගයන් සහ වාක්‍ය ඛණ්ඩ නැවත සකස් කර තිබේ.

2.4 ඉදිරිපත් කෙරෙන ව්‍යවහාරික මුදල් ඒකකය

ආයතනය ක්‍රියාත්මක වන මූලික ආර්ථික පරිසරයේ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් (LKR) වලින් ආයතනයේ මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කර ඇත.

2.5 අඛණ්ඩ පැවැත්ම

ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව කළමනාකාරිත්වය විසින් තක්සේරුවක් කර ඇති අතර එමගින් ආයතනයේ අපේක්ෂිත අනාගතය සඳහා කටයුතු කරගෙන යාමට එය සතුව සම්පත් පවතින බවට සෑහීමට පත්ව තිබේ. එමෙන් ම, අඛණ්ඩ පැවැත්ම පදනම් කරගෙන අඛණ්ඩව සූදානම්ව සිටීමට ආයතනයට ඇති හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයක් ඇතිකළ හැකි තත්වයන්ට අදාළ කිසිදු සැලකිය යුතු අවිනිශ්චිතතාවන් පිළිබඳව කළමනාකාරිත්වය දැනුවත්ව නොමැත. ඒ අනුව, ආයතනයේ මූල්‍ය ප්‍රකාශ අඛණ්ඩ පැවැත්ම පදනම යටතේ නොකඩවා පිළියෙල කරනු ලැබේ.

3. දේපළ, පිරියත සහ උපකරණ

ජාතික විද්‍යා පදනමේ දේපළ, පිරියත සහ උපකරණ යටතට ඉඩම, ගොඩනැගිලි, කාර්යාල උපකරණ සහ ගෘහභාණ්ඩ, පුස්තකාල පොත්, මෝටර් වාහන, උපාංග සහ විවිධ, ලේඛනගත කිරීමේ උපකරණ ඇතුළත් වේ.

3.1 හඳුනාගැනීමේ පදනම

අයිතමය හා බැඳි අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලා ඒමේ සම්භාවිතාවයක් පවතින්නේ නම් සහ අයිතමය සඳහා වන පිරිවැය විශ්වාසනීය අයුරින් මිනුම්කරණය කළ හැකි නම්, දේපළ, පිරියත හා උපකරණ හඳුනාගනු ලැබේ.

3.2 මුල් අවස්ථාවේ හඳුනාගැනීම

දේපළ, පිරියත සහ උපකරණ මුල් අවස්ථාවේ හඳුනාගනු ලබන්නේ මිලදී ගැනීමේ පිරිවැය සමඟ එහි අපේක්ෂිත භාවිතය සඳහා වත්කම් ක්‍රියාකාරී තත්ත්වයට ගෙනඒම සඳහා දැරිය යුතු ආනුෂංගික වියදම් ද ඇතුළු පිරිවැය මත ය. මුල් අවස්ථාවේ හඳුනාගැනීමෙන් අනතුරුව, දේපළ, පිරියත සහ උපකරණ සමුච්චිත ක්ෂය කිරීම් සහ සමුච්චිත හානිකරණ අලාභ අඩුකිරීමෙන් පසු පිරිවැයට මිනුම්කරණය කෙරේ.

3.3 හඳුනාගැනීම බැහැර කිරීම

දේපළ, පිරියත හා උපකරණ අයිතමයක් බැහැර කිරීමේ දී හෝ එහි භාවිතයෙන් හෝ බැහැර කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන්නේ නම් දේපළ, පිරියත හා උපකරණ අයිතමයක ධාරණ අගය හඳුනාගැනීම බැහැර කෙරේ. හඳුනාගැනීම බැහැර කිරීමේ ලාභ හෝ පාඩු ආදායම් ප්‍රකාශයේ හඳුනාගැනෙන අතර ලාභ ආදායමක් වශයෙන් වර්ගීකරණය නොවේ. ප්‍රත්‍යාගණනය කළ වත්කම් විකිණීමේ දී, ප්‍රත්‍යාගණනිත සංචිතයේ පවතින යම් සම්බන්ධිත වටිනාකමක් පවතී නම්, එය රඳවාගත් ඉපැයීම්වලට මාරු කෙරේ.

3.4 ප්‍රත්‍යාගණනය

වත්කමක් හඳුනාගැනීමෙන් අනතුරුව, සාධාරණ අගය විශ්වාසනීය ලෙස මැනිය හැකි දේපළ, පිරියත සහ උපකරණ කාණ්ඩ ඒවායේ පසුකාලීන සමුච්චිත ක්ෂය කිරීම් සහ පසුකාලීන සමුච්චිත හානිකරණ අලාභ ප්‍රත්‍යාගණනිත දිනයේ දී වත්කමේ සාධාරණ අගයෙන් අඩුකළ ප්‍රත්‍යාගණනිත වටිනාකමට ගිණුම්ගත කෙරේ. 2019 වර්ෂයේ දී රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ඉඩම, ගොඩනැගිල්ල (කන්ටේනර් කාර්යාලය ඇතුළුව) සහ මෝටර් වාහන ප්‍රත්‍යාගණනය කළ අතර, වත්කමෙහි වටිනාකම වැඩිවීම/අඩුවීම සිදුවී ඇති ප්‍රමාණය දක්වා වන ප්‍රත්‍යාගණනිත අතිරික්තය/ඌනතාවය ප්‍රත්‍යාගණනිත අතිරික්තය වෙත සෘජුවම හර/බැර කරන ලදී.

3.5 ඉඩම සහ ගොඩනැගිල්ල පිළිබඳ අනාවරණය

"කොළඹ නගරය ඇතුළුව ප්‍රධාන නගර කේන්ද්‍ර කරගත් යෝජිත ව්‍යාපෘති සඳහා රජයේ සහ පුද්ගලික ඉඩම් නාගරික සංවර්ධන අධිකාරිය වෙත පැවරීම/අත්පත් කරගැනීම" මැයෙන් නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ 2020.10.12 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා වූ අංක 20/1607/306/035 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, එකී අමාත්‍ය මණ්ඩල සංදේශයෙහි ඇමුණුම - 1 හි අනු අංක 6 යටතේ යොමුගත ජාතික විද්‍යා පදනමේ ඉඩම පවරා ගැනීමට අනුමැතිය ලැබී ඇත.

3.6 අස්පෘශ්‍ය වත්කම්

අයිතමය හා බැඳි අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලා ඒමේ සම්භාවිතාවයක් පවතින්නේ නම් සහ අයිතමය සඳහා වන පිරිවැය විශ්වාසනීය අයුරින් මිනුම්කරණය කළ හැකි නම්, පරිගණක මෘදුකාංග සහ බලපත්‍ර අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනාගනු ඇත. සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානිකරණ අලාභ පිරිවැයෙන් අඩු කර අත්පත් කරගත් අස්පෘශ්‍ය වත්කම් ප්‍රකාශ කෙරේ.

ක්‍රමක්ෂය

අස්පෘශ්‍ය වත්කමක ක්ෂය විය හැකි ප්‍රමාණය එහි ඇස්තමේන්තුගත ඵලදායි ජීව කාලය මුළුල්ලේ සරල රේඛීය පදනමින් ක්‍රමක්ෂය කරන අතර වියදමක් ලෙස හඳුනාගැනේ. ක්ෂය කිරීමේ අනුප්‍රමාණය පහත පරිදි වේ.

පරිගණක මෘදුකාංග	-	20%

3.7 ක්ෂය වන වත්කම් සහ ක්ෂය කිරීම්

ක්ෂය කිරීම්, වත්කම් මිලදී ගත් දිනයේ සිට සරල රේඛීය පදනමින් මුල් පිරිවැය හෝ ප්‍රත්‍යාගණනිත අගය මත මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය තුළ හඳුනාගැනෙන අතර ඇස්තමේන්තුගත ඵලදායි ජීව කාලය මුළුල්ලේ වත්කම් කපා හැරීම ගණනය කෙරේ. ඇස්තමේන්තු කළ අනුප්‍රමාණය පහත පරිදි වේ.

වත්කම් කාණ්ඩය	අනුප්‍රමාණය
ගොඩනැගිල්ල	5%
කාර්යාලීය උපකරණ සහ ගෘහ භාණ්ඩ	20%
මෝටර් වාහන	20%
උපාංග සහ විවිධ	20%
පුස්තකාල පොත්	5%
ලේඛනගත කිරීමේ උපකරණ	10%

4. පර්යේෂණ සහ වෙනත් විද්‍යාත්මක කාර්යයන් සඳහා ප්‍රදාන

පර්යේෂණ ප්‍රදාන කොන්ත්‍රාත් ගිවිසුමෙහි සම්පාදනය කර ඇති පරිදි පර්යේෂණ ප්‍රදානවලට අරමුදල් සැපයීමේ අපගේ ප්‍රතිපත්තිය වනුයේ ප්‍රදානලාභියා සේවය කරන ආයතනය වෙත වාරික වශයෙන් අරමුදල් මුදා හැරීම යි. ව්‍යාපෘතියක් අවසන් වීමෙන් අනතුරුව, වැය නොවූ අරමුදල්වලට අදාළව ණයගැතියෙකු ඇති වේ. ව්‍යාපෘතියේ භාවිතයට නොගත් ශේෂය නැවත ජාතික විද්‍යා පදනම වෙත ගෙවිය යුතු ය. ආයතනය වෙත මාරු කළ මුදල අදාළ වර්ෂය අවසානයේ දී වියදමක් ලෙස සලකනු ලැබේ.

5. ආයෝජන

ජාතික විද්‍යා පදනම හරහා ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය වෙත පවතින රජයේ සහභාගිත්වය, තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යාංශය විසින් අධීක්ෂණය කරනු ලැබේ. ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය සඳහා ජාතික විද්‍යා පදනම විසින් සිදුකර ඇති ආයෝජනය රු. 883,002,124/- කි.

6. ප්‍රකාශන

මෙම ප්‍රකාශන මූලිකවම ප්‍රකාශයට පත්කරනු ලබන්නේ විශේෂයෙන් පාසැල් සිසුන්ට සහ පොදුවේ සමාජය වෙත විද්‍යාත්මක දැනුම ව්‍යාප්ත කරලීම පිණිස මෙන්ම විද්‍යාත්මක ප්‍රජාව, ප්‍රතිපත්ති සම්පාදකයන්, අරමුදල් ප්‍රදානය කිරීමේ නියෝජිතායතන වෙත දැනුම බෙදා හැරීම සඳහා ය.

එබැවින්, බොහෝ අවස්ථාවලදී අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය යටතේ මෙම ප්‍රකාශන විද්‍යාව ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා පාසැල් සහ අනෙකුත් විවිධ අදාළ ආයතන වෙත ත්‍යාග/ප්‍රදාන වශයෙන් නොමිලේ ලබාදීමට සිදු වේ.

2010 නොවැම්බර් 15 දිනැති කළමනාකරණ මණ්ඩල තීරණයට අනුව, මාස හයකට වැඩි සඟරා සහ ජර්නල්වල අගය 50% කින් අඩුකරන අතර, වසරකට වැඩි සඟරා සහ ජර්නල්වල අගය ශූන්‍ය මට්ටමට සලකන ලදී.

2011 අගෝස්තු 12 දිනැති කළමනාකරණ මණ්ඩල තීරණයට අනුව, සඟරා හා ජර්නල් හැර පොත් සහ අනෙකුත් ප්‍රකාශන ඒවා මුද්‍රණයට පත්කළ දිනයේ සිට වසර පහක් ගෙවීයාමෙන් අනතුරුව ඒවායේ අගය ශූන්‍ය මට්ටමට සලකන ලදී.

2015 අගෝස්තු 13 දිනැති කළමනාකරණ මණ්ඩල තීරණය ප්‍රකාරව, ප්‍රකාශන පිරිවැය ඊට අදාළ වන අංශයේ පිරිවැයක් ලෙස සලකනු ලැබේ.

7. වත්කම් සහ ආදායම්වලට අදාළ ප්‍රදාන ඉදිරිපත් කිරීම

7.1 වත්කම්වලට අදාළ ප්‍රදාන

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති LKAS 20 අනුකූලව වත්කම්වලට අදාළ ක්ෂය කිරීම් විලම්භිත ආදායමක් ලෙස සලකමින් ඒවායේ ඵලදායී ජීව කාලය මුළුල්ලේ ක්‍රමානුකූල හා තාර්කිකරණ පදනමක් මත ආදායමක් ලෙස හඳුනාගැනේ.

7.2 ආදායමට අදාළ ප්‍රදාන

ආදායමට අදාළ ප්‍රදාන මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ බැර කිරීමක් ලෙස ඉදිරිපත් කරන අතර, එසේ නැතහොත් ආශ්‍රිත වියදම් වාර්තා කිරීමේදී එම අගය අඩු කෙරේ.

8. තොග

පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයෙන් අඩු අගයට තොග මිනුම්කරණය කෙරේ. පළමුව ලැබී ඇති තොග පළමුව නිකුත් කළ යුතුය (FIFO) යන මූලධර්මය අනුව තොගවල පිරිවැය නිර්ණය වන අතර, තොග අත්පත් කරගැනීමේ දී දරන ලද වියදම් සහ ඒවා දැනට පවතින ස්ථානයට සහ එකී තත්ත්වයට පත්කිරීම සඳහා දරන ලද අනෙකුත් පිරිවැය ද මීට ඇතුළත් වේ.
ප්‍රකාශන තොගවල වටිනාකම නිර්ණය වනුයේ පිරිවැය හෝ විකුණුම් මිල යන දෙකෙන් කවර හෝ අඩු අගයට ය.

9. ලැබිය යුතු දෑ

මුදල් අත්තිකාරම්, කාර්ය මණ්ඩල ණය, කාර්ය මණ්ඩල ණය ගැතියෝ සහ විවිධ ණය ගැතියන් ලැබිය යුතු දෑ යටතට ඇතුළත් වේ. වසර 3 කට වඩා හිඟහිට ඇති ණය සඳහා ජාතික විද්‍යා පදනම විසින් අඩමාණ ණය වෙන්කිරීම සිදුකරනු ලැබේ.

10. මුදල් සහ මුදල් සමාන දෑ

ආයතනයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ, මුදල් හා මුදල් සමාන දෑ යටතට අතැති මුදල් හා චෙක්පත්, බැංකුවේ ඇති මුදල්, සුළු මුදල් හා විශේෂ සුළු මුදල් ඇතුළත් වේ.

11. සේවක ප්‍රතිලාභ

සියලුම සේවකයන් සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල (ETF) මගින් ආවරණය වේ. පවතින සාමාන්‍ය සුබසාධන පහසුකම්වලට අමතරව, අනුමත වෛද්‍ය යෝජනා ක්‍රමයක් ද පවතී. නියම කර ඇති සංස්ථාපිත අවශ්‍යතා අනුව, සේවකයන්ගේ විශ්‍රාම ප්‍රතිලාභ ලබදෙනු ලැබේ. සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල (ETF) සඳහා ආයතනයේ දායකත්වය පිළිවෙලින් 15% ක් සහ 3% ක් වශයෙනි.

පාරිතෝෂික

නියම කර ඇති සංස්ථාපිත අවශ්‍යතා අනුව, සේවකයන් සඳහා වූ විශ්‍රාම ප්‍රතිලාභ ලබදෙනු ලැබේ. 1983 අංක 12 දරන පාරිතෝෂික පනතට අනුකූලව පාරිතෝෂික ප්‍රතිපාදනය වෙන්කරනු ලැබේ. වසරක සේවා කාලයක් සම්පූර්ණ කරන නිලධාරීන් සඳහා විශ්‍රාමික පාරිතෝෂික වගකීම්වලට අදාළව ගිණුම්වල ප්‍රතිපාදන වෙන් කරනු ලැබේ. පාරිතෝෂික ගෙවීම් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතානුකූලව මහා භාණ්ඩාගාරය වෙතින් ලබාදේ. මූලික වැටුප සහ ජීවන වියදම් දීමනාව මත පදනම්ව පාරිතෝෂිකය ගණනය කෙරේ.

පාරිතෝෂික ප්‍රතිපාදන සහ ගෙවීම් විස්තර පහත පරිදි වේ.

වර්ෂය සඳහා ගෙවූ පාරිතෝෂික මුදල්	රු.5,580,712.50
වර්ෂය සඳහා පාරිතෝෂික ප්‍රතිපාදනය	රු.3,367,046.75

12. ප්‍රතිපාදන, අවිනිශ්චිත වත්කම්, සහ අවිනිශ්චිත වගකීම්

යම් බැඳීමකින් සම්පත් පිටතට ගලායෑමේ ප්‍රවාහයක් ප්‍රතිඵල වන බවට සම්භාවිතාවයක් පවතී නම් සහ පිටතට ගලායෑමේ ප්‍රවාහයෙහි ප්‍රමාණය සම්බන්ධයෙන් විශ්වාසනීය ඇස්තමේන්තුවක් සිදුකළ හැකි නම් එකී ශේෂ පත්‍ර දිනට පවතින එවැනි සියළුම බැඳීම් සඳහා ප්‍රතිපාදන වෙන්කරනු ලැබේ. අනාවරණය කිරීම සඳහා අවිනිශ්චිත වත්කම් හෝ වගකීම් නොමැත.

13. ආදායම

ආර්ථික ප්‍රතිලාභ ආයතනය තුළට ගලාඒමේ ප්‍රවණතාවයක් සහ ආදායම සහ දරනු ලැබූ හෝ දරනු ලැබිය යුතු ආශ්‍රිත වියදම් විශ්වාසනීය ලෙස මැනිය හැකි බවට පවතින ප්‍රමාණය තෙක් ආදායම් හඳුනාගනී. වෙළඳ වට්ටම් අඩුකළ ලැබූ ප්‍රතිෂ්ඨාවේ හෝ ලැබිය හැකි ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගයට ආදායම මිනුම්කරණය කෙරේ. ආදායම් හඳුනාගැනීම සඳහා පහත දැක්වෙන නිශ්චිත නිර්ණායක භාවිතා කරනු ලැබේ.

13.1 පොලී ආදායම

පොලිය උපචිත වන අවස්ථාවේ දී පොලී ආදායම හඳුනාගනී.

13.2 විවිධ ආදායම්

විවිධ ආදායම් උපචිත පදනමින් හඳුනාගනු ලැබේ.

13.3 දේපළ, පිරියත සහ උපකරණ බැහැර කිරීමේ ලාභය/ (අලාභය)

දේපළ, පිරියත සහ උපකරණ සහ අනෙකුත් ජංගම නොවන වත්කම් බැහැර කිරීමේ ශුද්ධ ලාභය සහ අලාභය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ගිණුම්ගත වේ. ලාභය සහ අලාභය ගණනය කරනුයේ විකුණුම් ආදායමෙන් එකී වත්කම්වල ධාරණ අගය සහ ආශ්‍රිත විකුණුම් වියදම් අඩු කිරීමෙනි.

13.4 ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානයේ ආදායම

ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානයේ ආදායමට පුස්තකාල සේවා, Winsis පැකේජ සහ දත්ත සමුදා සංක්‍රමණය කිරීම් ඇතුළත් වේ. සේවා ලබාදුන් හෝ සේවා ඉටුකළ ගිණුම්කරණ කාලසීමාවට අදාළව සේවා සැපයීමෙන් ලැබෙන ආදායම හඳුනාගනී.

13.5 ප්‍රකාශන අලෙවිය

ප්‍රකාශන පිටත්කර යැවෙන් අවස්ථාවේ දී හෝ අලෙවිය සිදුවන අවස්ථාවේ දී ප්‍රකාශන අලෙවියෙන් ලැබෙන ඉපැයුම් ආදායමක් ලෙස හඳුනාගනී.

13.6වැඩමුළුවලින් ලැබූ ආදායම

වැඩමුළු, සම්මන්ත්‍රණ සඳහා ලියාපදිංචි වන අවස්ථාව සහ අදාළ කටයුත්ත වෙනුවෙන් සිදුකරන ගෙවීම් රැස්කරන අවස්ථාවේ දී වැඩමුළු, සම්මන්ත්‍රණවලින් ලැබෙන ආදායම හඳුනාගනී.

13.7 ව්‍යාපෘතිවලින් ආදායම

අදාළ ව්‍යාපෘතිය භාර අංශයෙන් ලැබෙන පරිපාලන වියදම් අනුව ව්‍යාපෘති ආදායම හඳුනාගනී.

13.8 කර්තෘ ප්‍රකාශන ගාස්තු

කර්තෘ ගාස්තු ආදායම උපචිත පදනමින් හඳුනාගනු ලැබේ.

13.9 විලම්භිත ආදායම

ප්‍රාග්ධන ප්‍රදානය මහා භාණ්ඩාගාරයෙන් මුදා හරින වත්කමකට අදාළ වන අවස්ථාවක, වියදම් කළ අයිතමයකට පුනරාවර්තන වියදම් අදාළ වනවිට, එය හිලව්වීමට අපේක්ෂිත පිරිවැය සඳහා ක්‍රමානුකූල පදනමින් ගැලපුම් කිරීම සඳහා අවශ්‍ය කාලසීමාව පුරා ආදායමක් ලෙස හඳුනාගනී.

14. වියදම් සහ ආදායම් ප්‍රකාශවල ඉදිරිපත් කිරීම

දරන ලද පිරිවැය සහ යෝග්‍ය පරිද්දෙන් නිශ්චිත ආදායම් අයිතම ඉපැයීම් අතර සෘජු සම්බන්ධතාවය පදනමින් ආදායම් ප්‍රකාශය තුළ වියදම් හඳුනාගනු ලැබේ. ආයතනය පවත්වා ගෙන යෑමේ දී දරන ලද සියලුම වියදම් සහ දේපළ, පිරියත සහ උපකරණවල ක්ෂය කිරීම්, අදාළ කාල සීමාව සඳහා අතිරික්තය/(හිඟය) ගණනය කිරීමේ දී ආදායමෙන් අයකර තිබේ.

15. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත SLPSAS 2 ප්‍රකාරව වක්‍ර ක්‍රමය භාවිතා කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස්කරනු ලබන අතර, එහි දී මෙහෙයුම් ක්‍රියාකාරකම්, මූල්‍ය ක්‍රියාකාරකම් සහ ආයෝජන ක්‍රියාකාරකම්වල දළ මුදල් ලැබීම් සහ දළ මුදල් ගෙවීම් හඳුනාගනී.

16. ජංගම වගකීම්

ජංගම වගකීම් ඒවායේ ගිණුම්කරණ අගයට සටහන් කෙරේ.

17. වාර්තාකරණ දිනයෙන් පසු සිදුවීම්

ආයතනයේ කටයුතු සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක අයුරින් බලපෑමක් ඇතිවන සිද්ධි ශේෂ පත්‍ර දිනයෙන් පසු වාර්තාවී නොමැත.

18. මහා භාණ්ඩාගාරයෙන් ලබාගත් අරමුදල් - 2023

18.1	අයවැය රු.	ලැබුණු රු.	
ප්‍රාග්ධන අරමුදල්	70,000,000	14,000,000	**සටහන A**
පුනරාවර්තන අරමුදල්	162,228,000	142,714,183	

සටහන A: ජාතික විද්‍යා පදනම වෙත බලය පැවරී ඇති අදාළ ක්ෂේත්‍ර සඳහා ප්‍රාග්ධන අරමුදල් වෙන් කිරීම

- ජාතික විද්‍යා පදනම වෙත පැවරී ඇති බලය - 01 35,700,000
- ජාතික විද්‍යා පදනම වෙත පැවරී ඇති බලය - 02 8,076,000
- ජාතික විද්‍යා පදනම වෙත පැවරී ඇති බලය - 03 2,390,000
- ජාතික විද්‍යා පදනම වෙත පැවරී ඇති බලය - 04 3,800,000
- ජාතික විද්‍යා පදනම වෙත පැවරී ඇති බලය - 05 14,734,000
- ජාතික විද්‍යා පදනම වෙත පැවරී ඇති බලය - 06 5,300,000

18.2 අයවැය ඉදිරිපත් කිරීම

2023 වර්ෂය සඳහා ආයතනයේ අනුමත අයැවය පිළියෙල කර තිබේ. ක්‍රියාකාරී සැලැස්මේ දක්වා ඇති ක්‍රියාකාරකම් අනුව ආයතනයේ අයවැය පිළියෙල කර තිබේ. අයවැය සහ තත්‍ය අගයන් අතර සංසන්දනාත්මක ප්‍රකාශය, මූල්‍ය ප්‍රකාශ -2023 හි පිටු අංක 19 සිට 21 දක්වා වූ වෙනම ඇමුණුමක් ලෙස දක්වා ඇත.

ජාතික විද්‍යා පදනම
2023 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වර්ෂය
සඳහා වන ගිණුම් පිළිබඳ සටහන්

සටහන අංක 19

			2023	2022
19.1 - ප්‍රකාශන අලෙවිය			රු.	රු.
	ප්‍රකාශන අලෙවියෙන් ලද ආදායම	**සටහන - A**	18,827.50	75,900.00
			18,827.50	**75,900.00**
සටහන - A ප්‍රකාශන අලෙවියෙන් ලද ආදායම				
1	ශ්‍රී ලංකා සමාජ විද්‍යා සඟරාව		-	800.00
2	ශ්‍රී ලංකා සමාජ විද්‍යා සඟරාව වෙළුම් අංක 42		-	-
3	ශ්‍රී ලංකා සමාජ විද්‍යා සඟරාව වෙළුම් අංක 43		-	400.00
4	ශ්‍රී ලංකා සමාජ විද්‍යා සඟරාව වෙළුම් අංක 44		-	200.00
5	අනෙකුත් ප්‍රකාශන		27.50	4,500.00
6	ශ්‍රී ලංකාවේ ස්වභාවික සම්පත්		18,000.00	18,000.00
7	විදුරාව - පැරණි කලාප		800.00	4,000.00
8	ජාතික විද්‍යා පදනමේ සඟරාව වෙළුම් අංක 48		-	2,000.00
9	කොවිඩ් -19		-	45,000.00
10	විදුරාව වෙළුම් අංක 37-2 (ඉංග්‍රීසි)		-	200.00
11	විදුරාව වෙළුම් අංක 37-2 (සිංහල)		-	200.00
12	විදුරාව වෙළුම් අංක 37-4 (ඉංග්‍රීසි)		-	200.00
13	විදුරාව වෙළුම් අංක 37-4 (සිංහල)		-	400.00
			18,827.50	**75,900.00**
19.2 - අලෙවි පිරිවැය - ප්‍රකාශන				
	2023.01.01 දිනට ආරම්භක තොගය		358,879.72	1,341,493.36
	එකතු කළා			
	නව ප්‍රකාශන පිරිවැය		2,287,577.36	2,662,611.00
			2,646,457.08	4,004,104.36
	අඩු කළා			
	කපා හරින ලද ප්‍රකාශන තොග		(3,578.82)	(94,550.80)
	2023.12.31 දිනට අවසාන තොගය		(324,723.75)	(358,879.72)
			2,318,154.51	**3,550,673.84**
19.3 ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානය				
1	නඩත්තු සහ අලුත්වැඩියා කටයුතු		-	-
2	පාරිභෝජන ද්‍රව්‍ය		-	-
			-	**-**
19.4 - මුද්‍රණ ඒකකය				
1	පාරිභෝජන ද්‍රව්‍ය සහ රසායනික		291,384.45	369,056.90
2	කඩදාසි සහ බෝඩ්		(188,390.82)	95,089.14
3	නඩත්තු සහ අලුත්වැඩියා කටයුතු		848,766.91	101,932.54
			951,760.54	**566,078.58**

ජාතික විද්‍යා පදනම
2023 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වර්ෂය
සඳහා වන ගිණුම් පිළිබඳ සටහන්

සටහන අංක 20

20.1 - ජාතික විද්‍යා පදනම වෙත පැවරී ඇති බලය 01

පර්යේෂණ සහ සංවර්ධන කටයුතු ප්‍රවර්ධනය කිරීම

		2023	2022
		රු.	රු.
1	පර්යේෂණ අංශය	10,481,431.38	22,449,920.80
2	තාක්ෂණ අංශය	256,954.75	16,125.75
3	පර්යේෂණ ශිෂ්‍යත්ව සහ අධිශිෂ්‍යත්ව	-	1,843,000.00
4	ජාත්‍යන්තර සබඳතා අංශය	-	-
		10,738,386.13	**24,309,046.55**

20.2 - ජාතික විද්‍යා පදනම වෙත පැවරී ඇති බලය 02

විද්‍යා සහ තාක්ෂණ තොරතුරු ව්‍යාප්ත කිරීම

ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානය

1	ශ්‍රී ලංකා මාර්ගගත සඟරාවේ දත්ත සමුදාය	2,078,621.12	2,043,520.68
2	පුස්තකාල පොත්	-	72,720.80
3	ජාතික ඩිජිටල්කරණය	118,303.18	158,166.65
4	සම්මන්ත්‍රණ සහ වැඩමුළු	-	-
5	දායකත්ව මුදල් සහ වාර ප්‍රකාශන	195,910.00	94,620.00
6	දැනුවත් කිරීමේ වැඩසටහන්	235,480.05	-
7	ජාතික කෝෂ්ඨාගාරය විද්‍යා සහ තාක්ෂණ	-	-
		2,628,314.35	2,369,028.13

සඟරා ප්‍රකාශන ඒකකය

1	ජාතික විද්‍යා පදනමේ සඟරාව - (JNSF)	1,234,183.08	1,859,157.52
2	ශ්‍රී ලංකා සමාජ විද්‍යා සඟරාව - (SLJSS)	373,650.00	403,955.72
		1,607,833.08	2,263,113.24
		4,236,147.43	**4,632,141.37**

20.3 - ජාතික විද්‍යා පදනම වෙත පැවරී ඇති බලය 03

විද්‍යා සහ තාක්ෂණ ධාරිතා ගොඩනැංවීම

ජාත්‍යන්තර සබඳතා අංශය

1	ජාත්‍යන්තර සබඳතා - සංචාර ප්‍රදාන	-	-
2	ජාත්‍යන්තර සබඳතා - OSTP	-	2,731,970.00
3	ජාත්‍යන්තර සබඳතා - IPSAT	-	-
4	ජාත්‍යන්තර සබඳතා අංශය	605,756.91	678,711.88
5	ජාත්‍යන්තර විද්‍යා සංවිධාන වෙත දායකත්ව මුදල්	1,672,179.58	2,015,984.25
		2,277,936.49	5,426,666.13

විද්‍යා සහ තාක්ෂණ ප්‍රතිපත්ති පර්යේෂණ අංශය

1	ජාත්‍යන්තර විද්‍යා සංවිධාන වෙත දායකත්ව මුදල්	222,662.33	250,050.96
		222,662.33	250,050.96

සඟරා ප්‍රකාශන ඒකකය

1	ජාතික විද්‍යා පදනමේ සඟරාව - (JNSF)	250,000.00	500,000.00
		250,000.00	500,000.00
		2,750,598.82	**6,176,717.09**

20.4 - ජාතික විද්‍යා පදනම වෙත පැවරී ඇති බලය 04

විද්‍යා සහ තාක්ෂණ ප්‍රතිපත්ති පර්යේෂණ

		2023 රු.	2022 රු.
1	විද්‍යා සහ තාක්ෂණ ප්‍රතිපත්ති පර්යේෂණ අංශය	1,429,344.82	1,559,676.89
2	ජාත්‍යන්තර සබඳතා අංශය	-	92,000.00
		1,429,344.82	**1,651,676.89**

20.5 - ජාතික විද්‍යා පදනම වෙත පැවරී ඇති බලය 05

විද්‍යාව ප්‍රචලිත කිරීම

1	විද්‍යා සන්නිවේදන ව්‍යාප්ති අංශය - SCOD	4,995,380.80	4,058,195.48
2	මාධ්‍ය අංශය	443,694.57	61,036.29
		5,439,075.37	**4,119,231.77**

20.6 - ජාතික විද්‍යා පදනම වෙත පැවරී ඇති බලය 06

ප්‍රාග්ධන වත්කම් අත්පත් කරගැනීම, නඩත්තු කිරීම සහ පද්ධති පරිපාලනය

පරිපාලන සහ තොරතුරු තාක්ෂණ

1	කාර්යාල උපකරණ සහ ගෘහ භාණ්ඩ	1,550.00	6,372.00
2	ගොඩනැගිලි	-	-
3	මෝටර් වාහන	-	-
4	තොරතුරු තාක්ෂණ	175,000.00	2,427,622.87
5	ඉඩම සහ වැඩිදියුණු කිරීමේ කටයුතු	-	-
6	උපාංග සහ විවිධ	43,570.50	7,400.00
7	කාර්ය මණ්ඩල සංවර්ධන දේශීය	401,461.00	569,683.49
	විදේශීය	217,550.00	-
		839,131.50	**3,011,078.36**

ජාතික විද්‍යා පදනම
2023 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වර්ෂය
සඳහා වන ගිණුම් පිළිබඳ සටහන්

	සටහන අංක 21 - මුදල් සහ මුදල් සමාන දෑ		2023	2022
			රු.	රු.
	බැංකු ගිණුම්			
1	ලංකා බැංකුවේ ජංගම ගිණුම 0002323269	**සටහන - A**	2,979,645.49	2,977,620.19
2	ලංකා බැංකුවේ ජංගම ගිණුම 0002323270		172,027.60	1,417,990.25
3	ලංකා බැංකුවේ ජංගම ගිණුම 0002322471		1,685,377.79	1,187,855.34
4	ලංකා බැංකුවේ ඉතිරුම් ගිණුම 80771519		5,402,963.49	3,613,181.53
5	විශේෂ මුදල් අග්‍රිමය		-	100,000.00
6	සුළු මුදල්		-	5,000.00
7	අතැති මුදල් සහ චෙක්පත්		(87.31)	680,891.69
			10,239,927.06	**9,982,539.00**
	සටහන A : 2023.12.31 දිනට ප්‍රාග්ධන මුදල් ශේෂය			
	භාණ්ඩාගාර අරමුදල් -ප්‍රාග්ධන		27,695.89	25,670.59
	කොවිඩ් -19		823,540.00	823,540.00
	කුරුඳු ව්‍යාපෘතිය		2,045,054.75	2,045,054.75
	ක්‍රීඩා ළමුන් පරිසරයට අනුගත කිරීමේ ජාතික විද්‍යා පදනමේ ව්‍යාපෘතිය -2021		83,354.85	83,354.85
			2,979,645.49	**2,977,620.19**

	සටහන අංක 22 - ලැබිය යුතු			
1	**කාර්ය මණ්ඩලය සඳහා ලබාදෙන ණය**			
	ආපදා ණය - 01	*උපලේඛනය - 1*	1,502,754.00	1,867,273.00
	ආපදා ණය - 02	*උපලේඛනය - 2*	10,611,463.00	12,175,703.00
	සංයුක්ත ණය	*උපලේඛනය - 3*	-	-
2	උත්සව අත්තිකාරම්	*උපලේඛනය - 4*	20,000.00	31,250.00
3	කාර්යමණ්ඩල ණය ගැතියෝ	*උපලේඛනය - 5*	140,219.70	34,571.53
4	විවිධ ණය ගැතියෝ	*උපලේඛනය - 6*	273,187.44	3,162,594.38
	අඩුකළා : අඩමාණ ණය සඳහා වෙන්කිරීම්		-	(6,000.00)
5	විවිධ මුදල් අත්තිකාරම්	*උපලේඛනය - 7*	26,660.00	-
			12,574,284.14	**17,265,391.91**

සටහන අංක 22.1 - ලැබිය යුතු දෑ විශ්ලේෂණය	වටිනාකම	වසරක් තුළ නිරවුල් කිරීම	වසරකට පසු නිරවුල් කිරීම
ආපදා ණය - 01	1,502,754.00	440,422.00	1,062,332.00
ආපදා ණය - 02	10,611,463.00	3,021,828.00	7,589,635.00
අනෙකුත් ලැබිය යුතු දෑ	460,067.14	460,067.14	-
	12,574,284.14	**3,922,317.14**	**8,651,967.00**

	සටහන අංක 23 - තොග			
1	ලිපිද්‍රව්‍ය සහ පාරිභෝජන ද්‍රව්‍ය	*උපලේඛනය - 8*	1,007,394.27	822,363.25
2	ප්‍රකාශන	*උපලේඛනය - 8*	324,723.75	358,879.72
			1,332,118.02	**1,181,242.97**

	සටහන් අංක 24 - අනෙකුත් ජංගම වත්කම්			
1	නැවත ගෙවිය යුතු තැන්පතු	*උපලේඛනය - 9*	93,650.00	93,650.00
			93,650.00	**93,650.00**

සටහන අංක 25 - දේපළ, පිරියත සහ උපකරණ

විස්තරය	2023.01.01 දිනට ශේෂය (රු.)	එකතු කළා	බැහැර කිරීම්	2023.12.31 දිනට ශේෂය (රු.)
වත්කම් - (පිරිවැය සහ ප්‍රත්‍යාගණනය කළ)				
ඉඩම	1,134,314,859.19	-	-	1,134,314,859.19
ගොඩනැගිල්ල	124,647,001.40	-	-	124,647,001.40
කාර්යාල උපකරණ සහ ගෘහභාණ්ඩ	100,937,457.78	1,550.00	-	100,939,007.78
මෝටර් වාහන	25,320,000.00	-	-	25,320,000.00
උපාංග සහ විවිධ	1,428,958.55	43,570.50	-	1,472,529.05
පුස්තකාල පොත්	5,768,827.82	-	-	5,768,827.82
ලේඛනගත කිරීමේ උපකරණ	15,783,121.85	-	-	15,783,121.85
	1,408,200,226.59	45,120.50	-	1,408,245,347.09
සමුච්චිත ක්ෂය කිරීම				
ගොඩනැගිල්ල	21,508,072.48	6,232,350.07	-	27,740,422.55
කාර්යාල උපකරණ සහ ගෘහභාණ්ඩ	97,363,075.30	3,070,413.13	-	100,433,488.43
මෝටර් වාහන	15,187,787.40	5,064,400.00	-	20,252,187.40
උපාංග සහ විවිධ	1,390,139.11	22,586.01	-	1,412,725.12
පුස්තකාල පොත්	4,634,470.24	46,907.83	-	4,681,378.07
ලේඛනගත කිරීමේ උපකරණ	15,783,121.85	-	-	15,783,121.85
	155,866,666.38	14,436,657.04	-	170,303,323.42
ශුද්ධ අගය	**1,252,333,560.21**			**1,237,942,023.67**

සටහන අංක 26 - අස්පාශ්‍ය වත්කම්

	2023	2022
පිරිවැය	Rs.	Rs.
වර්ෂය අරම්භයේ ශේෂය	8,905,571.54	6,763,571.54
එකතු කළා	175,000.00	2,142,000.00
මාරු කිරීම්/ බැහැර කිරීම්	-	-
වර්ෂය අවසානයේ ශේෂය	**9,080,571.54**	**8,905,571.54**
සමුච්චිත ක්‍රමක්ෂය		
වර්ෂය අරම්භයේ ශේෂය	4,702,121.66	3,383,745.08
වර්ෂය තුළ අයකිරීම්	1,304,576.81	1,318,376.58
මාරු කිරීම්/ බැහැර කිරීම්	-	-
වර්ෂය අවසානයේ ශේෂය	**6,006,698.47**	**4,702,121.66**
වර්ෂය අවසානයේ ඉදිරියට ගෙනගිය ශේෂය	**3,073,873.07**	**4,203,449.88**

*** අස්පෘශ්‍ය වත්කම් යටතට මිලදී ගනු ලැබූ පරිගණක මෘදුකාංග සහ මෘදුකාංග බලපත්‍ර ඇතුළත් වේ.**

ජාතික විද්‍යා පදනම
2023 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා
ගිණුම් පිළිබඳ සටහන්

			2023	2022
			රු.	රු.
	සටහන අංක 27- ආයෝජන			
1	ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය	**සටහන - B**	883,002,124.00	883,002,124.00
			883,002,124.00	**883,002,124.00**
	සටහන - B : ආයෝජන පිළිබඳ විස්තරය			
		කොටස් ගණන		
	සාමාන්‍ය කොටස්	43,680,786	394,036,527.00	394,036,527.00
	වරණීය කොටස්	51,792,386	488,965,597.00	488,965,597.00
			883,002,124.00	**883,002,124.00**
	සටහන අංක 28- උපචිත වියදම්			
1	උපචිත වියදම්	***උපලේඛනය -10***	4,198,147.71	7,760,037.00
			4,198,147.71	**7,760,037.00**
	සටහන අංක 29- ණය හිමියෝ			
	රු.2,963,345.10 ක වටිනාකමින් යුතු ණය හිමියන් මගින් පහත පරිදි ජාතික විද්‍යා පදනම විසින් දරා සිටින මුදල් ප්‍රමාණය දැක්වේ.			
1	කුඩා ළමුන් පරිසරයට අනුගත කිරීමේ ජාතික විද්‍යා පදනමේ ව්‍යාපෘතිය -2021		83,354.85	83,354.85
2	කොවිඩ් - 19		823,540.00	823,540.00
3	කුරුඳු ව්‍යාපෘතිය		2,045,054.75	2,045,054.75
4	කාර්ය මණ්ඩල ණය හිමියෝ	***උපලේඛනය -6***	11,395.50	-
			2,963,345.10	**2,951,949.60**
	සටහන අංක 30 - විශ්‍රාමික පාරිතෝෂික සඳහා වෙන්කිරීම්			
	2023.01.01 දිනට ශේෂය		43,532,122.50	41,389,595.00
	(+) වර්ෂය සඳහා වෙන්කිරීම්		3,367,046.75	3,479,077.50
			46,899,169.25	44,868,672.50
	(-) වර්ෂය තුළ සිදුකළ ගෙවීම		(5,580,712.50)	(1,336,550.00)
	2023.12.31 දිනට ශේෂය		**41,318,456.75**	**43,532,122.50**
	සටහන අංක 31 - විලම්භිත ආදායම			
1	විලම්භිත ආදායම - වත්කම්	**සටහන - C**	43,742,434.34	49,679,397.69
			43,742,434.34	**49,679,397.69**
	සටහන C : විලම්භිත ආදායම - වත්කම්			
	2023.01.01 දිනට ශේෂය		49,679,397.69	55,385,154.44
	(+) ප්‍රාග්ධනීකරණය කළ වත්කම්		220,120.50	2,250,692.80
			49,899,518.19	57,635,847.24
	(-) විලම්භිත ක්ෂය කිරීම්		(6,157,083.85)	(7,956,449.55)
	2023.12.31 දිනට ශේෂය		**43,742,434.34**	**49,679,397.69**
	සටහන අංක 32 - ජාතික විද්‍යා පදනමේ සංවර්ධන අරමුදල			
1	ජාතික විද්‍යා පදනමේ කොටස		167,966.31	338,966.31
2	කාර්ය මණ්ඩලයේ කොටස		159,734.80	159,734.80
			327,701.11	**498,701.11**

ජාතික විද්‍යා පදනම

2023 වර්ෂය සඳහා අයවැය සහ තත්‍ය වියදම්

ප්‍රාග්ධන වියදම

රු.000'

විස්තරය	*ඇස්තමේන්තුව 2023*	*සංශෝධිත ඇස්තමේන්තුව 2023*	*තත්‍ය වියදම*	*අතිරික්තය/(විචලනය)*
ජාතික විද්‍යා පදනම වෙත පැවරී ඇති බලය - 01	35,700	35,700	10,738	24,962
ජාතික විද්‍යා පදනම වෙත පැවරී ඇති බලය - 02	8,076	8,076	4,236	3,840
ජාතික විද්‍යා පදනම වෙත පැවරී ඇති බලය - 03	2,390	2,900	2,751	149
ජාතික විද්‍යා පදනම වෙත පැවරී ඇති බලය - 04	3,800	3,800	1,429	2,371
ජාතික විද්‍යා පදනම වෙත පැවරී ඇති බලය - 05	14,734	14,224	5,439	8,785
ජාතික විද්‍යා පදනම වෙත පැවරී ඇති බලය - 06	5,300	5,300	839	4,461
උපචිතිය	-	-	3,584	(3,584)
එකතුව	**70,000**	**70,000**	**29,016**	**40,984**

විස්තරය	*ඇස්තමේන්තුව 2023*	*සංශෝධිත ඇස්තමේන්තුව 2023*	*තත්‍ය වියදම*	*අතිරික්තය/(විචලනය)*
පුද්ගල පඩිනඩි	121,000	120,868	115,678	5,190
ගමන් වියදම්	1,240	1,240	109	1,131
සැපයුම්	9,350	7,050	3,470	3,580
නඩත්තු වියදම්	6,000	8,200	6,429	1,771
ගිවිසුම්ගත සේවා	12,400	12,230	11,090	1,140
අනෙකුත්	15,010	12,640	10,475	2,165
උපචිතිය	-	-	4,518	(4,518)
එකතුව	**165,000**	**162,228**	**151,769**	**10,459**

ජාතික විද්‍යා පදනම

2023 වර්ෂය සඳහා අයවැය සහ තත්‍ය වියදම්

රු.000'

විස්තරය	*ඇස්තමේන්තුව 2023*	*සංශෝධිත ඇස්තමේන්තුව 2023*	*තත්‍ය වියදම*	*අතිරික්තය/(විචලනය)*
කාර්ය මණ්ඩල පඩිනඩි				
වැටුප් සහ දීමනා	76,072	76,072	75,439	633
සේවක අර්ථසාධක අරමුදල	11,362	11,362	10,747	615
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල	2,272	2,272	2,149	123
භාවිතා නොකළ නිඩාඩු සඳහා ගෙවීම්	-		-	-
අනෙකුත් දීමනා	23,694	23,694	19,993	3,701
විශ්‍රාමික පාරිතෝෂිකය	5,400	5,600	5,581	19
අතිකාල සහ නිවාඩු දිනවල සේවයට වාර්තා කිරීම වෙනුවෙන් ගෙවීම්	2,200	1,868	1,769	99
	121,000	**120,868**	**115,678**	**5,190**
ගමන් වියදම්				
රාජකාරී ගමන්	1,240	1,240	109	1,131
	1,240	**1,240**	**109**	**1,131**
සැපයුම්				
නිල ඇඳුම්	350	350	-	350
ලිපිද්‍රව්‍ය සහ පාරිභෝජන ද්‍රව්‍ය	4,250	3,150	948	2,202
ඉන්ධන සහ ලිහිසි තෙල්	4,750	3,550	2,522	1,028
	9,350	**7,050**	**3,470**	**3,580**
නඩත්තු කටයුතු				
මෝටර් වාහන නඩත්තුව	2,500	2,500	1,542	958
කාර්යාල උපකරණ නඩත්තුව	2,000	4,200	4,170	30
ගොඩනැගිල්ල නඩත්තුව	1,500	1,500	718	782
ඉඩම නඩත්තුව	-	-	-	-
	6,000	**8,200**	**6,429**	**1,771**
සේවා				
විදුලිය	3,500	5,200	5,113	87
තැපැල්	750	400	42	358
දුරකතන/ෆැක්ස්	2,200	830	568	262
රක්ෂණ ගාස්තු - වාහන සහ ගොඩනැගිල්ල	900	900	777	123
ජල පාරිභෝජනය	550	700	655	45
ආරක්ෂක සේවා	2,100	2,100	2,017	83
සනීපාරක්ෂක සේවා	2,400	2,100	1,917	183
කල්බදු පහසුකම්	-	-	-	-
	12,400	**12,230**	**11,090**	**1,140**

රු.000'

විස්තරය	ඇස්තමේන්තුව 2023	සංශෝධිත ඇස්තමේන්තුව 2023	තත්‍ය වියදම	අතිරික්තය/(විවලනය)
අනෙකුත් පුනරාවර්තන වියදම්				
ප්‍රචාරණ වියදම්	450	250	-	250
කළමනාකරණ මණ්ඩලය සහ විගණන කමිටුව සඳහා දීමනා සහ ගමන් වියදම්	950	950	581	370
විගණන ගාස්තු -විගණකාධිපති දෙපාර්තමේන්තුව	430	550	550	-
බැංකු ගාස්තු	150	150	96	54
විනෝදාස්වාද කටයුතු	-	-	-	-
නීති ගාස්තු	200	110	13	98
වෛද්‍ය යෝජනා ක්‍රමය	230	230	187	43
කමිටු රැස්වීම් සඳහා සංග්‍රහ	200	200	157	43
පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානය	-	-	-	-
මුද්‍රණ ඒකකය	450	1,700	952	748
මුද්දර ගාස්තු	50	50	1	49
විවිධ වියදම්	700	450	354	96
භාෂා පරිවර්තන ගාස්තු	200	200	7	193
අන්තර්ජාල සාමාජික ගාස්තු	5,670	6,400	6,309	91
මෘදුකාංග බලපත්‍ර අලුත්කිරීම සඳහා දායකත්ව මුදල්	5,330	1,400	1,268	132
	15,010	**12,640**	**10,475**	**2,165**
එකතුව	**165,000**	**162,228**	**147,251**	**14,977**
ප්‍රතිපාදන වෙන්කිරීම් සහ වෙනත්				
පාරිතෝෂික සඳහා වෙන්කිරීම්	-	-	3,367	-
ක්ෂය කිරීම්	-	-	14,437	-
අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කිරීම්	-	-	1,305	-
කපාහරින ලබන ණයගැතියෝ	-	-	6	-
නැවත ආපසු ගෙවනු ලබන තැන්පතු අහිමිවීම්	-	-	-	-
කපා හරින ලද ලිපිද්‍රව්‍ය හා පාරිභෝජන ද්‍රව්‍ය තොග	-	-	-	-
කපා හරින ලද සඟරා හා ජර්නල් තොග	-	-	4	-
අලෙවි පිරිවැය - ප්‍රකාශන	-	-	2,318	-
අනෙකුත් පුනරාවර්තන වියදම් එකතුව	**-**	**-**	**21,436**	**-**
එකතුව	**165,000**	**162,228**	**168,687**	**-**

උපලේඛනය -1

ආපදා ණය -01

		රු.	රු.
1	රුවන්ති ඉපලවත්ත	83,564.00	
2	කේ.ජී.ජේ.කරුණාසේන	35,910.00	
3	චන්දිමා සමරසිංහ	26,406.00	
4	එස්.වී.පී.එම්.රුක්ෂානි	9,144.00	
5	එස්.එන්.පී.කේ.සපුමොහොට්ටි	38,920.00	
6	එච්.අයි.සන්දනායක	40,549.00	
7	එම්.එම්.සී.පෙරේරා	148,866.00	
8	ධනුෂ්ක සොයිසා	78,888.00	
9	ජේ.ඒ.සී.ජේ.සමරසිංහ	111,852.00	
10	චම්පිකා ප්‍රියදර්ශනී	45,364.00	
11	උමේක ගුණරත්න	149,976.00	
12	චින්තක ඒකනායක	4,648.00	
13	ආර්.එම්.එම්.ජයජීවනී	48,124.00	
14	බී.වී.අයි.ඩී.විමලරත්න	38,628.00	
15	සදාරි දෙමටගොල්ල	110,150.00	
16	දිලුෂි මුණසිංහ	20,100.00	
17	එස්.ඒ.ජයසිංහ	40,755.00	
18	පී.එන්.හංසමාලි	158,654.00	
19	පී.එච්.හස්නි	42,714.00	
20	රනිල් කුමාර	57,998.00	
21	එම්.ඩී.පී.පෙරේරා	43,882.00	
22	බී.එම්.රිහාස්	34,306.00	
23	කේ.එම් ද සිල්වා	42,252.00	
24	ඒ.එච්.ඩී.ආර්.මොනාලි	91,104.00	
			1,502,754.00

ආපදා ණය - 02 *උපලේඛනය -2*

1	අජන්තා කාන්ති	12,498.00
2	වී.ආර්.ප්‍රියංගනී	187,470.00
3	එන්.එස්.ලියනගේ	187,470.00
4	එන්.එස්.එස්.සිල්වා	17,439.00
5	සමන් සුජීව	179,138.00
6	උප්පලා මේධාවි	179,138.00
7	මොනිකා විජේමාන්න	183,304.00
8	කේ.ඩී.පී.එන්.නානායක්කාර	237,462.00
9	බී.එස්.කුරේ	187,470.00
10	රුවන්ති ඉපලවත්ත	133,068.00
11	එන්.ඒ.එච්.ප්‍රියදර්ශනී	187,470.00
12	ඒ.ජේ.එන්.සිල්වා	162,474.00
13	ඩී.එම්.එන්.ප්‍රශාන්ති	179,138.00
14	අයි.සී.රමණි	183,304.00
15	කේ.ජී.ජේ.කරුණාසේන	109,865.00
16	ඩබ්.ඒ.ඩී.ඒ.පෙරේරා	83,320.00
17	නදීජා වික්‍රමාරච්චි	4,166.00
18	කේ.එන්.ආර්.හන්සි මහපිටිය	220,798.00
19	දිලිනි ජයවීර	224,964.00
20	චන්දිමා සමරසිංහ	11,088.00
21	එම්.ඒ.ආර්.එල්.මිල්ලවිතාන	4,166.00
22	එස්.වී.පී.එම්.රුක්ෂාණි	140,832.00
23	එස්.එන්.පී.කේ.සපුමොහොට්ටි	127,720.00
24	එච්.අයි.සන්දනායක	130,257.00
25	එම්.එම්.සී.පෙරේරා	30,229.00
26	මහේෂා නාඩුගල	174,972.00
27	ධනුෂ්ක සොයිසා	158,574.00
28	අභිමානි රණතුංග	4,166.00
29	පී.ඩී.ජී.මුදිත	224,964.00
30	සම්මානි වීරසිංහ	179,138.00
31	යොහාන් චන්දිර	179,138.00
32	කේ.ජී.සී.එම්.සිල්වා	191,636.00
33	කාන්චනා සෙව්වන්දි	183,304.00
34	ජේ.ඒ.සී.ජී.සමරසිංහ	50,622.00
35	චම්පිකා ප්‍රියදර්ශනී	137,896.00
36	චින්තක ඒකනායක	4,803.00
37	පුෂ්පා ඇල්ලපල්ලගේ	179,138.00
38	ප්‍රියංකා බමුනේන්ද්‍ර	183,304.00
39	ආර්.එම්.එම්.ජයජීවනී	172,621.00
40	ඒ.එන්.එල්.පෙරේරා	191,636.00

41	බී.වී.අයි.ඩී.විමලරත්න	115,514.00	
42	ආර්.පී.සී.ජානක	41,290.00	
43	ඒ.අයි.අහන්ගම	154,142.00	
44	සරෝජා තිලකරත්න	15,544.00	
45	සදාරි දෙමටගොල්ල	98,150.00	
46	දිලුෂි මුණසිංහ	42,390.00	
47	එස්.ඒ.ජයසිංහ	188,375.00	
48	පී.එන්.හංසමාලි	32,982.00	
49	එස්.සී.එස්.ප්‍රනාන්දු	187,470.00	
50	ඩබ්.ඒ.බී.ප්‍රනාන්දු	191,636.00	
51	පී.එච්.හස්නි	182,250.00	
52	රනිල් කුමාර	137,804.00	
53	පූජිත හේවාවසම්	12,498.00	
54	තස්නීම්	166,640.00	
55	සරනි මෙනේරපිටිය	170,806.00	
56	හර්ෂා ෂාමිනි	237,462.00	
57	හිරන්‍යා විනෝලි	183,304.00	
58	පී.එස්.ඩී.ප්‍රනාන්දු	191,636.00	
59	පවනි අබේසිරි	208,300.00	
60	සුමුදු ගුණසේකර	191,636.00	
61	මනුජා කරුණාරත්න	250,000.00	
62	එස්.වර්ණසූරිය	187,470.00	
63	නදීෂා මුහන්දිරම්	29,162.00	
64	කේ.එන්.සමන්ති	16,664.00	
65	එම්.ඩී.පී.පෙරේරා	206,118.00	
66	බී.එම්.රිහාස්	107,338.00	
67	කේ.එම්. ද සිල්වා	132,720.00	
68	මහේෂි මධුෂානි	216,632.00	
69	නුවන් නිශාන්ත	220,798.00	
70	එච්.කේ.ඒ.එස්.ප්‍රනාන්දු	187,470.00	
71	එම්.එන්.එම්.වික්‍රමසිංහ	162,474.00	
72	සි.එන්.ජේ.මොරගොඩ	162,474.00	
73	ඒ.එච්.ඩී.ආර්.මොනාලි	108,864.00	
74	ජී.ඩී.එන්.රංජන්	179,138.00	
75	උවිනි චමත්කා	91,652.00	
76	පී.ජේ.එම්.සී.පෙරේරා	82,500.00	
			10,611,463.00

උපලේඛනය -3

සංයුක්ත ණය

		රු.	රු.
1	නොපවතී	-	
			-

උපලේඛනය -4

උත්සව අත්තිකාරම්

	නම	**රු.**
1	කේ.ඒ.ඩී.පී.එන්.නානායක්කාර මයා	10,000.00
2	ජූඩ් මාලන් මයා	10,000.00
	එකතුව	**20,000.00**

උපලේඛනය -5

කාර්ය මණ්ඩල ණයගැතියන්ගේ උපලේඛනය

1	නන්දනී පරණවිතාන මෙය	1,043.85
2	ඩී.පී.එන්.නානායක්කාර මයා	4,398.37
3	ඊ.එම්.ඩී.සී.කේ.ඒකනායක මෙය	32,225.79
4	ඩබ්.එල්.සී.දසනායක මෙය	1,784.05
5	ඒ.එන්.එල්.පෙරේරා මිය	3,553.21
6	කාංචනා සෙව්වන්දි මිය	6,446.59
7	චම්පිකා ප්‍රියදර්ශනී මිය	3,581.44
8	උමේක සමරනායක මයා	674.98
9	නිසංසලා හංසමාලි මිය	1,409.99
10	සඳුනි සමරසේකර මිය	49,726.18
11	සඳුන් ප්‍රනාන්දු මයා	5,909.50
12	නදීෂා මුහන්දිරම් මිය	16,318.12
13	එන්.එම්.වික්‍රමසිංහ මිය	4,765.63
14	චාමලී මොරගොඩ මිය	8,382.00
		140,219.70

කාර්ය මණ්ඩල ණයහිමියන්ගේ උපලේඛනය

1	එල්.එන්.ඒ.එල්.පී.නිශ්ශංක මිය	11,395.50
		11,395.50

උපලේඛනය -6

විවිධ ණයගැතියන්ගේ උපලේඛනය

දිනය	වවුචර් අංකය	ප්‍රදානයේ අංකය	ප්‍රදානලාභියා	මුදල රු.	ශත
2022-12-31	JV - 255	ඉන්වොයිස් අංකය -5311	ජනාධිපති කාර්යාලය ගාලු මුවදොර	75,000.00	
2023-12-29	JV - 283	ඉන්වොයිස් අංකය -5339	ලේඛකාධිකාරී තාක්ෂණ සහ ව්‍යවහාරික විද්‍යා පීඨය රජරට විශ්වවිද්‍යාලය මිහින්තලේ	35,730.00	
2023-12-29	JV - 329	TG/2020/COVID/AG/01	මූල්‍යාධිකාරී රුහුණු විශ්වවිද්‍යාලය මාපලාන කඹුරුපිටිය	772.00	
2023-12-29	JV - 329	RG/2019/SS/01	මූල්‍යාධිකාරී රුහුණු විශ්වවිද්‍යාලය වැල්ලමාදම මාතර	69,261.50	
2023-12-29	JV - 332	RG/2019/AG/02	මූල්‍යාධිකාරී කැළණිය විශ්වවිද්‍යාලය කැළණිය	92,423.94	
				273,187.44	

උපලේඛනය- 7

නොපියවන ලද විවිධ මුදල් අත්තිකාරම්

දිනය	වවුචර් අංකය	ගොනු අංකය	නම	මුදල- රු.
2023-12-22	G - 1011	RGB/GEN- 114 Media	ජානක කරුණාසේන මයා	26,660.00

උපලේඛනය -8

	තොග	රු.	රු.
1	**ලිපිද්‍රව්‍ය සහ පාරිභෝජන ද්‍රව්‍ය**		
	ගබඩාව	303,373.25	
	මුද්‍රණ අංශය	704,021.02	**1,007,394.27**
2	**ප්‍රකාශන**		
	කොරල්පර පිළිබඳ පෝස්ටර්	80.00	
	හෝටන්තැන්න පිළිබඳ වීඩියෝපට	8,043.75	
	කොවිඩ් -19	315,000.00	
	විදුරාව 37-1 (දෙමළ)	400.00	
	විදුරාව 38-2 (සිංහල)	400.00	
	විදුරාව 38-3 (සිංහල)	400.00	
	විදුරාව 39-3 (සිංහල)	400.00	**324,723.75**
	එකතුව		**1,332,118.02**

උපලේඛනය -9

	පූර්ව ගෙවීම්	රු.
1	රක්ෂණය	281,811.31
2	ගොඩනැගිල්ල නඩත්තුව	324,324.00
3	කාර්යාල උපකරණ නඩත්තුව	786,686.78
4	තැපැල් ගාස්තු	34,223.00
5	මෘදුකාංග බලපත්‍ර අලුත්කිරීමේ ගාස්තු	512,274.54
		1,939,319.63

	තැන්පතු	රු.
1	ෆිලික්ස් පෙරේරා ඇන්ඩ් සන්ස්	65,000.00
2	විදුලි සංදේශ අධ්‍යක්ෂ	450.00
3	ටෙලිකොම්	5,000.00
4	විදුලිබල මණ්ඩලය	10,000.00
5	ටෙලිකොම් -අන්තර්ජාල දුරකතන පහසුකම්	5,000.00
6	ලාෆ් හෝල්ඩින්ග්ස්	8,200.00
		93,650.00

උපලේඛනය - 10

උපචිත ගෙවීම්

පුනරාවර්තන වියදම්

1	විගණන ගාස්තු	550,000.00	
2	විදුලිය	489,286.15	
3	ජල පාරිභෝජන ගාස්තු	38,085.61	
4	ලිපිද්‍රව්‍ය සහ පාරිභෝජන ද්‍රව්‍ය	31,512.50	
5	ආරක්ෂක සේවා	173,259.00	
6	සනීපාරක්ෂක සේවා	174,334.25	
7	ඉන්ධන වියදම්	386,563.00	
8	දුරකතන	43,133.63	
9	වෛද්‍ය වියදම්	30,322.00	
10	විවිධ වියදම්	4,000.00	
11	වැටුප් සහ දීමනා	18,165.32	
12	ගමන් වියදම් - රාජකාරි	1,575.00	
13	අතිකාල	186,986.83	
14	අන්තර්ජාල ගාස්තු සඳහා දායකත්ව මුදල්	1,482,278.16	
15	ජංගම දුරකතන සඳහා අන්තර්ජාල පහසුකම්	15,622.74	
16	කළමනාකරණ මණ්ඩල සාමාජිකයන් සඳහා ගමන් වියදම් දීමනාව	7,500.00	
17	මෘදුකාංග බලපත්‍ර අලුත්කිරීමේ ගාස්තු	141,410.34	
18	කාර්යාල උපකරණ නඩත්තු කිරීම	114,558.37	3,888,592.90

ප්‍රාග්ධන වියදම්

1	පර්යේෂණ අංශය	18,529.64	
2	දැනුවත් කිරීමේ වැඩසටහන්	175.00	
3	ජාත්‍යන්තර සබඳතා අංශය	5,000.00	
4	මාධ්‍ය අංශය	60,152.30	
5	ජාතික විද්‍යා පදනමේ සඟරාව - (JNSF)	51,000.00	
6	ශ්‍රී ලංකා සමාජ විද්‍යා සඟරාව - (SLJSS)	15,000.00	
7	විද්‍යා සහ තාක්ෂණ ප්‍රතිපත්ති පර්යේෂණ අංශය	17,500.00	
8	කාර්යාල උපකරණ සහ ගෘහභාණ්ඩ	1,550.00	
9	විද්‍යා සන්නිවේදන සහ ව්‍යාප්ති අංශය	35,097.87	
10	කාර්ය මණ්ඩල සංවර්ධන කටයුතු - විදේශීය	105,550.00	309,554.81
	එකතුව		**4,198,147.71**

ජාතික විද්‍යා පදනම

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

සටහන

විගණන විමසුම ප්‍රකාරව, අලෙවි පිරිවැය - ප්‍රකාශන සහ විලම්භිත ආදායම (ප්‍රකාශන) යන ගිණුම් පහත පරිදි නැවත නිශ්චය කර සඳහන් කෙරේ.

	විගණිත ශේෂය	ගැලපුම්	නැවත ප්‍රකාශිත ශේෂය
අලෙවි පිරිවැය – ප්‍රකාශන	3,460,180.85	90,492.99	3,550,673.84
විලම්භිත ආදායම (ප්‍රකාශන)	2,572,118.01	90,492.99	2,662,611.00

	සටහන	2022 දෙසැම්බර්31 වැන දිනට විගණනය කළ ශේෂය	ගැලපුම්	2022 දෙසැම්බර් 31 වැනි දිනට ගැලපුම් කළ ශේෂය
වත්කම්				
ජංගම වත්කම්				
මුදල් සහ මුදල් සමාන දෑ		9,982,539		9,982,539
ලැබිය යුතු		7,350,860		7,350,860
තොග		1,181,243		1,181,243
පූර්ව ගෙවීම		2,049,186		2,049,186
අනෙකුත් ජංගම වත්කම්		93,650		93,650
මුළු ජංගම වත්කම්		20,657,477	-	20,657,477
ජංගම නොවන වත්කම්				
ලැබිය යුතු		9,914,532		9,914,532
දේපළ, පිරියත සහ උපකරණ		1,252,333,560		1,252,333,560
අස්පෘශ්‍ය වත්කම්		4,203,450		4,203,450
ආයෝජන		883,002,124		883,002,124
මුළු ජංගම නොවන වත්කම්		2,149,453,666	-	2,149,453,666
මුළු වත්කම්		2,170,111,144	-	2,170,111,144
වගකීම්				
ජංගම වගකීම්				
උපචිත වියදම්		7,760,037		7,760,037
ණය හිමියෝ		2,951,950		2,951,950
ජංගම නොවන		10,711,987	-	10,711,987
වගකීම්				
විශ්‍රාමික පාරිතෝෂික සඳහා වෙන්කිරීම්		43,532,123		43,532,123
විලම්බිත ආදායම්		49,679,398		49,679,398
මුළු ජංගම වගකීම්		93,211,520	-	93,211,520
ශුද්ධ වත්කම්		103,923,507	-	103,923,507
		2,066,187,637	**-**	**2,066,187,637**
හිමිකම් සහ සංචිත				
සමුච්චිත අරමුදල				
ජාතික විද්‍යා පදනමේ අරමුදල		(66,529,303)		(66,529,303)
ප්‍රත්‍යාගණනිත සංචිතය		1,249,216,115		1,249,216,115
රජයේ ප්‍රදාන		883,002,124		883,002,124
ජාතික විද්‍යා පදනමේ සංවර්ධන අරමුදල		498,701		498,701
මුළු හිමිකම්		**2,066,187,637**	**-**	**2,066,187,637**

මූල්‍ය කාර්යසාධනය සැසඳුම

	විගණනය කළ ශේෂය 2022	2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා			
			ගැලපුම්		
ආදායම					
රජයේ ප්‍රදාන	157,060,000				
අනෙකුත් ආදායම්					
ලැබූ පොලිය	703,790				
විවිධ ආදායම්	45,320				
ප්‍රකාශන අලෙවිය	75,900				
ඡායා පිටපත් කිරීමෙන් ලද ආදායම්	2,472				
ප්‍රකාශන ගාස්තු වශයෙන් ලද – ජාතික විද්‍යා පදනමේ සඟරාව	710,812				
ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානයේ ආදායම	373,900				
වැඩමුළුවලින් ලැබූ ආදායම	106,000				
ස්ථාවර වත්කම් විකිණීමෙන් ලැබූ ලාභය/(අලාභය)	159,080				
ව්‍යාපෘතිවලින් ලැබූ ආදායම	586,359				
විලම්බිත ආදායම - ප්‍රකාශන	2,572,118		90,493		
විලම්බිත ආදායම - වත්කම්	7,956,450				
		170,352,201			170,442,694
වියදම්					
කාර්යාලීය වියදම්					
කළමනාකරණ මණ්ඩල සාමාජිකයන් සඳහා ගමන් වියදම් සහ දීමනා	649,500			649,500	
රැස්වීම් සඳහා සංග්‍රහ කටයුතු	86,237			86,237	
අලෙවි පිරිවැය - ප්‍රකාශන	3,460,181	4,195,918	(90,493)	3,550,674	4,286,411
කාර්ය මණ්ඩල පඩිනඩි					
වැටුප් සහ දීමනා	87,290,971			87,290,971	
සේවක අර්ථසාධක අරමුදල	11,081,559			11,081,559	
සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල	2,217,313			2,217,313	
ප්‍රවාහන සහ ඉන්ධන දීමනා	9,429,552			9,429,552	
විශ්‍රාමික පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	3,479,078			3,479,078	
අතිකාල	1,572,638			1,572,638	
නිවාඩු දින සේවයට වාර්තා කිරීම වෙනුවෙන් ගෙවීම්	-			-	
නිල ඇඳුම්	-			-	
		115,071,110			115,071,110
කාර්යාල පරිපාලනය					
ගමන් වියදම් - රාජකාරී	799,568			799,568	
ලිපිද්‍රව්‍ය සහ පාරිභෝජන ද්‍රව්‍ය	216,031			216,031	
විදුලිය	2,609,235			2,609,235	
දුරකතන/ෆැක්ස්	1,880,799			1,880,799	
තැපැල් ගාස්තු	37,050			37,050	
විගණන ගාස්තු - විගණකාධිපති දෙපාර්තමේන්තුව	375,000			375,000	
බැංකු ගාස්තු	61,825			61,825	
වෛද්‍ය වියදම්	183,546			183,546	
ප්‍රචාරණ	-			-	
ඉන්ධන වියදම්	2,881,662			2,881,662	
මෝටර් වාහන නඩත්තුව	2,273,166			2,273,166	
කාර්යාල උපකරණ සහ ගෘහභාණ්ඩ නඩත්තුව	2,852,233			2,852,233	
ගොඩනැගිල්ල නඩත්තුව	682,514			682,514	
ඉඩම නඩත්තුව	-			-	
රක්ෂණය	765,697			765,697	
ජල පාරිභෝජන ගාස්තු	453,433			453,433	
ආරක්ෂක සේවා	1,759,115			1,759,115	
ක්ෂය කිරීම්	16,222,223			16,222,223	

අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය	1,318,377			1,318,377	
නීති ගාස්තු	130,000			130,000	
විවිධ වියදම්	286,423			286,423	
සනීපාරක්ෂක සේවා	1,858,464			1,858,464	
භාෂා පරිවර්තන ගාස්තු	181,802			181,802	
මුද්දර ගාස්තු	1,175			1,175	
මෘදුකාංග බලපත්‍ර අලුත්කිරීමේ ගාස්තු	1,728,476			1,728,476	
අඩමාණ ණය ගැතියන්ට ප්‍රතිපාදන වෙන් කිරීම්	6,000			6,000	
කපා හැරි සඟරා සහ ජර්නල් තොගය	94,551	39,658,363		94,551	39,658,363
අනෙකුත්					
ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානය	-			-	
මුද්‍රණ අංශය	566,079			566,079	
අන්තර්ජාල සේවා සඳහා දායකත්ව මුදල්	5,509,134	6,075,213		5,509,134	6,075,213
ප්‍රාග්ධන වියදම්					
ජාතික විද්‍යා පදනම සඳහා පැවරී ඇති බලය - 01	24,309,047			24,309,047	
ජාතික විද්‍යා පදනම සඳහා පැවරී ඇති බලය - 02	4,632,141			4,632,141	
ජාතික විද්‍යා පදනම සඳහා පැවරී ඇති බලය - 03	6,176,717			6,176,717	
ජාතික විද්‍යා පදනම සඳහා පැවරී ඇති බලය - 04	1,651,677			1,651,677	
ජාතික විද්‍යා පදනම සඳහා පැවරී ඇති බලය - 05	4,119,232			4,119,232	
ජාතික විද්‍යා පදනම සඳහා පැවරී ඇති බලය - 06	3,011,078			3,011,078	
		43,899,892			43,899,892
වියදම් ඉක්මවා ගිය ආදායමේ අතිරික්තය		**(38,548,294)**			**(38,548,294)**

මුදල් ප්‍රවාහ ප්‍රකාශය සැසඳුම

රු.'000

	විගණනය කළ ශේෂය 2022	ගැලපුම්	ගැලපුම් කළ ශේෂය 2022	
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ				
ආදායම ඉක්මවා ගිය වියදම්වල ශුද්ධ අතිරික්තය	(38,548)		(38,548)	
එකතු කළා; ජාතික විද්‍යා පදනමේ අරමුදලේ පූර්ව වර්ෂ ගැලපුම්	11,037		11,037	
	(27,511)		**(27,511)**	
ගැලපුම් කළා				
ක්ෂය කිරීම්	16,222		16,222	
අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය	1,318		1,318	
වර්ෂය තුළ ගෙවන ලද පාරිතෝෂික ගෙවීම්	(1,336)		(1,336)	
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	3,479		3,479	
ස්ථාවර වත්කම් බැහැර කිරීම	(159)		(159)	
අස්පෘශ්‍ය වත්කම් කපා හැරීම	-		-	
අඩමාණ ණයකරුවන් සඳහා වෙන්කිරීම්	6		6	
විලම්භිත ආදායම	(7,956)		(7,956)	
ණයකරුවන් කපා හැරීම	-		-	
කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය/(පාඩුව)	**(15,937)**		**(15,937)**	
වෙළඳ අනෙකුත් ලැබිය යුතු දෑ ශුද්ධ වැඩිවීම/අඩුවීම	(3,019)		(3,019)	
තොගවල ශුද්ධ වැඩිවීම/අඩුවීම	1,343		1,343	
වෙළඳ ගෙවිය යුතු දෑ ශුද්ධ වැඩිවීම/අඩුවීම	(1,039)		(1,039)	
මෙහෙයුම්වලින් ජනනය වූ මුදල්	(2,715)		(2,715)	
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ		**(18,652)**		**(18,652)**
ආයෝජන කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ				
ස්ථාවර වත්කම් බැහැරකිරීම්වලින් ලද ආදායම්	158		158	
වත්කම් මිලදී ගැනීම්	(2,250)		(2,250)	
පොත් විකිණීමෙන් ලද ආදායම	-		-	
ආයෝජන කටයුතුවල යෙදූ ශුද්ධ මුදල්		**(2,092)**		**(2,092)**
මූල්‍ය කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ				
රජයෙන් ලද දායකත්වයන්	2,250		2,250	
ජාතික විද්‍යා පදනමේ සංරචකවලින් ලද දායකත්වයන්	-		-	
		2,250		**2,250**
මූල්‍ය කටයුතුවලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ		(18,494)		(18,494)
කාල සීමාව ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ		28,476		28,476
කාල සීමාව අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ		**9,982**		**9,982**

ජාතික විද්‍යා පදනම
2023 වර්ෂය තුළ වත්කම් එකතුවීම

වත්කම් අංකය	වවුචර් අංකය	මිලදී ගත් දිනය	සැපයුම්කරු	වර්ගීකරණය	අයිතම සංඛ්‍යාව	වටිනාකම
කාර්යාල උපකරණ						
2023/OE/COM/RD/01	JV - 295	2023.12.12	Mobile Doc	පරිගණක යුඑස්බී මවුස්	1	1,550.00
						1,550.00
විවිධ සහ උපාංග						
2023/MIS/AD/01	JV - 58	2023.03.17	NTS Electronics	උණු වතුර ෆ්ලාස්ක්	1	6,000.00
2023/MIS/AD/02	G - 647	2023.11.04	Mega Heaters (pvt) Ltd	වතුර බොයිලේරුව	1	37,570.50
						43,570.50
අස්පෘශ්‍ය වත්කම්						
2023/IA/IT/01	G - 506	2023.08.31	Accsoft Solutions	වැටුප් සැකසීමේ පැකේජය	1	175,000.00
						175,000.00

විගණකාධිපති වාර්තාව

(152)

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } IMT/F/NSF/1/23/24 ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2024 මැයි 22 දින

සභාපති,

ජාතික විද්‍යා පදනම

ජාතික විද්‍යා පදනමේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික විද්‍යා පදනමේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, පදනමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

පිටුව 1 | 7

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 7 හි 65 ඡේදය ප්‍රකාරව සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත්, තවමත් භාවිතයට ගන්නා පිරිවැය වටිනාකම රු.100,250,215 ක් වූ වත්කම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කර නොතිබුණු අතර රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව එම වත්කම්වල ඵලදායී ජීවිත කාලය නැවත සමාලෝචනය කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කර නොතිබුණි.

(ආ) Office 365 A3 මෘදුකාංගයේ 2022 නොවැම්බර් 5 දින සිට 2023 නොවැම්බර් 04 දින දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා බලපත්‍රය අලුත් කිරීම වෙනුවෙන් ගෙවන ලද රු.464,356 ක් 2023 හා 2024 වර්ෂ වෙනුවෙන් දරන ලද වියදමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම රු.392,038 ක් අඩුවෙන් හා කලින් ගෙවූ වියදම රු.392,038 ක් වැඩියෙන් දැක්වීණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 පදනමේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන පදනමේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැළපෙනවාද යන්න සලකා බැලීමයි.

පදනමේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, පදනම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය පදනම ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා පදනමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

පදනමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, පදනමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි

අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් පදනමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා පදනම පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පදනමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පදනමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට පදනම සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ පදනමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි 9.1 ඡේදයෙහි (අ) හා (ආ)	මාණ්ඩලික නිලධාරියෙකුගේ සෘජු අධීක්ෂණය යටතේ නිලධාරියෙකුට රු. 25,000 ක උපරිමයක් දක්වා සුළු මුදල් අග්‍රිමයක් තබා ගැනීම සඳහා සිය අභිමතය මත අවසර දීමට ගණන් දීමේ නිලධාරියෙකුට හැකිය යන්නට පටහැනිව පදනම විසින් කළමණාකරණ සහකාර සේවයේ නිලධාරීන් තිදෙනෙකුට අවස්ථා 27 ක දී එකතුව රු.1,577,900 ක් අග්‍රිම ලබා දී තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පදනමේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පදනමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

2.3 වෙනත් කරුණු

(අ) පාසල් හා විශ්ව විද්‍යාල මගින් සිදු කරනු ලබන විද්‍යා අධ්‍යාපන හා ප්‍රවර්ධන වැඩසටහන් සඳහා ප්‍රදාන ලබා දීමේ වැඩසටහනක් සැලසුම් කර තිබූ අතර, ඒ පිළිබඳව විශ්ව විද්‍යාල හා පාසැල් දැනුවත් වී නොතිබීම හේතුවෙන් මෙම වැඩසටහන යටතේ ප්‍රදාන ලබා ගැනීම සඳහා පාසැල් 05 ක් පමණක් ඉල්ලුම් කර තිබුණි.

(ආ) 2017 වර්ෂයේ සිට දේශගුණික විපර්යාස හා ජාතික ආපදා යන තේමාව යටතේ සිදු කළ පර්යේෂණ ව්‍යාපෘති 2කට අදාලව එකතුව රු. 8,454,100 ක් ප්‍රදානය කර තිබුණු අතර, එක් ව්‍යාපෘතියක තේමාව හා නියැදිය වෙනස් කිරීමටත්, අනෙක් ව්‍යාපෘතියේ නියැදිය සීමා කිරීමටත් ගත් තීරණය හේතුවෙන් එළඹී නිගමනවල ප්‍රමාණාත්මක භාවය දරන ලද වියදමට සාපේක්ෂව ප්‍රමාණාත්මකද යන්න විගණනයේදී සැතීමකට පත්විය නොහැකි විය.

(ඇ) ගබඩා භාණ්ඩ පිළිබඳ භෞතික පරීක්ෂාවේදී භාවිතා කල හැකි තත්ත්වයේ පවතින සියලු උපාංග සහිත රු.750,750 ක් වටිනා පරිගණක 07 ක් මධ්‍ය සැකසුම් ඒකක (CPU) 14 ක් ද, මොනිටර් 12 ක් හා යතුරු පුවරු (keyboard) 16 ක් නිෂ්ක්‍රියව පැවතුණි.

(ඈ) ණයගිමි ශේෂය තුළ ඇතුලත් වසර 5 කට වැඩි රු.2,045,055 ක් හා වසර 2 ට වැඩි රු.906,895 ක් ලෙස එකතුව රු.2,951,950 ක් වූ ණයගිමි ශේෂයක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2023 වර්ෂයේ දී තාක්ෂණික පැවරුම් ව්‍යාපෘති 04 ක් සඳහා එකතුව රු. 15,469,633 ක් ප්‍රදානය කර තිබුණු අතර ඉන් ව්‍යාපෘති 02 ක් ප්‍රමාද කාල සහිතව අවසන් කර තිබුණි. එම ව්‍යාපෘති 02 හි එක් ප්‍රදානලාභියෙකු සම්බන්ධ කර ගැනීමේ ගැටළුවකට පදනම් මුහුණ පා තිබූ අතර තවත් ප්‍රදානලාභියෙකු විශ්‍රාම ගොස් විදේශ ගත වී තිබුණි. එම හේතූන් නිසා ප්‍රදාන ගිවිසුමේ 8.5.1 ප්‍රකාරව ප්‍රදානලාභීන් කටයුතු කල යුතු නමුත් එසේ කටයුතු කර නොතිබුණි.

(ඊ) ජාතික විද්‍යා පදනම විසින් 2023 වර්ෂය සඳහා සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් 6 ක් සඳහා ප්‍රතිපාදන රු.මිලියන 4 ක් ලැබී තිබුණු ද, වර්ෂය තුල දී රු.මිලියන 0.72 ක් පමණක් වියදම් කර තිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රගතිය සියයට 18ක් විය. තව ද, සැලසුමේ ඒ ඒ කාර්යය සඳහා අපේක්ෂිත ඉලක්කවලට ලහා වීම සංඛ්‍යාත්මකව දක්වා නොතිබුණු අවස්ථා 13 ක් විය.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති.

විගණකාධිපතිවරයාගේ වාර්තාව සම්බන්ධයෙන් ජාතික විද්‍යා පදනමේ අදහස් දැක්වීම

විගණකාධිපති,

ජාතික විගණන කාර්යාලය,

අංක 306/72, පොල්දූව පාර,

බත්තරමුල්ල,

2023.04.17

<u>ජාතික විද්‍යා පදනමේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ ව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාර ව විගණකාධිපති වාර්තාවේ කෙටුම්පත සඳහා පැහැදිලි කිරීම්.</u>

1. මූල්‍ය ප්‍රකාශන

1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) විගණන නිරීක්ෂණය සමග එකග වේ.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 ප්‍රකාරව තවමත් භාවිතා කරනු ලබන පිරිවැය වූ රු. 100,250,215 ක වත්කම් මූල්‍ය ප්‍රකාශනවල නැවත සමාලෝචනය කිරීම සම්මාලෝචනය සඳහා වත්කම් හඳුනා ගැනීමට කටයුතු කරමින් සිටින අතර මෙහිදී කාර්යාල උපකරණ පමණක් සලකාබැලූ අතර වැඩිදුර පරීක්ෂාවේදී ස්ථාවර වත්කම් ලේඛනයේ පවතින භෞතිකව හඳුනාගත හැකි වත්කම් වල වටිනාකම රු. 92,222,742.74 ක් හා ස්ථාවර වත්කම් ලේඛනයේ පවතින කේත අංක නොමැති එහෙත් අගය හඳුනාගත නොහැකි ස්ථාවර වත්කම් සහ ස්ථාවර වත්කම් ලේඛනයේ පවතින නමුත් භෞතිකව හඳුනාගත නොහැකි වත්කම් වල වටිනාකම රු. 8,714,715.04 බව හඳුනාගන්නා ලදී. ඒ සම්බන්ධව සිදුකරන ලද සියලු කාර්යයන් හා එහිදී ඇති වී ඇති ගැටළු පිළිබඳව විගණන කලමනාකරණ කමිටුව (AMC) වෙත වාර්තාවක් ඉදිරිපත් කරන ලදී. එම කමිටුවේ නිර්දේශයන් ද අනුව හඳුනා නොගත් වත්කම් තවදුරටත් හඳුනා ගැනීමට කටයුතු කරමින් සිටී. එහි ප්‍රගතිය ද සමග වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට අපේක්ෂා කෙරේ.

(ආ) විගණන නිරීක්ෂණය සමග එකග වේ.

Office 365 A 3 මෘදුකාංග බලපත්‍රයට අදාල ලේඛන ගෙවීම් සඳහා ඉදිරිපත් කිරීමේ දී බලපත්‍රයේ දින වකවානු නිසිපරිදි සඳහන් කරන ලද ලේඛනයක් ඉදිරිපත් කර නොතිබීම නිසා එම වියදම 2024 වර්ෂය සඳහා වන වියදම් ලෙස ගිණුම් වල සටහන් කරන ලදී. කෙසේ වුව ද මෙම වියදම 2023

නොවැම්බර් 05 සිට වන වියදමක් බව තහවුරු වී ඇති බැවින් අදාළ නිවැරදි 2024 වසරේ දී සිදු කරනු ලැබේ.

2.2.2 නීතිරීති / විධානයට අනුකූල නොවීම

නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණය සඳහා පැහැදිලි කිරීම
(අ) ආයතන සංග්‍රහයේ XIV පරිච්ඡේදයේ 1 වගන්තිය	විගණන නිරීක්ෂණය සමග එකඟ වේ. ප්‍රදර්ශනවල රාජකාරි ඉටු කිරීම ඉතා අපහසු කාර්යයක් වන බැවින් ඒ සඳහා සහභාගි වීමට කාර්ය මණ්ඩලය දිරිමත් කිරීම සඳහා ප්‍රදර්ශනයන් සඳහා සහභාගි වන්නන් වෙනුවෙන් දුෂ්කර දීමනාවක් ගෙවීම සඳහා කලමණාකරන මණ්ඩලය විසින් 2019 වර්ෂයේදී තීරණයක් ගෙන ඇති අතර, එම තීරණය අනුව, පෙර සඳහන් කල මහපොල ප්‍රදර්ශණය සඳහා සහභාගි වූ නිළධාරීන් සඳහා දුෂ්කර දීමනාව ගෙවා ඇත. ප්‍රදර්ශනවල රාජකාරී සඳහා අනුයුක්ත කරන අයට අහාරපාන ලබා ගැනීමට ප්‍රදර්ශන කුටි විවෘතව තබා පිටතට යාමට නොහැකි නිසා අදාල ප්‍රදර්ශන කුටිවල රාජකාරි කරන ආයතනයේ නිලධාරින්ට ආහාර පාන සහ අනෙකුත් සංග්‍රහ ආයතනය මගින් ලබා දීමට කටයුතු කර ඇත. මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව ගෙවනු ලබන සියලුම දීමනා අනුමැතිය සඳහා මහා භාණ්ඩාගාරයට දැනටම ඉදිරිපත් කර ඇත. ඒ සඳහා අනුමැතිය ලැබීමත් සමග ඉදිරි ගෙවීම් සිදු කරනු ඇත. එතෙක් ආයතන සංග්‍රහය අනුව ගෙවීම් කරනු ලැබේ.

(ආ)	මුදල් රෙගුලාසි 454 (1) හා (2)	විගණන නිරීක්ෂණය සමග තරමක්දුරට එකග වේ. මුදල් රෙගුලාසි සංග්‍රහයේ අංක 454 (1) ප්‍රකාරව ගෘහ භාණ්ඩ, කාර්යාල උපකරණ හා අනෙකුත් උපකරණ බාර ගැනීම හා නිකුත් කිරීම සඳහන් කිරීම සඳහා බඩු ලේඛන පොතක් මෙතෙක් භාවිතා කර නොමැති අතර වත්කම්, පිරිවැය සමග සැසඳීම අවසන් වීමත් සමග ආරම්භක ශේෂයන් ඇතුළත් කර භාවිතයට ගැනීම සඳහා මෘදු පිටපතක් 2015 වසරේ සිට සකස් කර ඇත.එසේම මූ.රෙ. 454(2) ප්‍රකාරව රජයේ ගොඩනැඟිලිවල සියලු විදුලි උපාංග හා උපකරණ පිළිබඳව බඩු ලේඛනයක් 2023 සිට සකස් කර ඇත.
(ඇ)	මුදල් රෙගුලාසි 756 (5) (අ) සහ (ආ)	විගණන නිරීක්ෂණය සමග එකග වේ. භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල විසින් බඩු වල හරි වැරදි බැලීම සඳහා ටී සහ ඒ 66 ආකෘතිය ද පාවිච්චි කල නොහැකි බඩු ගැන වාර්තා කිරීම සඳහා පොදු 47 ආකෘතිය ද භාවිතා කර නොමැති අතර, ඉදිරියේදී සම්පූර්ණ කිරීමට ඇති 2024 භාණ්ඩ සමීක්ෂණය සඳහා එම ආකෘති භාවිතා කිරීමට කටයුතු කරනු ලැබේ.
(ඇ)	මුදල් රෙගුලාසි 757	විගණන නිරීක්ෂණය සමග එකග වේ. කාර්ය මණ්ඩලයේ ඇති හිඟතාවය නිසා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයට පත් කරන ලද නිළධාරින්ට එම රාජකාරිවල නියැලීමට වෙලාවන් වෙන්කර ගැනීමට තිබූ අපහසුතාවය නිසා 2022 භාණ්ඩ සමීක්ෂණ වාර්තා සම්පූර්ණ කර හාර දීම ප්‍රමාද විය. මෙම වර්ෂයේදී එම ප්‍රමාදයන් වලක්වා ගැනීමට කටයුතු යොදනු ලැබේ.
(ඉ)	මූ.රෙ. 780	විගණන නිරීක්ෂණය සමග එකග වේ. මෙම ප්‍රදර්ශණය 2023 දෙසැම්බර් මස 25 සිට 31 දක්වා පැවැති අතර, නොවැම්බර් මස 13 වන දින එක් රියදුරු මහතකු ඉල්ලා අස්වීම හේතුවෙන් ඒ වන විට ආයතනයේ සංචිත වාහන සඳහා අනුයුක්ත කල හැකි රියදුරන් සිටියේ දෙදෙනෙකු පමණි. ඉන් එක් රියදුරු මහතකු අතිශය පුද්ගලික කරුණක් හේතුවෙන් දෙසැම්බර් මස 27 /28/29 යන දියන්හි දී නිවාඩු ඉල්ලුම් කර තිබුණි. ඒ අනුව එම දිනයන්හි දී ආයතනයේ සංචිත වාහන සඳහා එක් රියදුරු මහතකු පමණක් සිටි අතර, ඔහුද , අසනීප වීම හේතුවෙන් දෙසැම්බර් 29 දින සේවයට වාර්ථා කිරීමට නොහැකි විය.

රාජකාරි කටයුතු සඳහා ආයතනය තුල එක් රියදුරු මහතකු හෝ රදවා ගත යුතු බැවින් මෙම ප්‍රදර්ශනය සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීමේ දී මෙම කුලී රථ සේවාව යෙදා ගන්නා ලදි. අදාල ආයතනය , නිසි ප්‍රසම්පාදන ක්‍රියාවලිය යටතේ තෝරා ගත් කුලී රථ ආයතනයක් වන අතර , ප්‍රදර්ශනය සඳහා දරන ලද ප්‍රවාහන වියදම් එම වැඩසටහන සඳහා වෙන්කර ඇති මුදලින් ආවරණය වේ.

යම් හෙයකින් ආයතනයේ ඒ වන විට රැඳී සිටි රියදුරු මහතා මේ සඳහා යෙදවුයේ නම් , එම දින 4 සඳහා ආයතනයේ අවශ්‍යතාවයන් ඉටු කර ගැනීම සඳහා වෙනත් රියදුරු මහතකු නොමැති බැවින් විශාල ගැටළුවකට මුහුණ දීමට සිදු වේ. එසේම අදාල ප්‍රදර්ශන පැවැති භූමියේ වාහන ගාල් කිරීමට අවසර ලබා දී නොතිබූ බැවින් ආයතනයේ වාහනය ගාල් කරන ස්ථානය පිලිබඳ ගැටළුවක් මතු වේ. මෙම ප්‍රදර්ශනය රාත්‍රී 11.00 ට අවසන් වන බැවින් අප ආයතනයේ වැන් රථය මේ සඳහා යෙදා ගත්තේ නම් , අදාල නිළධාරීන් රාත්‍රී කාලයේ නිවෙස් වලට ප්‍රවාහනය කර , රියදුරුට තම රාජකාරිය අවසන් කිරීමට අවම වශයෙන් පසුදින පාන්දර 03 පමණ වත් වනු ඇත. එවිට නැවත පසුදින පාන්දර 06.30 වන විට ප්‍රදර්ශනය සඳහා පිටත් වීම පිලිබඳව ප්‍රශ්නයක් ඇති වේ. කුලී රථයන් මේ සඳහා යොදා ගැනීම නිසා , අප ආයතනයේ රථවාහන යොදා ගැනීමේදී සිදුවන වාහන වල නඩත්තු වියදම්, අතිකාල, ඉන්ධන පිරිවැය හා බටා දිමනා වන්හි එකතුවට වඩා සාපෙක්ෂව පිරිවැය ද අවම වී ඇත.

(ඊ) 2009 නොවැම්බර් 13 දිනැති අංක 438 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය

විගණන නිරීක්ෂණය සමග එකග වේ.
2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා ලබා දීම ප්‍රමාද වීම නිසා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් භාවිතයට ගත නොහැකි ලෙස හදුනාගත් භාණ්ඩ සම්බන්ධයෙන් රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 438 අනුව සුදුසු පියවර ගැනීමට නොහැකි විය. එම භාණ්ඩ ඉතා ඉක්මනින් අපහරණය කිරීමට කටයුතු කරනු ලැබේ.

(උ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි 9.1 ඡේදයෙහි (අ) හා (ආ)

විගණන නිරීක්ෂණය සමග එකග වේ.

මෙම මුදල් අත්තිකාරම් ඉන්ධන ලබා ගැනීම සඳහා ලබා ගෙන ඇත. ජාතික විද්‍යා පදනම දිර්ඝ කාලයක සිට ඉන්ධන ලබා ගන්නේ ණය පදනම මත වන අතර රට තුල ඇති වූ ඉන්ධන අර්බුදයත් සමගම ඉන්ධන මිල ඉහල යාම හේතුවෙන් 2022 වසරේ අගොස්තු මස සිට එම ආයතනය ණය පදනම මත ඉන්ධන නිකුත් කිරීම තාවකාලිකව නතර කල අතර, එතැන් සිට 2023 ජුලි මස දක්වා එම තිරණය ක්‍රියාත්මක විය. එම කාලය තුල ආයතනයේ සංචිත වාහන වලට ඉන්ධන සැපයීම සඳහා මුදල් අත්තිකාරම් ලබා ගැනිමට සිදු විය.

නැවත වරක් 2023 දෙසැම්බර් 08 දින සිට මේ වන තෙක් ම ණය පදනම මත ඉන්ධන සැපයීම සැපයුම්කරු විසින් නතර කරන ලදි. මේ හේතුවෙන් නැවත වතාවක් මුදල් අත්තිකාරම් ලබා ගැනිමට සිදු විය.

මෙතෙක් මෙම මුදල් අත්තිකාරම් ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරිගේ අධික්ෂණය මත, කළමණාකරන සහකාර මහතකුට ලබා දෙන ලදී. විගණන විමසුම අනුව, සංචිත වාහන වලට ඉන්ධන ලබා ගැනිමට අවශ්‍ය වන මුදල් අත්තිකාරම් ජ්‍යෙෂ්ඨ පරිපාලන නිළධාරි විසින් ලබා ගැනිම දැනටමත් ආරම්භ කර ඇත. එසේ ම චෙක්පත් මගින් ගෙවීම් කිරීමේ පදනම මත ඉන්ධන ලබා ගැනීම සඳහා අදාළ ආයතනය වෙත ලිඛිත ඉල්ලීමක් යැවීමට ද කටයුතු කරනු ලැබේ.

2.3 වෙනත් කරුණු

(අ) විගණන නිරීක්ෂණය සමග එකග නොවේ.

උද්භිද විද්‍යාත්මක ශාක නාමකරණය යනු ශාක විද්‍යාත්මකව හඳුන්වා දීමයි. මෙම මුදල් ආධාර ලබා දී ඇති පාසල කොළඹ ප්‍රදේශයේ මධ්‍යයට වන්නට පවතින පාසලකි. මෙම දරුවන්ට විවිධත්වයකින් යුතු ශාක හඳුනා ගැනීමට ඇති ඉඩකඩ සීමිතය. විද්‍යා අධ්‍යයනයේ මූලික අංගයක් ලෙස අවට පරිසරය පිළිබඳව දැනුවත් වීම අත්‍යවශ්‍ය වේ.

ජාතික විද්‍යා පදනමේ විශේෂ විද්‍යා අධ්‍යාපන ව්‍යාපෘතිය මඟින් සිදු කරනුයේ සිසුන්ගේ විද්‍යා සාක්ෂරතාවය වැඩිදියුණු කිරීමට මඟ සැලසීමයි. ඒ යටතේ මෙම ප්‍රදානය ලබා දෙනු ලැබුවේ , ශාක පිළිබඳ දැනුවත් විද්‍යාඥයෙකුගේ මඟ පෙන්වීම යටතේ සිසුන් විසින් ශාක හඳුනාගෙන, දැනුමක් සහිතව නාම පුවරු සවි කිරීමටයි. මෙමඟින් මුළු පාසලේම සිසුන් හට පාසල් භූමියේ ඇති ශාකවල සාමාන්‍ය නාමය පිළිබඳ දැනුවත් වීමට හැකියාව ලැබේ. එය විද්‍යා අධ්‍යාපනය ප්‍රචලිත කිරීමට ගනු ලැබූ පියවරකි.

(ආ) විගණන නිරීක්ෂණය සමග එකග නොවේ.

මෙම පර්යේෂණය ක්ෂේත්‍ර අධ්‍යයනයන් හා සම්බන්ධ වුවක් බැවින් කොරෝනා වසංගතය, සංචාරක සීමා කිරීම්, ඉන්ධන අර්බුදය සහ ප්‍රවාහන වියදම් ඉහළ යාම හේතුවෙන් මෙම ව්‍යාපෘතියේ ක්‍රියාකාරී සැලසුමට බාධා ඇති විය. ඒ අනුව වැඩිහිටි ජනගහනයෙන් සමීක්ෂණ මගින් දත්ත රැස් කිරීම සහ විශ්ලේෂණ කටයුතු කොවිඩ් 19 වසංගතය මතුවීමත් සමඟ අඩාල විය. මෙම අනුමත ව්‍යාපෘති යෝජනාවට අනුව, රු. මිලියන 11.032 ක් ඇස්තමේන්තු කර තිබූ අතර සහ මේ දක්වා රු. මිලියන 2.28 ක් (ඇස්තමේන්තු කර තිබූ මුදලින් 20.67% පමණ) ලබා දී ඇත. ව්‍යාපෘති ප්‍රධානියා වන මොරටුව විශ්වවිද්‍යාලයේ වාස්තු විද්‍යා පීඨයේ වාස්තු විද්‍යා අංශයේ මහාචාර්ය ඉන්ද්‍රිකා රාජපක්ෂ මහත්මිය අප වෙත දන්වා ඇත්තේ එම දුෂ්කරතා සහ අයවැය කප්පාදුව හේතුවෙන් සැලසුම් කළ පරිදි දිස්ත්‍රික්ක හතරක් ආවරණය වන පරිදි අධ්‍යයනය සිදු කිරීමට නොහැකි වූ බවත් අධ්‍යයනය කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික ප්‍රදේශවලට සීමා කිරීමට සිදුවන බවත්ය. තවද ව්‍යාපෘති ප්‍රධානියා විසින් ව්‍යාපෘති කාලය 2024 ජුනි දක්වා දීර්ඝ කරන ලෙස ඉල්ලීමක් කරන ලදී.

කාලගුණ විපර්යාස සහ ස්වාභාවික විපත් පිළිබඳ මෙහෙයුම් කමිටුව අධ්‍යයනයේ විෂය පථය සීමා කිරීම සම්බන්ධයෙන් විශ්ලේෂණය කළ අතර මෙම ගැටළුව සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා ව්‍යාපෘතියේ ප්‍රගතිය ව්‍යාපෘති ප්‍රධානියාගෙන් පැහැදිලි කිරීම් ලබා ගනිමින් විශේෂ කමිටු රැස්වීම් දෙකකින් සමීපව සමාලෝචනය කරන ලදී. දිස්ත්‍රික්ක 4ම ආවරණය වන පරිදි අධ්‍යනය සිදුකිරීම සඳහා ඉන්ධන සහ ගමනා ගමනයට වැය වන අධික පිරිවැය පිළිබඳ කමිටුව අවධානය යොමු කරන ලදී. ඒ අනුව කරන ලද ඉල්ලීම, වත්මන් තත්ත්වය, අපේක්ෂිත නිමැවුම් සහ අධ්‍යයනයේ වැදගත්කම සැලකිල්ලට ගනිමින්, දැනටමත් වැය කරන ලද අරමුදල්වලට සරිලන පරිදි ව්‍යාපෘතිය සාධාරණ නිගමනයකට ගෙන ඒමේ අභිලාෂයෙන් ව්‍යාපෘතියේ මාතෘකාව "උණුසුම් ආතතිය, ජීවන තත්ත්වය සහ නාගරික ප්‍රදේශවල ජීවත් වන වැඩිහිටියන්ගේ යහපැවැත්ම: කොළඹ නාගරික ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී ජනාවාසයක වයස්ගත වීම පිළිබඳ පර්යේෂණයක්" ලෙස සංශෝධනය කිරීමට සහ ව්‍යාපෘති කාලය 2024 ජුනි 08 දක්වා දීර්ඝ කිරීම සඳහා ජාතික විද්‍යා පදනමේ කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය සහිතව අවසර ලබා දෙන ලදී.

කොළඹ නාගරික ප්‍රදේශය යනු ශ්‍රී ලංකාව තුළ වෙසෙන වැඩිම වැඩිහිටියන් සංඛ්‍යාවක් (ගෘහස්ථ පරිසරය සහ ජන ඝනත්වය අනුව) අතිශය උණුසුම් සහ තාප තත්වයන්ගේ බලපෑමට ලක් වන ප්‍රදේශයයි. මේ අනුව අධ්‍යයන නියැදිය නිරූපණය කරන්නේ අධික තාප තත්වයන්ට උපරිම අවදානමට ලක්වන වැඩිහිටි ජනගහනයයි. එබැවින් වඩාත්ම බලපෑමක් ඇති ප්‍රදේශය අධ්‍යනය සඳහා යොදා ගැනීම තීරණාත්මක විශ්ලේෂණ සඳහා වඩාත් ඵලදායී වේ. දිවයිනේ සෙසු ප්‍රදේශවල වෙසෙන වැඩිහිටියන් එයට වඩා අවම මට්ටමකින් උෂ්ණත්වයේ බලපෑම මත සිදුවන දේශගුණික බලපෑමට ලක්වෙන බැවින් මෙම ප්‍රවේශය මගින් අනෙකුත් සියලුම ස්ථාන මෙම ප්‍රදේශයට වඩා උණුසුම් හා තාප තත්වයන්ට අඩු අවදානමක් ඇති බව සනාථ කරයි.



Fig. 1: Distribution of the young elderly



Fig. 2: Land surface temperature

(ඇ) NTRP/2017/CC&ND/TA 02/P02/01 ව්‍යාපෘතිය ක්ෂේත්‍ර අධ්‍යයනයේ හා සම්බන්ධ ව්‍යාපෘතියක් බැවින් කොරෝනා වසංගතය සහ අනෙකුත් සාමාජීය සහ මූල්‍යමය ගැටළු සහගත තත්වයන් හමුවේ බලාපොරොත්තු වූ පරිදි තේ, පොල්, රබර් සහ උක් යන වගා අංශ හතරම ආවරණය කිරීමට නොහැකි බව ව්‍යාපෘති ප්‍රගති පිළිබඳ සොයා බැලීමේදී හඳුනා ගන්නා ලදී. ඒ අනුව වියදම් කරන ලද මුදලට සාධාරණයක් වන ලෙසින් තේ සහ පොල් යන වගා ක්ෂේත්‍රයේ පමණක් ආවරණය වන පරිදි පර්යේෂණය අවසන් කිරීමට අනුමැතිය ලබා දෙන ලදී. මෙම ව්‍යාපෘතියේ ප්‍රතිඵල තේ සහ පොල් වගාවන්ට අදාල නිර්දේශ ලබා දීමට ප්‍රමාණවත් තරම් වනු ඇත.

මෙම අධ්‍යයනය සඳහා තේ සහ පොල් වගා කරන දිස්ත්‍රික්ක වලින් පසුගිය වසර 15-18 කාලය ආවරණය කරමින් මාසික දත්ත රැස් කරන ලදී. මෙමගින් ඉතා විශාල දත්ත ප්‍රමාණයක් රැස් කරගන්නා ලදී. මෙය තේ සහ පොල් වල පිළිවළින් නිරීක්ෂණ 11,040 සහ 17,868 ක් වූ අතර, මුළු නිරීක්ෂණ ප්‍රමාණය 29,508 ක් වන අතර එය ඉතා විශාල දත්ත සමූහයකි. මෙම දත්ත භාවිතා කරමින්, මුල් යෝජනාවේ පරිදි ඵලදායිතාව, ලාභදායිත්වය සහ තාක්ෂණික කාර්යක්ෂමතාව කෙරෙහි දේශගුණික විපර්යාස වල බලපෑම සම්බන්ධයෙන්, තේ සහ පොල් වගා කරන සියලුම ප්‍රදේශ වලට අනාවැකි පළ කරන ලදී. එමෙන්ම මෙම බෝග දෙක සම්බන්ධයෙන් ඒවා වගාවෙදී ඇති අවදානම් පැතිකඩයන් [vulnerability profiles] දිස්ත්‍රික්ක අනුව භූගෝලීය තොරතුරු පද්ධති සිතියම් [GIS Maps] සකස් කර ඇති අතර එය රටේ අනාගත ජාතික සැලසුම්කරණයෙදී ඉතා වැදගත් වේ. තේ සහ පොල් ශ්‍රී ලංකාවේ ප්‍රධානම අපනයන කෘෂිකාර්මික බෝග වන බැවින්, මෙම අධ්‍යයනයේ ප්‍රතිඵල ශ්‍රී ලංකාවේ වැවිලි හා අපනයන කෘෂිකාර්මික අංශ කෙරෙහි දේශගුණික විපර්යාස බලපෑම් තක්සේරු කිරීමේ NSF ව්‍යාපෘතියේ අරමුණට මැනෙවින් අනුකූල වේ.

එමෙන්ම මෙම ව්‍යාපෘතිය මගින් සිසුන් දෙදෙනෙකුට තම පශ්චාත් උපාධි ලබා ගැනීමට හැකි විය. මෙය ජාතික විද්‍යා පදනමේ ශ්‍රී ලංකාවේ විද්‍යා විෂයන්හි මානව සම්පත් ධාරිතාව ඉහළ නැංවීමේ අරමුණ සමඟ ද හොඳින් ම ගැලපේ.

ඊට අමතරව, වියදම් කළ මුදල, මුළු අපේක්ෂිත ව්‍යාපෘති පිරිවැයෙන් අඩක් පමණි.

(ඇ) මෙම All-In-One පරිගණක යන්ත්‍ර 2016 වර්ෂයේ නිෂ්පාදිත දේශීය නිෂ්පාදනයක් වන අතර, මෘදුකාංග යාවත්කාලීන කරමින් තව දුරටත් ආයතනික පරිගණක ජාලය තුල භාවිතා කල නොහැකි

බැවින් සේවයෙන් ඉවත්කොට ඇත. සංවේදී තොරතුරු ඉවත්කර ක්‍රමානුකූලව අපහරණය කරනු ලැබේ.

(ඉ) කුරුඳු ව්‍යාපෘතියෙහි එක් ව්‍යාපෘතියක අවසන් වාර්තාව ලබා ගත් වහාම පියවන අතර කොවිඩ් 19 හා Kids naturalist ව්‍යාපෘති වෙනුවෙන් පරිත්‍යාගශීලීන් ගෙන් ලද මුදල්වලින් ඉතිරි මුදල් සම්බන්ධයෙන් ඔවුන්ගේ උපදෙස් මත ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ.

(ඊ)

i. TG/2017/Tech-D/02

විගණන නිරීක්ෂණය සමග එකග වේ.

මෙම ප්‍රදානලාභියාගෙන්ද වරින් වර ප්‍රගති සමාලෝචනයන් සඳහා පසුවිපරුම් සිදු කරන ලදී. 2022 වර්ෂයේ දී WIPO (World Intellectual Property Organization) වෙතින් සාර්ථකව නිමාවූ පර්යේෂණ සඳහා පිරිනමන වාණිජකරණය සඳහා වූ උපදේශකත්ව පාඨමාලාවට මෙම පර්යේෂකයාව සම්බන්ධ කර ගන්නා ලදී. කෙසේ වුව ද ගිවිසුම් ප්‍රකාරව උපකරණ මිලදී ගැනීම් පිළිබඳව G ආකෘතියේ වාර්තාව හා 8.5.1 වගන්තිය ප්‍රකාරව මෙම ප්‍රදානය පිළිබඳ වසර 5 ක කාලයක අදාළ නවතම ක්‍රියාකාරකම් පිළිබඳව වාර්තාවක් ද 2024 මැයි 30 දිනට පෙර ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ.

ii. TD/2016/Tech-D/06

විගණන නිරීක්ෂණය සමග එකග වේ.

මෙම පර්යේෂකයාගෙන් විවිධ අවස්ථාවල දී පසුවිපරම් සිදු කර ඇත. මොහු මෙම නිෂ්පාදනය Arpico (Pvt) Limited සමඟ වාණිජකරණය සිදු කරන ලද අතර නිෂ්පාදනය එළි දැක්වීම ජාතික විද්‍යා පදනමේ ශ්‍රවනාගාරයේදී සිදු කරන ලදී. කෙසේ වුව ද ගිවිසුමේ 8.5.1 වගන්තිය ප්‍රකාරව ප්‍රධාන පර්යේෂකයා විසින් වසර 5 ක කාලයක් ව්‍යාපෘතියට අදාළ නවතම ක්‍රියාකාරකම් පිළිබඳ වාර්තාවක් 2024 මැයි මස අවසන් වීමට පෙර ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ .

iii. TG/2017/Tech-D/07

විගණන නිරීක්ෂණය සමග එකග වේ.

මෙම ව්‍යාපෘතියේ ප්‍රදානලාභියා සම්බන්ධ කර ගැනීමේ ගැටළුව සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා ග්‍රාම නිළධාරීතුමාගෙන් රහසා වාර්තාවක් කැදවන ලද අතර පොලිසියේ පැමිනිල්ලක් ද ගොනු කර ඇත. එසේ ම මැතිවරණ කොමසාරිස් කාර්යාලයෙන් හා පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් ද තොරතුරු ලැබී ඇති අතර එම තොරතුරු

ද සමග විගණන හා කළමණාකරණ කමිටුවේ හා කළමණාකරණ මංඩලයේ උපදෙස් පරිදි ඉදිරි පියවර ගනිමින් සිටී.

iv. විගණන නිරීක්ෂණය සමග එකග වේ.

මෙම ව්‍යාපෘතියේ අවසන් වාර්තාව ඇගයීම් සඳහා 2023 ජනවාරි මස යවන ලදී. එම ඇගයීම් වාර්තාව ප්‍රමාද බැවින් සිහිකැඳවීම් කිහිපයක් සිදු කළ අතර, ඉතා ඉක්මනින් ඇඟයීම් වාර්තාව ලබාදීමට පොරොන්දු වී ඇත. කෙසේ වුවද පවතින තත්ත්වය සලකා අවසන් සිහිකැඳවීමක් සිදුකර මෙම වාර්තාව වෙනත් ඇගයීම්කරුවෙකුට යැවීමට කටයුතු කරනු ලැබේ.

මෙම පර්යේෂකයාගෙන් විවිධ අවස්ථාවල පර්යේෂණය සම්බන්ධයෙන් පසුවිපරම් කරන ලද අතර පර්යේෂණය හා සම්බන්ධ විද්‍යාත්මක ප්‍රකාශන සම්බන්ධයෙන්ද කරුණු විමසන ලදී. අමාත්‍යාංශය විසින් කරනු ලබන ප්‍රගති සමාලෝචනයන්ටද මොහුගෙන් කරුණු ලබා ගන්නා ලදී. කෙසේ වුවද ගිවිසුමේ 8.5.1 වගන්තිය ප්‍රකාරව ප්‍රධාන පර්යේෂකයා විසින් වසර 5 ක කාලයක් ව්‍යාපෘතියට අදාළ නවතම ක්‍රියාකාරකම් පිළිබඳව වාර්තාවක් 2024 මැයි මස අවසන් වීමට පෙර ලබා ගැනීමට කටයුතු කරනු ඇත.

(ඇ) ඇමුණුම් I හා II

Science Foundation
7/75, Maitland Place
Colombo 07

සභාපති

18 ජූලි 2024

ජාතික විද්‍යා පදනම

ක්‍රියාකාරී සැලැස්ම 2023
ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය: ජාතික විද්‍යා පදනම

#	ව්‍යාපෘතිය	අපේක්ෂිත ඉලක්කය ළඟාකර නොගැනීම සම්බන්ධයෙන් හේතු
